# නෑඩන් බට්ටිච්චි 2

Nandan Battichche

CHAMILA RUWAN KUMARI



චමිලා රුවන් කුමාරි

Scanned by CamScanner

# නාඩන් බට්ට්ච්ච් - 2

**චමිලා රුවන් කුමාරි**

Scanned by CamScanner

# පෙරවදන

''නාඬන් බට්ටිච්චි'' යනු මගේ ජීවිතය සහමුලින්ම වෙනස් මඟකට යොමු කළ සන්ධිස්ථානයක් ලෙස මම නිරතුරුවම සලකමි.

මෙය මගේ ප්‍රථම නව කතාව විය. ප්‍රථම රැකියාවේත්, ප්‍රථම ආයතන ප්‍රධානියාගේත් අත්දැකීම් ලැබුණේ ''නාඬන් බට්ටිච්චි'' නිසාය.

සත්තකින්ම ඒ අතීතය සිහි කිරීම සුන්දරය.

මගේ යාලුවන්ගේ නිවෙස්වල ඥාතීන්ද සැම විටම අපේය විය. අප ඔවුන්ව ඇමතුවේ අපේ යාලුවන් ඔවුන්ව අමතන නැකම්වලිනි. ඔවුන් අතරේ අනුෂක්කාගේ අක්කා පුවතපතක දුටු දැන්වීමක් මා වෙත එව්වාය. එහි වූ සම්මුඛ පරීක්ෂණ සඳහා මම කොළඹ පැමිණියෙමි.

දින තුනකට පසුව මා වෙත ටෙලිග්‍රෑම් පණිවිඩයක් ලැබිණ. එහි වූයේ වහා පැමිණ පුවත්පත් කාර්යාලයේ රැකියාව බාර ගන්නා ලෙසය.

පුවත්පත් කාර්යාලයක රැකියාවට යනවාට නිවෙසින් මහා විරෝධයක් පැන නැගිණි.

එහි අවසාන ප්‍රතිඵලය වූයේ නිල් පාට, දම් පාට ලප කැලැල් රැසකුත්, අම්මාගේ ආශිර්වාදය පමණකුත් රැගෙන නිවසින් එළියට බසින්නට සිදුවීමය.

නිවසේ දොර මට වැසිණි. මා කොළඹට පැමිණියේ රුපියල් එකසිය හැත්තෑ නමයකුත් ශත ගණනකුත්, ඇඳුම් තුනකුත් පමණක් රැගෙනය.

ඉන් පසුව ජීවියතට මුහුණ දෙන්නට අර ලප කැලැල් පන්නරය ...... ගැහැනු ආත්මයට වරදක් නොකර ගන්නට අම්මාගේ ආශිර්වාදය මා රැගෙන විත් තිබිණි.

මා කළ අභිනිෂ්ක්‍රමණයේ දුෂ්කර ක්‍රියා සමය ඇරඹිණි. යක්ෂ, ප්‍රේත, මිනිසුන් හමුවේ එවකට විසි හැවිරිදි වූ මට මුහුණ දෙන්නට සිදුවූ සිදුවීම් අපමණය. නිවසෙන් කිසිදු සහයක් නොවූ බැවින් පළමු මාස හය අපා දුක් වින්දෙමි. කුසගිනි උහුලන්නට නොදැන සිටි මා එම කාලය ගත කළේ දවසකට එක් ආහාර වේලකින්ය.

ඒ දුක් පීඩා අතරේ 'නාඬන් බට්ටිච්චි' ඉපදිණ. පළමු මාසය ගෙවී යනවිට මා ලත් පාඨක ලිපි ගොඩ ගැසූ කල මට වැඩිය උස විය. ඊට මගේ ප්‍රථම ප්‍රධානියා වූ අර්නස්ට් වඩුගේ මහතාත් මා පිළිබඳව නිරන්තර සොයා බැලූ ප්‍රීතිරාජ් වීරරත්න මහතාත් ශාරිකා වීරරත්න මහත්මියත් සාක්ෂිය.

පුරා දෙවසරක් 'සුවඳ' හැඩ කළ 'නාඬන් බට්ටිච්චි' මගේ ජීවිතය සහමුලින්ම වෙනස් කළේය. සරස්වතී දේවියත්, ලක්ෂ්මී දේවියත් මගේ ජීවිතයට එබී බැලුවේ 'නාඬන් බට්ටිච්චි' නිසාය.

ජීවිතයේ සිදුවූ බොහෝ වෙනස්කම් වලට පදසම වූයේ 'නාඬන් බට්ටිච්චි' වේ. ඉදින් අද එවන් සුවිශේෂී වෙනසක් කළ 'නාඬන් බට්ටිච්චි' එක සහ දෙක දෙවන මුද්‍රණය ලෙසින් ඔබ හමුවට නැවත වතාවක් සපැමිණෙන බව සෙනෙහසින් දන්වමි.

මං, චමිලා රුවන් කුමාරි

# 1

**සැණින්** සුරතට වැදුණු තද පහරකින් බෝතලය විසිවී බිම වැටී කුඩු පට්ටම් වී ගියේය. බියෙන් ත්‍රස්ත වූ මම හිස මඳක් හරවා බැලීමි.

''දෙයියනේ භාෂිණී..., මොකක්ද ඔයා මේ කරගන්න ගිය විනාසෙ?'' සුභාෂ් අයියා මා දෙවුරින් අල්ලා සොලවමින් ඇසීය. මම කිසිවක් කියාගත නොහී සුරතේ දබරැඟිලි නිය තුඩුව සපමින් බිම බලා ගතිමි. මගේ විලාපය, හිත තුළ අවදිවෙමින් තිබෙනු මට දැනිණි.

''තව තප්පරයක් හරි එහා මෙහා වුණා නං එහෙම.. හොඳ වෙලාවට මං ආවෙ..'' සුභාෂ් අයියා සිය සුරත මගේ වම් උරයෙන් ගෙන මගේ නිකටින් ඔසවාලමින් කීවේය.

''මට මැරෙන්නවත් ඉඩ නැද්ද? ඒ තරම්වත් වාසනාවක් මට නැද්ද? ඇයි දෙයියනේ මොන එහෙකටද ඔයා මාව බේර ගත්තෙ..?'' දැඩි ආවේගයකින් යුතුව මම ඇසීමි. ඒ සමගම මට හැඬිණි. දෝතම සුභාෂ් අයියාගේ ළමැදට තබා ඔහු තල්ලු කර දැමූ මම යහනෙහි මුනින්තලාව වැටී හඬන්නට වීමි.

සුභාෂ් අයියා මා අසලින් හිඳ ගන්නවා හඬන අතරතුරේදීම මට දැනිණි.

''අඬන්නෙපා භාෂි..'' සුභාෂ් අයියා මා දෙසට නැමී සෙමින් කොඳුළමින් මගේ හිස අතගාන්නට විය. එනිසාම මගේ අසරණ බව



Scanned by CamScanner

මට වැඩි වැඩියෙන් දැනෙමින් තිබිණි. ඒ සමගම මා විඳවන සියල්ල සුභාෂ් අයියාට කියන්නට මට සිත් විය. මම යහනෙහි හිඳගෙන ඔහුගේ උකුලෙහි මුහුණ සඟවා ගතිමි.

''ඔය ඇති භාෂි ඇඬුවා..'' සුභාෂ් අයියා කියද්දී මම දෑත ඔහුගේ දෙවටොරට බර කොට කඳුළින් පෙඟුණු දෑස ඔහු වෙත හරවාලීමි.

''කියන්න අයියා කියන්න.. මං කියන දේවල් ඔක්කොම අහගෙන ඉන්නවද කියලා..'' මම ඇසුවෙමි.

''ඔව් භාෂි, ඔයා ඕනම දෙයක් කියන්න මං අහගෙන ඉන්නම්.. ඒ විතරක් නෙමෙයි ඔයාගෙ සතුට වෙනුවෙන් මං ඕනම දෙයක් කරන්නම් භාෂි. මට කියන්න. මේ තරම් දරුණු තීරණයක් ගන්න හේතුව මොකද්ද කියලා..'' සුභාෂ් අයියා මගේ දෑස දෙස එක එල්ලේ බලමින් තිර හඬින් කීවේය.

මම දිගු සුසුමක් හෙළමින් ඔහුගේ දෙවටොර මත තබාගෙන සිටින දෑත ඉවතට ගෙන මොහොතක් වේලා නිහඬව ම ඉවත බලා සිටියෙමි.

''ඇයි භාෂි තවත් කල්පනා කරන්නෙ..? මට කියන්න මං අහගෙන ඉන්නම්..''

ඒ සමග කුඩම්මාගේත් තමාලිගේත් කටහඬ ගෙමිදුල දෙසින් ඇසිණ. මම තිගැස්සෙමින් සුභාෂ් අයියා දෙස බැලීමි. ඔහු ගණනකටවත් නොගෙන මදෙස බලා සිටියි. කුඩම්මාත් තමාලිත් දැන් මෙතනට පැමිණියහොත් සිදුවන්නේ විපතකි. අනෙක තමාලිගේ කට කැඩුණු කතා ඉවසාලිය නොහැක.

''අනේ සුභාෂ් අයියෙ, ඔයා දැන් මෙතනින් යන්න.. අර දෙන්නා ආවොත් මට විසුමක් වෙන්නෙ නෑ..'' මම යදින හඬින් කීවෙමි.

''එයාලට ඔයා ඔය තරම් බය වෙන්නෙ මොකටද..? ඔයා ඔහොම බය නැතුව ඉන්න..'' සුභාෂ් අයියා නොපහන් හඬින් කීය.





''එපා.. එපා.. ඔයා යන්න. මං කැමති නෑ ඔයත් එයාලත් එක්ක ගැටෙනවට..'' මම ඔහුගෙන් දැඩි ලෙසින් ඉල්ලා සිටියෙමි.

මගේ දැඩි ඉල්ලීම හමුවේ කිසිත් කරගත නොහුණු සුභාෂ් අයියා යහනෙන් නැගිට දොර අසලට ගොස් නැවත හැරිණි.

''ඔයාගෙ ඉල්ලීම අහක දාන්න බැරිකමටයි මං යන්නෙ. ඒත් ඉස්සෙල්ල වගේ මෝඩ වැඩක් කර ගන්න හිතන්න එපා..'' සුභාෂ් අයියා දැඩි හඬින් එසේ කියා පිටව ගියේය.

මම කාමරය පුරාවට දෙනෙත දිවෙව්වෙමි. විසිරුණු පත පොත, බිඳී ගිය සයනයිඩ් බෝතලයේ කැබලි කාමරය අවුල් ජාලයක් කර ඇති සේය.

සුභාෂ් අයියා නොඑන්නට මේ වන විට මා මේ අකාරුණික ලෝකයෙන් වෙන්ව ගොසින්ය. එහෙත් ඔහුගේ පැමිණීමෙන් ඒ සියල්ල වැළකී ගියේය. එහෙත් මිය යාමේ ආශාව මා කෙරෙන් ඒ වන විටත් තුරන්වී නොතිබිණ. සත්තකින්ම ජීවිතය කෙරෙහි මම බෙහෙවින් කලකිරීමට පත්ව සිටියෙමි.

මම කාමරයට ම වී කල්පනා කරමින් සිටියෙමි. සුභාෂ් අයියා වරින් වර පැමිණ කාමරයට එබී ගියේය. ඔහු මා විපතක් කර ගනිතැයි යන බියෙන් පසුවන බැව් මට වැටහිණි. මට ඔහු ගැන දුක සිතිණ.

කඩින් කඩ අවදි වෙමින් කෙටි නින්දක පහස ලැබූ මම පසුදා උදෑසනින්ම අවදි වීමි. තෙහෙට්ටු ගතියත්, අලස බවත් ගත පුරා වැතිර තිබිණි. මම පාන්දර හයට පමණ පිටුපස දොර හැරගෙන මිදුලට ගියෙමි. ඒ සමගම මා පසුපසින් සුභාෂ් අයියාද පැමිණියේය. ඔහු මා කරන කියන දෑ පිළිබඳව බෙහෙවින් පරීක්ෂාකාරීව සිටින බැව් මට පෙනිණි.

මම ඔහු නොදුටු සේ නිවස ඉදිරිපස ගෙමිදුලේ මල් ගාල දෙසට ගියෙමි. සීතල සුළඟක් පැන අවුත් ගස් මත වැටුණු තුෂර බිඳු වලින් මා නහවා දැමීය. මම සීතලෙන් දෑත පොරවා ගතිමි. රෝස පෑ ගත්



Scanned by CamScanner

නිදන ඇඳුමේ සිහින් පීත්ත පටි සැලෙමින් තිබිණි.

මම රෝස පඳුරක් ළඟ නැවතුණෙමි. එකී පඳුරෙහි පිපී තිබුණේ එක'මෙක රතු රෝස මලක් පමණක්මය. මම එදෙස බලා දිගු සුසුමක් හෙලුවෙමි.

සුභාෂ් අයියා මා අසලටම පැමිණ සිටියේය. තවමත් නිදි බරැති ඔහුගේ දෑස් මවෙත යොමු වී තිබිණි.

''හාෂි.. මට ඔයත් එක්ක කතා කරන්න ඕනැ. වරදවල තේරුම් ගන්න එපා. මට හිතෙනව තවත් ප්‍රමාද වුණොත් ඔයාගෙ ජීවිතේ නැති වේවි ද කියලත්, ඒ හින්දා අද මට කොහොම හරි ඔයා කියන දේවල් අහගන්න ඕනැ..'' සුභාෂ් අයියා එක දිගට කියාගෙන කියාගෙන ගියේය.

අවසානයේදී සියල්ල ඔහුට පැවසිය යුතු යැයි මට ද සිතිණි.

''මේ ගෙදරදී නම් අපිට කතා කරන්න ලැබෙන්නෙ නෑ අයියෙ..'' මම නිදන ගවුමේ ළමැදට වන්නට සමනලයෙකු සේ ගැට ගසා තිබූ සිහින් පීත්ත පටියේ අග සපමින් කීවෙමි. සුභාෂ් අයියා මොහොතක් කල්පනා කළේය.

''එහෙනම්.. ඔයාට පුළුවන් ද උදේ අටට බස් හෝල්ට් එකේ ඉන්න. මං බයික් එක අරන් එන්නම්..'' සුභාෂ් අයියා දෙගිඩියාව මුසු බැල්මකින් යුතුව කීවේය.

මම මොහොතක් කල්පනා කළෙමි. ෂෙහාන් හැරුණු විට කිසිදු පිරිමියෙකු සමග තනිව ගොස් නැති මට සුභාෂ් අයියා සමග යතුරු පැදියක යාමට මඳ පැකිළීමක් දැනිණි. එහෙත් ඔහු හා කතා කරන්නට නම් වෙන කිසිදු මඟක් නැත.

මම සුභාෂ් අයියාගේ අදහසට එකඟවීමි.

හත හමාරට පමණ මා සූදානම් වී සුභාෂ් අයියාට පෙර බස් නැවතුම් පොළට ගියෙමි. ඊට මඳ වේලාවකට පසුව සුභාෂ් අයියා





යතුරු පැදියෙහි විත් මා අසල නැවතිණි.

මම සුභාෂ් අයියා දුන් හෙල්මට් එක පැළඳගෙන යතුරු පැදියට නැගුණෙමි.

ඔහු යතුරු පැදියේ වේගය කෙමෙන් කෙමෙන් වැඩි කෙරුවේය. කිසිදු දිනෙක ෂෙහාන් හැරුණු විට වෙනත් කිසිදු පිරිමියෙකු සමග තනිව මෙවන් ගමනක් නොගොස් ඇති බැවින් මහිත කිසියම් තිගැස්මකින් පෙළෙමින් තිබෙනු මට ම දැනිණි.

එහෙත් ඕනෑම අවස්ථාවකදී පැකිළීම, නුහුරු බව යටපත් කොට මුහුණ දීමේ ශක්තිය මවෙත නිතැතින්ම තිබිණි.

''සුභාෂ් අයියෙ කොහෙද යන්නෙ..?'' කරාපිටිය නව රෝහල පසුවෙත් ම මෙතෙක් නිහඬව සිටි මම ඇසුවෙමි.

''ඇයි බයද..?'' සුභාෂ් අයියා පැති කණ්ණාඩියෙන් මදෙස බලමින් ඇසීය. මම කිසිත් නොකියා ඉවත බලා ගත්තෙමි.

''බය වෙන්න එපා. නිදහසේ කතා කරන්න පුළුවන් තැනකට විතරයි ඔයාව ගෙනියන්නෙ..'' සුභාෂ් අයියා මගේ නිහඬ බව වටහාගෙන කීවේය.

සුභාෂ් අයියා ගාල්ලේදී යතුරු පැදිය කොළඹ පාරට හරවා පදවන්නට විය. ''යන තැනකට ගියාවේ..'' යන හැඟුමෙන් මම ඔහේ සිත් පිත් නැත්තියක සේ සිටිමි.

ගිංතොට හරියේදී වේගය බාල කළ සුභාෂ් අයියා යතුරු පැදිය වම් පස කිසියම් ස්ථානයකට හැරවීය. එය ගිංතොට ලක්මාල් ඡායාරූප ශාලාව විය.

''බහින්න..'' යතුරු පැදියේ තිරිංග තද කළ සුභාෂ් අයියා කීවේය. මම ඔහුගේ උරහිසට අත තබා බැස ගතිමි.

යතුරු පැදියෙන් බැස හෙල්මටය ගලවාගෙන, සුභාෂ් අයියා මදෙස බලා සිනාසුණේය.



Scanned by CamScanner

''ඇයි මෙතෙන්ට ආවෙ..?'' කිසිවක් වටහාගත නොහැකිව මම ඇසීමි.

''මගෙ යාලුවෙක් ඉන්නව ස්ටුඩියෝ එකේ.. එන්නකො..'' එසේ කියමින් සුභාෂ් අයියා ඡායාරූප ශාලාව දෙසට ගියේය. මම ඔහු පසුපසින් ගියෙමි.

''හලෝ සුභාෂ්.. උඹව දකින්න තියෙන අමාරුව..'' අපි ලක්මාල් එකට ඇතුළු වෙත්ම කොහේදෝ සිට ආ සුභාෂ් අයියාගේ වයසේම අයෙකු ඔහුගේ කර වටා සුරත දමා ගත්තේය. සුභාෂ් අයියා සිනාසෙමින් මවෙත හැරුණේය.

''ඒ හාම මා දුටු සුභාෂ් අයියාගේ යාළුවා..

''ම්.. ම්.. ම්.. උඹ තනියම නෙමෙයි එහෙනම්..?'' යි අමුතු විදියකට කියද්දී සුභාෂ් අයියා ඔහුගේ පිටට පහරක් ගැසුවේය.

මහිත කිසියම් ලැජ්ජාවකින් පිරිණි. මම බිම බලා ගතිමි.

''පිස්සු කියවන්නෙ නැතුව හිටපන්.. මං උඹට පස්සෙ විස්තරේ කියන්නම්.. භාෂිණී නංගී මේ මගෙ යාළුවෙක්. නම ප්‍රියන්ත..'' සුභාෂ් අයියා මට ප්‍රියන්තයියාව හඳුන්වා දුන්නේ එලෙසිනි.

''ඉතිං.. ඉතිං.. සහෝදරයා මොකද්ද මගෙන් කෙරෙන්න ඕන..?'' ප්‍රියන්තයියා සුභාෂ් අයියාගෙන් විමසීය.

''අපිට ටිකක් නිදහසේ කතා කරන්න ඕනි. ඒකයි උඹව හොයාගෙන ආවෙ..''

''මං දන්නව ඒක. නැත්තං ඉතින් මාව හොයන් ඒවියැ.. ඔක්කොටම ඉස්සෙල්ල මොකුත් බීල ඉමුකො. දෙන්නත් එක්ක ඔහොම වාඩි වෙලා ඉඳපල්ලකො..''

ප්‍රියන්තයියා අපිට වාඩි වීමට සලස්වා කොහේදෝ ගියේය. මම වාඩිවී වට පිට බැලීමි. ලක්මල් එක තිබූ පරිසරය කිසියම් අපූර්වතම සුන්දරත්වයකින් යුතු යැයි මට සිතිණ.





''හරිම ලස්සන තැන..'' මම සුභාෂ් අයියා දෙස බලමින් කීවෙමි.

''ඔයා තව දැක්කෙ නෑ.. එහා පැත්ත මීටත් වඩා ලස්සනයි..'' ඔහු කීය.

ඒ සමගම චොක්ලට් බීම දෙකක් ගෙන ප්‍රියන්තයියා ආවේය. අපි එය බොන අතරේදී ප්‍රියන්තයියා සුභාෂ් අයියාව මිදුලට කැඳවාගෙන ගියේය. තවත් මොහොතකට පමණ පසු සුභාෂ් අයියා මට කතා කළේය. මම ඔහු වෙත ගියෙමි.

''එන්න ඔයාට ලස්සන පෙන්නන්න..'' එසේ කියමින් සුභාෂ් අයියා ලක්මල් එක පිටුපස වූ මුහුදත් ගඟත් යා කරන සුන්දර පරිසරයට මා කැඳවාගෙන ගියේය. සත්තකින්ම එතරම් දැකුම්කළු පෙදෙසක්.. මට නම් සිතාගත නොහැක. වැලි තීරයත්, නීල සයුරු තෙරත් සහිත ගඟත් මුහුදත් යා වෙන පසුබිමෙහි ලක්මල් ඡායාරූප ශාලාව තනා තිබිණි. එහෙත් සිතට ඇතුළු වූ පාරිසරික ලස්සන මකාලමින් සයුරු තෙර දුටු විගස ෂෙහාන් පිළිබඳ මතකය මහිතෙහි අවදි වෙමින් තිබිණි. මගේ දෑස් කඳුළින් පෙඟිණ. සුභාෂ් අයියාට මගේ වෙනස වැටහෙන්නට ඇත.

''භාෂිණී ඇයි..?'' ඔහු විමසීය. මම කිසිත් නොකියා වැලි තලාවේ සෙවනක දෙපා විදා හිඳ ගතිමි. සුභාෂ් අයියා ද මා අසල හිඳ ගත්තේය.

කිසිඳු කතා බහක් නොමැතිව තත්පර කීපයක් ගත විය. එකී මොහොතේ සයුරු තෙරේ විලාප රාවය මහිත දස දහස් වතාවක් කොනිහන්නට ඇත.

''ඉතිං භාෂිණී දූන් මට ඔයාගෙ ජීවිතේ හැම දෙයක්ම කියන්න ඕන..'' සුභාෂ් අයියා මවෙතට හැරෙමින් දැඩි ලෙසින් කීය.

දිගු සුසුමක් හෙළූ මම සාගරයේ ඉමක් කොනක් නොපෙනෙන අනන්තය දෙස දෑස් දල්වා සියල්ලම ඔහුට කියන්නට වුණෙමි. ෂෙහාන් පිළිබඳ තතු, සුභාෂ් අයියා සමග මගේ සබඳතාවක් ඇතැයි



Scanned by CamScanner

ෂෙහාන් සැක කළයුරු ඇතුළු සියල්ලම මම ඔහුට පැවසීමි. සියල්ල අසා සිටි සුභාෂ් අයියා බොහෝ වේලාවක් කල්පනා කළේය.

''හාෂිණී මං ඔයාට ඇත්තම කියන්නම්.. ඔයා දැකපු දවසෙ ඉඳල මගේ හිතේ ඇති වුණේ පුදුම ආදරයක්..''

''සුභාෂ් අයියා..'' ඔහුගේ කතාව ඇසූ මට කෑගැසිණි.

''ඉන්න කලබල නොවී.. මං මේ කියන්න පටන් ගත්තා විතරයි. ඔයාගෙ ජීවිතේ තොරතුරු, තොරතුරු කිව්වෙ පවුලෙ තොරතුරු ඇහුවම මට ඔයා ගැන තිබුණ ආදරේ වැඩිවුණා. ඇත්තමයි හාෂිණී, මං මේ ඔයා කියනකම් දැනගෙන හිටියෙ නෑ ඔයාට බී.එල්. කෙනෙක් ඉන්නව කියලා. මොනව වුණත් මං දන්නව හාෂිණී ආදරේ බලෙන් ගන්න පුළුවන් දෙයක් නෙමෙයි කියලා. අනික ඔයා වගේ කෙනෙකුට ඉස්සෙල්ලාම ආදරේ කරපු කෙනාව අමතක කරන්නත් අමාරුයි කියලා මට තේරෙනවා. එක්ස්ට්‍රීම්ලි සොරි හාෂිණී, මං නිසා ඔය දෙන්නට වුණ කරදරේ ගැන මට දුකයි. මං ෂෙහාන්ව මීට් වෙලා කතා කරන්නම්..''

සුභාෂ් අයියා එසේ කියද්දී මගේ මුවගෙහි සිනා මලක් පිපිණ.

''ඔයාට එහෙම කරන්න පුළුවන් නම් ගොඩාක් ස්තුතියි සුභාෂ් අයියෙ..'' මම ඉපිල ගිය සතුටින් කීමි.

''කොහොම වුණත් ඔය කරගන්න ගියේ නම් අන්තිම සීරියස් වැඩක්..''

''මොකද්ද..?''

''වහ බොන්න හදපු එක.. මං තව තත්පරයක් හරි ලේට් වුණානම් ඉතිං..''

මම සිනාසීමි.

''හිනා තමා..'' සුභාෂ් අයියා නෝක්කාඩු හඬින් කියා නැගිට සිටියේය.





''අපි යමුද එහෙනම්..?'' ඔහු මදෙස බලා විමසීය.

''හා..'' මම ද හුන් තැනින් නැගී සිට සුභාෂ් අයියා පසුපසින් ඇවිද ගෙන ගියෙමි.

''ඉවරද කතාව..?'' අප දුටු සැනින් ප්‍රියන්තයියා විමසීය.

''ඉවරයි.. ඉවරයි..'' සුභාෂ් අයියා කීය.

''හරි ලස්සනයි ප්‍රියන්තයියා ඔයාලගෙ ස්ටුඩියෝ එක තියෙන තැන..'' මම මඳ සිනාවක් පා කීමි.

''ඒක තමයි ලක්මල් එකේ තියෙන විශේෂත්වය..'' ප්‍රියන්තයියා කීය.

තවත් මඳ වෙලාවක් ඔහු සමග කතා කරමින් හුන් අපි ප්‍රියන්තයියාගෙන් සමුගෙන පිටව ආවෙමු.

ගාලු නගරයේදී යතුරු පැදිය නතර කළ සුභාෂ් අයියා මා ඇමතුවේය.

''ඔයාට පුළුවන් ද බස් එකේ ගෙදර යන්න.. මං මේ ගමන්ම ෂෙහාන්ව මීට් වෙන්න යන්නම්..''

''මට පුළුවන්. ඉන්න මං එයාගෙ එඩ්‍රස් එක දෙන්න..'' මම ඔහුට ෂෙහාන්ගේ ලිපි යොමුව දුන්නෙමි.

''එහෙනම් මං යනවා.. ප්‍රවේසමෙන් යන්න..'' කී සුභාෂ්. අයියා යන්නට ගියේය. මම ඔහු යන දෙස සතුට කැළඹුණ හැඟුමින් බලා සිටියෙමි.

මම වෙලාව බැලීමි. දොළහයි දහය එහි සටහන් වී තිබිණ. සුභාෂ් අයියා පැමිණෙන්නට තවත් බොහෝ වේලාවක් ගත වෙනු ඇත. එතෙක් වේලා නිවසෙහි රැඳී සිටිය නොහැක. කරන්නේ කුමක්දැයි මම යටි තොල සපාගෙන කල්පනා කරන්නට වීමි.

''ඒයි..'' සැනින් මගේ පිටට වැදුණු පහරකින් මම තිගැස්සී ගියෙමි.

''අනේ අනෝජා..'' මම සිනාසෙමින් ඇගේ දෑතෙහි එල්ලුණෙමි.

''හාෂි මොකද බං මේ යන එන මං නැතුව වගේ බලාගෙන ඉන්නෙ..?'' අනෝජා ඇසුවාය.

''යන එන මං නැතුව තමයි බලාගෙන හිටියෙ. ඒක නෙමේ උඹ කොහෙ යන ගමන්ද මේ..?'' මම ඇසීමි.

''අපේ ගෙවල් ළඟ ඇන්ටි කෙනෙක් හොස්පිට්ල් එකේ. මං මේ බලල එන ගමන්. උඹ කොහෙ යන්නද..?''

''ඒක දිග කතාවක් අනෝ. මට උඹත් එක්ක ගොඩක් දේවල් කතා කරන්න ඕනැ. කොහෙ හරි නිදහස් තැනකට යමං..'' මම කීවෙමි.

''එහෙනම් අපේ ගෙදර යමු..'' මම අනෝජාත් සමග ඇගේ නිවසට ගියෙමි. පෙරදා පටන් සිදුවූ සියල්ල මම ඇයට විස්තර කළෙමි. මා කර ගන්නට ගිය විපත ඇසූ ඇය මට බෙහෙවින් බැණ වැදුණාය.

''අපිට තමයි උඹේ ඔක්කොම අවවාද නීති රීති. මෝඩියෙක් වගේ වැඩ කරන්න එපා. වෙලාවට තමයි සුභාෂ් අයියා ආවෙ. වස ටිකක් බීල මැරුණම ඔක්කොම හරි යයි කියලද උඹ හිතුවෙ..?''

''බැනපං.. උඹට ඇතියි කියල හිතෙනකම්ම බැනපන්..'' මම සෙමින් කීවෙමි. අනෝජා මට අවවාද කළාය.

කවුරුන් කුමක් කීව ද ප්‍රශ්නයක් පැමිණි විට හුදකලා වන්නේ මාය. විඳවන්නේ ද මාය. මම කිසිත් නොපවසා ඇය කියන්න අසා සිටියෙමි.

තුන හමාරට පමණ මම අනෝජාගේ නිවසින් පිටව ගෙදර ආවෙමි. මා එනවිට මිදුලේ මල් ගාල අසල නවතා තිබූ යතුරු පැදිය දුටු මතින්ම සුභාෂ් අයියා පැමිණ ඇති බැව් මට වැටහිණි. මම කුල්මත් සිතින් ගෙතුළට දිව ආවෙමි.

සුභාෂ් අයියා හුන් කාමරයේ දොර මඳක් අඩවල් කොට තිබිණි.

''සුභාෂ් අයියා..'' යි අමතමින් මම දොරට ගැසුවෙමි. ඒ සමගම කාමරයෙන් පිටතට ආවේ කඳුළින් පෙඟී ගිය වතින් යුතු තගමාලිය.





ඇය මදෙස නොබලාම ගියාය. මම විස්මිත දෑසින් කාමරය තුළට දෙනෙත් විහිදුවීමි. මදෙසට පිටුපා ජනේලය අසල සිට ගෙන සිටි සුභාෂ් අයියා එක්වරම මදෙසට හැරුණි.

''ආ.. හාෂිණී..''

සුභාෂ් අයියා කළුව ගිය මුහුණින් යුතුව මා ඇමතීය.

''ඇයි අයියා මොකුත් ප්‍රශ්නයක්ද..?'' මම ඇසීමි.

''කතා කරල වැඩක් නෑ හාෂිණී. මගෙ හිත ආදරේ නොකරන කෙනෙකුට මං කොහොමද නංගි ආදරේ කරන්නෙ..? අනික අපේ නැකම් ගැලපෙනවද..? තමාලි ඒ ටික තේරුම් ගත්තෙ නැතුවට මට කරන්න දෙයක් නෑ..'' සුභාෂ් අයියාගේ ඒ කෙටි විස්තරයෙන් මම බොහෝ දෑ තේරුම් ගතිමි. එසේ නම් තමාලි සුභාෂ් අයියාට ආදරය කරනවා විය යුතුය. මම කිසිත් නොපවසා සිටින්නට වීමි.

මගේ දැඩි අවශ්‍යතාවය තිබුණේ සුභාෂ් අයියා ගිය ගමනේ ප්‍රතිඵල දැන ගැනීමටය. එහෙත් සුභාෂ් අයියා සිටින තත්ත්වය උඩ මට එය ඔහුගෙන් ඇසිය නොහැක. සුභාෂ් අයියාට මගේ සිතැඟි වැටහෙන්නට ඇත.

''හාෂිණී, මම ෂෙහාන්ලගෙ ගෙදර ගියා..'' මගේ හද ගැහෙන්නට විය. ඉන්පසු..

''ෂෙහාන් කොහෙද ගිහින්. මං යනකොට හිටියෙ නෑ..'' ඒ ඇසූ වහාම මගේ වත මැලවිණි. මා මෙතෙක් තබාගෙන හුන් බලාපොරොත්තු හිරු දුටු පිණි මෙන් වියැකිණි. මම දිගු සුසුමක් හෙළීමි. සුභාෂ් අයියාට මගේ වෙනස වැටහිණි.

''ඔයා දුක්වෙන්නෙපා හාෂිණී. මං ආයෙ හෙට හරි අනිද්දා හරි එහෙ යනවා.. මටත් ඕන මේ ප්‍රශ්නෙ කෙළවරක් දකින්න.. ඒ නිසා දුක් නොවී ඉන්න..''

ඔහු මා සැනසීමට මෙන් කීය. මම කලකිරුණු සිතින් මගේ



Scanned by CamScanner

කාමරයට ගියෙමි. තමාලිගේ කාමරය දෙසින් සිහින් ඉකිබිඳුම් රාවයක් ඇසේ. කිසියම් කණගාටුව මුසු හැඟීමක් තමාලි පිළිබඳ මසිතෙහි උපදිමින් තිබිණි.

සත්තකින්ම තමන් ආදරය කරන්නාගේ ආදරය නොලත් විට යමෙකු බෙහෙවින් වේදනාවට පත්වේ. එය මම අත්දැකීමෙන්ම දනිමි. එහෙත් තමාලි වෙනුවෙන් මට කළ හැකි කිසිවක් නොවීය. මම කාමරයට වැදී දොර වසා ගතිමි. කාමරය පිස්සන් කොටුවක් සේය. මම කාමරය අස්කර දැමීමි.

පාසලේ පාඩම් වැඩ දැනටමත් බොහොමයක් මා අතින් අතපසුව ඇත. වෙනදා දැඩි උනන්දුවකින් අධ්‍යාපන කටයුතුවල නියැලුණ මට, දැන් දැන් කිසිදු දෙයක් පැහැදිලිව කිරීමට සිතක් නැත. මම ජනේලය අසලට ගොස් ඔහේ බලාගෙන සිටියෙමි.

ජනේලයෙන් පිට ගෙවත්තට වැටුණ පඬු පැහැ හිරු එළිය මහිතට ගෙන ආවේ තව තවත් කලකිරීම මුසු හැඟීම්ය. සිත ලස්සන වූ දා මුළු ලොවම සුන්දර යැයි දකින්නට අප පුරුදුව ඇත. එහෙත් සිත දුකින් පිරී තිබෙද්දී කෙතරම් සුන්දර වුව ද අපට පෙනෙන්නේ අසුන්දර ලෙසටමය. සිතක අරුමය.

මහිත කල්පනා දැහැනින් එක්වරම බිඳී ගියේ කාගෙදෝ බහින් බස් වීමක හඬිනි. මම මඳක් සවන් පෑවෙමි.

ඒ සුභාෂ් අයියාගේත්, තමාලිගේත් කටහඬවල් බැව් මට වැටහිණි. ''ඔයාට අරකිත් එක්ක නටන්න පුළුවන්..'' තමාලිගේ වේගවත් හඬ මට ඇසිණි.

''මං ඔයා වගේ කා එක්කවත් නටන්න ගියේ නෑ..'' සුභාෂ් අයියාගේ කටහඬ ඇසුණු සැනින් මම කාමරයට පිටතට ආවෙමි.

''නැත්තෙ මොකද ඔයා බැලුවොත් ඇත්නම් භාෂිණීගෙ ඇගේ එල්ලිලා..'' තමාලි කීවාය.





''කිසිම දෙයකට හරියට නොදැන ඔය විදියට කතා කරන්න එපා තමාලි..'' මම සන්සුන් හඬින් කීවෙමි. ඒ ඇසුන වහාම තමාලි මදෙසට හැරුණාය.

''මට ඔය එක එක්කෙනාගෙ අවවාද උපදෙස් ඕන නෑ..'' තමාලි වේගවත්ව කීවාය.

''මට කාටවත් අවවාද දෙන්න කිසිම උවමනාවක් නෑ. ඒත් මගේ නමත් ඔය කතාවලට ගාවල නිසයි කතා කළේ..'' මම නොපහත් හඬින් කීවෙමි. තමාලි ගස්සාගෙන ගෙතුළට ගියාය.

මම නිහඬවම සුභාෂ් අයියා දෙස බැලීමි. ඔහු දෙනෙතට හිස් බැල්මක් නගාගෙන මදෙස බලා සිටියේය. මම නිහඬවම ආපසු හැරී විත් කාමරයට වැදී දොර වසා ගතිමි.

සවස අනෝජලාගේ නිවසින් කෑ බැවින් කුසගින්නක් නොදැනේ. ඒ වෙනුවට ගත පුරා දැනෙන්නේ තෙහෙට්ටු බවකි. මම යහනට පැන ඇතිරිලි අස්සේ ගුලිවීමි.

හෙට උදෑසන පාසල් යායුතුව තිබේ. පාසලේ අධ්‍යාපනික වැඩ කොටසත්, ලේඛක හවුලේ වැඩත්, ක්‍රීඩා කටයුතුත් එක පිට එක ගොඩ ගැසී තිබිණි. මා මේ පරිබාහිර වැඩ කොට සොයන්නේ හිත පෙළෙන සියල්ලෙන් මොහොතකට හෝ මිදීමේ අවකාශය නොවේද?

කිසියම් පාළුවක් මගේ හිත වටා දවටෙමින් තිබිණ. සත්තකින්ම ජීවත් වෙනවාට වඩා මිය යාම කෙතරම් සැපතක්දැයි මෙකී මොහොතේ මට දැනෙමින් තිබිණි. මම සියල්ල අමතක කොට නිදන්නට තැත් කළෙමි. එහෙත් නින්ද මා වෙත ළඟා වූයේ බොහෝ රෑ බෝ වූ පසුය.



Scanned by CamScanner

# 2

**පසුදා** උදෑසනින්ම මම පාසල් යන්නට සැරසුණෙමි. මම නිවසේ අය එහාට මෙහාට වෙන තෙක් බලා හිඳ සුභාෂ් අයියා හුන් කාමරය දෙසට ගියෙමි.

''සුභාෂ් අයියෙ..'' මම ඔහු ඇමතුවෙමි.

''ආ.. භාෂිණී එන්න..''

''සුභාෂ් අයියෙ ඔයා ෂෙහාන්ව මුණ ගැහෙන්න යන්නෙ කවදද..?'' මම ඇසීමි.

''මං අද හවස යන්න හිතාගෙන ඉන්නෙ. මොකද ඔයා යවපු ලිපිය ලැබිල තිබුණොත් මිනිහ කලබල වේවි..''

''මං යන්නම්.. සුභාෂ් අයියා අදම යන තරමට හොඳයි..'' මම අඩ සිනහවකින් යුතුව කියා ඔහුගෙන් සමු ගතිමි.

ගෙමිදුලට පය තබනවාත් සමගම ගෙමිදුලේ සිටි කුඩම්මා මා ඉදිරියට ආවාය.

''බලමුකො කුමාරිහාමි තව කොච්චර කාලයක් උජාරුවට ඔහොම යයිද කියලා..'' ඇය ඔච්චම් හඬින් එසේ කීවාය. මම නිහඬවම පාර දෙසට ගියෙමි.

මා පාසලට යද්දී මිතුරියන්ගෙන් පැමිණ සිටියේ අනෝජා පමණි.

''මං හිතුව උඹ අද උදෙන්ම ඒවි කියලා.. ඒකයි මම අද උදෙන්ම ආවෙ..'' අනෝජා කීවාය.





''අනේ මන්දා අනෝ.. දන්නම් ගෙදර ඉන්න බැරිම තත්ත්වයක් උදාවෙලයි තියෙන්නෙ.. මට වෙලාවකට හිතෙනවා ඔලුව හැරුණ අතක යන්න..'' මම අනෝජාත් සමග පන්තියෙන් පිටට පා ඔසවමින් කීවෙමි.

''අපූරුයි උඹේ මොළේ නං.. භාෂි දෙයක් කරන්න කලින් ඒකෙ ප්‍රතිඵලෙත් හිතල බලපන්.. ඒක නෙමේ මං කියන්නම් වැඩක්. භාෂි කැමති නං අපේ ගෙදර ඇවිත් නවතින්න..''

අනෝජාගේ එකී කතාවෙන් මම විස්මිතව දෑස් විදා ඇය දෙස බලා සිටියෙමි.

''ඔව් භාෂි, උඹ වගේ කෙල්ලෙක් ඔය විදියට දුක් විඳින්න ඕන නෑ..'' ඇය යළිත් කීවාය.

''මම නම් උඩින්ම කැමතියි අනෝ.. ඒත් එතකොට මං කරන්නෙ උඹලගෙ ගෙදරට ලොකු කරදරයක්. මං කාටවත්ම කරදරයක් වෙන්න කැමති කෙනෙක් නෙමෙයි කියලා උඹ දන්නවනෙ..''

''මන්ද, අපිට කරදරයක් නෑ.. අපිට එකට පාඩම් කරන්නත් පුළුවන්. කොහොම වුණත් උඹ කල්පනා කරල බලපන්කො. මං කියපු එක ගැන..'' අනෝජා මදෙස බලමින් කීවාය. මම කිසිත් නොපවසා නිහඬ වීමි.

සිව්වන කාල පරිච්ඡේදයේදී සිංහල විෂය සඳහා ගුරුතුමිය පැමිණියාය. ව්‍යාකරණ පාඩමේදී ඇය විටින් විට මගෙන් ප්‍රශ්න නැගුවාය. ඒ හැම වතාවකම එක්කෝ මා දුන් පිළිතුර වැරදිය. නැතිනම් පැටලුම් සහගතය. වෙනදා පාඩමට කන් නොදුන්නද සිංහල විෂය ඔස්සේ අසනු ලබන ඕනෑම පැනයකට මම පහසුවෙන් පිළිතුරු දුනිමි. එහෙත් අවුල් සහගත මානසික වාතාවරණයක සිටි මට පාඩමට තබා අසන ප්‍රශ්නයද තේරුම් ගත නොහැකි තත්ත්වයකට ඇද වැටී ඇත. ගුරුතුමිය පමණක් නොව අනෙක් දැරියෝ ද විස්මයෙන් මෙන් මදෙස බලා සිටියහ.



Scanned by CamScanner

''හාෂිණී, ඉන්ටවල් එකේදී මාව මුණ ගැහෙන්න..'' ගුරුතුමිය මදෙස මොහොතක් වේලා බලා සිට කීවාය. මහිතට කිසියම් ලැජ්ජාවක් දැනිණි.

විවේක කාලය හඟවන සීනුව නාද වූ වහාම කොරිඩෝරය දිගේ යමින් සිටි ගුරුතුමිය වෙත මම දිව ගියෙමි.

''මිස්..''

''ආ.. හාෂිණී.. හාෂිණී වෙනදා වගේ නෙමෙයි හරි වෙනස්.. මොකද ඒ..?'' ගුරුතුමිය මදෙස බලමින් ඇසුවාය.

මම බිම බලාගෙන බැගෑබර සිනාවක් පෑවෙමි.

''මට කියන්න බැරි දෙයක් හාෂිණීට තියෙන්න බැහැ..?'' ඇය එක එල්ලේ මදෙස බලමින් ඇසුවාය. ඇය මට බෙහෙවින් දයාබර බව මම දනිමි. එහෙත්.. මා පෙළෙන දවන කතාව මා ඇයට කෙළෙසක නම් කියන්නෙම්ද..?

''එහෙම කරදරයක් මොකුත් නෑ මිස්.. මේ දවස්වල මට ටිකක් සනීප මදි වගේ..''

''අසනීප ගතියක් දැනෙනව නම් ඩොක්ටර් කෙනෙක් හමුවෙන එක හොඳයි. කොහොම වුණත් කමක් නෑ.. පන්තියෙ වැඩ නම් අතපහු කරගන්න එපා. විභාගෙටත් තව එච්චර කාලයක් නැහැනෙ. අනික ඔයා බලාපොරොත්තු තියා ගන්න පුළුවන් ළමයෙක්..'' ගුරුතුමිය අවවාදානුරූපීව කීවාය.

මම දිග කල්පනාවකට වැටුණෙමි. මාරයා කට ඇරගත්තා සේ දෙසැම්බර් විභාගය මට පෙනේ. එහෙත් ක්‍රීඩා තරග.. මේ සියල්ල මැද්දැවෙන් මගේ අධ්‍යාපන කටයුතු අතපසු වෙමින් තිබේ. කෙසේ වෙතත් අධ්‍යාපන කටයුතුවලට හසු කර ගත හැකි පැහැදිලි මනසක් මා සතු නොවීය.

එක්වරම මගේ දෙනෙත් කාගෙදෝ දෑතකින් වැසී ගියෙන් මම





කලබල වීමි.

''අනෝ.. දීප්ති..'' මම නම් වැලක් කියාගෙන ගියෙමි. අවසානයේදී දෑත් ඉවතට ගෙන සිනාසෙමින් මා ඉදිරියට පැමිණියේ දිල්හානි අක්කාය.

''ඇත්තමයි මට කවුද කියලා හිතා ගන්න බැරිවුණා..'' මම ඇගේ දෑතෙහි එල්ලී කීවෙමි.

''ඉතිං නංගී..'' ඇය මදෙස බැලුවාය. මම දිගු සුසුමක් හෙළිමි. ඇය ''ඉතිං..'' යි අරඹන්නට යන කතාව මම හොඳින් දැන සිටියෙමි.

මම දිගු සුසුමක් හෙළිමි.

''මට තේරෙනව හාෂිණී. මං සිද්ධ වුණ හැම දෙයක්ම දන්නවා නංගී..'' දිල්හානි අක්කාගේ කතාවත් සමග මගේ දෙනෙතට කඳුළු පුරමින් තිබිණි. මම නිහඬවම බිම බලා සිටියෙමි.

''දුක් වෙන්න එපා නංගියෙ.. කවුරු ඔයා අමතක කළත් අපි ඔයාව අමතක කරන්නෙ නෑනෙ..'' ඇගේ දයාර්ද්‍ර වදන් වැලෙන් මහිතට ගෙන ආවේ මා පිළිබඳවම කණගාටුවකි.

''අනේ මන්දා අක්කෙ. මට මොකුත් හිතා ගන්න බෑ. මේ තරම් ආදරේ කරල මාව දාලා ගියාට වැඩිය හොඳයි ෂෙහාන් මාව මරල දම්මනං..''

''නංගී ඔයාට පුළුවන් නම් වෙලාවක අපේ ගෙදර එන්නකො.. එතකොට අපිට ටිකක් කතා කරන්න පුළුවන්. දැන් බෙල් කරාවි.. මං යන්නම් එහෙනම්..'' ඇය මගේ දෝත මිරිකා යන්නට ගියාය.

මම ඇය යන දෙස කඳුළු අතරින් බලා සිටියෙමි. ඇය නොපෙනී ගිය පසු මම පන්තියට ගියෙමි.

එතැන් සිට පාසලේ ඉතිරි කාලය ගෙවුණේ අතීත සිහින මැද්දැවේය.

පාසලේ නිමාවෙන තත්පරයේදී අනෝජා මවෙත නැඹුරු වූවාය.

''හාෂි අද ක්ලාස් යමං..''



Scanned by CamScanner

''මට බෑ..'' මම අකීකරු හඬින් කීමි.

''මේ බලපන්.. පිස්සු නටන්න විතරක් එපා.. ෂෙහාන් මත්තෙම උඹ උඹේ අනාගතයත් පූජා කරන්නද හදන්නෙ..?'' ඇය මදෙස එක එල්ලේ බලමින් ඇසුවාය.

''අනෝජා.. අම්ම ළඟට මං මේ ලෝකෙ ආදරේ කළේ එකම එක්කෙනෙකුට විතරයි.. මං ඉපදුණේ අම්මගෙන්. මං ජීවත් වුණේ ෂෙහාන්ගෙන්. ෂෙහාන් නැති ජීවිතේ, මට අනාගතයක් නෑ අනෝජා..'' මම දැඩිව තිරව කියා සිටියෙමි.

''උඹ නම් කවදාවත් හැදෙන කෙනෙක් නෙමේ. හරිම අකීකරු මුරණ්ඩු හිතුවක්කාරියක්..'' අනෝජාගේ චෝදනාවෙන් මම වියරු වීමි.

''අනෝජා මං හිතුවක්කාරයි, අකීකරුයි, මුරණ්ඩුයි. ලෝකෙට ම පේන්නෙ මාව ඒ වගේ.. ඒ වුණත් කාටවත් පේන්නැති මගෙ අඬන හිත මට හරි අහිංසකයි. උඹලට විතරක් නෙමෙයි, කාටවත් ඒ හිත තේරෙන්නෙ නෑ. ඇයි ඉතින් උඹල ඒ වගේ අකීකරු, මුරණ්ඩු, හිතුවක්කාරියක් එක්ක යාලු වුණේ? උඹල ඔක්කොම මාව දාලා පලයල්ල. කමක් නෑ මට කවුරුවත් ඕන් නෑ..'' මා මුවින් අවසාන වදන් පෙළ කියවද්දී මට හැඬිණ. වහා ඩෙස්කුව මත තිබූ පොත් ටික ගත් මම පන්තියෙන් දිව ගියෙමි.

''භාෂිණී... භාෂිණී.. ඔහොම ඉන්න..'' අනෝජාගේත්, දීප්තිගේත් කටහඬවල් මට පිටුපසින් ඇසිණ. මම ඒ හඬවල් නෑසුණ සේ දිව ගියෙමි. මට අවශ්‍යව තිබුණේ සියල්ලන්ගෙන්ම මිදී සිටින්නටය.

සුව නොවනා හිත් තුවාලය බෙහෙවින් පෑරී තිබිණ.

මම පාසලෙන් පිටව කොටු දොරකඩ දෙසට වේගයෙන් පියමං කළෙමි. කොටු දොරකඩ පසු කරත්ම සැනින් මනෙත දිව ගොස් නැවතුණේ ගාලු නගර සභා ක්‍රීඩාංගණ තණ තිල්ලෙහිය. මහිත ගිහි වැදිණ.





වම් පසින් නැගෙන මුහුදේ හෝ රාවය සේ මහිත විලාප නගමින් තිබෙනු මට දැනෙමින් තිබිණ. මම දැඩි ආයාසයෙන් විලාපීය හිත හංගා ගැනීමට උත්සාහ ගනිමින් ගාලු බස් නැවතුමේ මාපලගම කිව් එකට පැමිණියෙමි. මා එන්නට විනාඩියකට දෙකකට පමණ පෙර පාසල් බස් රිය පිටව ගොස් තිබූ බැවින් බසයක් එනතුරු මට බලා සිටින්නට සිදුවිය.

ටික වේලාවකට පසු මට පිටුපසින් කොල්ලන් රැනකගේ දඟකාර සිනා හඬ ඇසිණ. මම පිටුපස හැරී බැලීමි. දෙවියනි, මහින්දියන් කැලක්. එහෙත් ඔවුනතර මා හඳුනන කිසිවෙක් නොවීය. ඔවුන් මා පසුකර නොපෙනී යන තෙක් මම ඔහේ බලා සිටියෙමි.

මගේ නෙත් සර බිඳලමින් බසයක් පැමිණියෙන් මම ඊට නැග ගතිමි. නිවස වෙත යාමේ කිසිදු ප්‍රිය මනාපත්වයක් නොවූවද වෙන යා යුතු තැනක් නොවූ හෙයින්ද මම ගෙදර ගියෙමි.

කුඩම්මා පමණක් නිවසෙහි හිඳින බැව් මට වැටහිණ. මම හඬ නොනැගෙන සේ කාමරයට වැදීමට සමත් වීමි.

මා ඇඳුම් මාරු කර ගන්නා අතරතුර කාරය පණ ගැන්වී සෙමින් ඉදිරියට ඇදෙනු මට ඇසිණ. කුඩම්මා කොහේ හෝ යන්නට ඇතැයි මට සිතිණ. මම සෙමින් සෙමින් කුස්සියට ආවෙමි.

කුසගින්න නොදැනුණ ද මම බත් බෙදාගෙන කෑවෙමි. කෑම කෑ විගස මට නිදිමත දැනුණ බැවින් මම යහනට වැටී නිදා ගතිමි.

අවදි වෙන්නට ආසන්න අඩ නින්දේදී මම කාගෙදෝ සෙලවීමකින් නෙත් හැර බැලීමි. මා අසල සිනාසෙමින් බලා සිටියේ සුභාෂ් අයියාය.

''හොඳ නින්ද..'' ඔහු කීය.

මම අඩ සිනාවක් පෑමි.

''දැන් වෙලාව කීයද දන්නවද..?'' ඔහු මගෙන් විමසීය.

''කීයද..?'' මම ද ඇසීමි.



Scanned by CamScanner

''කීයද..? හතරයි. මං ෂෙහාන්ව මීට් වුණා.. නැගිටල එන්න විස්තර කියන්න..'' සුභාෂ් අයියාගේ ඒ කතාවත් සමග මා යහනෙන් නැගිට්ටා නොව ඉබේ නැගිට්ටවිණි.

මම සුභාෂ් අයියා පිටුපසින් කාමරයෙන් පිටතට ආවෙමි. සුභාෂ් අයියා ගොස් ආලින්දයේ පුටුවක වාඩි වී ඊට ඉදිරි පුටුවේ වාඩි වන සේ මට සන් කළේය. මම අසුන් ගතිමි.

''මම ෂෙහාන්ව මීට් වුණා..''

''ඉතිං මොකද කිව්වෙ..? අනේ කියන්න සුභාෂ් අයියෙ ප්ලීස්..'' මම ඔහුට පින්සෙන්ඩු වීමි.

''ඔයත් වෙලාවකට කරන්නෙ සීරියස් වැඩ..'' ඔහු කීය.

''ඇයි..?''

''ඇයි කියන්නෙ.. ඔයා යවපු ලෙටර් එක ෂෙහාන්ට ලැබිල තියෙන්නෙ අද දවල් ගෙදර ආව වෙලාවෙ.. ෂෙහාන් ඒක කියවලා පිස්සු නටන්න හදනකොට තමයි වෙලාවට මම ගියේ..''

''ඉතින්..'' මම ඔහුගේ විස්තරය අසාලන්නට නොඉවසිල්ලෙන් බලා හුනිමි.

''ෂෙහාන් මාව දැක්ක විතරයි කෑ ගහගෙන මගේ ඇඟේ එල්ලුණා. එයාගෙ අතේ තිබුණු ලෙටර් එකෙන් ම මම දැන ගත්ත වෙලා තියෙන්නෙ මොකද්ද කියලා. මම එයාට හැම දෙයක්ම පැහැදිලි කරල දුන්නා. ඔයා දන්නවද ෂෙහාන්ගෙ හිතට සැකයක් දීල ඔය දෙන්නව තරහ කෙරෙව්වෙ කවුද කියලා..?''

''නෑ..'' මම විස්මයෙන් කීමි.

''තමාලි..''

''තමාලි.. ඒ කොහොමද..?''

''තමාලි මාත් එක්ක යාලු වෙන්න දඟලුවනෙ. ඒක බැරි වෙනකොට එයා හිතුවා ඔයාගෙයි මගෙයි මොකක් හරි සම්බන්ධකමක් තියෙනවා





ඒකයි මම එයාට අකැමැති කියලා. කොහොම හරි එයාට දැන ගන්න ලැබිල තියෙනවා ෂෙහාන් එක්ක ඔයාගෙ එෆෙයාර් එකක් තියෙනවා කියලා. ඔය දෙන්නම කොහොමටත් කොලේජ්වල ජනප්‍රිය නිසා ඔය වගේ එෆෙයාර් එකක් රහසක් කරන්න බෑ නංගී..''

''ඉතින් කොහොම හරි ඔයා බිග් මැච් එකට නොගිය දවසෙ තමාලි ඒ ගැන කියලා අපි දෙන්නව සම්බන්ධ කරලා ෂෙහාන්ට මහ ජරා ලෙටර් එකක් යවලා. ඊට පස්සෙ තමයි ඉතිං ඔය සේරම..''

මට එකී කතාව අදහාගත නොහැකි තරම්ය. තමාලි එවන් දූර්වල වැඩක් කරාවි යැයි මම සිහිනෙකිනිදු නොසිතුවෙමි.

''දැන් ඔය ගැන කල්පනා කරල වැඩක් නෑ. ඔයා දැන් මගෙ කාමරේට ගිහින් බලන්න ඉන්නෙ කවුද කියලා..'' ඔහුගේ කතාව වටහාගත නොහැකිව මම ඔහු දෙස බැලීමි.

''ගිහින් බලන්න..'' ඔහු යළිත් කියද්දී මම සුභාෂ් අයියාගේ කාමරය අබියසට ගොස් දොර තිරය මෑත් කළෙමි.

දෙවියනේ.. මා දකින්නේ සිහිනයක්දැයි මට එක්වරම සිතිණි.

මම ගල් ගැසී ඔහුගේ දෑස දෙස මොහොතක් බලා සිටියෙමි. එකී දෑසෙහි ආදරණීයම බැල්මක් ඇඳෙද්දී, මුවග සුපෙම්බර සිනාවක් නැගෙද්දී මම වශීකෘතවී බලා සිටියෙමි. ඔහු දෝත පෑවේය. මම දෙවරක් නොසිතාම ඔහුගේ තුරුලට පැන ගතිමි.

ඒ තුරුලෙහි සැතපෙන්නට අනේක වාරයක් පාරමී පිරූ මම එකී මොහොත දරා ගැන්මට නොහැකිව ඉකි ගසා හඬා වැළපෙන්නට වීමි. ඔහු වමත මගේ ඉණ වටා යවා තව තවත් ඔහුගේ සිරුරට තද කොට ගනිමින් සුරතින් මගේ පිට සෙමින් සෙමෙන් පිරිමැද්දේය.

''අඬන්නෙපා බට්ටි..'' දිගු කලකට පසු ඔහුගේ ආදරණීයැති හඬ අසන්නට මට ලැබිණි.

මම ඔහුගේ කමිසයෙහි ඉදිරිපස බොත්තමක් සපමින් හැඬුම වළකා



Scanned by CamScanner

ගන්නට දැඩි උත්සාහයක් ගනිමින් සිටියෙමි. එහෙත් දිගු කාලයක සිට මහදෙහි සිරව තිබූ වේදනාව පිටාර ගලා යනු වළකාලන්නට මම සමත් නොවීමි.

"ෂෙහාන්.." හඬා වැටෙනා අතරතුරේදීම කොඳුරා ගන්නට මම සමත් වීමි.

"බට්ටියෙ මට සමා වෙන්න.. මේ හැම දේකටම මුල මගෙ වැරද්ද.." ෂෙහාන් බිඳුණු හඬින් කීය.

"එපා ෂෙහාන්.. කවම කවදාවත් ඔයා මගෙන් සමාව ඉල්ලන්නෙපා.."

"ඇයි බට්ටි ඔයා එහෙම කියන්නෙ..? කියන්න ඔයා මාත් එක්ක තරහයි නේද..?" ෂෙහාන් මගේ වත දෝතින්ම ඔහු දෙසට හරවා ගනිමින් ඇසීය.

"නෑ ෂෙහාන් මං කවද කවදාවත් ඔයත්තෙක්ක තරහෙන් හිටියෙ නෑ.. ඔයානෙ මාත්තෙක්ක තරහෙන් හිටියෙ.." මම දැඩි සෙනෙහසින් ඔහු දෙස බලමින් කීවෙමි.

"ඇත්ත බට්ටියෙ.. ඇත්ත මට ඔයත්තෙක්ක ගොඩාක් දේවල් කතා කරන්න තියෙනවා. කොහොමද අපි හමුවෙන්නෙ..?" ඔහු මගෙන් ඇසීය. මට ද ඔහු සමග කතා කරන්නට බොහෝ දෑ තිබිණ. එසේ හමු වෙන්නට ඉඩ කඩක්? මට සිතාගත නොහැක. සෙනසුරාදා උදාවන තුරු සිටින්නට තරම් ඉවසිලි සිතක් මට නොමැත.

"ෂෙහාන් හෙට අපි කොලේජ් නොගිහින් ඉමු.." මම කීමි.

"එපා බට්ටී.. මට වැඩිය ඔයාටයි කොලේජ් නොගියාම පාඩු.." ෂෙහාන් කීය.

"මොකක්ද ෂෙහාන්.. හෙට විතරනෙ.." මම නෙතඟින් ඔහු දෙස බලමින් කීවෙමි. ෂෙහාන් මොහොතක් කල්පනා කළේය.

"මං නම් කොහොමටත් කැමති නෑ බට්ටි, කොලේජ් නොගිහින්





ඉන්නවට. ඒත් සෙනසුරාදාවක් එන්න තව දවස් කීයක් තියෙනවද නේද..?"

"ඔව් ෂෙහාන් මට ඔයත්තෙක්ක කතා කරනකං ඉවසිල්ලක් නෑ දෙයියනේ.. කොච්චර දේවල් තියෙනවද මගේ හිතේ ඔයාට කියාගන්න.." මා කියද්දී ඔහු දුක්බර ලෙස සිනාසිණි.

"එහෙනම් හෙට උදේ අටට අම්බලන්ගොඩ කිව් එකේදි හොඳ ද..?"

"හා.." මම සතුටින් කීවෙමි.

"බට්ටි යමු එළියට සුභාෂ් තනියම.."

"අනේ ෂෙහාන්.. තව චුට්ටක් ඉමුකො.." මම ඇසෙන නෑසෙන හඬින් කීවෙමි.

එසැනින් ඔහු උමතුවෙන් මෙන් මා සිප ගන්නට විය. මට ඔහුගේ සෙනෙහසෙහි සැඟවෙන්නට ඇවැසි විය. ඔහුගෙන් ලිහිලක් ලත් සැනින් මම ඔහුගේ වත මදෙසට හරවා ගතිමි. අඩවන් දෙනෙත් යුගෙහි රැඳුන, ආදරය, ආශාව කැටිකර ගත් පෙර බැල්ම යළිත් ඔහු කෙරෙන් මම දුටිමි.

"ෂෙහාන්.." ඔහු ගෙල වටා දෝත යවාගත් මම හිස ඇල කොට ගෙන ඔහු දෙස බැලීමි.

"ඇයි බට්ටි..?"

"කොච්චර කාලෙකට පස්සෙද මේ..?" අසමින් මම ඔහුව සිප ගතිමි.

"සුවඳයි ඔයා ළඟ.."

"ගොඩාක්.."

"ඔව්.."

"පිස්සි.. මගෙ ළඟ දාඩිය.."



Scanned by CamScanner

''නෑ.. මට සුවඳනෙ..''

''මගේ හදවතේ සුවඳ අඳුරන්නෙ ඔයා විතරයි බට්ටි..'' ෂෙහාන්ගේ එකී වදන් පෙළත් සමග මට සුබෝධිනි සිහිවිය. මගේ මුහුණින් සිනාව මැකී යනු මටම දැනිණි. ෂෙහාන්ට මගේ වෙනස දැනිණි.

''ඇයි..?'' ඔහු මගෙන් ඇසීය.

''ඔයාගෙ සුවඳ මං විතරයි අඳුරන්නෙ කියලා ඔයා කියන්නෙ ඇත්තමද..?''

''ඔව් බට්ටි. ඇයි එහෙම ඇහුවෙ..?''

''එතකොට සුබෝධිනී..?'' මම ඇසීමි. මගේ එකී පැනයත් සමග ෂෙහාන් දිගු සුසුමක් හෙලුවේය.

''මං ඒ හැම දෙයක්ම ඔයාට, හෙට හමුවුණාම කියන්නම්කො බට්ටි..''

''අපි යමු එළියට..'' මම කීවෙමි. අපි දෙදෙනා සුභාෂ් අයියාගේ කාමරයෙන් එළියට ආවෙමු.

''අද එයි ද කියලා සැකෙන් මං හිටියෙ..'' සුභාෂ් අයියා සිනාසෙමින් කීව ද ඒ සිනාවට යටින් කිසියම් සෝබර බවක් වෙතැයි මට සිතිණි. සත්තකින්ම සුභාෂ් අයියා මට ආදරය කළ බව මම දැන සිටියෙමි. දැන් ඔහු එකී ආදරය සහෝදර ප්‍රේමයකට හරවා ගන්නට දැඩි ආයාසයක් දරන බැව් මට රහසක් නොවිණ.

''ඉතින් දැන් දෙන්නගෙ ප්‍රශ්න ඉවරනෙ..'' සුභාෂ් අයියා යළිත් කීවේය.

''සුභාෂ්ට මං කොහොම තැන්ක්ස් කරන්නද කියලා මටම තේරෙන්නෙ නෑ..'' ෂෙහාන්, සුභාෂ් අයියාගේ අත අල්ලා ගනිමින් කීවේය.

''ඒක සුළු දෙයක් ෂෙහාන්.. ඔය දෙන්න කල්පනාවෙන් වැඩ කරන්න..'' සුභාෂ් අයියා අවවාදානුරූපීව කීවේය.





එක්වරම ඇසුණ කාරයක ශබ්දයෙක් මම තිගැස්සී ගියෙමි. තත්පරයක් ගත වෙන්නටත් පෙර නැවතුණ රියෙන් බිමට බට අය දුටු මම වෙව්ලා ගියෙමි.

''සුභාෂ් අයියා..'' මම ඇඬුම් ස්වරයෙන් සුභාෂ් අයියා දෙස බැලීමි.

''ඔයා කලබල නොවී ඔහොම ඉන්න නංගී..'' සුභාෂ් අයියා සෙමින් කීවේය. ෂෙහාන් ද වගකට නැති සේ සිටියේය. එහෙත් මම බෙහෙවින් කලබල වී සිටියෙමි.

කුඩම්මා නොපහන් දැසින් යුතුව අප හුන් තැනට ආවාය.

''කවුද සුභාෂ් පුතා මේ..?'' කුඩම්මා අඩ සිනාවක් පාමින් ඇසුවාය.

''මගෙ යාළුවෙක්..'' සුභාෂ් අයියා එසේ කියද්දි මහිතට කිසියම් සහනයක සේයා දැනිණි.

''ඇත්තද බොන්න මොනාත් දුන්නෙ නැද්ද පුතා..?'' කුඩම්මා කාරුණිකව ඇසුවාය. සත්තකින්ම ඇය නපුරු ගැහැණියක යැයි නිවසට පැමිණෙන අමුත්තෙකුට කිසිදු විටෙක වටහා ගත නොහැක.

''තාම නෑ..'' සුභාෂ් අයියා කීවේය.

''ඉන්න මං බොන්න මොනව හරි ගේන්නම්..'' එසේ කියමින් කුඩම්මා මා අසල නැවතිණි.

''භාෂිණී මොකද මෙතන කරන්නෙ..?'' ඇගේ තරමක් වේගවත් වදන් හමුවේ මා අසරණ විය. මම තවත් එක'මෙක වරක් ෂෙහාන් දෙස බලා ගෙතුළට ගියෙමි.

''ඕන දේකට ඉස්සරහට පැනගෙන ඇති මීට. පස්සෙ පලයන්කො බලන්න..'' මා පසුපස පැමිණි කුඩම්මා මා මගේ කාමරයට හැරෙන්න ඔන්න මෙන්න තිබියදී කීවාය. මම නිහඬවම කාමරයට වැදී ෂෙහාන්ලාගේ කතාවට සවන් පෑමට උත්සාහ ගතිමි. එහෙත් ඔවුන් කී කිසිවක් මට පැහැදිලිව නොඇසිණි.

තවත් පෑ කාලකට පමණ පසුව මට සුභාෂ් අයියාගේ යතුරු පැදිය

පණ ගැන්වෙනු ඇසිණ. මම ජනෙල් කවුළුව අතරින් එබී බැලීමි. සුභාෂ් අයියාත්, ෂෙහානුත් යතුරු පැදියේ නැගී පිටව යනු මම බලා සිටියෙමි.

මහිතෙහි සුභාෂ් අයියා කෙරෙහි සානුකම්පිත හැඟීමක් ඇති වෙමින් තිබිණ. මම දිගු සුසුමක් හෙළා හිත සැහැල්ලු කර ගන්නට උත්සාහ කළෙමි.

පසුදා උදෑසනින්ම අවදි වුණ මම ෂෙහාන් ආසා කළ ඇඳුමකින් සැරසුණෙමි. ෂෙහාන්ට දෙන්නයි මේරි නැන්දා දී තිබූ ලිපිය මට සිහිවිණ. මම එය සොයා අතට ගතිමි. අවසානයේදී මම මගේ හදවත හැඩැති කැඩපතට එබුණෙමි. මගේ දෑස තුටින් දිලෙමින් තිබෙනු මටම පෙනිණි.

නිවසින් පිටවූ මම පාරට පැමිණියෙමි. ටික වේලාවකට පසුව පැමිණි බසයකට මම නැග ගතිමි. බසය ගාල්ලට පැමිණෙන විට හත හමාරට පමණ ඇත. මම අම්බලන්ගොඩ කිව් එක අසලට ගියෙමි. දිගු කලෙකට පසුව ලැබෙන අසිරිමත් මොහොත එළඹෙන තුරු මම නොඉවසිලිමත්ව සිටියෙමි. හදවත කුමක්දෝ හැඟීමකින් ගැහෙමින් තිබිණ.

අන්තිමේදී ඒ රුව මම දුටිමි. මම මුව පුරා විසිර ගිය සිනාවෙන් යුතුව බලා සිටීමි.

''ගුඩ් මෝර්නින්.. බට්ටි..'' ෂෙහාන් කීය.

''ම්.. කොහෙද යන්නෙ? ස්කුල් ඩේ එකක් නිසා මේ හරියෙ ඉන්න එක නම් භයානකයි..''

''ඔයා ම තීරණය කරන්න ෂෙහාන්..''

''එහෙනම් යමු..'' මම යන්නේ කොහේදැයි නොඅසාම ඔහු අසලින් එක පෙළට වැටුණෙමි.

අපි ගාල්ල දුම්රිය නැවතුම් පොළ තුළට පැමිණියෙමු.





''අටයි පනස් තුනට මාතර ට්‍රේන් එකක් තියෙනවා යමු..'' දුම්රිය කාල සටහන බැලූ ෂෙහාන් කීවේය. ඔහු ටිකට් ගත්තේය. අපි දුම්රිය අංගනයට ඇතුල් වීමු. සතියේ දිනක් වූ බැවින් මෙහි එතරම් සෙනඟක් නැත. දුම්රියට තවත් පැය භාගයක් පමණ තිබිණි.

''බට්ටි මොනා හරි බීලම යමු..''

මම නිහඬවම ඔහුට එකඟ වීමි. අපි දුම්රිය අංගනයෙහි වූ ආපන ශාලාවට ඇතුල් වීමු. ශීත කළ චොකලට් කිරි බඳුන් දෙකක් ෂෙහාන් ගෙන්නුවේය. අපි කිසිදු කතාවක් බහක් නොමැතිව එය බීවෙමු. එහෙත් සිත් සතන් තුළ පොර බදන දහසක් දෑ එකිනෙකාට කියා ගන්නට අපට ඇවැසිව තිබිණ.

තවත් ටික වෙලාවක් ආපන ශාලාව තුළ සිටි අපි දුම්රියට මිනිත්තු පහක් තිබියදි ඉන් එළියට ආවෙමු.

මාතර බලා යන 'ගාලු කුමාරි' දුම්රිය පැමිණි විට අපි හිස් පෙට්ටියක් තෝරා නැග ගතිමු.

''ඉතිං බට්ටි..'' ෂෙහාන් අසුන් ගත් විගස මා ඔහු දෙසට හරවා ගනිමින් ඇසීය.

''ඉතිං.. ඔයාම පටන් ගන්න ෂෙහාන්..''

''ඊට ඉස්සෙල්ල තව ටිකක් මෙහාට ළංවෙන්න..''

''මට බෑ..'' මම දඟ හඬින් කීමි.

''අනේ රහසක් කියන්න..'' ෂෙහාන් ඇවිටිලි හඬින් කීවේය.

''හැබැයි රහස විතරයි හොඳද..?'' එසේ කියමින් නැගිට ඔහුගේ උරහිසෙහි හැපෙමින් අසුන් ගතිමි. ඔහු එකවර ම මගේ වම් කණ සිප ගත්තේය.

''ඊයි හරි නරකයි.. ඔයා රහසක් කියනව කියලනෙ කිව්වෙ..'' මම හිස ඇලකොට අව්හිංසක හඬින් කීවෙමි.

''ඒක තමයි රහස..''

පණ ගැන්වෙනු ඇසිණ. මම ජනෙල් කවුළුව අතරින් එබී බැලීමි. සුභාෂ් අයියාත්, ෂෙහානුත් යතුරු පැදියේ නැගී පිටව යනු මම බලා සිටියෙමි.

මහිතෙහි සුභාෂ් අයියා කෙරෙහි සානුකම්පිත හැඟීමක් ඇති වෙමින් තිබිණ. මම දිගු සුසුමක් හෙළා හිත සැහැල්ලු කර ගන්නට උත්සාහ කළෙමි.

පසුදා උදෑසනින්ම අවදි වුණ මම ෂෙහාන් ආසා කළ ඇඳුමකින් සැරසුණෙමි. ෂෙහාන්ට දෙන්නයි මේරි නැන්දා දී තිබූ ලිපිය මට සිහිවිණ. මම එය සොයා අතට ගතිමි. අවසානයේදී මම මගේ හදවත හැඩැති කැඩපතට එබුණෙමි. මගේ දෑස තුටින් දිලෙමින් තිබෙනු මටම පෙනිණි.

නිවසින් පිටවූ මම පාරට පැමිණියෙමි. ටික වේලාවකට පසු පැමිණි බසයකට මම නැග ගතිමි. බසය ගාල්ලට පැමිණෙන විට හත හමාරට පමණ ඇත. මම අම්බලන්ගොඩ කිව් එක අසලට ගියෙමි. දිගු කලෙකට පසුව ලැබෙන අසිරිමත් මොහොත එළඹෙන තුරු මම නොඉවසිලිමත්ව සිටියෙමි. හදවත කුමක්දෝ හැඟීමකින් ගැහෙමින් තිබිණ.

අන්තිමේදී ඒ රුව මම දුටිමි. මම මුව පුරා විසිර ගිය සිනාවෙන් යුතුව බලා සිටීමි.

''ගුඩ් මෝර්නින්.. බට්ටි..'' ෂෙහාන් කීය.

''ම්.. කොහෙද යන්නෙ? ස්කූල් ඩේ එකක් නිසා මේ හරියෙ ඉන්න එක නම් භයානකයි..''

''ඔයා ම තීරණය කරන්න ෂෙහාන්..''

''එහෙනම් යමු..'' මම යන්නේ කොහේදැයි නොඅසාම ඔහු අසලින් එක පෙළට වැටුණෙමි.

අපි ගාල්ල දුම්රිය නැවතුම් පොළ තුළට පැමිණියෙමු.





''අටයි පනස් තුනට මාතර ට්‍රේන් එකක් තියෙනවා යමු..'' දුම්රිය කාල සටහන බැලූ ෂෙහාන් කීවේය. ඔහු ටිකට් ගත්තේය. අපි දුම්රිය අංගනයට ඇතුල් වීමු. සතියේ දිනක් වූ බැවින් මෙහි එතරම් සෙනඟක් නැත. දුම්රියට තවත් පැය භාගයක් පමණ තිබිණි.

''බට්ටි මොනා හරි බීලම යමු..''

මම නිහඬවම ඔහුට එකඟ වීමි. අපි දුම්රිය අංගනයෙහි වූ ආපන ශාලාවට ඇතුල් වීමු. ශීත කළ චොකලට් කිරි බඳුන් දෙකක් ෂෙහාන් ගෙන්නුවේය. අපි කිසිදු කතාවක් බහක් නොමැතිව එය බීවෙමු. එහෙත් සිත් සතන් තුළ පොර බදන දහසක් දෑ එකිනෙකාට කියා ගන්නට අපට ඇවැසිව තිබිණ.

තවත් ටික වෙලාවක් ආපන ශාලාව තුළ සිටි අපි දුම්රියට මිනිත්තු පහක් තිබියදි ඉන් එළියට ආවෙමු.

මාතර බලා යන 'ගාලු කුමාරි' දුම්රිය පැමිණි විට අපි හිස් පෙට්ටියක් තෝරා නැග ගතිමු.

''ඉතිං බට්ටි..'' ෂෙහාන් අසුන් ගත් විගස මා ඔහු දෙසට හරවා ගනිමින් ඇසීය.

''ඉතිං.. ඔයාම පටන් ගන්න ෂෙහාන්..''

''ඊට ඉස්සෙල්ල තව ටිකක් මෙහාට ළංවෙන්න..''

''මට බෑ..'' මම දඟ හඬින් කීමි.

''අනේ රහසක් කියන්න..'' ෂෙහාන් ඇවිටිලි හඬින් කීවේය.

''හැබැයි රහස විතරයි හොඳද..?'' එසේ කියමින් නැගිට ඔහුගේ උරහිසෙහි හැපෙමින් අසුන් ගතිමි. ඔහු එකවර ම මගේ වම් කණ සිප ගත්තේය.

''ඒයි හරි නරකයි.. ඔයා රහසක් කියනව කියලනෙ කිව්වෙ..'' මම හිස ඇලකොට අවිහිංසක හඬින් කීවෙමි.

''ඒක තමයි රහස..''

''ඕක රහසක් යැ..''

''එන්න එපා ඕවට මාත්තෙක්ක.. ඕවට ගිහින් සුබෝධිනීව අල්ලා ගන්න..'' මම ඔහුගේ දුබල තැනක් අල්ලා සියුම් පහරක් එල්ල කළෙමි. සැනින් ඔහුගේ වත මැලව ගියේය. සිහින් දුකක් මහිතෙහි ඉපදුන ද සුබෝධිනී නම් යුවතිය කෙරේ වැඩුණ තරහින් මම මිරිකී සිටියෙමි.

''මං ඔයාට මොන තරම් ආදරේ කළා ද ෂෙහාන්? ඔයිට වැඩිය ප්‍රශ්න ඇති වෙන්න ඕන තැන්වලදී අපි ආදරෙන් කතා බහ කරල ඒව විසඳ ගත්ත නේද? අම්මා තාත්තා නැති, කාත් කවුරුවත් නැති මං වගේ කාලකණ්ණි අසරණියක් ඔය තරම් ඉක්මනට ඔයාට එපා වුණාද ෂෙහාන්?''

''බට්ටි..'' යි ෂෙහාන් වියරුවෙන් මෙන් කෑගැසීය.

''ඔය විදියට මට රිද්දල මගෙන් පලි ගන්න එපා එපා බට්ටි..'' ෂෙහාන් ඉවත බලාගෙන කීවේය.

''මම ද රිද්දුවෙ..? මම ද පලි ගත්තෙ ෂෙහාන්? ඒක කියන්න මට.. පසුගිය කාලෙ ඔයාට අමතක වෙන්න විදිහක් නැනෙ..'' මම තවදුරටත් ඔහුට රිදවන සිතින් කීවෙමි. ගැහැණියක පිරිමියෙකු රිදවූ කල ඔහුගේ සියුම් තැන් බලමින් පහර එල්ල කිරීම ගැහැණියකගේ සිරිතකැයි මම කොහේදෝ තිබී කියවා ඇත්තෙමි. ගැහැණියකට වඩා පිරිමියෙකුට එවන් රිදවීමක් විඳවා ගැනීමට අපහසු බව මම දැන සිටියෙමි.

''බට්ටි ඔයාට ඕන මාත් එක්ක රණ්ඩු වෙන්නද..?''

''නෑ.. රණ්ඩු ඕන වෙලාවල් තිබුණ ෂෙහාන්. ඒත් මම ඒ වෙලාවල් වලටත් රණ්ඩු වුණේ නැත්නම් දූන් ද රණ්ඩු වෙන්නෙ? රණ්ඩු වෙලාවත්, පොර කාලවත්, තරඟ කරලවත් මට කිසි දෙයක් බලෙන් ගන්න ඕන කමක් නෑ ෂෙහාන්. විශේෂයෙන්ම ආදරය වගේ දෙයක් උදුර ගන්නවත්, ඒ වෙනුවෙන් රණ්ඩු වෙන්නවත් මට ඕන නෑ ෂෙහාන්..'' මම එක දිගටම කියාගෙන කියාගෙන ගියෙමි. ෂෙහාන් දිගු සුසුමක් හෙළනු මට ඇසිණි. මම දුම්රිය කවුළුවෙන් පිටත





බලාගෙන සිටියෙමි. දුම්රිය හබරාදූව පසු කරමින් තිබිණි.

බොහෝ වේලාවක් අප දෙදෙනා අතර කිසිදු කතා බහක් නොවීම ගෙවී ගියේය. මම ෂෙහාන් දෙස හැරී බැලීමි. ඔහුගේ නෙතු අග කඳුළක් දිලෙමින් තිබෙනු සැනින් මගේ නෙතට හසුවිණ. මහිත කම්පිත විණි. පිරිමියෙකුගේ ඇසකින් වැටෙන කඳුළක් ගැහැණියකට බරක්මය. මෙතරම් වෙලාවක් මා කියූ දේවල් පිළිබඳව මටම දුක සිතිණ.

''ෂෙහාන්..'' මම ඔහුගේ උරහිසට සුරත තබා ඇමතීමි. එහෙත් ඔහු කිසිවක් නොකීවේය. ඒ සමගම කිසියම් ගී රාවයක් මට ඇසිණ. ඩොලැක්කියක් ගත් තරුණයෙකුත්, සර්පිනාවක් ගත් තරුණයෙකුත් අප හුන් දුම්රිය මැදිරියෙහි බිම වාඩි වී කරුණාරත්න දිවුල්ගනයන්ගේ මා ආසම කළ, මා නිතරම හඬවාලූ අර ගීතය ගයන්නට වූහ.

ඇසට අසුවන මායිමේ
බඹර සැණකෙළි මල් විලේ
ලසෝ ලැව් ගිනි ඇවිලුණා සිත
ඔබ මගෙන් වෙන් වූ දිනේ..//

සිය පතක් මත විසුල පිනි කැට
සැඩ සුළං වැද සර සරින් ගෙන
මගෙන් රිදවී ගෙවුණ මොහොතක
ඔබේ වත මට නැගේ සිහියට..

ඇසට අසුවන මායිමේ...

සතර අත පෙති විහිද විකසිත



Scanned by CamScanner

මලේ මල් මී බඹනයුරු දැක //
ඔබේ ලවනත සැදුණ මී විත
මත් කළා මනකයි මගේ හිත..

ගීතය ඇසෙද්දීම මට හැඬිණ. එහෙත් හැඬුම ෂෙහාන්ට නොඇසෙන්නට මම වග බලා ගතිමි. එහෙත් ගීයේ ඉතිරි පද ඇසෙද්දී මට මාව ම පාලනය කර ගන්නට නොහැකි විය. මම ෂෙහාන්ගේ උකුලට වැටී හඬන්නට වූයෙමි.

''බට්ටි..'' යි කියමින් ෂෙහාන් මහිස සෙමෙන් පිරිමැදීය. එහෙත් හිස නොව මට අවශ්‍යව තිබුණේ හිත පිරිමද්දා ගැන්මටය.

''මං දන්නව බට්ටි ඔයාට, ඔය සින්දුව අහන් ඉන්න අමාරුයි කියලා. හිතේ වේදනාවට පිස්සි වගේ කියෙව්වට මං ඕව ගැන ඒ තරම් දුරට හිතන්නෙ නෑ බට්ටි..''

මම බොහෝ වේලා හැඬුවෙමි. අවසානයේදී මම හඬා රතු වූ දෑස ඔහු වෙතට හැරවූයෙමි.

''කියන්න ෂෙහාන්.. හැම දෙයක්ම මට කියන්න.. තවත් මට ඉවසගෙන ඉන්න බෑ ෂෙහාන්..'' මම ඉකි ගසමින් කීවෙමි.

ෂෙහාන් ඒ අමිහිරි කතාවට මුල පිරීය.

''ඔයා එදා බිග්මැච් එකට එනකම් මං මඟ බලාගෙන හිටියෙ. ඔයා ආවෙ නැති වුණාම මට හිතුණ මොකක් හරි කරදරයක් වෙලා කියලා. ඊත් දෙවැනි දවසෙ උදේම මට ක්‍රිෂාන්ත ලියුමක් ගෙනත් දුන්නා මෙන්න කවුද කෙල්ලෙක් මේක උඹට දෙන්න කිව්වා කියලා. ඒ ලියුමෙ තිබුණෙ ඔයයි සුභාෂ් අයියයි අතරෙ තිබුණ එෆෙයාර් එකක් ගැන විස්තර. ඒ මදිවට බිග් මැච් එක දවසෙ ඔයයි සුභාෂ් අයියයි ගෙදර කාමරේට වෙලා කතා කර කර හිටියා කියලා ඒ ලියුමෙ තිබුණා. ඒක කියෙව්වට පස්සෙ බට්ටි මට ඔයා ගැන





අවිශ්වාසෙකට වැඩිය මට දැනුණෙ ඔයා ආවෙ නැති එකේ තරහ. ඒකයි එදා මං අර විදිහට හැසිරුණේ..''

''සුබෝධිනීව මං අඳුර ගත්තෙ මැච් එක පටන් ගන්න ඔන්න මෙන්න කියලා තියෙද්දි ඇවිල්ල විෂ් කරනකොට. ඊට පස්සෙ හැම වෙලාවෙම වගේ ඒ ගර්ල් ඇවිත් මාත්තෙක්ක කතා කළා. ඒ වෙලාව ඇත්තටම මටත් ඕනැ වෙලා තිබුණෙ ඔයාට රිද්දන්නනෙ. මාත් සුබෝධිනී එක්ක හොඳට කතා කළා.

ඔයා දන්නවද ඊට පස්සෙ මොකද වුණේ කියලා..?'' ෂෙහාන් මවෙතින් ඇසීය.

''මං දන්නෙ කොහොමද..?'' මම තරහින් මෙන් කීවෙමි.

''අම්මෝ මෙයාට යන තරහ. ඔක්කොම කියන්නම් අහගෙන ඉන්න. ඉතින් ඊට සතියකට විතර පස්සෙ මට ඒ කෙල්ලගෙන් ලියුමක් ආව..'' ෂෙහාන් කීවේය.

''මම ඒක කියෙව්ව..'' මම කීවෙමි.

''ඒ කොහොමද..?'' ඔහු පුදුමයෙන් මෙන් ඇසීය.

''ඔයාට වැඩක් නැනෙ ඒක..'' මම කීවෙමි.

''බට්ටි ඔය බොරු කියන්නෙ..''

''හරි හරි බොරු, ඔයා ඔයාගෙ කතාව කියන්නකො..'' මම කීවෙමි.

''ඒ ලියුමෙ තිබුණෙ මට සුබෝධිනීව මීට් වෙන්න කියලා..'' ෂෙහාන් එසේ කියා මා දෙස බැලීය.

''ඉතිං ඔයා ගියාද..?''

''පිස්සුද බට්ටි.. ඔයත්තෙක්ක තරහට මං ඒ වෙලාවෙ ඒ කෙල්ලත් එක්ක කතා කළාට ඔය එල්ලි එල්ලි බලෙන් කතාවට එන කෙල්ලන්ට මං කැමති නෑ කියලා ඔයා දන්නවනෙ.. ඉතින් ඊට පස්සේ මං විඳවපු හරිය ඔයාට කියලා වැඩක් නෑ.. ඔයාගෙ ලියුම ලැබුණට පස්සේ තමයි මං කරපු වැඩේ ටූ සීරියස් කියලා තේරුණේ. වෙලාවට



Scanned by CamScanner

සුභාෂ් මාව හොයාගෙන ආවෙ. නැත්නම් ඉතිං මං ගැන කතා කරල වැඩක් නෑ බට්ටියෙ.."

"මං සුබෝධිනී ඔයාට එවපු ලියුම කියෙව්වෙ කොහොමද කියලා දන්නවද..2"

"කොහොමද..?"

"එදා නිශාන්ත අයියලගෙ කඩේට දිලිප් අයිය ඔයාව එක්කන් ආව වෙලාවෙ ඔයා දිලිප් අයියා එක්ක එළියට ගියේ පොත් ටික පුටුව උඩ තියලානෙ. ඒ වෙලාවෙ මං ඔයාගෙ පොත් ටික පෙරලුව. ඒ ලියුම දැක්කම මං කඩාගෙන බිඳගෙන යන්න ගියේ.." මම කීවෙමි.

ෂෙහාන් මදෙස දුක්බර ලෙස බලා සිටිනු මම දකිමි.

"දැන්වත් මාව විශ්වාස කරන්න බට්ටි.." ෂෙහාන් යදින හඬින් කිය.

මම එක එල්ලේ ඔහුගේ තරු දෙනෙත දිහා බලා සිටියෙමි. ආදරය, සෙනෙහස, විශ්වසනීයත්වය එකී නෙත් පත්ලෙහි ඇඳෙමින් තිබිණි.

"ඇයි ඔහොම බලාගෙන ඉන්නෙ?" ෂෙහාන් ඇසීය. මම කිසිත් නොපවසා සිනාවෙන් විකසිත වන්නට පොපියන දෙතොල සිරකොට ගෙන එලෙසින්ම ඔහු දෙස බලා සිටියෙමි.

"ඇයි..?" ඔහු රහසින් මෙන් ඇසීය.

"ලස්සන බැලුවෙ.." මම දඟ හඬින් කීවෙමි.

"ලස්සනද ගොඩාක්..?"

"හ්ම්.. තව නැත්තං.."

"එහෙමද..?"

"ඔව් එහෙම තමා.."

"මං තරහයි.." එසේ කියමින් ෂෙහාන් දෑත බැඳගෙන නෝක්කාඩු බැල්මෙන් ඉදිරිය බලා සිටියේය.





"ෂෙහාන්.." මට ඔහුව කතා කරවන්නට අවැසි විය. එහෙත් ඔහු නිහඬය.

"ඒයි මේ.. ඔයාට කියන්න දෙයක් තියෙනවා.." මම ඔහුගේ වම් අතින් අදිමින් කීවෙමි. එහෙත් ඔහු කතා නැත.

"එපානෙ එහෙනම්..?" මම ඇසුවෙමි. ෂෙහාන් අඩ සිනාවක් පාමින් මවෙත හැරිණ.

"මොකද්ද..?"

"දැන්නම් කියන්නත් වටින්නෑ.. ගණින් ඉස්සුවනෙ මුලදිම.." මම කීවෙමි. ෂෙහාන් සිනාසිණි.

ක්‍රිකට් තරගය නැරඹීමට පැමිණීමට නොහැකි වූ තැන සිට සියලු විස්තර මම ඔහුට පවසා, අවසානයේදී මේරි නැන්දා ඔහුට දෙන්නට තබා ගොස් තිබූ ලිපිය ෂෙහාන්ට දුනිමි.

ෂෙහාන් එය එක හුස්මට කියවා අමුතු බැල්මක් මුහුණට නගා ගත්තේය.

"මොකද ෂෙහාන් කියල තියෙන්නෙ..?" මම ඇසුවෙමි.

"ඔයාව හොඳට බලා ගන්න කියලා.." ඔහු ටික වේලාවක් කල්පනා කරමින් සිට කීවෙමි.

"කෝ දෙන්න මටත් බලන්න.." මම ඉල්ලුවෙමි.

"ඕන නෑ බට්ටි.." එසේ කියමින් ෂෙහාන් ලිපිය කලිසම් සාක්කුවට දමා ගත්තේය.

එකී ලිපියෙහි කුමන හෝ රහසක් ඇතැයි මට නිකමට මෙන් සිතිණ. නොඑසේනම් ෂෙහාන් මට ලිපිය නොපෙන්වා සිටින්නේ නැත. එහෙත් මම ඒ ගැන වැඩිදුර නොඅසන්නට ගියෙමි.

පෙරවරු එකොළහට ආසන්න වෙත්ම අපි මාතරට පැමිණියෙමු. දුම්රියෙන් බැසගත් අපි ගාල්ල, මාතර මාවතේ මාතර අලුත් පාලම ඔස්සේ ආවෙමු.



Scanned by CamScanner

පුංචි ස්නැක් බාර් එකකට ඇතුළු වුණ අපි වයිනිස් රෝල්ස් සහ පෝටෙලෝ බීවෙමු.

“කොහෙද ෂෙහාන් අපි යන්නෙ..?” ස්නැක් බාර් එකෙන් එළියට එද්දී මම ඇසීමි.

“බීච් එකට..” ඔහු කීවේය.

අපි මාතර එස්.කේ. සිනමා හලට ඉදිරිසින් වූ මුහුදු වෙරළ දෙසට ඇවිද ගෙන ගියෙමු.

සෙවනක් බලා හිඳ ගත් අපි කතාවෙන් තොරව රළ ඇළි ගැහෙන නීල සයුරු තෙර දෙස බලා සිටියෙමු.

“ඔයා මොනව හරි හංගනව ෂෙහාන්..” මම වෙනසක ලකුණු දුටු කීවෙමි.

“නෑ බට්ටියෙ එහෙම මොකුත් නෑ. ඒක නෙමේ.. කොහොමද ඔයාගෙ කොලේජ් එකේ වැඩ එහෙම..?”

“ඒව ගැන කතා කරල වැඩක් නෑ ෂෙහාන්..” මම පසුතැවිලි මුසු වූ හඬින් කීවෙමි.

ෂෙහාන් මට බෙහෙවින් අවවාද කළේය.

“තව මාස කීයද බට්ටි එග්සෑම් එකට? මේ ටික කාලෙ විතරනෙ ඔයා මහන්සි වෙන්න ඕනැ..”

මම නිහඬවම ඔහු කියන්න අසා සිටියෙමි.

“ෂෙහාන්.. ඔයා දන්නවනෙ මගේ බලාපොරොත්තු, ආශාවල්, ප්‍රාර්ථනා හැම දෙයක්ම තියෙන්නෙ ඔයාගෙ මත්තෙ කියලා. ඔයා මගෙන් ඈත් වෙනවා කියන්නෙ ඒ හැම දෙයක්ම නැති වුණා කියන එක ෂෙහාන්..” මම අවසානයේදී කීවෙමි.

ෂෙහාන් බොහෝ වේලාවක් නිහඬවම කල්පනා කළේය. එකට පමණ අපි යළිත් මාතර නගරයට පැමිණියෙමු. දහවල් ආහාර ගත් අපි මාතර එස්.කේ. සිනමා ශාලාවට ඇතුළු වූයෙමු. ෂෙහානුත්





මමත් බොහෝ තැන්වල ඇවිද ඇති නමුත් ජීවිතයේ ප්‍රථම වරට අප දෙදෙනා සිනමා හලකට ආ ප්‍රථම අවස්ථාව මෙය විය.

සිනමා හලේ දර්ශනයට නියමිතව තිබුණේ මධු සිහිනය.

“මධුකා.. මධූකා..” ගීතය ශාලාව පුරා විහිද යමින් තිබිණ. අඩ අඳුරේ ෂෙහාන්ගේ තරු දෙනෙත දිළිසෙද්දී මම ඔහුගේ උරහිසට බර වීමි.

“බට්ටි..” ඔහු සෙමින් කොඳුරනු මට යාන්තමට මෙන් ඇසිණ.

මම කිසිත් නොපවසා ඔහුගේ ළමැදෙහි උණුසුම සොයා තුරුළු වීමි.

“හැම දාටම ෂෙහාන් මට මෙහෙම ඉන්න ඉඩ දෙන්න ෂෙහාන්.. ප්ලීස්..” දෙනෙත කඳුළින් පෙඟී යද්දී මම කීවෙමි.

“අඬන්නෙපා බට්ටි.., මං ආයෙ කවදාවත් ඒ විදිහට වෙනස් වෙන්නෙ නෑ..” ෂෙහාන් තිර හඬින් කීය.

මගේ හිස ඇතුළින් සියුම් වේදනාවක් දැනෙමින් තිබුණද මම එය ෂෙහාන්ට නොකීවෙමි.

අප සිනමාහලින් පිට වෙද්දී එකී වේදනාව ටිකෙන් ටික වැඩි වෙමින් තිබිණ. ගාලු බසයකට නැග අසුන් ගත් පසු මම ෂෙහාන්ගේ උරහිසට හිස තබා ගතිමි.

“ඇයි බට්ටි..?”

“මගෙ ඔලුව ඇතුළෙන් හරියට රිදෙනවා ෂෙහාන්..” මම කීවෙමි.

“ඇයි ඒ..?”

ඔහු මගේ හිස අත ගාමින් ඇසීය.

“මන්දා ෂෙහාන්..” මම කෙඳිරිගාමින් කීවෙමි.

ගාල්ලට පැමිණෙද්දී මගේ හිසේ වේදනාව දරාගත නොහැකි තරම් විය. වේදනාව වැඩිකමට මම ක්ලාන්ත වීමි. එතැන් සිට මට

පුංචි ස්නැක් බාර් එකකට ඇතුළු වුණ අපි වයිනීස් රෝල්ස් කා පෝටෙලෝ බීවෙමු.

''කොහෙද ෂෙහාන් අපි යන්නෙ..?'' ස්නැක් බාර් එකෙන් එළියට එද්දී මම ඇසීමි.

''බීච් එකට..'' ඔහු කීවේය.

අපි මාතර එස්.කේ. සිනමා හලට ඉදිරිසින් වූ මුහුදු වෙරළ දෙසට ඇවිද ගෙන ගියෙමු.

සෙවනක් බලා හිඳ ගත් අපි කතාවෙන් තොරව රළ රැළි නඟන නීල සයුරු තෙර දෙස බලා සිටියෙමු.

''ඔයා මොනව හරි හංගනව ෂෙහාන්..'' මම වෙනසක ලකුණු දැක කීවෙමි.

''නෑ බට්ටියෙ එහෙම මොකුත් නෑ. ඒක නෙමේ.. කොහොමද ඔයාගෙ කොලේජ් එකේ වැඩ එහෙම..?''

''ඒව ගැන කතා කරල වැඩක් නෑ ෂෙහාන්..'' මම පසුතැවිල්ල මුසු වූ හඬින් කීවෙමි.

ෂෙහාන් මට බෙහෙවින් අවවාද කළේය.

''නව මාස කීයද බට්ටි එග්සෑම් එකට? මේ ටික කාලෙ විතරනෙ ඔයා මහන්සි වෙන්න ඕනැ..''

මම නිහඬවම ඔහු කියන්න අසා සිටියෙමි.

''ෂෙහාන්.. ඔයා දන්නවනෙ මගේ බලාපොරොත්තු, ආශාවල්, ප්‍රාර්ථනා හැම දෙයක්ම තියෙන්නෙ ඔයාගෙ මත්තෙ කියලා. ඔයා මගෙන් ඈත් වෙනවා කියන්නෙ ඒ හැම දෙයක්ම නැති වුණා කියන එක ෂෙහාන්..'' මම අවසානයේදී කීවෙමි.

ෂෙහාන් බොහෝ වේලාවක් නිහඬවම කල්පනා කළේය. එකට පමණ අපි යළිත් මාතර නගරයට පැමිණියෙමු. දහවල් ආහාර ගත් අපි මාතර එස්.කේ. සිනමා ශාලාවට ඇතුළු වූයෙමු. ෂෙහානුත්





මමත් බොහෝ තැන්වල ඇවිද ඇති නමුත් ජීවිතයේ ප්‍රථම වරට අප දෙදෙනා සිනමා හලකට ආ ප්‍රථම අවස්ථාව මෙය විය.

සිනමා හලේ දර්ශනයට නියමිතව තිබුණේ මධු සිහිනය.

''මධුකා.. මධුකා..'' ගීතය ශාලාව පුරා විහිද යමින් තිබිණ. අඩ අඳුරේ ෂෙහාන්ගේ තරු දෙනෙත දිළිසෙද්දී මම ඔහුගේ උරහිසට බර වීමි.

''බට්ටි..'' ඔහු සෙමින් කොඳුරනු මට යාන්තමට මෙන් ඇසිණ.

මම කිසිත් නොපවසා ඔහුගේ ළමැදෙහි උණුසුම සොයා තුරුළු වීමි.

''හැම දාටම ෂෙහාන් මට මෙහෙම ඉන්න ඉඩ දෙන්න ෂෙහාන්.. ප්ලීස්..'' දෙනෙත කඳුළින් පෙඟී යද්දී මම කීවෙමි.

''අඬන්නෙපා බට්ටි.., මං ආයෙ කවදාවත් ඒ විදිහට වෙනස් වෙන්නෙ නෑ..'' ෂෙහාන් තිර හඬින් කීය.

මගේ හිස ඇතුළින් සියුම් වේදනාවක් දැනෙමින් තිබුණද මම එය ෂෙහාන්ට නොකීවෙමි.

අප සිනමාහලින් පිට වෙද්දී එකී වේදනාව ටිකෙන් ටික වැඩි වෙමින් තිබිණ. ගාලු බසයකට නැග අසුන් ගත් පසු මම ෂෙහාන්ගේ උරහිසට හිස තබා ගතිමි.

''ඇයි බට්ටි..?''

''මගෙ ඔලුව ඇතුළෙන් හරියට රිදෙනවා ෂෙහාන්..'' මම කීවෙමි.

''ඇයි ඒ..?''

ඔහු මගේ හිස අත ගාමින් ඇසීය.

''මන්දා ෂෙහාන්..'' මම කෙඳිරිගාමින් කීවෙමි.

ගාල්ලට පැමිණෙද්දී මගේ හිසේ වේදනාව දරාගත නොහැ තරම් විය. වේදනාව වැඩිකමට මම ක්ලාන්ත වීමි. එතැන් සිට ම



Scanned by CamScanner

පුංචි ස්නැක් බාර් එකකට ඇතුළු වුණ අපි චයිනීස් රෝල්ස් කා පෝටෙලෝ බීවෙමු.

''කොහෙද ෂෙහාන් අපි යන්නෙ..?'' ස්නැක් බාර් එකෙන් එළියට එද්දී මම ඇසීමි.

''බීච් එකට..'' ඔහු කීවේය.

අපි මාතර එස්.කේ. සිනමා හලට ඉදිරිසින් වූ මුහුදු වෙරළ දෙසට ඇවිද ගෙන ගියෙමු.

සෙවනක් බලා හිඳ ගත් අපි කතාවෙන් තොරව රළ රැළි නඟන නීල සයුරු තෙර දෙස බලා සිටියෙමු.

''ඔයා මොනව හරි හංගනව ෂෙහාන්..'' මම වෙනසක ලකුණු දැක කීවෙමි.

''නෑ බට්ටියෙ එහෙම මොකුත් නෑ. ඒක නෙමේ.. කොහොමද ඔයාගෙ කොලේජ් එකේ වැඩ එහෙම..?''

''ඒව ගැන කතා කරල වැඩක් නෑ ෂෙහාන්..'' මම පසුතැවිල්ල මුසු වූ හඬින් කීවෙමි.

ෂෙහාන් මට බෙහෙවින් අවවාද කළේය.

''නව මාස කීයද බට්ටි එග්සෑම් එකට? මේ ටික කාලෙ විතරනෙ ඔයා මහන්සි වෙන්න ඕනැ..''

මම නිහඬවම ඔහු කියන්න අසා සිටියෙමි.

''ෂෙහාන්.. ඔයා දන්නවනෙ මගේ බලාපොරොත්තු, ආශාවල්, ප්‍රාර්ථනා හැම දෙයක්ම තියෙන්නෙ ඔයාගෙ මත්තෙ කියලා. ඔයා මගෙන් ඈත් වෙනවා කියන්නෙ ඒ හැම දෙයක්ම නැති වුණා කියන එක ෂෙහාන්..'' මම අවසානයේදී කීවෙමි.

ෂෙහාන් බොහෝ වේලාවක් නිහඬවම කල්පනා කළේය. එකට පමණ අපි යළිත් මාතර නගරයට පැමිණියෙමු. දහවල් ආහාර ගත් අපි මාතර එස්.කේ. සිනමා ශාලාවට ඇතුළු වූයෙමු. ෂෙහානුත්





මමත් බොහෝ තැන්වල ඇවිද ඇති නමුත් ජීවිතයේ ප්‍රථම වරට අප දෙදෙනා සිනමා හලකට ආ ප්‍රථම අවස්ථාව මෙය විය.

සිනමා හලේ දර්ශනයට නියමිතව තිබුණේ මධු සිහිනය.

''මධුකා.. මධූකා..'' ගීතය ශාලාව පුරා විහිද යමින් තිබිණ. අඩ අඳුරේ ෂෙහාන්ගේ තරු දෙනෙත දිළිසෙද්දී මම ඔහුගේ උරහිසට බර වීමි.

''බට්ටි..'' ඔහු සෙමින් කොඳුරනු මට යාන්තමට මෙන් ඇසිණ.

මම කිසිත් නොපවසා ඔහුගේ ළමැදෙහි උණුසුම සොයා තුරුළු වීමි.

''හැම දාටම ෂෙහාන් මට මෙහෙම ඉන්න ඉඩ දෙන්න ෂෙහාන්.. ප්ලීස්..'' දෙනෙත කඳුළින් පෙඟී යද්දී මම කීවෙමි.

''අඬන්නෙපා බට්ටි.., මං ආයෙ කවදාවත් ඒ විදිහට වෙනස් වෙන්නෙ නෑ..'' ෂෙහාන් තිර හඬින් කීය.

මගේ හිස ඇතුළින් සියුම් වේදනාවක් දැනෙමින් තිබුණද මම එය ෂෙහාන්ට නොකීවෙමි.

අප සිනමාහලින් පිට වෙද්දී එකී වේදනාව ටිකෙන් ටික වැඩි වෙමින් තිබිණ. ගාලු බසයකට නැග අසුන් ගත් පසු මම ෂෙහාන්ගේ උරහිසට හිස තබා ගතිමි.

''ඇයි බට්ටි..?''

''මගෙ ඔලුව ඇතුළෙන් හරියට රිදෙනවා ෂෙහාන්..'' මම කීවෙමි.

''ඇයි ඒ..?''

ඔහු මගේ හිස අත ගාමින් ඇසීය.

''මන්දා ෂෙහාන්..'' මම කෙඳිරිගාමින් කීවෙමි.

ගාල්ලට පැමිණෙද්දී මගේ හිසේ වේදනාව දරාගත නොහැ තරම් විය. වේදනාව වැඩිකමට මම ක්ලාන්ත වීමි. එතැන් සිට ම



Scanned by CamScanner

සිදුවූ කිසිවක් මට පැහැදිලි නොවිණ.

මට සිහි ගැන්වෙමින් තිබිණ. බොඳ වූ නෙත්වලින් අවට හඳුනා ගන්නට මම වෑයම් කළෙමි. එහෙත් හිස් මුදුනින් නැගී එන දරුණු වේදනාවකින්මම මුසපත්ව සිටියෙමි. වේදනාව දරා ගත නොහැකි බැවින් මට ඉබේම කෙඳිරි ගෑවිණි.

''බට්ටි..'' මට අර හුරු පුරුදු සෙනේබරිත කට හඬ ඇසිණ. මම දැඩි ආයාසයකින් ඔහු හඳුනා ගතිමි.

''ෂෙහාන්...'' මා තොල් මතුරන්නට ඇත.

''බට්ටි.. දැන් ඔයාට කොහොමද..?'' ඔහු මගේ මුහුණට එබීගෙනම ඇසීය.

''ඔළුව හරියට රිදෙනව අනේ.. කොහෙද මේ..?''

''මහමෝදර හොස්පිට්ල් එකේ. මතකද ඔයාට එක පාරටම ෆේන්ට් වුණා. ඒ වෙලාවෙම මං ත්‍රීවීල් එකකට කතා කරලා හොස්පිට්ල් ගෙනාව. තව ටිකකින් ඩොක්ටර් එයි..'' ෂෙහාන් විස්තර කළේය.

''ෂෙහාන් මට බයයි.. ඔයා මගෙ ළඟින්ම ඉන්න..''

''මොනාටද ළමයො බය වෙන්නෙ..? මං ඔයාව දාලා යන්නෙ නැනෙ බට්ටි..'' ෂෙහාන් මහිත පිරිමදිමින් කීවේය.

මම ඔහුගේ සුරත ගෙන ළමැදට තද කොට ගතිමි.

''ඔයාගෙ අත් සීතල වෙලා බට්ටි..''

''මට මගේ ජීවිතේ ගැන මහා බයක් දැනෙනව ෂෙහාන්.. මං මැරෙන්න බය නෑ.. ඒත් මට ඔයාව දාලා යන්න දුකයි ෂෙහාන්..''

මම මා පිළිබඳවම නැගුණු අනුකම්පාවෙන් යුතුව කියාගෙන කියාගෙන ගියෙමි.

''ඕන්නැති කතා කියන්නැතුව ඉන්න. ඩොක්ටර් එනවා..'' ෂෙහාන් එසේ කියමින් ඔහුගේ සුරත මගෙන් මුදා ගත්තේය.





''දැන් කොහොමද..?'' වෛද්‍යවරයා විමසුවේය.

''ඉවසන්න බැරි තරමට ඔලුව රිදෙනවා ඩොක්ටර්..'' මම කීමි.

''වෙනදත් භාෂිණීට මේ විදියට ඔලුව කකියන්න ගන්නවද..?''

''ඔව් සමහර දවස්වලට රිදෙනවා.. පෙනඩෝල් දෙකක් ගත්තම ඇරෙනවා.. ඒත්.. අද තරම් රිදුණෙ නෑ කවදාවත්..''

''භාෂිණී වැටිල එහෙම තියෙනවද..?'' වෛද්‍යවරයා මා පිරික්සමින් විමසීය.

''නෑ ඩොක්ටර්..''

''හොඳට කල්පනා කරල බලන්න.. වැටිල හරි ඔලුව තදින් මොහොක හරි වැදිලා තියෙනවද කියලා..''

මට බාප්පා පහර දෙන අවස්ථා සිහියට නැගිණි. ඒවා වෛද්‍යවරයකු හා කිව හැකිද? මම මොහොතක් වේලා කල්පනා කරමින් සිටියෙමි.

''නෑ ඩොක්ටර් එහෙම මොකුත් නෑ..'' මම කීවෙමි.

''කොහොම වුණත් භාෂිණීව එක්ස්රේ කරන්න වේවි..''

''එතකොට ඩොක්ටර් අද මට ගෙදර යන්න බැරි වෙයිද?''

''කිසිම ප්‍රතිකාරයක් නොකර කොහොමද අපි පේෂන්ට් කෙනෙක් යවන්නෙ..? දවසක් දෙකක් වෝඩ් එකේ ඉන්න වේවි. දැනට ඔයාට වේදනාවට බෙහෙත් දෙන්නම්..'' එසේ කියමින් වෛද්‍යවරයා හෙදියකට යමක් කියා යන්නට ගියේය.

අද ගෙදර නොගියොත් ඇති වන තත්ත්වය මට සිහිවිණ. මම බියපත් දෑසින් ෂෙහාන් දෙස බැලීමි.

''ෂෙහාන්. අද ගෙදර යන්න බැරි වුණොත් කුඩම්මලා මාව කාවි..'' මම කීවෙමි.

''හරි මං ඒක බලා ගන්නම්.. ඔයා බය නැතුව ඉන්න.. මං දැ
ගිහින් සුභාෂ් අයියව මීට් වෙන්නම්..''

''ඔයා යනවද? අනේ ෂෙහාන්..'' මම හඬන්නට වීමි.

''නාඩා ඉන්න හොඳ ළමය වගේ. ඔයාට අඳින්න ඇඳුමක්වත් ඕනනෙ.. මං ගිහින් ඉක්මනට එන්නම්..'' ෂෙහාන් එසේ කියා මගේ නළලත මුදුවට සිප ගත්තේය. තවත් මොහොතක් මගේ දෙස එක එල්ලේ බලා සිට ඔහු යන්නට ගියේය.

මම යහනට වී ඔහු ගිය දෙස බලා සිටියෙමි.

හෙදියක් මවෙත පැමිණ කිසියම් බෙහෙත් පෙත්තකුත්, කරල් දෙකකුත් පෙව්වාය. ටික වේලාවකින් මගේ දෑස නිදිබර වෙමින් තිබිණ.

යළි මා අවදි වූයේ පසුදාය. මා අසල දිල්හානි අක්කා සිටියාය.

''අක්කෙ..'' මම අමාරුවෙන් ඇය ඇමතීමි.

''නංගියෙ මොකද දැන්..?''

''අනේ මන්ද අක්කෙ. කියා ගන්න බෑ වේදනාව...''

''උදේ ඩොක්ටර් ඇවිල්ල බලල කිව්ව දහයට එක්ස්රේ ගන්නවා කියලා..''

''අක්ක උදේ ද ආවෙ..? ෂෙහාන් කෝ? එයා සුභාෂ් අයියව මීට් වෙලාද..?'' මම ප්‍රශ්න වැලක් ඇයගෙන් අසාගෙන ගියෙමි.

''ඊයෙ රෑ තමයි නංගි, ෂෙහාන් අපිට කිව්වෙ. එයා සුභාෂ් අයියව මීට් වෙලා ගෙදරට කියල තියෙනවා..''

''ඉතින් ගෙදර අය මොකද කියල තියෙන්නෙ..?''

''ඒව අපි පස්සෙ කතා කරමු නංගි..''

''මොනව හරි වෙලා තියෙනවා.. අක්කල මට කියන්නෙ නෑ..'' මම දුක්බරව කීවෙමි.

''ඔයාලගෙ ගෙදර මිනිස්සු නම් මහ පුදුම ජාතියක් නංගියෙ. ඔයාව හොස්පිට්ල් ඇඩ්මිට් කළා කියල තියෙන්නෙ සුභාෂ්. බාප්පා





ගෙදර ඉඳලා නෑ. ඕන එකක් කර ගත්තාවෙ කියලා කුඩම්මා කියල තියෙනවා..''

''කෝ දැන් ෂෙහාන්..?''

''එයා දොළහට ඒවි ඔයා බලන්න.. ෂෙහාන් නම් කියා ගන්න බැරි දුකෙන් ඉන්නෙ..''

''මං හින්දා එයා හරියට වද විඳිනව අක්කෙ.. මට ඒක දරා ගන්න බෑ.. මේ ලෝකෙ මගේ කියන්න මට දැන් ඉතුරුවෙලා ඉන්නෙ ෂෙහාන් විතරයි..'' මම හඬා වැටෙමින් කීවෙමි.

''අඬන්න එපා නංගියෙ.. අපි ඔයාව තනි කරන්නෙ නැනෙ.. ඔයා හිත හදාගෙන ඉන්න බලන්න.. මොනව වුණත් ලෙඩ සනීප කරගෙන ඉන්න එපායැ..''

දිල්හානි අක්කාත්, මමත් බොහෝ වේලාවක් කතා කරමින් සිටියෙමු.

''ඔයාව එක්ස්රේ රූම් එකට ගෙනියන්න ඕන.. ඇඳෙන් බහින්න..'' හෙදියක් පැමිණ කීවාය.

මම දිල්හානි අක්කාගේ වාරුවෙන් යහනින් බැස ගතිමි.

එක්ස්රේ කාමරේදි මගේ හිස කිහිප ආකාරයට එක්ස්රේ ගත කරනු ලැබීය. මා පෙළනු ලැබූ රෝගය හඳුනා ගැනීම වෛද්‍යවරුන්ට මහත් පැටලුම් සහගත විණ.

දහවල් රෝගීන් බලන වේලාවේදී දිලිප් අයියාත් කැටුව ෂෙහාන් මා බලන්නට පැමිණියේය. ඒ මොහොතේදී දිල්හානි අක්කා නිවසට ගොස් යළි එන බව කියා පිටව ගියාය.

''බට්ටි නංගි මොකද දැන් ඔයාට..?'' දිලිප් අයියා විමසීය.

''තාම ඒ තරම් අඩුවක් නෑ අයියෙ.. ඇඳටම වෙලා ඉන්න ගියාමත් එපා වෙනවා..'' මම කීවෙමි.

''ඩොක්ටර් මොකද කිව්වෙ..?'' ෂෙහාන් ඇසීය.

''තාම හරියට කිව්වෙ නෑ. ඒත් ටැබ්ලට්ස් නම් බර ගණනක් දුන්න බොන්න..''

''උඹල දෙන්න කතා කරපල්ලකො.. මං ටිකක් එළියට ගිහින් එන්නම්..'' එසේ කියා දිලිප් අයියා අප අසලින් ඈත්විණ.

''බට්ටි..'' ෂෙහාන් මහිස පිරිමදිමින් මිමිණුවේය. මම ආදරයෙන් පෙඟුණ එකී නිල් දෙනුවන දිහා ඔහේ බලාගෙන හුන්නෙමි. එකී දෑසෙහි මගේ දෑස රඳවාගෙන අනේක වාරයක් නොසැලී මට බලා සිටිය හැක.

''ෂෙහාන්..'' මම කොඳුළෙමි.

''බට්ටියෙ.. ඇයි..?''

''ෂෙහාන් ඔයා මගේමයි නේද..?'' මම ඔහුගේ සුරත මිරිකා ගනිමින් ඇසීමි.

''සත්තකින්ම බට්ටියෙ..''

''මට බයයි ෂෙහාන්..''

''මං හුඟක් ම ආසාවෙන් ඔයා ළඟ ඉන්න වෙලාවල් හුඟක් ඉක්මනින් ගෙවිල යනව ෂෙහාන්..''

''දූනට අපි හමුවෙලා වෙන් වුණත් සදහටම මං ඔයාව මගෙ ළඟට ඉක්මනින්ම ගන්නව බට්ටි..''

''ඒ තරම් කාලයක් මං ඉඳීවිද ෂෙහාන්.. ඔයාට තේරෙන්නෙ නෑ ෂෙහාන්.. මං දූන් ලෙඩෙක් වේගෙන යන්නෙ..''

''පිස්සු නොකියා ඉන්න බට්ටි..'' ෂෙහාන් මඳක් තදින් කීවේය. ඉන් මහිත රිදිණ. මගේ නෙතු අග්ගිස්සේ කඳුළු වැල් රූරා වැටෙමින් තිබිණ.

''මේ අහන්න බට්ටි.. අපි මොන දේ ගැන හිතන්නත් කලින් ඔයාගෙ ලෙඩේ සනීප කරගෙන ඉන්න ඕනෑ.. මානසිකව හිතන්න හිතන්න වැඩි වෙන්නෙ ලෙඩයි.. හැම දේකටම අඩල හරියන්නෙ





නැහෙ බට්ටියෙ..''

''මගෙ පපුවෙ ලේ නහර අස්සෙ හිර කරගෙන තියෙන දුක මෙහෙමයි කියලා ඔයාට කියන්න, පෙන්නන්න පුලුවන් නම්.. එතකොටවත් ඔයා තේරුම් ගනීවි ඇයි මං හැම වෙලාවෙම අඬා වැටෙන්නෙ කියලා..''

''අමුතුවෙන් කියන්න දෙයක් නෑ බට්ටියෙ.. මං තේරුම් අරගෙන තියෙන්නෙ ඔයාගෙ හිත..''

''ෂෙහාන්.. ෂෙහාන්..'' දිලීප් අයියාගේ ඇමතුම් හඬින් ගැස්සුණ අපි ඔහු එන දෙස හැරී බැලුවෙමු. ඔහු ඉක්මන් ගමනින් අප වෙත පැමිණියේය.

''ඉක්මනට මාරු වෙමු.. බට්ටි නංගිලගෙ ගෙදරින් එනවා..'' දිලිප් අයියා කලබල හඬින් කීවේය.

''බට්ටි අපි ටිකක් එළියට යන්නං..'' ෂෙහාන් එසේ කියමින් පිටව යද්දී මම බිය රැඳි දෑස රෝහලේ කොරිඩෝරයෙහි රැඳවීමි.

කුඩම්මාත්, තමාලිත් පැමිණෙනු මම දුටුවෙමි. ඔවුන් පැමිණි කල තිබෙන සැනසුම ද මවෙතින් පලා යන බව මට වැටහිණි.

කුඩම්මාත්, තමාලිත් මගෙ ඇඳ අසලට ළං වී වට පිට බැලූහ.

''හිතෙන හිතෙන වෙලාවට තනියම හොස්පිට්ල් ඇඩ්මිට් වෙලා අපිට ලැජ්ජා කරන්නද උඹට ඕනැ..?''

කුඩම්මා මා වෙතට නැමී සෙමින් එහෙත් දැඩි හඬින් කීවාය. මම කිසිත් නෑසුණා සේ සුදු සිවිලිම දෙස බලා හුන්නෙමි.

''තනියම මොනවද? ඇයි සුභාෂ් අයියත් ඉන්නෙ..?''තමාලි උපහාසාත්මක ස්වරයෙන් කියද්දී මම ඇගේ වත දෙස එක එල්ලේ බැලුවෙමි.

''ඇයි කියන කොට රිදෙනවද..?'' තමාලි තමා සිටින්නේ රෝහලක යන්න පවා අමතක කරලමින් වේගයෙන් ඇසුවාය.



Scanned by CamScanner

''ප්ලීස් තමාලි ගෙදර ගියාම ඕන දෙයක්. මෙතන නම් කෑ ගහන්න එපා..'' මම අයැද සිටියෙමි.

''අපි කෑ ගැහුවොත් තමයි උඹට ලැජ්ජාව. උඹ මේ කරන වැඩ හරිද..?'' කුඩම්මා ද තමාලිට දෙවැනි නැත.

''මං මෙතන මේ ඉන්න ටිකවත් ඉන්න හරි සැනසිල්ලෙන්.. ඒ ටිකවත් මට මගේ පාඩුවේ ඉන්න ඉඩ දෙන්න කුඩම්මෙ..'' මා එසේ කියද්දී මට මා පිළිබඳවම දුක සිතිණ. ආත්මානුකම්පාව තරම් හිතකට ප්‍රබලව රිදවෙන අන් යමක් නැති බැව් මම හොඳින් දැන සිටියෙමි.

''හොඳයි මම උඹට සැනසිල්ලෙ ඉන්න ප්‍රබෝෂන් එකකට යවන්නම්කො.. හැමදාම කියනව වගේ නෙමෙයි මේ වතාවෙ මේ කුඩම්මා කියන්නෙ.. අන්න ඒක උඹ හොඳට මතක තියා ගනින්..'' කුඩම්මා දබරැඟිල්ල පා මට කීවාය.

මම අසා සිටියෙමි. ජීවිතයේ ලොකුම ඉවසීම කොට මම අසා සිටියෙමි.

''දැන්ම ගෙදර යන්න ලේස්ති වෙනවා..'' කුඩම්මා අණ කර සිටියාය.

''එක්ස්රේ එක ටෙස්ට් කරනකම් මට යන්න ලැබෙන්නෙ නෑ..'' මම තිර හඬින් කීවෙමි.

''ඒකත් එහෙමද..? හොඳයි මං ඒක බලා ගන්නම්කො.. තමාලි යං..''

එසේ කියා කුඩම්මා මට රවා ගස්සා ගෙන තමාලිවත් ඇදගෙන වේගයෙන් පිටව ගියාය. අවට ඇඳන් අසල හුන් කිහිප දෙනෙකු ඒ දෙස හැරී බලනු මම දුටුවෙමි.

අසනීපව සිටිය ද මගේ පාඩුවේ හිඳින්නට මට වරම් නැත. මම මුනිං තලාවී කඳුළින් පෙඟුණ දෑස කොට්ටයෙහි සඟවා ගතිමි.

''බට්ටි..'' මට ෂෙහාන්ගේ දයාබරිත ඇමතුම් හඬ ඇසිණි. එහෙත් මම හිස නොඑසෙව්වෙමි.





''අඬන්නෙපා බට්ටි.. එයාල මොනවද කිව්වෙ කියල විතරක් මට කියන්න.. ඒ ඇති..''

මම කඳුළින් නැහැවුණ වත ඔහු දෙසට හරවා ගතිමි. ෂෙහාන් නැමී සුරත් තුඩුවලින් මගේ කඳුළු බිඳු පිස දැමීය.

කුඩම්මලා කියූ දෑ මම ෂෙහාන්ට වැයමින් කියා ගත්තෙමි.

''මහ පුදුමාකාර මිනිස්සු ජාතියක් බට්ටි. එක අතකට ඔය වගේ අයට මිනිස්සු කියන්නවත් වටින්නෙ නෑ. ඒක නෙමේ බට්ටි.. දැන් එකට දහයයි. තව ටිකකන් මට යන්න වේවි..''

''අනේ ෂෙහාන්..'' මට ඉබේම කියැවිණි.

''අනේ කියල පුළුවන්ද? පිරිමියෙකුට වෝඩ් එකේ ඉන්න දෙනව නං මං පැනලනෙ ඔයා ළඟ ඉන්නෙ..'' ෂෙහාන් අඩ සිනාවකින් යුතුව මගේ නිකට ඔහු සුරතින් අල්ලා සොලවමින් කීය.

මම නිකමට මෙන් කොරිඩෝරයේ සිට වාට්ටුවට ඇතුල් වන දොරටුව දෙස බැලීමි. දෙවියනේ.. ඒ එමින් සිටියේ කවුද..?

''ෂෙහාන්..'' මට කියවෙන්නට ඇත. මගේ දෑසේ නළියමින් තිබූ බිය දුටු ෂෙහාන් ද මා අනුව එදෙස බැලීය.

''අනේ ෂෙහාන්.. දැන් මොකද කරන්නෙ..?'' මම ෂෙහාන්ගෙන් විපිළිසරව අසා සිටියෙමි.

''අපිව දැක්ක නේද..?'' ෂෙහාන් ද තිගැස්සුණ ස්වරයෙන් අසද්දී මට තව තවත් බය සිතිණ.

''ඔව් ෂෙහාන් අපිව දැක්කා.. අනේ දැන් මොකද කරන්නෙ ෂෙහාන්..''

''බලමුකෝ..''

''මචං වැඩේ අබ්ලික් වෙන්නයි යන්නේ..'' දිලිප් අයියා අප වෙත එමින් කීය.



Scanned by CamScanner

''අපිව දැක්කට පස්සෙ මාරු වෙන එකත් හරි නැතෙ.. මට තමු
ප්‍රශ්නයක් නෑ..'' ෂෙහාන් කීය.

''මෝඩයෝ උඹට නෙමේ, මේ අහිංසක කෙල්ලටයි ප්‍රශ්නෙ.. ඒක තේරෙන්නෙ නැද්ද..?''

''තමුසෙලා කව්ද..?'' බාප්පා අප අසලටම ළං වෙමින් ඇසීය.

''බට්ටි නංගි ලෙඩ වෙලා කියලා දැනගෙන අපි ආවෙ බලන්න..'' දිලිප් අයියා සෙමින් කීය.

''බට්ටි නංගී..?''

''සොරි අන්කල් භාෂිණී නංගී..''

''මෙයා කවුද..?'' බාප්පා ෂෙහාන් දෙසටෙ අත දිගු කර දිලිප් අයියාගෙන් අසනු මා බලා සිටියේ ගැහෙන සිත තද කොට ගන්නට උත්සාහ කරමිනි.

''මේ මගේ යාලුවෙක්..'' දිලිප් අයියා කිසිදු පැකිළීමකින් තොරව කීවේය.

''තමුසෙගෙ නෙමෙයි මෙන්න මෙයාගෙ හොඳ යාලුවෙක් එහෙම නේද..?'' බාප්පා මා පෙන්නා දැඩි හඬින් කීවේය.

අපි තිදෙනාම නිහඬව සිටියෙමු.

''කතා කරනවා..'' බාප්පා දබරැඟිල්ල පා කීවේය.

''ඔව් අන්කල් මගෙ හොඳ යාලුවෙක් භාෂිණී..'' ෂෙහාන් පියවරක් ඉදිරියට තබමින් කීවේය.

''හඃ තමුසෙ හිතාගෙන ඉන්නෙ තමුසෙ ගැන මං දන්නෙ නෑ කියලද? මං හොයාගෙන තියෙන්නෙ හැම දෙයක්ම. මං මේ තමුසෙට කියන පළමුවෙනි වතාව වගේම අවසාන වතාව. හොඳට මතක තියා ගන්නව මේ භාෂිණී ගැන අදහසක් තියෙනව නම් කරුණාකරලා ඒ අදහස අත්ඇර ගන්නව.. මොකද තමුසෙ කියන්නෙ..?''





''අන්කල් ඔහොම නෙවෙයි කොහොම කිව්වත් මගෙයි භාෂිණීගෙයි තියෙන සම්බන්ධෙ මං නවත්තන්නෙ නෑ අන්කල්..'' ෂෙහාන් තදින් කියද්දී මහිත බියෙන් ත්‍රස්තව ගිනිගෙන දැවෙමින් තිබිණ.

''තමුසෙ රැවටිලා ඕයි.. භාෂිණීට ආදරේ කරන්න තරම් තමුසෙ රැවටිලා. මේ වගේ කාලකණ්ණි, අවාසනාවන්ත කෙල්ලෙක් තමුසෙ බාර ගන්නව කියන්නෙ නම් මට කරන ලොකු උපකාරයක්..''

''අන්කල් මට භාෂිණී ගැන අමුතුවෙන් අඳුන්වල දෙන්න ඕන නෑ. එයා ගැන මං හොඳට දන්නවා. එයාගෙ තාත්තා කවුද, බාප්පා කවුද කියන තැනේ ඉඳන් හැම දෙයක්ම මම දන්නවා. භාෂිණී ගැන අන්කල් මට කිව්ව වගේම මටත් අන්කල් ගැන හරිම ලස්සන දේවල් කියන්න පුළුවන් අන්කල්.. මේ වගේ අහිංසක කෙල්ලෙකුට පිට ගෑනියෙකුත් එක්ක එකතු වෙලා වෙනස්කම් කරන්න එපා. සහගහනවා ඒක..'' ෂෙහාන් අර ආදරණීයම දෑස නපුරු කරගෙන කියාගෙන කියාගෙන ගියේය.

''ත.. තමුසෙ ඔය කාටද කතා කරන්නෙ..?'' බාප්පා ගොත ගසමින් ෂෙහාන් ඉදිරියට යමින් ඇසීය.

''භාෂිණීගෙ තාත්තට..'' ෂෙහාන් නපුරු හඬින් කීය.

''ෂෙහාන්..'' දිලිප් අයියා කෑ ගැසීය.

''අනේ ඔයා යන්න ෂෙහාන්..'' මම බැගෑපත් වීමි.

''යන්න කලින් ඔයාගෙ තාත්තට මේව කියා දෙන්න ඕන ඔයාගෙ ජීවිතේට වග කියන්න ඕන වෙන කවුරුවත් නෙමෙයි මෙන්න මෙයා..''

''උඹ මගෙන් සල්ලං වෙනව බොහොම ඉක්මනට..'' බාප්පා ද එකට එක කීවේය.

''ෂෙහාන් වරෙන් යන්න..''

''නෑ දිලිප් මම යන්නෙ නෑ..''



Scanned by CamScanner

''පිස්සු නැතුව යමං.. මං කියන දේ අහපන් ෂෙහාන්..'' දිලිප් අයියා ෂෙහාන්ව ඇද ගෙන යාමට උත්සාහ කළ ද ඔහු මෙල්ල වන පාටක් නොවීය.

''මං වදින්නම් ෂෙහාන් අනේ මෙතනින් යන්නකො..'' මම එසේ කියමින් ඉකි බිඳින්නට වීමි. මහිත වඩාත් බියපත්ව තිබුණේ බාප්පාත් ෂෙහානුත් අතර ගුටිබැට හුවමාරුවක් වේදෝයි යන හැඟුමෙනි.

''ඔව් උඹ වැඳල කියපං යන්න කියලා. නැත්නම් වෙන්නෙ මගෙන් මැරුම් කන්න..'' බාප්පා කෝප දීප්ත දෙනෙත මවෙත එල්ල කරමින් කීවේය. ඒ දැසේ වූ ගින්නෙන් මම දැවී ගියෙමි.

''ෂෙහාන් යන්න ෂෙහාන්.. අනේ යන්න..'' මම මතුරක් සේ කියන්නට වීමි.

''හොඳයි ඔයා කියනව නම් මම යන්නම්.. හැබැයි මම යන්නෙ මේ යකාට බයේ නෙමෙයි.. ඒක මතක තියා ගන්න..''

''හොඳයි බලමුකො ඉලන්දාරියා..'' බාප්පා රවමින් කීවේය.

ෂෙහාන් දිලිප් අයියා සමගින් යන්නට හැරී යළිත් බාප්පා වෙතට හැරිණි.

''හාෂිණිට එහෙම මොකුත් කරල තිබුණොත්..''

''ඇයි මට මොනව කරන්නද..?'' බාප්පා ඇසීය.

''මං ඒක බලා ගන්නම්..''

''වරෙන් යන්න'' දිලිප් අයියා ෂෙහාන්ව බලෙන් මෙන් ඇදගෙන ගියේය.

ඔවුන් ගියෝය.. ඊළඟට.. ඊළඟට මම. මුහුණ දිය යුතු අවස්ථාව ඉතාමත් බැරෑරුම් සහගත එමෙන්ම බිය ජනකම අවස්ථාවක් විය. ඔව්.. ඒ මොහොත උදාවින.

''උඹ කාට කියලද හොස්පිටල් ඇඩ්මිට් වුණේ..?'' බාප්පා මවෙත නැමී වේගයෙන් ඇසීය.





''මං දන්නෙවත් නෑ කලන්තෙ හැදිල ඉන්නකොට යාලුවො එක්කගෙන ඇවිල්ල තියෙන්නෙ..''

''යාලුවො..? අර දූන් ආපු එවුන්ද..?''

බාප්පාගේ ප්‍රශ්නය ඉදිරියේ මම නිරුත්තර වීමි.

''කතා කරපන්...''

''නෑ..'' මම යන්තමට කියා ගතිමි.

''එතකොට සුභාෂ් එක්කන් ආව කිව්වෙ කුඩම්මට.. ඒ මොකද..?''

''මං දන්නෙ නෑ..'' මා කිවූ මුසාව වැරදුණු බව දැනුණ පසු මම කීවෙමි.

''හිටපං මම පේෂන්ට් ඇඩ්මිෂන් එක බලල එනකන්.. මටත් දැන ගන්න ඕන උඹට මේ තරම් කරුණාවන්ත වෙලා හොස්පිට්ල් එකට ඇඩ්මිට් කළ කෙනා කවුද කියලා..'' එසේ කියමින් බාප්පා මා අසලින් යන්නට ගියේය.

මම යළිත් දැවෙන්නට වීමි. දැන් ඔහු රෝගීන් ඇතුල් කර ගන්නා පොත බැලූ විට ෂෙහාන්ගේ නම දකිනවා ඇත. මා කුමක් කළ යුතු දැයි මටම නොවැටහේ. ඒ මදිවාට මගේ හිස කැක්කුම ක්‍රම ක්‍රමයෙන් උත්සන්න වෙමින් තිබෙනු මට දැනෙයි.

මම යහනින් බැස වාට්ටුවට පිවිසෙන තැනින් කොරිඩෝරයට ආවෙමි. හිස කැක්කුම දරාගත නොහැකි තරමට තිබිණ.

එහා කොරිඩෝරයක සිට මදෙසට එන බාප්පා මගේ නෙතට හසුවිණ.

සැනින් මගේ නෙතු නිලංකාර වී අවට අඳුරු වෙනවා මට දැනිණ. දෙපා පණ නැතිව යමින් දෑස් නිලංකාර වනවා මෙන් මට යාන්තමට ම..ත..ක..ය..



Scanned by CamScanner

# 3

**මා** කොහේදෝ ලොවක පාවෙමින් සිටින්නාක් මෙන් මට දැනෙමින් තිබිණ. මම සෙමින් නිදිගත් නෙතු විවර කළෙමි. කිසිවක් පැහැදිලි නැත. සියල්ල මා දුටුවේ බොඳ වූ නෙත් අතරිනි. හිසට යමකින් පහර දී ඇතිවාක් මෙන් මට දැනේ. ඒ වේදනාව මැදින් මම සිදු වූ සියල්ල මතක් කර ගන්නට වෙර දැරුවෙමි. ඔව්. අවසානය මට සිහිපත් විනා. ඈත කොරිඩෝරයක බාප්පා එනු දුටු මා දෙපා පණ නැතිව ඇද වැටෙනයුරු මට සිහිපත් විණ.

මම වට පිට බැලීමි. සුදු ඇඳුමින් සැරසුණු හෙදියක් මවෙත ළඟී ලහියේ එනු පෙනිණි.

''හාෂිණී.. දැන්ද නැගිට්ටෙ..?'' ඇය මවෙත ළයාන්විත සිනාවක් පාමින් ඇසුවාය.

මම දුබල සිනාවක් පෑවෙමි.

''දැන් කොහොමද..?'' ඇය යළිත් ඇසුවාය.

''අනේ මන්ද මිසී මට මොකද වුණේ..?''

''ඔයා එක පාරටම ෆේන්ට් වුණා.. දැන් ඒව ගැන හිතන්නෙ නැතුව මේ ටැබ්ලට්ස් දෙක බොන්න..''

''එපා වෙනව මිසී ඕව බොන්න ගියාම..'' මම ඇලි මැලිව කීවෙමි.

''එහෙම කියල පුලුවන්ද? බෙහෙත් නොබී ලෙඩ හොඳ වෙනවද? බොන්න.. බොන්න..'' ඇය මට පෙරැත්ත කළාය. ඇගේ කාරුණික





බව මගේ දෙනෙතට කඳුළු නංවන්නට තරම් සමත් විය.

''ඇයි නංගි..?'' ඇය දැඩි සෙනෙහසින් යුතුව ඇසුවාය. ''නංගී..'' යන වදන ඈ මුවින් ගිලිහුණේ දැඩි ලෙස හැඟුම්බරවය.

''නෑ අක්කා මොකුත් නෑ..'' මම වැයමින් කියා ගතිමි. ඇය සෙමින් මහිස පිරිමැද යන්නට ගියාය. මම නෙතු සිරකොට පියා ගතිමි.

බාප්පා කුමක් කළේදැයි යන්න පවා මම දැන නොසිටියෙමි. සියල්ල අපැහැදිලිය. මගේ ජීවිතේ බොහෝ තැන් බෙහෙවින්ම අපැහැදිලිය.

යහන මත්තෙහි දිගාවී සිටින මට සියල්ල සිහිපත් වේ. මගේ ජීවිතයේ එදා මෙදා තුර සිදුවූ සිදුවීම් මධ්‍යයේ මා මෙලෙසවත් ජීවිතය රඳවාගෙන සිටීම ගැන මටම පුදුම සිතේ.

ෂෙහාන් නොසිටියා නම් මා අම්මා ගිය ගමනම ගොස් වෙන්නට පුලුවන.

තවත් දවසක් ඇරඹී ගෙවී යමින් තිබිණ.

මම වාට්ටුවේ බිත්තියේ සවි කර තිබූ ඔරලෝසුව දෙස බැලීමි. දහවල රෝගීන් බලන වේලාවට තව පැ එක හමාරක් පමණ තිබේ. මෙසේ එක්තැන්ව කාලය කා දමන්නට මම කවදත් අකැමැත්තියක වීමි.

මම නිදන්නට උත්සාහ ගතිමි. එහෙත් නින්ද මා අසලකටදු නොඒ. දහවල රෝගීන් බලන වේලාව උදා වෙද්දී මා සිටියේ දැඩි නොඉවසිලි ගතියකිනි.

එකා දෙන්නා බැගින් කොරිඩෝරය දිගේ අවුත් වාට්ටුවට ඇතුල් වෙද්දි මම තව තවත් නොසන්සුන් වීමි.

සැනින් වාට්ටුවට ඇතුළු වූ පිරිසකින් මම විස්මිත වීමි. මම අර රතු ටයි පටිය, එස් අකුර සිත්තම් වුණ තිල ලාංඡනය හඳුනා ගතිමි. ඔව්. මා බලන්නට අනෝජලා, දීප්තිලා, මධූකලා ඇතුළු සියල්ලෝම පැමිණියාහ.



Scanned by CamScanner

''හාෂි උඹට මොකද වුණේ..?''

''කවද්ද හොස්පිට්ල් ඇඩ්මිට් කළේ..?''

''ඩොක්ටර් මොකද කිව්වෙ..?''

''දැන් දවස් කීයක්ද..?''

ඔවුහු දහසකුත් ප්‍රශ්න අසති. මම ඔවුන්ගේ පැමිණීමත් සමග කුල්මත් වූ සිතින් බලා හුන්නෙමි.

''කතා කරපන්කො හාෂි..'' අනෝජා ඇවිටිලි හඬින් කීවාය.

''ඉස්සෙල්ල කියපන් කවුද මම හොස්පිට්ල් එකේ ඉන්නව කියලා උඹට කිව්වෙ..?''

''මමයි දීප්තියි ඊයෙ අමරදාස ප්‍රෙස් එකට ගියා. අපි යනකොට දිලිප් අයියා ශ්‍රී ලාල් අයියත් එක්ක බර කතාවක්. ඒ වෙලාවෙදි තමයි දිලිප් අයියා විස්තරේ කිව්වෙ..'' මධූකා එක දිගටම කියාගෙන ගියාය.

''ඊයෙ හවසමයි අපි උඹව බලන්න එන්න හිටියෙ.. ඒත්.. ඒ වෙලාවෙ ආව නම් ලෙඩ්ඩු බලන වෙලාව පහුවෙලා..'' දීප්ති මගේ හිස අත ගාමින් කීවාය.

''උඹල ඊයෙ ආව නැති එකමයි හොඳ..''

''ඇයි ඒ..?''

මම ඔවුන්ට සිදුවූ සියල්ල විස්තර කළෙමි.

''උඹලගෙ බාප්පා මහ නරුමයෙක්නෙ..'' මධූකා පිළිකුල් හඬින් කීවාය.

''එපා බං.. උඹල පව් පුරෝගන්න.. මං හින්දා මිනිස්සුන්ට වෛර කරල උඹලයි පව් පුරව ගන්නෙ.. ඒක නෙවේ උඹල කොහොමද කොලේජ් එකෙන් පැන ගත්තේ..?'' මම විමසාලූයෙමි.

''පොඩි ගේට් එකෙන් පනින්නත් හිතලා ආයෙ කට්ටිය වැඩියිනෙ.. ඒ නිසා ක්ලාස් ටීචර්ට කියලා පර්මිෂන් ගත්තා..''

''පුදුමයි යුනිෆෝම් එකෙන් එන්න දුන්නා..'' මම කීවෙමි.





''පුදුමයි ඒත් ඇත්තයි.. අපි ආවනෙ කොහොම හරි බලන්න.. ඒක නෙමේ මොකද ඩොක්ටර්ස්ලා කියන්නෙ..?'' අනෝජා ඇසුවාය.

''අනේ මන්දා බං.. තාම පැහැදිලි දෙයක් කියන්නෙ නැහැ.. එක්ස්රේ එකේ රිසල්ට් එක කිව්වෙත් නෑ..''

''හාෂි මං අපේ තාත්තිට කියන්නද උඹව කෝපරේටිව් හොස්පිට්ල් එකට ඇඩ්මිට් කරන්න කියලා.. මට නම් හිතෙන්නෙ ස්පෙෂලිස්ට් කෙනෙක් ලවා බලවන එක හොඳයි කියලයි..'' මධූ සෙනෙහෙබර හඬින් කීවාය.

''එපා මධූ. මං හින්ද කරදර වෙන්නෙපා.. අපි තව ටිකක් බලමුකෝ හොඳේ..'' මම ඇගේ සිත නොරිදෙන සේ කීවෙමි.

''හාෂි.. උඹ දවල්ට කෑවද..?'' දීප්ති ඇසුවාය.

''තාම නෑ..'' .

''හිටිං මං කෑම එකක් ගේන්නං..''

''එපා දීප්ති, දැන් ෂෙහාන්ලා එනකොට කෑම එකක් ගෙනේවි..''

''ෂෙහාන්ගෙත් ඒ ලෙවල් එග්සෑම් එක මේ සැරේ නේද..?'' අනෝජා මවෙතින් අසා සිටියාය.

''ඔව්.. මේ අගෝස්තුවේ..''

''මිනිහ එග්සෑම් වට්ට ගනීද හාෂි මේ ප්‍රශ්න හින්ද..?''

''මටත් බය ඒකම තමා කොලේජ් එකේ ටීචර්ස්ලත් ෂෙහාන් ගැන හුඟක් බලාපොරොත්තු තියාගෙන ඉන්නෙ..''

''උඹ සනීප වුණ ගමන් අපේ ගෙදර යමං..'' අනෝජා සැහැල්ලු හඬින් එහෙත් තිර ලෙස කීවාය. මම කිසිවක් නොපවසා නිහඬව බලා සිටියෙමි.

''ඒ පාර මොනවද කල්පනා කරන්නෙ..?''

''උඹලට චුට්ටක්වත් හිතෙන්නෙ නැද්ද මං මහා අවාසනාවන්තියක් කියලා..''



Scanned by CamScanner

''උඹට විකාරද භාෂි..?'' අනෝජා තරහින් මෙන් ඇසුවාය.

''හිතපං එක්කො අම්මා ඉන්න ඕන. එක්කො තාත්තා ඉන්න ඕන. කොටින්ම කියනව නම් මගෙ කියන්න කවුද ඉන්නෙ..? පාරෙ වැටිල ඉන්න හිඟන්නෙකුටත් වැඩිය අසරණයි බං මම..'' නෙත පෙරගෙන කඳුළු අතරින් මම කියා සිටියෙමි.

''ඔය ඒ සැරේ උඹ අඬනවා.. භාෂි හැම දේකටම මූණ දීපං අපි උඹ ළඟ ඉන්නවා.. ඒක අමතක කරන්න එපා..'' අනෝජා අවවාදානුරූපීව කීවාය.

''ඒයි අන්න එනවා..'' දීප්ති ගේ හඬින් තිගැස්සුණු මම කොරිඩෝරය දෙස හැරී බැලීමි.

ඒ එමින් සිටියේ දිලිප් අයියාය. ෂෙහාන් කොහේදැයි මට පැනයක් වෙමින් තිබිණි.

''බට්ටි නංගි මං ටිකක් පරක්කු වුණා. නංගි තාම දවල්ට කන්නත් නැතුව ඇති නේද? මං ඔයාට අපේ ගෙදරින් කෑම එකක් ගෙනාවා..'' දිලිප් අයියා කලබලයෙන් මෙන් කියාගෙන කියාගෙන ගියේය.

''කෝ ෂෙහාන් අයියා..?'' මා අසන්නට පුල පුලා බලා සිටි පැනය අනෝජා ඇසුවාය. අපි සියල්ලෝම ඔහුගේ පිළිතුර පතා නිහඬව බලා සිටියෙමු. එහෙත් ඔහු ගොළු වූවාක් වැනිය. ෂෙහාන් හට කුමක් හෝ කරදරයක් සිදුවූවාවත්ද? මහිත සිහින් බියකින් පෙළෙමින් තිබිණි.

''ඇයි දිලිප් අයියා..?'' මම ඇසුවෙමි. ඔහු මා නෙත් මඟහැර ඉවත බලා ගත්තේය.

''මොකක්ද වුණේ දිලිප් අයියා..?''

''කෝ ෂෙහාන් අයියා..?''

''එයාට කරදරයක්වත්ද..?''

මිතුරියෝ දිලිප් අයියා වටලා ගනිමින් ඇසූහ. එහෙත් ඔහු නිහඬය.





''මොකක් හරි අවාසනාවන්ත දෙයක් සිද්ධ වෙලා තියෙනවා. අනේ දිලිප් අයියා මට හංගන්නෙ නැතුව සේරම කියන්න..'' මම නෙත් කෙවෙනි තුළ කඳුළු දිය උතුරා යද්දී දිලිප් අයියාගේ සුරත මිරිකා ගනිමින් ඇවිටිලි හඬින් කීවෙමි.

''කලබල වෙන්න තරම් දෙයක් නෑ නංගී.. ඔයා කෑම ටික කාලා ඉන්නකෝ..'' දිලිප් අයියා කරුණාබර හඬින් කියද්දී මට ඉකි බිඳිණි.

''අඬන්නෙපා භාෂි.. ඇඬුවොත් ඔයාගෙ ලෙඩ තවත් වැඩිවෙයි..'' දීප්ති සිය වම් කොපුල් තලය මගේ දකුණු කොපුල් තලය මත තබා සෙමෙන් තද කරමින් කීවාය.

''අනේ දීප්ති මොකක්ද වෙලා තියෙන්නෙ කියලා විතරක් මට කියන්න..'' මම ඇගේ අත ගෙන ළමැදට තද කොට ගෙන හඬා වැටෙමින් කීවෙමි.

''අපිවත් තාම දන්නෙ නෑ භාෂි.. වෙලා තියෙන්නෙ මොකද්ද කියලා.. අඬන් නැතුව ඉන්නකෝ දිලිප් අයියා කියනකම්..'' අනෝජා ද දයාවැති හඬින් කීවාය.

''බට්ටි නංගි..'' දිගු කතාවකට දිලිප් අයියා මුල පුරන්නට හදන බැව් මට වැටහිණි.

''ඔයාගෙ බාප්පා ෂෙහාන්ලගෙ ගෙදර ගිහිල්ලා..''

''මොනව දෙයියනේ.. ෂෙහාන්ලගෙ ගෙදර.. බාප්පා..'' මම විස්මිතව පැටලුම් ස්වරයෙන් කීවෙමි. මිතුරියෝ ඇරුණු මුවින්, නෙතින් සෙල් රූ සේ නොසැලී බලා හිඳිති.

''ඔව් නංගී අපිටත් තාම හිතා ගන්න බැරි ෂෙහාන්ලගෙ ගෙදර කොහොම හොයා ගත්තද කියලා..''

''ඉතිං අයියෙ මොකද වෙලා තියෙන්නෙ..?'' මගේ ස්වරය නොඉවසිලිමත් වන්නට ඇත.

''ඒ වෙලාවෙ ෂෙහාන් ඉඳල නෑ.. අම්මයි, තාත්තයි, ලොකු අයියයි ඉඳලා තියෙන්නෙ..''

ෂෙහාන්ගෙ ලොකු අයියා වන නිශාන් වාරුක ජයම්පති මැදක් සැර බව මට ෂෙහාන් පවසා ඇත. මම යටි තොල සපාගතිමි.

''බාප්පා ඔයාගෙයි ෂෙහාන්ගෙයි එෆෙයාර් එක ගැන කියලා. තව මොන මොනවද ජරා කතා වගේකුත් කියලා ඇවිත්. හැබැයි ෂෙහාන්ලගෙ ගෙදර මිනිස්සු නම් පුදුම ඉවසිල්ලක් ඉවසල තියෙන්නෙ.. ෂෙහාන්ගෙ ලොකු අයියා ටිකක් සැරයිනෙ..''

''දැන් කෝ ෂෙහාන්..?'' මම ඇසුවෙමි.

''මිනිහට ගෙදරින් හොඳටම දොස් කියලා. අයියා එහෙම තදට බැනල තියෙනවා. කොහොම හරි ෂෙහාන් ගෙදරින් ඇවිත්.. තාම ගෙදර ගිහින් නෑ.. මං උදේ ෂෙහාන්ව හොයන්න ගෙදර ගියාම තමයි අම්මා අඬ අඬා ඔය සීන් එක කිව්වෙ. මං හිතුවෙ මිනිහා මෙහෙ ඇති කියලා. ෂිහ් මේ යකා කොහෙ ගියාද මන්දා..'' දිලිප් අයියා සුරත් තුඩින් සිය නළලට තට්ටු කර ගනිමින් කීවේය.

මහිත යළිත් ගිනි වැදෙමින් තිබිණ. ෂෙහාන් ගෙදරින් පැමිණියා නම් ඔහු මා හමුවට පැමිණිය යුතුය. ඔහු කොහේ ගියාද? කිසියම් කරදරයකට මුහුණ පෑවාද? මම මගේ හදවතින් ප්‍රශ්න කළෙමි.

''නංගී දැන් පේෂන්ට්ල බලන වෙලාවත් ඉවර වෙන්න ආවා. මං යන්නම්.. හවසට මොන ක්‍රමයක් දාලා හරි මං ෂෙහාන්ව අල්ලන් එන්නම්..'' ඔහු කීවේය. මට දිලිප් අයියා ගැන දුක සිතිණි. සත්තකින්ම ඔහු කෙතරම් හිත හොඳ මිතුරෙක්ද..?

''හිත රිද්දගන්නෙ නැතුව ඉන්න.. මං ගිහින් එන්නම් නංගී..'' ඔහු එසේ කියා මා හා මමිතුරියන් ගෙන්ද සමු ගෙන යන්නට ගියේය.

''හාෂි මොනව නැතත් උඹ එක දෙයක් ලබල තියෙනව. හැම කෙනෙක්ගෙන්ම ආදරය, අනුකම්පාව ලබන්න උඹ පිං කරලා..'' අනෝජා කීවාය.

''මට ෂෙහාන් ගැන දුකයි අනෝ. මං හින්දනෙ මේ ඔක්කොම කරදර..'' මම යළිත් හඬමින් කීවෙමි.





''ඔය වගේ ප්‍රශ්නෙකදි විපතක් කර ගන්න තරම් ෂෙහාන් මෝඩයෙක් නෙමෙයි නෙ. උඹ බය නැතුව ඉඳින්.. හවසට දිලිප් එක්ක ඒවි..'' මධූකා මා සනසන්නට මෙන් කීවාය.

''ඒක නෙමෙයි දැන් අපි යන වෙලාවත් හරි.. හෙට එනකොට උඹට මොනවද ගේන්න ඕනැ..? ඕන දෙයක් කියපන්..'' අනෝජා මවෙත ළං වෙමින් කීවාය.

''මුකුත් එපා. මං බලන්න ආවට උඹලට පින් සිද්ද වෙනවා..'' මම යාන්තමට බිඳුණු හඬින් එසේ කියා ගතිමි.

''අනං මනං කල්පනා කරන්නෙපා.. හරියට බෙහෙත් ටික බීපන්.. අපි ආයෙ එනවා හොඳද..?'' වැඩිහිටියන් සේ ඔවුන් මට බොහෝ උපදෙස් හා අවවාද දී යන්නට ගියෝය.

ඔවුන්ගේ යාමත් සමගම මම යළිත් තනිවුණෙමි. මගේ කල්පනාව ෂෙහාන් වටා දැහැන්ගත වෙමින් තිබිණි.

මෙතෙක් කලක් අප දෙදෙනාගේ සබැඳියාව ෂෙහාන්ලාගේ නිවසට රහසක්ව තිබිණ. බාප්පා ගොස් කලබල කළ පසු ෂෙහාන්ලාගේ මවුපියන් කුමන පියවරක් ගනීවිදැයි යන බිය මහිතෙහි එක් කොනක රැඳී තිබිණ. සත්තකින්ම ෂෙහාන්ලාගේ පවුල හා සැසඳෙන්නට මගේ කිසිදු සුදුසුකමක් නොවිණ. මම මවක්, පියෙක්, නෑදෑයෙක් නොමැති, කිසිදු දේපොළකට හෝ වත් පොහොසත්කමකට හිමිකම් නොකියන අනාථ අසරණ කෙල්ලෙක්මි.

වරින් වර නින්දත් නොනින්දත් අතර කාලය ගත වී සවස රෝගීන් බලන වේලාව එළඹි විට මම කිසිවෙකුගේ පැමිණීමක් බලාපොරොත්තුවෙන් සිටියෙමි. කොයි මොහොතක හෝ දිලිප් අයියා සමග ෂෙහාන් පැමිණෙතැයි මට සිතිණ. සත්තකින්ම නෙත් යුවළ නේක පාරමී පුරන්නේ ඔහුගේ එකී ආදරණීයැතිම රුව දකින්නට නොවේද? සැනින් කොරිඩෝරයේ ඈතින් ෂෙහාන් වැන්නෙකු ගේ රුවක් මතුවිණ. මහිත සතුටින් පිරී යමින් තිබිණ. එහෙත් ළං වූ කල



Scanned by CamScanner

ඒ එමින් සිටියේ වෙනත් කවුදෝ කෙනෙකි. එනමුදු ඔහුට ද ඇත්තේ ෂෙහාන්ගේ රුවමය. වෙනසකට ඇත්තේ ඔහු ෂෙහාන්ට වඩා මදක් කලු වීමත් උඩු රැවුලක් තිබීමත්ය.

ඒ පැමිණි තැනැත්තා වාට්ටුවේ හෙදියකගෙන් යමක් විමසනවාත් හෙදිය මා දෙසට අත දිගු කරනවාත් දකීමෙන් මම තිගැස්සුණෙමි. මේ ෂෙහාන්ගේ අයියා නිශාන්වත්ද? මට නිකමට මෙන් සිතිණ. ඔහු මවෙත එමින් සිටියේය.

මේ එමින් සිටියේ ෂෙහාන්ගේ අයියා නිශාන් තාරුක ජයම්පතිම බව මට වැටහිණ. ඔහු පැමිණ මගේ ඇඳ අසල නැවතිණ. මම නිසල දෑසින් ඔහු දෙස බලා සිටියෙමි.

''ෂෙහාන් ආවද..?'' ඔහු මගෙන් විමසුවේය.

''නෑ.. ඔයා කවුද..?'' මම විමසීමි.

''මම ෂෙහාන්ගෙ අයිය.. භාෂිණී.. ඔයා හොස්පිට්ල් එකෙන් පිටවුණු දවසක මට කතා කරන්න තියෙනවා..'' ඔහු කීවේය.

මොනවාදැයි අසන්නට මට උවමනාව තිබිණි. එහෙත් ඒ බව අසන්නට තරම් දිරි සිතක් මට නොවිණ.

''ලෙඩ වෙලා ඉන්න කෙනෙකුගෙ හිත රිද්දන්න තරම් අමනුෂ්‍යයෙක් නෙමෙයි මං, ඒත්.. හුඟක් ඉක්මනටම මම භාෂිණීව මුණ ගැහෙනවා.. ඒක මතක තියා ගන්න.. මල්ලි ආවොත් කොහොම හරි ගෙදර එන්න කියන්න.. මං යනවා..'' ඔහු එසේ කියා යන්නට ගියේය.

සිතන්නට දෙයක් නැත. ඔහු මා හමුවන්නට ඇවැසි බව කීවේ ෂෙහාන්ගේත් මගේත් සම්බන්ධය නතර කළ යුතු බව කියන්නට විය යුතුය. සත්තකින්ම එය කළ හැකි දෙයක්ද? මම දිගු සුසුමක් හෙළීමි. එවන් දෑ සිතන්නට සිතන්නට මගේ හිස වඩ වඩාත් කකියන බැව් මට දැනිණ. මම තර කොට නෙතු පියා ගතිමි.



# 4

**සැනින්** කිසිවෙකු මගේ ඇඳ අසල රැඳෙන්නාක් මෙන් මට දැනිණ.

මම වහා නෙතු හැර බැලීමි. දෙවියනේ.. මට අදහාගත නොහැකි විය.

මේරි නැන්දා මා අසල සිටියාය. මා දකින්නේ සිහිනයක් දැයි මට සිතිණි. මම දෑස් පිස දැමුවෙමි.

''සුදු බේබි..'' ඇය දැඩි සෙනෙහසින් මගේ හිස අත ගෑවාය.

''නැන්දා කොහොමද දන්නෙ මං මෙහෙ කියලා..? නැන්දා බණ්ඩාරවෙල ඉඳලමද ආවෙ..? මේ ආව ගමන්ද..?'' මම ඇගෙන් එක දිගටම අසාගෙන ගියෙමි.

''ඊයෙ රාත්තිරියෙ ෂෙහාන් මහත්තය මාව හොයාගෙන බණ්ඩාරවෙල ආවා..''

''ෂෙහාන් බණ්ඩාරවෙල ආවා..?'' මම විස්මිතව ඇසුවෙමි.

''ඔව් බේබි.. ෂෙහාන් මහත්තය තමයි සුදු බේබි ඉස්පිරිතාලෙ ඉන්නවා කිව්වෙ.. මාව එක්කගෙන එන්ටයි කිව්ව ආවෙ.. මට ඒත් බය හිතුණා.. මං ඇහුව ඇයි මහත්තය හදිස්සියෙම කියලත්. ඒ ගමන කිව්වා සුදු බේබි ගාව නවතින්න කෙනෙක් ඕන කියලා.. ඒ සැරේ ඊයෙ රාත්තිරියෙම එහෙන් පිටත් වුණා බේබි..'' මේරි නැන්දා කීවාය. ඇගේ වතෙහි වූයේ කිව නොහැකි තරමේ වෙහෙසකාරී බවකි.



Scanned by CamScanner

''මගෙ රත්තරන්, දැන් බේබිට මොකද..?'' ඇගේ සෙනෙහබරිත ස්වරය මහිත සනසන සුළු විය.

අනේ මන්ද නැන්දෙ.. ඩොක්ටර්ස්ලත් තාම හරියකට දෙයක් කියන්නෙ නෑ. ඒත් ඉතිං මං ළඟ ඉන්න කෙනෙක් නතර කරන්න තරම් නං දැන් මට අමාරුවක් නෑ නැන්දෙ..'' මම කීවෙමි.

''ඒ වුණාට ෂෙහාන් මහත්තය කිව්වෙ නං බේබි ගාව කවුරු හරි නතර කරන්නම ඕන කියලයි..''

''ඉතින් නැන්දෙ දැන් කෝ ෂෙහාන්..?'' මෙතෙක් වේලා සිට කරගෙන සිටි පැනය මම විමසාලූයෙමි.

''දොස්තර මහත්තය හම්බ වෙලා එන්නම් කියලා ගියා.. දැන් එතව ඇති මයෙ හිතේ..''

''කොහොමද නැන්දෙ අළුත් විස්තර එහෙම..?'' මම විමසාලූයෙමි.

''ඒව පස්සෙ කතා කරමුකො බේබි.. ඉස්සර වෙලා බේබි ගැන කියන්ටකො..''

''අනේ මන්දා නැන්දෙ. මට මං ගැන කියලා කියන්න තියෙන්නෙ දුක හිතෙන දේවල් විතරයි නැන්දෙ..'' මම කීවෙමි.

''මං දන්නව බේබි, බේබිගෙන් ඈත් වෙලා මම ගියේ හිතකින් යන්න පුළුවන් ගමනක් නෙමේ බේබි.. ගිය දවස්වල මට ඉන්ට හිතුණෙම නෑ. සුදු බේබිට ලියමනක් ලියන්ට හිතුවත් ඒකත් බේබිගෙ හිතට දුකක් වෙයි කියලා හිතල ලිව්වෙ නෑ. දැන් ගෙදර තත්වෙ කොහොමද බේබි..?'' මේරි නැන්දා මගෙන් ඇසුවාය.

මම ඇය ගියදා පටන් සිදුවූ සියල්ල කීවෙමි. ඒ අසා ඇගේ දයාවැති නෙත් සඟල තුළ කඳුළු දිය පිරෙනු මම දුටුවෙමි.

''බේබි කෑවද..?''

''නෑ නැන්දෙ මේ කෑම එක තියෙනවා.. නැන්ද කෑවද..?''

''ඔව් බේබි. ෂෙහාන් මහත්තයා මට කෑම අරන් දුන්නා.. මං බේබිට





කවන්නද..?'' ඇය ඇසුවාය. දිගු කලකට පසුව ඇගේ සෙනෙහස සුපුරුදු පරිදි විඳ ගැන්මට මට අවැසි විණ. මම ඇගේ අදහසට එකඟ බැව් හඟවමින් හිස සෙලවීමි.

මේරි නැන්දා බත් පතෙන් පිඩ පිඩ ගුලි කොට මට කවන්නට වූවාය. මම ආසාවෙන් මුව ඇරීමි. සත්තකින් ම ඈ මට ආදරබර මවක්මය. ඇය මා අසල රැඳුණ හැම මොහොතකම මගේ ඕනෑ එපාකම් සොයා බැලුවාය. වෙනසකට තිබුණේ මම ඇගේ කුසින් බිහි නොවීම පමණක් නොවන්නේද?

''බේබි ෂෙහාන් මහත්තයා එනවා..'' මේරි නැන්දාගේ කියමනත් සමග මම හැරී බැලුවෙමි. ෂෙහාන් එමින් සිටියේය. මේරි නැන්දා අපට ඉඩ දෙමින් ඉවතට ගියාය.

''ෂෙහාන්..'' මම ආසාවෙන් තෙපලුවෙමි.

''බට්ටි.. දැන් කොහොමද ඔයාට..?''

''දැන් ටිකක් හොඳයි වගේ.. ඒක නෙමේ ෂෙහාන්.. ඔයා මොකද්ද මේ කරගත්තෙ..?'' මම දුක්බරව විමසීමි.

''මොකද්ද බට්ටි..?''

''ඔයා ගෙදරින් පිට වුණේ මං හින්ද නේද ෂෙහාන්..? මට හැම දෙයක්ම දිලිප් අයියා කිව්වා..''

''ඕවා. ගැන හිතන්න එපා බට්ටි. අපි ඒව ගැන පස්සෙ කතා කරමුකො.. මේරි නැන්දා ආව එක හොඳයිනෙ ඔයාට..?'' ඔහු කතාව වෙනතකට පෙරලමින් ඇසීය.

''අනේ ෂෙහාන් ඔයා හදිස්සියෙ බණ්ඩාරවෙල ගියා කිව්වම මට පුදුම හිතුණා. ඒ වුණාට දැන් මගෙ ළඟ කවුරුවත් නතර කරන්න ඕන නැනෙ..''

මා කී දේ අසා ඔහු නිහඬවම කල්පනා කරන්නට විය.

''ඇයි ෂෙහාන්..?'' මම විමසුවෙමි.



Scanned by CamScanner

''ඔයා ළඟ කවුරු හරි නතර කරන්න වෙනව බට්ටි.. මං දැන් එනකොට ඩොක්ටර් මුණ ගැහෙන්න ගියෙත් ඔයා ගාව මේරි නැන්දා නතර කළා කියන්න..''

ෂෙහාන් බිඳුණු හඬින් කීවේය.

''ඒ ඇයි..?''

''ඔයාට ඔපරේෂන් එකක් කරන්න තියෙනව බට්ටි..'' බොහෝ වේලාවක් නිහඬව සිට ෂෙහාන් කීවේය.

''ඔපරේෂන් එකක්..?'' මම විස්මිතව යහනෙහි හිඳ ගනිමින් ඇසුවෙමි.

''ඔව් බට්ටි..''

''ඇයි ෂෙහාන් ඔයා මට මෙච්චර වෙලා කිව්වෙ නැත්තෙ..?''

''මං කොහොමද බට්ටි ඒ වගේ දෙයක් එක පාරටම කියන්නෙ? ඔය ඔපරේෂන් එක ගැන ඩොක්ටර් මට කියල දැන් දවස් දෙක තුනක් විතර වෙනවා. ඔයා ළඟ නතර කරන්න මේරි නැන්දව එක්කන් ආවෙත් ඒකයි මං..''

''ඇයි ෂෙහාන්.. මට ඔපරේෂන් එකක් කරන්න තරම් අමාරුවක් නැහැනෙ..'' මම දුක්බර හඬින් කීවෙමි.

''ඔයාගෙ ඔළුව ඇතුළෙන් මොකක්දෝ ගෙඩියක් වගේ දෙයක් තියෙනව කියලා එක්ස්රේ එකට අහුවෙලා ඒකයි..''

''මට බයයි ෂෙහාන්..''

''බය වෙන්නෙපා බට්ටි.. ඔයාව සනීප කරගන්න කරන්න පුලුවන් හැම දෙයක්ම මම කරනවනෙ.''

''මැරෙන්න මං බය නෑ ෂෙහාන්. ඒත්.. මට ඔයාගෙන් වෙන් වෙන්න අමාරුයි..''

''ඔයා මොනවද මේ කියන්නෙ..?'' ෂෙහාන් නුරුස්නා හඬින්





මෙන් කීය.

''නෑ ෂෙහාන්.. ඔළුවෙ ඔපරේෂන් එකක් කරනව කියන්නෙ හුඟක්ම භයානක දෙයක්. මං දන්නව ෂෙහාන් මගෙ ලෙඩේ බැරෑරුම්කම ඔයාල හැමෝම මං හංගනව කියලා.. හැම ලෙඩෙකුටම ලෙඩේ නියම තත්ත්වය පැහැදිලි කරල කියන්නෙ නෑ කියලා මං දන්නව ෂෙහාන්..''

''නෑ බට්ටි.. බය වෙන්න තරම් දෙයක් නෑ.. පොඩි ඔපරේෂන් එකක් විතරයි..''

''ෂෙහාන්.. මට මොනව හරි වුණොත් ඔයා ගොඩක් කණගාටු වෙයි නේද..?'' මම ඇසෙන නෑසෙන හඬින් ඇසුවෙමි. ෂෙහාන් දුක්බර බැල්මකින් දෙනෙත පුරවාගෙන මදෙස බලාගෙන සිටියේය.

''මේ ආත්මෙදි අපි දෙන්නට එක් වෙන්න පුළුවන් වෙයිද කියලත් මට සැකයි ෂෙහාන්.. එහෙම බැරි වුණොත් ලබන ආත්මෙවත් අපි එකතු වෙන්න ප්‍රාර්ථනා කරමු ෂෙහාන්.. අම්ම ගාවට මං ආදරේ කළේ ඔයාට.. ඒ ආදරේ මට හරියට වටිනවා ෂෙහාන්.. සමහරවිට ඔයාට ඒක තේරුම් ගන්න බැරිව ඇති..'' මම එක දිගටම කියාගෙන කියාගෙන ගියෙමි. ෂෙහාන්ගේ දෑසෙහි කඳුළු නළියමින් තිබෙනු මම දුටුවෙමි.

''ජීවත් වෙලා හිටියත් අපි දෙන්නට එකතු වෙන්න බැරිව යාවි..'' මම බිඳුණු හඬින් කීවෙමි.

''ඔයා කොහොමද බට්ටියෙ එහෙම කියන්නෙ..?''

''ඔයාගෙ ගෙදරින් කවදාවත් මට කැමති වෙන්නෙ නැහැ ෂෙහාන්..''

''ඔයා කොහොමද දන්නෙ..?''

''ඔයාගෙ අයියා දවල් මාව හොයාගෙන ආවා..''

''නැහ්.. අපේ අයියා..?''



Scanned by CamScanner

''ඔව්.. ෂෙහාන්..''

''මොකද කිව්වෙ..?'' ෂෙහාන් කලබල වෙමින් ඇසීය. මම අයියා කියූ දෑ ඔහුට පැවසීමි. ඒ අසා ඔහු දිගු සුසුමක් හෙළීය.

''ෂෙහාන්.. අද ඔයා ගෙදර යනවද..?'' මම ඇසීමි.

''නෑ..''

''අනේ ෂෙහාන් කොහොම හරි යන්න..''

''මට බෑ බට්ටි..'' ඔහු යළිත් කීය.

''මං හින්දා ඔයා ගෙදර අය තරහ කරගන්න එපා.. ෂෙහාන් ඔයාලගෙ අම්මා කන්නෙ බොන්නෙත් නැතිව අඬනවලු.. අම්මනෙ ෂෙහාන්.. ඔයා යන්න..'' මා එසේ කී විට ඔහු බොහෝ වේලා කල්පනා කළේය.

''හොඳයි ඔයා කියන හින්දම මම යන්නම්.'' ෂෙහාන් පසුව කීය.

''ෂෙහාන්..'' මම සෙමින් මිමිණිමි.

''ඇයි බට්ටි..?''

''මං ඔයාට ගොඩක් ආදරෙයි ෂෙහාන්..''

''බට්ටි..'' ඔහු මගේ දෑත අල්ලා ගනිමින් තෙපළීය.

''ඔයාගෙ අත් දෙක හොඳටම උණුහුමයි ෂෙහාන්..'' මම ඔහුගේ දෝත මිරිකා ගනිමින් කීවෙමි.

''ඔයා දන්නවද අත් දෙක උණුහුම් කෙනෙකුට තියෙන්නෙ මොන වගේ හිතක්ද කියලා..?''

''නෑ..''

''හිතත් ඒ වගේම උණුහුම්.. ආදරෙන් පිරිලා..''

''ඔයා කොහොමද දන්නෙ..?''

''ඇයි මගෙ හිත ඒ වගේනෙ..''





ඔහු සිනාසෙමින් කීය.

''උඹනං මහ පුදුම සතෙක් ෂෙහාන්..'' සැනින් අප අතරට කඩා වැදුණ දිලිප් අයියාගේ හඬින් අපි දෙදෙනාම තිගැස්සී ගියෙමු.

''මොකද..?'' ෂෙහාන් විමසීය.

''මොකද? මං උදේ ඉඳන් උඹව හැම තැනම හොයනවා. අන්න උඹලගෙ ගෙදර ගිනි පත්තු වෙලා..'' දිලිප් අයියා හති හලමින් කීය.

''ඉතිං..''

''ඉතිං තමා. එක්කො යන තැනක් මට කියල යන්න ඕන.. බලපන් මං උදේ ඉඳන් රස්තියාදු වුණ රස්තියාදුවිල්ලක්..''

''මං ඊයෙ රෑ බණ්ඩාරවෙල ගියා දිලිප්.. යන ගමන් උඹට කතාව කියන්නම්..'' ෂෙහාන් කීය.

''නියමයි.. එක්කො කාට හරි පණිවිඩයක් තියලා යන්න ඕනෑ.. මේ හිටියා මේ නෑ.. උඹලගෙ අම්මා අඬන හැටි මතක් වෙනකොට ඇත්තමයි මට උඹත් එක්ක එන තරහ කියල වැඩක් නෑ..'' දිලිප් අයියා තරහින් මෙන් ෂෙහාට දොස් නැගුවේය.

''ඇති.. ඇති නවත්තපන්.. තව ටිකක් උඹත්තෙක්ක මෙතන හිටියොත් හොස්පිට්ල් එකෙන් අපිව පන්නයි.. උඹේ කට සංටාරයක්නෙ..''

''නෑ නංගි මං කියන්නෙ වැරැද්දක්ද..?'' දිලිප් අයියා මගෙන් විමසීය.

''නෑ.. නෑ.. උඹ හරි මම වැරදියි. ජේෂන්ට්ල බලන වෙලාවත් ඉවර වෙන්න ආව. යමං මට තව වැඩ වගයකුත් තියෙනවා..'' ෂෙහාන් කියද්දී මට දුක සිතිණ.

''එහෙනං බට්ටි.. අපි යන්නද..?'' ෂෙහාන් එසේ ඇසුව ද සත්තකින්ම ඔහුට සමුදිය හැකිද?

''මං යන්නං බට්ටි..'' එසේ කියමින් ඔහු මා නළලත මුදුනට දෙතොල තබා සිප ගත්තේය. දිලිප් අයියා සිනාසෙමින් ඉවත බලා



Scanned by CamScanner

ගත්තේය.

''සිපාවාර පවත්වල වෙන් වෙනකොට හිතපං වටෙත් මිනිස්සු ඉන්නවා කියලා..'' දිලිප් අයියා ෂෙහාන්ට එසේ කියද්දී මම ලැජ්ජාවෙන් කොට්ටයෙහි මුහුණ සඟවා ගතිමි.

ඔවුන් දෙදෙනා වාට්ටුවෙන් නික්ම යද්දී මේරි නැන්දා මා වෙත ආවාය.

''දැන් බේබිගෙ හිත සතුටුද..?'' ඇය සිනාසෙමින් ඇසුවාය.

''සුදු බේබි.. ඔය ගවුම මාරු කළානං හොඳයි නේද..?'' ඇය එසේ කියමින් ලොකර් එකේ තිබුණ ගවුමක් ගෙන මට අන්දවන්නට සූදානම් වූවා පමණි. ඇගේ දෑස් විස්මයෙන් මෙන් විසල් වෙනු මම දුටුවෙමි.

''ඇයි නැන්දෙ..?''

''සුදු බේබි අර බලන්න..'' ඇය එසේ කියද්දී මම රෝහලේ කොරිඩෝරය දෙස බැලීමි.

''සුදු බේබි, ලොකු මහත්තයා..'' මේරි නැන්දාගේ බියපත් හඬ මා තිගස්සවනු ලැබීය. මම හිස ඔසවා මේරි නැන්දා බලා හුන් දෙස බැලීමි. බාප්පා එමින් සිටියේය.

මට මා ගැන ප්‍රශ්නයක් නැත. එහෙත් කිසිවෙකුට නොපවසා නිවසින් සැඟවී ගිය මේරි නැන්දා යළිත් මා අසල හිඳිනු දැකීමෙන් බාප්පා කුමක් කරනු ඇත්දැයි මට සිතා ගත නොහැක.

බාප්පා කෙමෙන් කෙමෙන් අප වෙත ළඟා වෙමින් සිටියදී මම බලා සිටියෙමි.

''මේරි..'' බාප්පා දෙනෙත් කුඩා කරමින් මේරි නැන්දා දෙස බැලීය. මේරි නැන්දා බිම බලාගෙන සිටියාය.

''ඇයි මේරිගෙ කණ ඇහෙන්නෙ නැද්ද..?'' බාප්පා වේගවත්ව ඇසීය.





''ඇයි මේරිගෙ කණ ඇහෙන්නෙ නැද්ද..?'' බාප්පා වේගවත්ව ඇසීය.

''ම.. ම.. මහත්තයා..'' ඇය ගොත ගසමින් කීවාය.

''උඹ කොහේ ඉඳලද මෙහෙ ආවෙ..?''

''බණ්ඩාරවෙල ඉඳලා මහත්තයා..''

''බණ්ඩාරවෙල ඉඳලා..'' බාප්පා විමතියෙන් මෙන් කීවේය.

''එහෙමයි..''

''මට දැන් සේරම හිතා ගත්තැකි මේකි තමයි මේ සේරම කරන්නෙ..''

''උඹේ අනුදැනුම උඩ තමයි මේ ගෑණි ගෙදරින් පැනල ගියේ.. දැන් උඹ ඒ ගෑනිට පණිවිඩ යවල මෙහෙට ගෙන්න ගෙන..'' බාප්පා පුපුරමින් කීවේය.

''සුදු බේබිගෙ වැරැද්දක් නෑ මහත්තයා.. මට ආරංචි වුණා සුදු බේබි ඉස්පිරිතාලෙ කියලා.. දැන ගත්ත ම තමයි මහත්තයො මම සුදු බේබිව බලන්න ආවෙ..'' මේරි නැන්දා එසේ කියද්දී මහිතට කිසියම් අස්වැසිල්ලක් දැනිණ.

''කට වහ ගනින් ගෑනියෙ.. වැරදි කරල මදිවට මට තව බොරු කියන්නත් එනවා..'' බාප්පාගේ එකී හඬින් මේරි නැන්දා නිහඬ වූවාය.

මම නෙත පිරෙන කඳුළු සිර කර ගන්නට උත්සාහ ගනිමින් සිටිමි.

''ඔව කියපල්ල කොණ්ඩෙ බැඳපු වීනුන්ට..'' බාප්පා යළිත් වේගවත්ව කීවේය. එකී හඬින් අවට ඇඳන්වල හුන් රෝගීන් කිහිප දෙනෙකු අප දෙස හැරී බලනවා මම නෙතඟින් දුටුවෙමි. ලැජ්ජාව සංතාප බව, දුක්බර බව මහිතෙහි රැකවල්ලා ගෙන තිබිණි. අහිංසක මේරි නැන්දා පවා නිකරුණේ බැණුම් අසන්නේ මා නිසා නොවන්නේද..? මගේ ජීවිතය මට පමණක් නොව අනුන් හට ද කරදරයක් වී ඇති සැටි.



Scanned by CamScanner

''හාෂිණී..'' බාප්පාගේ ගැඹුරු හඬින් මම තිගැස්සුණෙමි. මම නෙත් අයා ඔහු දෙස බැලීමි.

''අම්ම ළඟ තිබුණ අර බණ්ඩාරවෙල වත්තෙ ඔප්පුව කෝ..?''

''මොන ඔප්පුවක්ද..?''

''අර අම්ම ගාව තිබුණෙ..'' ඔහු පැමිණ ඇත්තේ අම්මා සතුව තිබූ බණ්ඩාරවෙල වත්තේ ඔප්පුව සෙවීමටය. මෙතෙක් කලක් ඔහු මා සමග කිසිම මොහොතක සුහදව කතා බහ කොට තිබුණේ නැත.

බාප්පා කියූ එකී ඔප්පුව මගේ කුඩා අල්මාරිය පත්ලෙහි එලා තිබූ කඩදාසිය යට තබා තිබුණා මට මතකය. එහෙත් ඒ බව බාප්පාට කියන්නට මට නොසිතිණ.

මට එසේ සිතුණේ කුමක් නිසාදැයි මටම වටහා ගත නොහැක.

''කෝ..?'' බාප්පා යළිත් ඇසීය.

''මං දන්නෙ නෑ..'' මම තිර හඬින් කීමි.

''ඒවයේ අයිතිය මටත් තියෙනවා..'' බාප්පාගේ එකී කතාවෙන් මම කෝපයට පත්වීමි.

''ඉඩ කඩම්වල අයිතිය විතරද මතක..? ඇයි මගෙ අයිතිය මතක නැද්ද..?'' මම වේගයෙන් ඇසීමි.

''හාෂිණී මේක හොස්පිට්ල් එක නිසා මම ඉවසනවා.. හොඳ හිතින් මට කියනවා ඔප්පුව කොහෙද කියලා..'' බාප්පා මට අණ කළේය.

''මං දැන් සැරයක් කිව්වනෙ මං දන්නෙ නෑ කියලා..'' මම වේගවත්ව කියා සිටියෙමි.

''හොඳයි මම හොයා ගන්නම්.. හැබැයි උඹ හිතන්න එපා ඒ ඉඩකඩම් උඹට අයිති කර ගන්න..'' බාප්පා එසේ කියා තරහින් යන්නට ගියේය.





මම දිගු සුසුමක් හෙළමින් මේරි නැන්දා දෙස බැලීමි.

''මං හිතුව සුදු බේබි ගැන ලොකු මහත්තයගෙ හිතේ ටිකක් හරි ළෙන්ගතුකමක් ඇති කියලා..''

''ඒත්..''

කියා මේරි නැන්දා දිගු සුසුමක් හෙලුවාය.

''දැන් ගිහින්, ගෙදර පෙරලගෙන ඔප්පුව හොයාවි..'' මම සිහින් හඬින් කීවෙමි.

''ඇත්තටම බේබි ඒක කොහෙද තියෙන්නෙ..?'' මේරි නැන්දා මා වෙත ළං වෙමින් ඇසුවාය.

''මගෙ අල්මාරියෙ අඩියෙ..''

''ලොකු මහත්තයා හොයා ගනීවිද..?''

''නෑ ඒක එයාලට හොයාගන්න බෑ..'' මම කීවෙමි.

''මං එකක් කියන්නම් බේබි.. ඒක විතරක් ලොකු මහත්තයට දෙන්න එපා.. මං ඔය බණ්ඩාරවෙල වත්තෙ සේරම විස්තර දන්නවා.. ලොකු මහත්තයා එහෙන් එනකොට ඔක්කොම වික්කත් ඔය වත්ත වික්කෙ නෑ.. මොකද ඒකෙ ඔප්පුව තිබ්බෙ ලොකු මැණිකෙගෙ නමට නිසා.. කවද හරි ඒක විතරයි සුදු බේබිට අයිති වෙන්නෙ..'' මේරි නැන්දා අවවාදාත්මකව කීවාය.

''මට ඕව ගැන ආසාවක් නෑ නැන්දෙ.. මට කොයි තරම් දේවල් නැති වුණාද? ඔය කොහේවත් තියෙන ඉඩමක් නැති වුණා කියලා මට අමුතු දුකක් නෑ..''

''එහෙම කියන්න එපා බේබි.. බේබිට තාම තේරෙන්නෙ නෑ.. සුදු බේබිගෙ අනාගතේට කියලවත් මොනවා හරි දෙයක් තියෙන්න ඕනැනෙ..''

''අනේ මන්දා නැන්දෙ මගෙ ඔලුවත් කකියනවා..'' මම සුරතේ ඇඟිලි තුඩු වලින් නළල මිරිකා ගනිමින් කීවෙමි.



Scanned by CamScanner

''බේබි, ලොකු දොස්තර මහත්තයා එනවා..''

''කොහොමද භාෂිණී..?'' වෛද්‍යවරයා දයාවැති සිනා පා මා පිරික්සමින් ඇසීය.

''මගෙ ඔලුව ආයෙත් කකියනවා ඩොක්ටර්..''

''ම්හ්.. හෙට දෙකට ඔයාව තියටර් රූම් එකට ගන්නවා ඔපරේෂන් එක කරන්න.. අද රෑ ඉඳලා මොනවත් කන්න එපා හොඳද..?'' වෛද්‍යවරයා එසේ කියමින් එහා ඇඳේ රෝගියා කරා ගියේය.

ඒ ඇසූ මොහොතේදී මගේ ගත සිත සීතලව යමින් තිබිණි. සැත්කමක්.. දෙවියනේ හිසේ සැත්කමක්.

මම හඬන්නට වීමි. මුණින් පෙරළී කොට්ටය සපාගෙන මම හඬා වැටුණෙමි.

''සුදු බේබි, ඇයි මයෙ රත්තරං අඬන්නෙ..?'' මේරි නැන්දා දයාර්ද්‍ර හඬින් මගේ පිට අත ගාමින් ඇසුවාය.

''මට බෑ නැන්දෙ මට බෑ..''

''මොනවද සුදු බේබි බැරි..?''

''ඔපරේෂන් එක කරන්න දෙන්න බෑ..'' මම හඬා වැටෙමින් කියා සිටියෙමි.

''එහෙම කියල පුලුවන්ද..? ලෙඩක් තියෙනවනං ඒක හොඳ කරගන්ට එපායැ ඔක්කොටම කලියෙන්..'' මේරි නැන්දාගේ හඬෙහි වූ තරවටුව මට දැනිණි.

''මං දන්නව නැන්දෙ මේ ඔපරේෂන් එක කළාට පස්සෙ මං ජීවත් වෙන එකක් නෑ කියලා..'' මම කොට්ටය මත දෙවැලමිට තබාගෙන හිස ඔසවා කීමි.

''බේබිට පිස්සුද..?''

''ඔව් නැන්දෙ මං අහල තියෙනවා ඔලුව ඇතුළෙ ඔපරේෂන්





එකක් කළාම සිහිය එන්නෙත් නැතුව මැරෙනවා කියලා..''

''මොන බොරුද සුදු බේබි..?''

''මං මැරෙන්න බය නෑ.. ඒත් මං දන්නවා එහෙම දෙයක් වුණොත් ෂෙහාන්ට ඒක දරා ගන්න බෑ කියලා.. මං අඬන්නෙ ඒකටයි නැන්දෙ..''

''අනේ සුදු බේබි ඔව ගැන කියන්ට එපා.. බේබි ගැන මගෙ පපු කැනැත්තෙ ඇවිලෙන දුක දන්නෙ මං විතරයි..'' මේරි නැන්දා පහතට නැමී රෙදි පට ඔසවා කඳුලු පිස දමමින් කීවාය.

මම නිහඬ වීමි. ඇගේ හිත තව තවත් රිදවාලන්නට බැරිකමට මම නිහඬ විමි.

* * * * *

රැය ගෙවී යමින් තිබිණ. රැහැයියන්ගේත්, පළඟැටියන්ගේත් සවන්පත් සිදුරු කරන හඬ රෝහලේ කොරිඩෝරයට මඳක් එහායින් තිබූ මල් ගාල දෙසින් ඇසිණ.

එකී සීතලම සීතල රාත්‍රියේ සුසුම කඳුළ මට තනි රැක්කේය. රැය පහන් වූයේ එලෙසිනි.

''සුදු බේබි උදේට කන්න එපා..'' උදෑසන ම මේරි නැන්දා මට අවවාද කළාය.

එහෙත් දහවල් වෙද්දී මට කුස ගින්දර වැඩි වැඩියෙන් දැනෙමින් තිබිණ.

''ඉන්න බෑ මේරි නැන්දෙ බඩගිනියි..'' මම කෙඳිරි ගෑවෙමි. මේරි නැන්දා සිනාසුණාය.

''සුදු බේබි පුංචි කෙනෙක් වගේනෙ.. කොයි දේත් ඉවසා දරා ගන්න පුරුදු වෙන්න ඕනැ..''

''ඒ වුණාට..'' මම නහයෙන් ඇඬුවෙමි.



Scanned by CamScanner

"ඒ වුණාට කියලා බෑ.."

දහවල රෝගීන් බලන වේලාව පැමිණෙන තෙක් මම නොඉවසිලිමත් වීමි. මගේ නොඉවසුම් බව බිඳලමින් ෂෙහාන්, දිලිප් සමග මවෙත ආවේය.

"ෂෙහාන් අද දෙකට මාව ඔපරේෂන් කරනවා.." මම ඔහු දුටු සැනින් කීවෙමි.

"මම දන්නව බට්ටි. අපි දැන් එන ගමන් ඩොක්ටර්ව මීට් වෙලයි ආවෙ.."

"ඔයාට නං ගානක් වත් නෑ.." මම නෝක්කාඩු හඬින් කීවෙමි. ඔහු කිසිවක් නොපවසා නිහඬවම ඉවත බලා ගත්තේය. මා නොසිතා කී කතාවෙන් ඔහු සිත රිදුන බැව් මට වැටහිණ.

"අනේ ෂෙහාන් මං හිතන්නෙ නැතුව එහෙම කිවුවෙ.. ගණන් ගන්නෙපා ෂෙහාන්.." මම ඔහුගේ අතින් ඇද කීවෙමි.

"නෑ.." කියමින් ෂෙහාන් සිනාසෙන්නට උත්සාහ ගත්තේය.

"හේයි.." සැනින් කඩා වැදුණ මමිතුරියන්ගෙන් ෂෙහානුත් මමත් තිගැස්සී ගියෙමු.

"මේ ග්‍රවුන්ඩ් එක කියල හිතුවද..?" දිලිප් අයියා ඔවුන් දෙස අමුතු විදියකට බලමින් කීය.

"අපිට කොහෙත් එකයි දන්නවද..?" එසේ කියමින් නිරෝෂා මවෙත ළං වූවාය.

"ඉතිං.." ඔවුන් කතාව මුල පුරද්දී ෂෙහාන් මගේ ඇඳ පාමුල සිටගෙන සිටියේය.

"මෙයාව දෙකට ඔපරේෂන් එකට ගන්නවා.." ෂෙහාන් මමිතුරියන්ට කියද්දී ඔවුන්ගේ දෑස් විස්මයෙන් විසල් වෙනු මම දුටුවෙමි.

"අද..?"





"ඔව්.."

"ඇත්තද භාෂිණී මේ කියන්නෙ..?"

ඔවුන් එසේ අසද්දී මට හැඬිණ. කිසියම් අසරණ බවක් මසිතෙහි දවටෙමින් තිබිණ.

"භාෂිණී අඬන්නෙපා. හිත තද කර ගනින්.. උඹට පුළුවන් මේ අවස්ථාවට මුහුණ දෙන්න.." තේජා මගේ හිස මුදු ලෙස පිරිමදිමින් කීවාය.

"ඔව් භාෂි, මෙච්චර දුක් කරදර විඳගන්න පුළුවන් වුණා නම් උඹට මේ තත්ත්වෙට මුහුණ දෙන්නත් පුළුවන් භාෂි.." මධුකා ද කීවාය.

"උඹ තනිවෙලා නෑ.. හැම තිස්සෙම අපි උඹට ඉන්නවා කියලා හිතපන්.." දීප්ති මගේ දෑත අල්ලා ගනිමින් කීවාය.

"මට බය හිතෙනවා.." මම කීවෙමි.

"බය වෙන්න දෙයක් නැනෙ භාෂි.. වෛද්‍ය ක්‍රම හුඟාක්ම දියුණු කාලයක්නෙ මේක.." අනෝජා මගෙ හිත සනසන්නට වූවාය.

රෝගියෙකුගේ තත්ත්වය කොතරම් බැරෑරුම් වුවද රෝගියාට ඒ බව නොකියා සිත දිරිමත් කළ යුතු බව මම දැන සිටියෙමි. ඔවුන් ද මේ කරන්නේ එය නොවේද..?

මමිතුරියෝ මා සමග බොහෝ වේලා කතාබහ කරමින් සිටියහ. අවසානයේදී ඔවුන් මගෙන් සමුගෙන නික්ම ගියහ.

ඒ සමග ෂෙහාන් මවෙත ළං විණ.

"බඩගිනියි ෂෙහාන්.. මේරි නැන්දා මට කන්නවත් දෙන්නෙ නැනෙ.." මම පැමිණිලි කරන කුඩා දරුවෙකු සේ කීවෙමි.

"දොස්තර මහත්තයා එපා කිව්වට පස්සෙ කොහොමද මහත්තය කන්න දෙන්නෙ.." මේරි නැන්දා සිනාසෙමින් ඇසුවාය.

"හොඳ වැඩේ නේද නැන්දෙ..?" ෂෙහාන් මදෙස ආදරයෙන්



Scanned by CamScanner

බලමින් කීය.

මේරි නැන්දා අපට ඉඩ දී ඉවතට ගියාය.

''බට්ටී..'' ඔහුගේ ආදරණීය හඬ මට ඇසිණ.

''මට බයයි වගේ..''

''බය වෙන්නෙපා බට්ටී..''

''ඔයාල දැන් යනවද..?'' මම ඔහුගෙන් විමසුවෙමි.

''එකට අපි වෝඩ් එකෙන් එළියට ගිහින් ඉන්නම්.. මට ඩොක්ටර් පර්මිෂන් දුන්නා තියටර් රූම් එකට ඔයාව ගන්න කලින් කතා කරන්න දෙන්නම් කියලා..''

''ඇත්තද ආ..'' මම සතුටින් ඇසීමි.

එකී කෙටි කාලය තුළ අපි බොහෝ දෑ කතා කළෙමු.

එකයි දහය පමණ වන විට ෂෙහාන් දිලිප් අයියා සමගින් වාට්ටුවෙන් පිට විණ.

ටික වේලාවකට පසු හෙදියක් මා අසලට පැමිණ මට සුදු ඇඳුමක් අන්දා සුදු හිස් වැස්මක් පැළැන්දුවාය.

ඒ ඇඳුමේ නුහුරු බවත් මා සමග මා මලානික වෙමින් සිටින බැව් මටම දැනිණි. මගේ දෑත සීතල වී තිබිණ. මේරි නැන්දා බයාදු බැල්මක් නගාගෙන මා අසලම දැවටෙමින් සිටියාය.

කාලය ගෙවෙමින් තිබිණ. හෙදියකත්, රෝහල් සේවකයෙකුත් මා ට්‍රොලි ඇඳක තබාගෙන ශල්‍යාගාරය දෙසට රැගෙන ගියහ. මේරි නැන්දා මා අසලින්ම ගියාය.

ශල්‍යාගාර දොරකඩ හමුවේ ෂෙහාන් සිටියේය.

''ෂෙහාන්..'' මම හඬාගෙනම ඔහුගේ සිරුරෙහි එල්ලුණෙමි.

''හිත ධෛර්යමත් කර ගන්න බට්ටියෙ.. බය වෙන්නෙපා ඔයාට බුදු සරණයි.. යන්න ඉතිං..'' ෂෙහාන් එසේ කියද්දී ඔහුගේ දෑසෙහි





නලියන කඳුළු මම දුටුවෙමි. මේරි නැන්දා ද නෑසෙන සේ හඬමින් සිටිය ද මම ඇය හඬන බව දැන සිටියෙමි.

''ෂෙහාන් මම යනවා..'' ආයාසයෙන් එසේ කියා ගත්තෙමි. මා ශල්‍යාගාර දොරටුවෙන් ඇතුල් කළ සැනින් දොර වැසී ගියේය.

ඒ දැවැන්ත දොර මාවත්, මේරි නැන්දා හා ෂෙහාන්වත් වෙන් කොට තිබිණි. මා දොර දෙස බලාගෙන සුසුම් හෙළමින් හඬද්දී කිසිවෙකු පැමිණ මගේ අතින් අල්ලා ගනු මට දැනිණි.

මුහුණ පමණක් පෙනෙන සේ හිස් වැස්මක් සහ සුදු කබායක් දමාගත් ප්‍රධාන වෛද්‍යවරයා මා අතින් අල්ලාගෙන සිටියේය. ඔහු අසල හෙදියක සිටියාය. මම අසරණ දෑසින් දෙදෙනා දෙස මාරුවෙන් මාරුවට බලන්නට වීමි.

''දුව ඇයි බය වෙලා වගේ..?'' වෛද්‍යවරයා කාරුණික හඬින් විමසීය. මම නිහඬවම බලා සිටියෙමි. වායු සමනය කළ කාමරයේ පැවැති තද සීතෙන් පවා මසිත තව තවත් දුබල කරමින් තිබිණ.

''නර්ස් මෙයාව එක්ක යන්න..'' වෛද්‍යවරයා අණ කළේය. රූකඩයක් සේ මම ද ඇය සමග ගියෙමි. එකී කාමරයේ සැත්කම් වලට සූදානම් කළ මා වැන්නවුන් කිහිප දෙනෙකු අසුන් ගෙන සිටියහ. ඒ සමග තවත් හෙදියක පැමිණ මා ට්‍රොලි ඇඳෙහි සිටියදීම කිසියම් බෙහෙතක් මගේ වම් අතට එන්නත් කළාය. එහි වේදනාවෙන් මගේ දෑසෙහි කඳුළු පිරිණ. මම දකුණු උරය මඳක් උස් කොට එහි දෙනෙත් ඇතිල්ලීමි.

මඳ වේලාවකට පසු කාමරයේ තවත් පසෙකින් දොරක් විවර වින.

''භාෂිණී..'' ඉන් මතු වූ ප්‍රධාන වෛද්‍යවරයා මා ඇමතීය. මම හිස ඔසවා ඔහු දෙස බැලීමි. වෛද්‍යවරයා හෙදියන් හට කළ කිසියම් සංඥාවකින් ඔවුන් මා ට්‍රොලි ඇඳෙන් ඔසවා ඔහු සැත්කම් කරනු ලබන ඇඳ මත තබනු ලැබීය.



Scanned by CamScanner

''භාෂිණී මොකද මේ බය වෙලා වගේ..?'' ප්‍රධාන වෛද්‍යවරයා හුරු පුරුදු කාරුණික හඬින් ම විමසීය. මම නිහඬවම බලා සිටියෙමි. කවාකාර දැවැන්ත පහන් දෙසත් ලෙයින් පෙඟුණු පුළුන් කැබලි බහා ලූ භාජන දෙසත්, විවිධාකාර වූ පිහි තල, අඬු, කතුරු සහිත භාජන දෙසත් මම බිය මුසු බැල්මෙන් යුතුව බලා සිටියෙමි.

''බය වෙන්න එපා භාෂිණී..'' වෛද්‍යවරුන් හා හෙදියන් කාරුණිකව මා සනසන්නට උත්සාහ ගනිති.

හෙදියක විසින් විදින ලද තවත් බෙහෙතකින් පසුව මට වෙනසක් ඇති විය.

කෙමෙන් කෙමෙන් මා නිද්‍රා ගත වෙන්නාක් සේ මට දැනිණ. කිසිවක් සිතා ගන්නට නොහැකි සැහැල්ලු ලෝකයක මා පාව යන්නාක් සේ මට දැනිණ. එතැන් සිට මට වූයේ කුමක්දැයි යන්න පවා මම නොදැන සිටියෙමි.



# 5

**බොහෝ** වේලාවකට පමණ පසු මට අවදි වෙන්නට අවැසිව තිබිණ. එහෙත් මම නෙත් හැර පියා ගත නොහී සිටියෙමි. කිසියම් වේදනාවක් දැනෙමින් තිබුණද එකී වේදනාව සිරුරේ කුමන අංශයකින් නැගුණේ දැයි යන්න වටහා ගන්නට තරම් මනස පැහැදිලි නැත. මම සෙමෙන් දෙනෙත් හැරීමි. කිසිවක් පැහැදිලි නැත. එහෙත් වේදනාව වැඩි වැඩියෙන් දැනෙමින් තිබිණ. මට කෙඳිරි ගෑවිණි.

''සුදු බේබි..'' කාගෙදෝ ඇමතුම් හඬක් ඇසුණද ඒ කාගේ දැයි වටහාගත නොහැකිවිණ.

මම වරින් වර නෙතු පිය සැලීමි. බොඳව ගිය පරිසරය පැහැදිලි වෙමින් තිබිණ. මම මේරි නැන්දාව දුටුවෙමි. ඇගේ කාරුණික දෑස් හරහා ඇදී ගිය කඳුළු රේඛා මම දුටුවෙමි.

''සුදු බේබි..'' මේරි නැන්දා ඇඬුම් ස්වරයෙන් මා ඇමතුවාය.

''නැන්දෙ.. මට වතුර ටිකක්..'' වියළී ගිය තොල් පට දිවගින් තෙත් කරමින් මම ආයාසයෙන් කියා ගතිමි.

''අනේ බේබි වතුර දෙන්න එපා කියලා ලොකු දොස්තර මහත්තයා කිව්වා..''

දරාගත නොහැකි වේදනාව හිස පෙදෙසින් නැගෙමින් තිබෙන බව ඒ වන විට මට වැටහෙමින් තිබිණ.

''හා.. හා.. බේබි ගැලවෙයි..'' මේරි නැන්දා එසේ කියමින් මා සුරත ඇඳ මත තබා අල්ලා ගත්තාය. මම හිස මඳක් හරවා එදෙස



Scanned by CamScanner

බැලීමි.

සුරතෙහි පිටි අල්ල පසාරු කර සේලයින් කටුවක් ගසා තිබිණ. කටුව ගැසූ තැන වටා නිල් පෑ මුසු රත් පැහැයක් ගෙන තිබිණ. මම කටුවට සවි කොට තිබූ වයරය ඔස්සේ ඉහළ බැලීමි. ආධාරකයේ ඉහළ එල්ලා තිබූ වයරයට සම්බන්ධ වූ සේලයින් බෝතලයෙන් අඩක් හිස්ව තිබිණි.

''ඔය දෙවැනි බෝතලේ බේබි..'' මට මේරි නැන්දාගේ හඬ ඇසිණි. මම වමත ඔසවා හිස පෙදෙස අත ගෑවෙමි. හිස වටා වට ගණනක් එතූ වෙළුම් පටිවල තද බව මට දැනිණ.

''දනව හරියටවත්..'' මම මුහුණ ඇද කරමින් කීවෙමි.

''ඇයි දෙයියනේ අමු අමුවෙ කැපුවම දැවිල්ල නැද්ද..?'' මේරි නැන්දා මගේ නළලත පිරිමදිමින් කීවාය.

''ෂෙහාන් ආවෙ නැද්ද නැන්දෙ..?''

''හවස ආවා.. එතකොටත් බේබිට සිහිය නෑ.. ෂෙහාන් මහත්තයට නං හරි දුකයි..'' මුළු සිරුරම තලා පෙලා දැමුවාක් සේය. කතා කිරීමට අවැසිව තිබුණද ඊට බලවත් ආයාසයක් ගත යුතුව තිබිණ.

''නැන්දෙ මට ඉන්න බෑ නැන්දෙ..'' මම තොල් මතුරමින් හඬන්නට වීමි.

''එපා බේබි අඬන්න.. දැන් බය වෙන්ට දෙයක් නැහැනෙ.. නාඩා නිදා ගන්න බලන්ට.. හොඳ බේබිනෙ..'' මේරි නැන්දා කියනු මට ඇසිණ.

මවක ගේ පියෙකු ගේ සෙනෙහසේ අඩු බව මට වඩ වඩාත් දැනෙමින් තිබිණ. සත්තකින්ම මෙවන් මොහොතක ළය හුනු නොවන පියෙකුගේ සිතක් තවත් මිහිපිට වෙත්දැයි මට සිතිණ. වේදනාව, සිත් තැවිලි බව නිසාම මගේ අසරණකම, අනාථකම, මහිත පුරාම කා වදිමින් තිබිණ. කඳුළු දිය කොපුල් තල ඔස්සේ නිරතුරුව ගලා යමින්





තිබිණ.

''අනේ බේබි.. අඬන්න එපා තුණුරුවන්ගෙ පිහිටෙන් බේබි ඉක්මනට හොඳ වේවි.. සුදු බේබි.. මං කතරගමට බාරෙකුත් වුණා...'' මේරි නැන්දා කඳුළු සලමින් කීවාය. මවක විසින් කළ යුතු දෑ ඇය කිසිදු පැකිළීමක් නොමැතිව කරන සැටි..

''මට හරි තිබහයි.. අනේ වතුර ටිකක්..'' මම පින්සෙන්ඩු වීමි.

''අනේ බේබි ටිකක් ඉවසන්න..''

''අනේ..'' යි කියමින් මම යළිත් හඬන්නට වීමි.

''බේබි නාඩා ඉන්ට ඔන්න දොස්තර මහත්තයා එනවා..'' මේරි නැන්දා මගෙ කඳුළු පිසලමින් කීවාය.

දහවල රෝගීන් බලන පැයේදී ෂෙහාන් මා බලන්නට පැමිණියේය. ඔහුගේ වත බොහෝ වෙහෙසකර, මලානික බවක් ගෙන තිබිණ. දෙනෙත ද මඳක් ඉදිමී ඇතිසේය. මහිතෙහි ඔහු කෙරේ අප්‍රමාණ වූ දුකක් ඇති විණ.

''බට්ටි..'' මුදු ලෙසින් කොඳුලමින් ඔහු මවෙත ළංවිය.

''ෂෙහාන්..'' මම කෙඳිරුම් ස්වරයෙන් අමතාලූයෙමි.

''අනේ බට්ටි..'' ඔහු මගේ වෙලුම් සහිත හිස දෙසත්, සුරතට කාවද්දා තිබූ සේලයින් කටුව දෙසත් මාරුවෙන් මාරුවට බලමින් කීවෙමි.

''රිදෙනව ෂෙහාන් හරියට..'' මම කීවෙමි.

''මට දැනෙනවා බට්ටි ඔයා විඳින දුක.. ඒත් දැන් ඉතින් සනීප වෙනවනෙ..'' ඔහු එසේ කියමින් මගේ නළල මුදුවට පිරිමැදීය. ඒ සුරතෙහි පහසින් සහනයක් දැනුණ බැවින් මම නෙත් පියා ගතිමි.

ආත්මීය ගත වූ සෙනෙහසක පහස මහිත තුටින් කළඹාලමින් තිබිණ.



Scanned by CamScanner

''ෂෙහාන්..'' මුදුවට ඔහු අමතාලීමි.

''ඇයි බට්ටියෙ..?''

''මං හිතුවෙ නෑ ෂෙහාන් ආයෙම මෙහෙම ඔයාව දකින්න ලැබෙයි කියලා..''

''පිස්සු කෙල්ල.. ඒක නෙමේ දෙන බෙහෙත් බොනවද..?''

''අනේ ෂෙහාන් මහත්තය, සුදු බේබිට බෙහෙත් පොවා ගන්න තියෙන අමාරුයක්.. පොඩි එකෙකුට එහා..'' මේරි නැන්දා ද අප අසලට එමින් කීවාය.

''ඇත්තද..?'' ෂෙහාන් මදෙස දයාබර ලෙස බලමින් ඇසීය. මම කිසිවක් නොපවසා බලා සිටියෙමි.

''බෙහෙත් ටික හරියට බොන්න හොඳද..?'' ඔහු අවවාද කරන සේ කීවේය.

''ෂෙහාන් අර එන්නෙ දිලිප් අයියා නේද..?''

''ඔව් එයා මාත් එක්ක ඇවිත් කවුද යාළුවෙක් දැකල එළියෙ නතර වුණා..'' ෂෙහාන් කීවේය.

''මචං..'' දිලිප් අයියා කලබල ස්වරයෙන් කීය.

''මොකද..? උඹ මහසෝනාවත් දැක්කද..?''

''මහසෝනා නෙමෙයි.. අන්න උඹලගෙ අයියා එනවා..''

''මෙහාට..?''

''නැත්තං.. මං දැක්කෙ වෝඩ් සෙවන් ළඟදී.. ටක් ගාලා මං පැන්න..''

''දැන් මොකද කරන්නෙ ෂෙහාන්..'' මම සෙමින් ඇසුවෙමි.

''මොනව කරන්නද..? ඔයා බය නැතුව ඉන්න..''

''ෂෙහාන් දිලිප් අයියත් එක්ක ඔයා යන්න ඉක්මනට..''

''කොහෙවත් යන්න ඕන නෑ බට්ටි..''





''අනේ ෂෙහාන් මං හින්ද අයියත් එක්ක ප්‍රශ්න ඇති කර ගන්නවට මම කැමති නෑ ෂෙහාන්..'' මම අයැද සිටියෙමි.

''කවද හරි මේව එයාල දැන ගන්නත් ඕනනෙ.. අනික බය ගුල්ලෙක් වගේ පැනල දුවන්න මං කැමතිම නෑ..'' ෂෙහාන් මුරණ්ඩු හඬින් කියා සිටියේය. මම හඬන්නට වීමි.

''මේ වගේ වෙලාවකටවත් මේ අහිංසක කෙල්ලගෙ තත්ත්වේ ගැන හිතල යමං..'' දිලිප් අයියාද කීවේය. ෂෙහාන් ඔහු දෙස රවා බැලීය.

''අනේ මන්දා බං උඹට කියන කට හොඳයි ගලක අතුල්ල ගන්නවා..'' දිලිප් අයියා කලකිරීම මුසු හඬින් කියා සිටියේය.

''ඔන්න..'' දිලිප් අයියා එක්වරම එහෙත් සෙමෙන් කියා සිටියේය.

ෂෙහාන්ගේ අයියා අප අසලට පැමිණෙනු මට යාන්තමට පෙනිණි. හිනා පොදක වගකුදු ඔහු වත අසලකුදු නොතිබිණ.

''මල්ලී..'' ඔහු මඳක් සැරෙන් කියමින් මදෙස බැලීය. සැනින් ඔහුගේ දෙනෙත් විසල් වෙනු මට පෙනිණ. ඒ දෙනෙතින් බැලූ බැල්ම මම වහා හඳුනා ගතිමි. එසැනින් ඔහු අවස්ථාවේ ස්වරූපයෙන් කිසියම් අපහසුතාවයකට පත්වූවා සේය.

''මල්ලි මොකද දැන් මෙයාට..?'' ඔහු කටහඬ වෙනස් කොට මුදු ලෙසින් අසා සිටියේය. එකී වදන් පෙළ ඇසූ මොහොතෙහි මමත්, ෂෙහානුත්, දිලිප් අයියාත් විස්මයෙන් යුතුව නිහඬවම බලා සිටියෙමු.

''ඩොක්ටර්ස්ලා මොකද කියන්නෙ..?'' ඔහු යළිත් ඇසුවේය.

''ඊයෙ ඔපරේෂන් එක කරලා තියෙන්නෙ අයියෙ. තාම ඩොක්ටර්ස්ලා කිසි දෙයක් කිව්වෙ නම් නෑ..'' ෂෙහාන් සෙමෙන් කියා සිටියේය.

''මෙතන හොඳද..? නරකද කෝපරේටිව් හොස්පිටල් එකට ඇඩ්මිට් කළොත්..?'' නිශාන් අයියා කියා සිටියේය.



Scanned by CamScanner

සැබැවින්ම මේ ෂෙහාන්ගේ අයියා දැයි යන්න පවා සිතා ගැන්මට නොහැකි අන්දමට ඔහු වෙනස්ව සිටියේය.

''තව ටිකක් බලමු අයියෙ..'' ෂෙහාන් කීවේය.

''මොනවද දැන් අඩුපාඩු..? තාම කන්න එහෙම දෙන්නෙ නෑ නේද..?'' ඔහු මවෙත හැරෙමින් ඇසීය.

''නෑ..'' මම වැයමින් කියා ගතිමි. ඔහු මගේ ඇඳ ඉහ පත කියවා බැලීය.

''මල්ලි හවස ගෙදර එන්න.. මං යනවා..'' ඔහු පොදුවේ සියල්ලන්ටම කියා යන්නට ගියේය.

''මොකක්ද බං ඒ වුණ වැඩේ..?'' මෙතෙක් වේලා නිහඬව සියල්ල දෙස බලා සිටි දිලිප් අයියා ඇසීය.

''ඒක තමයි බං මටත් අදහා ගන්න බැරි..''

''මං හිතුව මැන් ආපු විදියට මෙතන යකා නටලා යාවි කියලා.. මං දන්නවනෙ ඉතින් අයියගෙ හැටි..'' දිලිප් අයියා මදෙස බලා කීවේය.

''කොයි දේ වෙන්නෙත් හොඳට ෂෙහාන්.. අපි එහෙමවත් හිතා ගනිමු..'' මම කීවෙමි.

ෂෙහාන් සැහැල්ලු ලෙස සිනාසුණේය. මහිතට පවා කිසියම් අස්වැසිල්ලක් දනෙමින් තිබිණ. එහෙත් එකී අස්වැසිල්ල ගිනි ගනීවි යැයි මම එකී මොහොතෙහි නොසිතුවෙමි.

''සුදු බේබි..'' මේරි නැන්දාගේ බියපත් ඇමතුමෙන් මම එදෙස බැලීමි. මගේ ජීවිතයෙහි සිදුවන සෑම භාග්‍යවන්ත සිදුවීමක් සමගම විශාල අභාග්‍යසම්පන්න සිදුවීමක් වන්නේමය. මේත් එවැන්නක් නොවන්නේද?

කුඩම්මාත්, බාප්පාත් එමින් සිටියහ. මම තිගැස්ම මැද්දැවේම නෙත් පියා ගත්තෙමි. පා ගැටෙන හඬින්ම ඔවුන් මා අසලට පැමිණ ඇති





බව මම වටහා ගතිමි.

''මේරි..'' මට කුඩම්මාගේ රළු හඬ ඇසිණ.

''උඹ තමයි මේකිත්තෙක්ක එකතු වෙලා මේ සේරම කරන්නෙ..'' කුඩම්මා කීවාය.

''මං කිසි දෙයක් කරල නෑ නෝනා.. මේව නෝනලාම කරගත්තු ඒවා..''

''උඹේ කට වැඩියි මේරි..'' කුඩම්මා ගෝරනාඩු කළාය. බාප්පා ඔහේ සිත් පිත් නැත්තෙකු සේ බලා සිටියේය.

කුඩම්මා ගේ අණසකට බාප්පා යට වන බැව් මම දැන සිටියෙමි.

''භාෂිණී අර ඉඩමේ ඔප්පුව කොහෙද..?'' කුඩම්මා එක්වරම මවෙත හැරී ඇසුවාය. කිසිදු ලැජ්ජාවක් නොමැතිව මේ ගැහැණිය මගේ මවගේ ඉඩමක ඔප්පුවක් ගැන විමසන හැටි. මට කුඩම්මා කෙරේ තිබූ පිළිකුල වඩාත් තීව්‍ර වෙමින් දැනිණ. මම නෑසුණා සේ සිටියෙමි.

''භාෂිණී කෝ ඒ..?'' කුඩම්මා යළිත් ඇසුවාය. සැත්කමේ වේදනාවෙන් මා බෙහෙවින් දුබල තත්ත්වයක පසුවුව ද මහිත කේන්තියෙන් පිරී ගියේය.

''කාට තියෙන අයිතියක් ගැනද ඔය කතා කරන්නෙ..?'' මම අසා සිටියෙමි.

''මේ ඉන්නෙ නියම අයිතිකාරයා..'' කුඩම්මා බාප්පා පෙන්වා සිටියාය. උපහාසාත්මක සිනාවකින් මගේ දෙතොල තෙමිණ.

''ඒ ඉඩම විතරද අයිති..? ඇයි මගෙ අයිතිය මතක් වෙන්නෙ නැද්ද..? කොහොම වුණත් දැන් ඒ ඉඩමට කාටවත් අයිතියක් කියන්න බෑ.. අම්මා මැරෙන්න කලින් ඒ ඉඩම මගෙ නමට ලියලා..'' මම ආයාසයෙන් ඒ ටික කියා ගත්තෙමි. කුඩම්මාත් බාප්පාත් විමතියෙන් යුතුව එකිනෙකාගේ මුහුණ දෙස බලනු මට පෙනිණ. අම්මා එකී ඉඩම මගේ නමට ලියන්නට ඇතැයි බාප්පා කිසිදු විටෙක සිතන්න



Scanned by CamScanner

නොමැත.

''මම කිව්ව ඔයාට...'' කුඩම්මා සැර හඬින් බාප්පාට කීවාය.

''හාමිණී උඹ ඒ ඉඩම මගෙ නමට හරවන්න ඕනැ..'' බාප්පා තදින් කියා සිටියාය.

''මේ කරුණාකරලා මේ ලෙඩා ළඟින් යන්න. එයාට කතා කරන්න හොඳ නෑ..'' වාට්ටුවේ පුංචි මිසී පැමිණ කීවාය. කුඩම්මාත් බාප්පාත් මට රවමින් යන්නට ගියහ. මම දිගු සුසුමක් හෙළමින් මේරි නැන්දා දෙස බැලීමි.

''ඔය වගේ උන්ට හෙන වත් නැනෙ සුදු බේබි..'' මේරි නැන්දා කෝප බරිත හඬින් කීවාය.

''කෝ ෂෙහාන්ලා..''

''මං හිතන්නෙ එළියට ගියා බේබි..''

''බලන්න නැන්දෙ අසනීපයක් හැදිලවත් ඒ විදිහට ඉන්න දෙනවද මට..'' මම බිඳුණු හඬින් කීවෙමි.

''බේබි ඕව ගැන නොහිත ඉන්ට. මට ෂෙහාන් මහත්තයලත් එක්ක කතා කරන්ට ඕනැ..''

''මොනව ගැනද..?''

''මම පස්සෙ දවසක බේබිට කියන්නම්..''

''බට්ටි එහෙනම්.. අපි ගිහින් එන්නම්..'' ෂෙහාන් විත් කීවේය. දිලිප් අයියා ද දුක්මුසුව බලා සිටියේය. මගේ දෙනෙතට කඳුළු උනමින් තිබිණ. මේ නෙත් උල්පත නම් කිසිදු විටෙක සිඳී නොයනු ඇත.

''හොඳ ළමයා වාගෙ නාඩා ඉන්නකෝ. ඔයාට මොනවද ආයේ එනකොට ගේන්න ඕනැ..? ෂෙහාන් දැඩි කාරුණික හඬින් විමසුවේය.

''මොකුත් එපා ෂෙහාන්..'' මම හඬන හිත වහගන්නට උත්සාහ





ගනිමින් කීවෙමි.

''තෙරුවන්ගෙම සරණයි..'' ෂෙහාන් වට පිට බලා මා නළලත සිඹ සෙමින් මුමුණා දිලිප් අයියා ද සමගින් යන්නට ගියේය.

ඔවුන් ගිය පසු මට බොහෝ හුදකලා බවක් දැනිණ. හිස ද වරින් වර ඇදුම් දේ.

''නැන්දේ මගෙ ඔළුව ටිකක් අත ගාන්නකො..''

''ඇයි බේබි ඔළුව රිදෙනවද..?'' එසේ අසමින් ඇය මගේ හිස පිරිමදින්නට වූවාය.

මගේ කතාව අසන ඕනෑම කෙනෙකුට බාප්පා වෙසින් සිටින පියෙකුගේ මෙබඳු වෙනස්කම් වලට ලක් වේදැයි සිතනු ඇත. එහෙත් සත්තකින්ම මා වැන්නියක තවත් සිටිත්දැයි කියන්නට මම නොදනිමි. එහෙත් මගේ කතාව සත්‍යයක් පමණක් බව මට කිව හැක.

රෝහලේ දෙසතියක් පමණ ගත කොට මා නිවසට ගියේ සුභාෂ් අයියා සමගිනි.

රෝහලේ ඒකාකාරීව ගෙවී ගිය කාලය තුළදී ෂෙහාන් දිලිප් අයියා හැරුණු විට මගේ මිතුරියෝ, සුභාෂ් අයියා නිරතුරුවම මා බලන්නට පැමිණ ඇත.

නිවසට පැමිණිය ද ටික කාලයක් විවේකීව පසුවන ලෙස මට වෛද්‍ය උපදෙස් ලැබී තිබිණ. තවත් දෙසතියකට පමණ පසු මම පාසල් ගියෙමි.

''ඉතින් හාෂි දැන් කොහොමද..?'' අනෝජා ළංව විමසුවාය.

''දැන් නම් හොඳයි ඒත් තාම බෙහෙත් බොනවා..''

''අපි උඹට නොකිව්වට අපි හරියට බය වුණා හාෂි..'' මධූකා කීවාය.

''මං නැති දවස්වල ගොඩක් උගන්වල ඇති නේද..?'' මම විමසුවෙමි.



Scanned by CamScanner

''උඹ බය වෙන්න එපා භාෂි.. උඹ නැති අතරෙ උගන්වපු පාඩම්වල නෝට්ස් ටික අපි මාරුවට ලිව්වා..''

''තැන්ක්ස්..'' මම කෘතඥතා පූර්වක හඬින් කියා සිටියෙමි.

''තැන්ක්ස් කියලා බෑ.. ඔන්න ෂෙහාන් අයියගෙන් අපිට කන්න මොනව හරි ඉල්ලල දීපන්..''

''ඔව්.. ඔව් එයා දැන් නිත්‍ය අයිතිකාරයනෙ..''

කෙල්ලො ටික දාහකුත් දේ කියමින් කෑ ගැසූහ.

''පලයල්ල යන්න..'' මම අර පෙර පුරුදු සැහැල්ලු බවට අවතීර්ණ වෙමින් කීවෙමි.

''ආ.. භාෂිණි ඇවිල්ලනේ.. ඒකයි මේ සද්දෙ..'' අප පිටුපසින් ඇසුන හඬින් අපි තිගැස්සී හැරී බැලීමු. සුජාතා ගුරුතුමිය අප අසල සිටියාය.

''මිස්..'' මම ඇය ඇමතුවෙමි.

''මොකද භාෂිණී වුණේ..? ඇයි පහුගිය දවස් ටිකේ නාවෙ..?''

''හොස්පිට්ල් එකේ හිටිය මිස්..'' මම ඇයට කීවෙමි. ඇය මගෙන් සියල්ල විමසද්දී මම ඇයට සියල්ල පවසාලූයෙමි. ඒ අසා ඇය බෙහෙවින් කම්පා වූවාය.

''මෙයාලා මට නිකමටවත් කිව්වද..?'' ගුරුතුමිය යෙහෙළියන්ට චෝදනා කළාය.

''කමක් නෑ මිස්.. බලන්න එන එකත් කරදරයක්නෙ..'' මම යෙහෙළියන් බේරා ගැනීමට කීවෙමි. මොහොතකට පසු ගුරුතුමිය අපෙන් සමුගෙන ගියාය.

''අපි මිස්ට කියන්න ගියේ නෑ. කිව්වනං උඹව බලන්න එනවනෙ.. දන්නවනේ ගෙදර හැටි.. බාප්පා එහෙම ඇවිත් හිටපු වෙලාවක මිස් ආවනං එහෙම.. ඒකයි අපි කිව්වෙ නැත්තෙ..'' මධුකා එසේ කියද්දී ඔවුන් කොපමණ දුර කල්පනා කර ඇත්දැයි මට සිතිණි.





''ෂෙහාන් වගේ කොල්ලෙක් උඹ වගේ කෙනෙකුට ලැබුණ එක ලොකු වාසනාවක් භාෂි..'' විවේක කාලයේදී විද්‍යාල බිමේ තිබූ මෙතෝදිස්ත දෙව් මැදුර පසෙක වූ පේර ගස් සෙවනෙහිදී අනෝජා කීවාය.

''ඇත්ත අනෝ ඇත්ත.. කවමදාකවත් කොල්ලෙක් කෙල්ලෙක් වෙනුවෙන් මේ තරම් වද විඳින්නෙ නැතුව ඇති. ඒත් ෂෙහාන් මං වෙනුවෙන් ඒ හැම දෙයක්ම දරා ගන්න හැටි දැක්කම මට වාවන්නේ නෑ..'' මම සෙමෙන් කීවෙමි.

''දැන් කොහොමද ගෙදර තත්ත්වෙ..?'' පේර කොළයක් දතින් සපමින් අනෝජා ඇසුවාය.

''වෙනසක් නෑ බං.. මං නං පුදුම කරුමයක් කරපු කෙනෙක්..'' මම තෙපලුවෙමි.

''භාෂි උඹ පුළුවන් තරම් ට්‍රයි කරල විභාගෙ කරගෙන ජොබ් එකක් හොයා ගන්න බලපන්.. උඹේ ප්‍රශ්න ටිකක් හරි මඟෑරගන්න පුළුවන් එතකොට.. උඹට ෂෙහානුත් උදව් කරනවනෙ..'' මම නිහඬවම ඈ කියන්නක් ඔහේ අසාගෙන සිටියෙමි.

''ඒ පාර මොකද උඹ ගොළු වුණේ..?'' ඇය අසද්දී මම සිනාසෙන්නට උත්සාහ ගතිමි. එහෙත් මගේ දෙනුවන් කඳුළින් පිරී තිබිණි.

''උඹට ඉතිං පොඩ්ඩක් ඇති ඇස්වල කඳුළු පුරෝගන්න..''

''ඇස්වලින්වත් කඳුළු වැටුණෙ නැත්තං මගෙ හිත දුකින් පිරිලා පුපුරලා ගිහින් මෙලහකටත්..'' මම කීවෙමි.

''හිත ශක්තිමත් කර ගනින්.. හැමදාමත් කියනව වගේ අදත් මං උඹට කියන්නෙ හිත ශක්තිමත් කර ගනින් කියලා..'' ඇය මගේ වතට නැඹුරු වී කීවාය.

මම කඳුළු අතරින් ම ඈ දෙස බලා සිනාසුණෙමි.



Scanned by CamScanner

''අන්න එහෙම හොඳ කෙල්ල වගේ හිනාවෙලා හිටපන්.. උඹෙ හිත හොඳ වැඩියි.. ඒකයි නිතරම උඹ විඳවන්නෙ..''

''ඒ ගමන උඹල දෙන්න මේ පැනල යන්නද..?'' එසේ අසමින් අප වෙත පැමිණියේ දීප්තිය.

''ඔව්.. කියල යන්න ගියොත් උඹලට පාටි එකක් දෙන්න වෙනවනෙ..'' මම කීවෙමි.

''ඒක නෙමේ පස්වෙනි පීරියඩ් එකට මිස් ඇවිත් නෑ.. මොකක් හරි කරමු..'' දීප්ති කීවාය.

''මොකද කරන්නෙ ලයිබ්‍රරි යන්න නම් බෑ ඔන්න..'' අනෝජා කීවාය.

''මං කියන්නද එහා පන්තියත් ඒ වෙලාවට මියුසික් රූම් එකට යන හින්දා අපි පන්තියට වෙලා සින්දු කියමු..'' මම එසේ යෝජනා කළෙමි.

''අන්න නියමයි.. ඒ අයිඩියා එක නියමයි.. හුඟ දවසකට අපිට සින්දුවක් කියන්න බැරි වුණා..'' දීප්ති කෑ ගැසුවාය.

පස්වැනි කාල පරිච්ඡේදයේදී පන්තියේ ඇතැමුන් පුස්තකාලයටත් ටක් ෂොප් එකටත් යද්දී අපි දහ දොළොස් දෙනෙක් පිටුපස පේළියේ ඩෙස් එකක් වටා එකතු වීමු.

''හාෂි උඹ ම පටන් ගනින්..'' යෙහෙළියෝ කීහ. මම මොහොතක් වෙලා කල්පනා කළෙමි.

''නැගල යන එකක් කියමු..'' දීප්ති කීවාය.

''උඹට නැගලද යන්න ඕන..? එහෙනං පලයන් බයිසිකලේ..'' මධූකා කෑගැසුවාය.

''හෙමින් හෙමින් යකෝ.. කෑ ගහලා වැඩේ දෙල් කරගන්නද හදන්නෙ..?'' අනෝජා තරවටු හඬින් කීවාය. මා විජය කුමාරතුංගගේ මා ආසාම කළ ගීතයක පද පෙළ ගයද්දී යෙහෙළියන්ද ඊට හවුල්





වූහ.

ගඟ අද්දර මා කැඳවූ රස දහැනේ
ඉහ ඉද්දර පිපි ප්‍රාර්ථනා සිහිනේ
පිබිදුනි ආශා ගිනි සිළු සේ මා
ඔබ රුව ඡායා සැඟවේ පායා

එකී ගීයෙන් තවත් ගීයකට මුල පිරිණි. ටිකින් ටික අප නොදැනීම අපි අත් තල දෙන්නට වීමු. එකී වේලාවේ දී අපට සියල්ල අමතකව තිබිණි. සැබැවින්ම මිශ්‍ර විද්‍යාලයකට වඩා බාලිකාවක ලැජ්ජාව, බිය ගැහැණු ළමුන් වූ අපට නොතිබිණ.

අපේ ගී හඬ උච්ච වී තිබිණි.

''ළමයි..'' එක්වරම කිසිවක් පිපිරුවාක් සේ ඇසුණ ඒ හඬින් අපි තිගැස්සී ගියෙමු. අපේ ගායනය වාදනය කෙසේ නැවතුණේ දැයි කියන්නට අපිවත් නොදත්තෙමු. හිටි තැන් වලින් නැගිට ඔහේ බලා සිටින්නට වීමු.. ඊළඟට..? මහිත ප්‍රශ්න කරන්නට විණ.

දෑත පිටුපසට බැඳගෙන විදුහල්පතිනිය අප දෙස බලා සිටියාය.

''ඔය ළමයින්ට වැඩක් නැද්ද..?'' බැරෑරුම් ස්වරයෙන් ඇය විමසා සිටියාය.

''මිස් ඇවිල්ලා නෑ මැඩම්..'' අනෝජා කීවාය.

''මිස් ඇවිත් නැත්තං පොතක් පතක් බලා ගත්ත නම් නරකද..? ඔය ළමයි මේ සැරේ විභාගෙ ගන්න ඉන්න ළමයි නේද..?'' ඇය දෝෂාරෝපණය කළාය.

අපි නිහඬවම අසා සිටියෙමු.

''පංතියේ ඉන්න බැරි නම් ලයිබ්‍රරි එකට ගිහින් හරි මොනව හරි වැඩක් කරන්න..'' ඇය එසේ කියා යන්නට ගියාය.

''පුදුමයි ඔයින් බේරුණා. මං නම් හිතුවෙ පනිෂ්මන්ට් එකක් දෙයි



Scanned by CamScanner

කියලා.'' අනෝජා කීවාය.

''මොකද මන්දා අද මැඩම්ගෙ මූඩ් එක හොඳයි..'' මධූකා එසේ කියා සිනාසුණාය.

''ඒක නෙමේ මැඩම් කියනව වගේ අපි විභාගෙ කරන ළමයිනෙ..'' මම කිසියම් කතාවකට මුල පුරමින් කීවෙමි.

''ඉතිං උඹ මොකද කියන්න හදන්නෙ..?'' දීප්ති මුව පුරා නලියන සිනාවකින් යුතුව විමසුවාය.

''අපි එකතු වෙලා පාඩම් කරමු..'' මම එසේ යෝජනා කළෙමි.

''ඒක නං හොඳයි තමා පිස්සු නැටුව වගේ නෙමෙයි අන්තිමේදී විභාගෙ ෆේල් කර ගත්තොත්..'' මධූකා කීවාය.

අවසානයේදී අපි එකතු වී පාඩම් කරන්නට තීරණය කළෙමු. විශේෂයෙන් ම නිවසේ දී පාඩම් කිරීමට කිසිදු වරමක් නැති මට එය මහත් රුකුලක් විණ.

* * * * *

සියලු සංකා තැවුල් මධ්‍යයේ කාලය ගතවී ගියේය. ඒ වන විට ෂෙහාන්, ඔහුගේ උසස් පෙළ විභාගයට පෙනී සිටිමින් සිටියේය. විභාගය අවසන් වූ දා ඔහුට මා මුණ ගැසෙන්නට ඇවැසි විය.

එක් ශනිදා උදාවක අපි ගාලු බස් නැවතුම් පොළේ දී හමුවීමු. ඔහු කුරුල්ලෙකු සේ මා අසලට පැමිණියේය.

''දැන් නම් මගේ හිතට ලොකු සහනයක් දැනෙනවා බට්ටි..'' ඔහු කීවේය.

''පේනව පේනව මූණ දැක්කම කියන්න පුළුවන්..'' මම දඟ හඬින් කීවෙමි.

''ම්.. එහෙමද..?'' ඔහු අමුතු විදියකට මදෙස බැලුවේය.

''අනේ ෂෙහාන් මෙතන වැඩි වෙලා ඉන්න බෑ.. අපිට නිදහසේ





ඉන්න පුළුවන් නිස්කලංක තැනකට යමුද..?'' මම කීවෙමි. ඔහු මද වේලාවක් කල්පනා කළේය.

''මගෙ යාලුවෙක් ඉන්නව චාමින්ද කියලා හබරාදූවේ එහෙ යමුද..?'' ඔහු මගෙන් විමසීය.

''මන්ද ඔයාගෙ කැමැත්තක්..'' මම ඔහුට ඉඩ දුනිමි.

අපි හබරාදූව බසයකට නැඟ අසුන් ගතිමු. මම ෂෙහාන් දෙස බැලීමි. ඔහු මදෙස බලා සිටියේය. ඒ දෙනෙත කැලැතුන රහසක් මෙනැයි මට සිතිණි.

අපි බසය හැඩිවත්ත හන්දියට පැමිණි පසු බැස ගතිමු.

ෂෙහානුත්, මමත් චාමින්දලාගේ නිවහනට යනවිට දහයට පමණ වන්නට ඇත. අප එහි යන විට ඔහු කොහේදෝ ගොස් සිටියේය. ඔහු පැමිණෙන තුරු අපි යළිත් හැඩිවත්ත හන්දියට පැමිණ මාතර පාර හරහා ගොස් හබරාදූව මුහුදු වෙරළට ගියෙමු.

''මං ආසමයි ෂෙහාන්..'' වෙරළට පා තැබූ සැනින් මට කියැවිණි.

''ඔයාට මොකද ඉතිං මුහුද කිව්වොත්..'' ෂෙහාන් කීවේය.

''බීච් එකට ආවම මට ජීවිතේ හැම දෙයක්ම අමතක කරන්න පුළුවන්..'' මම හදවතින්ම පවසාලූයෙමි.

''මාවත්..?'' ෂෙහාන් ඇසීය.

''යන්න අනේ යන්න..'' මම නෝක්කාඩු හඬින් කියා පාවහන් යුගල ගලවා අතට ගතිමි.

''ඒ පාර මොකද ආව ගමන්ම මූදෙ බහින්නද හදන්නෙ..?'' ෂෙහාන් මගේ අතකින් අදිමින් කීය. මම සිනාසෙමින් ඔහු දෙස බැලීමි.

කෙහෙරැලි, ගවොම් සාය මුහුදු සුළඟෙහි දඟ දෙද්දී ෂෙහාන් මා ඔහු වෙත ඇද ගත්තේය.

ඔහුගේ ඊළඟ පියවර කුමක් දැයි මට ඉවෙන් මෙන් වැටහිණ.



Scanned by CamScanner

මම ගෙල අඩක් හරවා වෙරළ සිසාරා දෙනෙත් යැව්වෙමි. වෙරළෙහි කිසිවෙකු නැත. එකී පාළු බව දුටු සැනින් මම මහු ඔහු ළමැදෙහි හිස සඟවා ගතිමි.

''බට්ටි..'' රළ බිඳෙන හඬ අතරින් සුළං රැලි අස්සෙන් මට එකී අති ආදරණීය හඬ ඇසිණි. මම දෙනෙත් පියා ගතිමි. ඔහුගේ දෙතොලේ පහස මට දැනිණ. ආත්ම ගණනාවක් පුරාවට පතන එකම පහස මෙය නොවේද?

මගේ දඟකාර හිත අවදි වෙමින් තිබිණි. මම එක්වරම ෂෙහාන් තල්ලු කොට දිව ගියෙමි. ඔහු මා පසු පස්සේ දිව ආවේ නැත. ඒ වෙනුවට නෝක්කාඩු බැල්මකින් මදෙස බලාගෙන සිටියේය.

මම හිස ඇලකොට ඔහු දෙසට සුරත පෑවෙමි. ෂෙහාන් මා වෙත දිව ආවේය. මම ඔහුගේ සුරතෙහි එල්ලුණෙමි.

''ෂෙහාන් මේ..'' මම බිඳී විසිරී යන පෙන පිඬු අතරින් මතු වන සිප්පි කටු පෙන්වීමි.

ෂෙහාන් ඒවා මට අහුලා දුන්නේය. ඔහු මට දුන් සිප්පි කටු මම ගවොම් සාක්කුවේ ඔබා ගතිමි.

''මං මේවා ඔයාව මතක් වෙන්නත් එක්කලා අරන් තියා ගන්නවා..'' මම කීවෙමි.

''පිස්සු කෙල්ල..'' ෂෙහාන් මගේ කම්මුලට සෙමෙන් තට්ටු කරමින් කීවේය.

''බීච් එක දිගේ මේ පැත්තට ගියාම කොහෙද දන්නවද..?'' ෂෙහාන් ඇසීය.

''නෑ..''

''කොග්ගල..'' ඔහු කීවේය. මම ඔහු පෙන්වූ දෙස බලන්නට දෙනෙත් හරවාලීමි.

එසැනින් වෙරළ දෙසින් එමින් සිටි කිහිප දෙනා දුටු සැනින්





සියල්ල අමතක විය.

බාප්පාත් තවත් කිහිප දෙනෙකුත් වෙරළ දෙසට එමින් සිටියහ. ඔවුන් කිසියම් විනෝද සවාරියක් යමින් සිට මුහුදු වෙරළ දෙසට පැමිණි බව ඔවුන් අත වූ මත්පැන් බෝතල කිහිපයෙන් මම වටහා ගතිමි. මහිතෙහි බිය වැඩිකමට මට ෂෙහාන්ගේ අතින් ඇල්ලිනි.

''බට්ටි ඉක්මනට මෙහාට එන්න..'' ෂෙහාන් මා ඇදගෙන වැටකෙයියා ගොමුවට මුවා විය. මගේ හද ගැස්මෙහි වේගවත් හඬ ෂෙහාන්ට පවා ඇසෙන්නට ඇත.

''අපි එහා පැත්තෙන් පාරට දුවමු..'' එසේ කියමින් ෂෙහාන් මා ඇදගෙන දුවන්නට විය. මඳ දුරක් දුවද්දී ම මට හති වැටිණ.

''මට බෑ ෂෙහාන්..'' මම හති දමමින් කීවෙමි.

''චුට්ටක් දුවන්න බෑ හති.. ඒ වුණාට හොකී ටීම් එකේ කැප්ටන්..'' ෂෙහාන් මට සමච්චල් කරන හඬින් පැවසීය.

''විහිළු නොකර ඉන්න ෂෙහාන්.. මගෙ පපුව තාමත් ගැහෙනවා..'' මම කීවෙමි.

''කෝ බලන්න..'' ෂෙහාන් දෙතොලතර පොපියන සිනාවෙන් යුතුව කීය.

ඔහු මට විහිළු කරන්නේ යැයි මට සිතිණි. ඒ වන විටත් මම අවස්ථාවේ අසීරුතාවයෙන් මිදී නොසිටියෙමි.

''යන්න ෂෙහාන්..'' මම ඔහු ගේ දෑත ගසා දමා යන්නට ගියෙමි.

''බට්ටි..'' ඔහු මා අමතනු ඇසිණි. මම ඒ නෑසුනාක් සේ යමින් සිටියෙමි.

සැනින් ඔහු වෙත දිව අවුත් මා යන මඟ හරස් කොට සිටගෙන ඔහු දෝත මා දෙඋරමත තැබීය. මම ඉවත බලා ගතිමි.

''ඇයි මේ..?'' ඔහු දැඩි සෙනෙහසින් යුතුව විමසීය. එකී සෙනේබර හඬ මා දෙනෙත කඳුළින් පුරවමින් තිබිණ.



Scanned by CamScanner

''ඇයි බට්ටි මොකද මේ..?'' ඔහු දකුණත මා ඉණ වටා යවා මා තුරුළු කර ගනිමින් යළිත් ඇසීය.

''ඔයාට මාව විහිළුවක්ද..?'' මම ඔහු වත දෙස බලා විමසුවෙමි.

''පිස්සුද ඔයාට..?'' ඔහු නොපහන් හඬින් කීය.

''නැත්තං ඔයා මට ඔහොම හිනා වෙන්නෙ ඇයි..?'' මම ළදැරියක සේ ඇසීමි. ඒ ඇසූ ඔහු හඬ නගා සිනාසෙන්නට විය.

''මට බෑ.. මං යනවා අතාරින්න මාව..'' මම ෂෙහාන්ගේ ග්‍රහණයෙන් මිදෙන්නට තතනමින් කීවෙමි.

''මං ඔයාව අල්ලා ගත්තෙ සදහටම තියා ගන්න මිසක් අතාරින්න නෙමේනෙ..'' ඔහු එක විදියකට මදෙස බලමින් කීය.

මම තවමත් පහ නොවූ අමනාපයෙන් යුතුව ඉවත බලා සිටියෙමි.

''මේ තරහක් තියෙනව නම් දෙන්න ගහ ගමු.. ඒත් ඉක්මනට මෙතනින් යමු.. සමහර විට අර කට්ටිය මෙහාට ආවොත්..''

අපි පාර පැන චාමින්දලාගේ නිවස දෙසට ගියෙමු. අප එහි යන විට චාමින්ද පැමිණ සිටියේය.

''උඹල කොහෙද බං ගියේ..?'' චාමින්දයියා විමසීය.

''ඊට ඉස්සෙල්ලා කියපං උඹ කොහෙද ගියේ කියලා.. අපි මෙහෙ එනකොට ගෙදර මිනිස්සු ඉන්න ඕනැ..'' ෂෙහාන් කීය.

''හරි හරි වැරැද්ද මගේ.. ඒක නෙමේ ඔරුවකුත් තියෙනවා කොග්ගල යමුද..?'' චාමින්දයියා මදෙස ද බලමින් විමසීය.

''බට්ටි මොකද කියන්නෙ..?'' ෂෙහාන් මවෙත නැඹුරු වී ඇසීය.

''මං ආසයි ෂෙහාන්..'' මම කීවෙමි.

චාමින්දයියාගේ යහලුවන් කිහිප දෙනෙකුත් සමග අපි යළිත් පාරට ආවෙමු. මාතර බස් රියක නැග ගත් අපි කොග්ගලදී බසයෙන් බැස ගතිමු.





මට මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ මඩොල්දූව පොත සිහි විය. සත්තකින් ම මීදුමකින් වැසී ගියා සේ දිස්වන අයස්කාන්ත පරිසරයක් හරහා ගලා යන කොග්ගල ඔයේ මැද මඩොල් දූව පිහිටා තිබිණ.

අපි මඩොල් දූව වටා ඔරු පැද්දෙමු. දවස ප්‍රීති සහගත විය.

සත්තකින්ම ජීවිතය පුරාවටම මේ සතුට, සැනසිල්ල, සැහැල්ලු බව තිබේ නම්.. යැයි මට සිතිණ.

''ලෝකෙ මෙහෙමම නතර වෙනව නං.. එහෙනම් කිසි ප්‍රශ්නයක් නැනෙ..'' මට කියැවිණි.

''මට තේරෙනවා බට්ටි ඔයා ඉන්නෙ මොන තරම් සතුටකින්ද කියලා. ඒත් බට්ටි ඔයා දැන් විභාගය ගැනත් හිතන්න ඕනැ. තව මාස කීයද පසුගිය දවස් ටිකේ හුඟක් පාඩම් එහෙම අතපසු වුණානෙ.. මොන ප්‍රශ්න ආවත් විභාගෙ හොඳට කර ගන්න ඕන හොඳේ බට්ටි..'' ෂෙහාන් මට බෙහෙවින් අවවාද කළේය.

මම නිහඬවම ඔහු කියන්නක් අසා සිටියෙමි.



Scanned by CamScanner

# 6

**දවස** ගෙවී ගියේය. මම ෂෙහාන්ගෙන් සමුගෙන නිවසට ආවෙමි. නිවසෙහි කිසිවෙකු නොවීය. දොර වසා දමා අගුල දා සියල්ලන් කොහේදෝ ගොස් තිබිණ. මම නිවස පිටුපසට ගියෙමි. එහෙත් ඒ දොර ද අගුළු ලා තිබිණ. මම දිගු සුසුමක් හෙළා නිවසට ගොඩ වන පියගැටය මත වාඩි වී දෙදණ අස්සෙහි හිස රුවා ගතිමි.

කලකිරීම, පසුතැවිල්ල යළිත් මගේ හිත වටා දූවටෙමින් තිබිණ.

සත්තකින්ම විනාශ වී ගිය ආත්මාවතීතය මධ්‍යයෙහි මම හඬා වැටෙමින් සිටියෙමි. ජීවිතයේ අඩකට වඩා ගෙවුණේ කඳුළින්මය.

විටෙක මා දිවිය තණ පලසක් සිප ගත් පිණි කැටයක් බඳු විය. ඒ තරමට අවිශ්වාසනීයය.

දහසකුත් සිතුවිලි මැද තෙරපෙමින් සිටි මට රියක හඬ ඇසිණි.

පැමිණියේ කුඩම්මා හෝ බාප්පා විය යුතු යැයි මට සිතිණ. මා සිතුවා සේම පැමිණ සිටියේ කුඩම්මාත් තමාලිත්ය. ඔවුන්ගේ සිනාසෙමින් තිබූ මුහුණු මා දුටු මතින්ම හැකිලී කෝප ගැන්විණ. සත්තකින් ම මේ මිනිස්සු මට මේ තරම් වෛර කිරීමට මා කළ වැරැද්ද කුමක්දැයි යන්න මට වටහා ගත නොහැක.

''ඉර බහින වෙලාවෙත් මූසලකමට ඉස්සරහට වෙලා ඉන්නවා..'' කුඩම්මාගේ අකාරුණික හඬ මා සවන් පත් කීරි ගැස්වීය. මම එය නෑසුණා සේ නිහඬව ම ඉවත බලා ගතිමි.





''අපරාදෙ කියන්න බෑ මොනව නැතත් ආඩම්බර කම නං අගේට තියෙනවා..'' කුඩම්මා මා අසල සිටගෙන කීවාය. මා සමග පැටලීමට ඇයට අවැසිය ඇති බව මට වැටහිණ.

''එක්කෝ අපිට පව් නොදී මෙතනින් තොලොංචි වෙලා යන්න ඕන. මළ කරුමයක් වුණානෙ..'' කුඩම්මා හීසර සේ වදන් වැල් නොනවත්වා පිට කරයි. ඇගේ වදන් මට අසා සිටිය නොහැකි තරම් විය.

''කුඩම්මා බය වෙන්නෙපා.. මං කොහොමටත් වැඩි කලක් මෙහෙ ඉන්නෙ නෑ..'' මම නිවුණු ස්වරයෙන් කීවෙමි.

''කිය කියා ඉන්නෙ නැතුව දැන්ම පලයන්කො..'' ඇගේ ආඥාදායක ස්වරයෙහි රැඳී තිබුණු රළු බව මට වැටහිණි.

''මට යන්න තැනක් තියෙනව නම් දැන්ම ගිහින් තමා..'' මම ද එකටෙක කීවෙමි.

''පලයන් උඹත්.. උඹේ මහ ගෑනි ගිය තැනටම..'' ඒ වදන් පෙළත් සමගම මම කෝපයෙන් වියරු වූයෙමි. පණ සේ ආදරය කළ මගේ රත්තරන් අම්මාට එසේ අවමන් කරනවා මා බලා සිටින්නේ කෙළෙසකද? මා නොදැනුවත්වම මා හිඳි තැනින් නැගිට්ටවිණි.

''උඹ වගේ වල් ගෑනියෙක් නෙමෙයි මගෙ අම්මා..'' මම කෑ ගසා කීවෙමි.

''උඹ මට වල් ගෑනි කියන්න..'' කුඩම්මා එසේ කියමින් පියවරක් ඉදිරියට තබත්ම මම සිරුරේ පූර්ණ ශක්තිය යොදා මගේ සුරත කුඩම්මා වම් කොපුල් තලය මත පතිත කළෙමි. ඉන් වාරු වී ගත නොහී වැටෙන්නට ගිය කුඩම්මාව තමාලි වහා පැන අල්ලා ගත්තාය. පහරේ සැර බව කොපමණද යත් මගේ සුරත පුපුරු ගසන්නාක් සේ මට දැනිණි.

''වල් බැල්ලි..'' කුඩම්මාගේ මුවින් පිටවිණ. මම අඩියක් පෙරට



Scanned by CamScanner

තැබීමි.

''අපි ගෙට යමු..'' තමාලි කුඩම්මා ගෙතුළට කැඳවාගෙන යාමට උත්සාහ කළාය. ඇය නවත් මා කුඩම්මාට පහර දෙතැයි බිය වන්නට ඇත. සත්තකින්ම එකී මොහොතෙහි කිසිවෙකු හා පොරට වැටී මියෙන තුරුම පොර බදන්නට තරම් සැහැසි සිතක් මට ඇති වී තිබිණි.

''හොඳයි මං බලා ගන්නම්කො.. උඹ දිනුවයි කියලා හිතා ගනින්..'' කුඩම්මා එසේ කියමින් තමාලිත් සමග ගෙතුළට ඇදී ගියාය.

මම දිගු සුසුමක් හෙළීමි. ඒ වන විටත් මගේ කෝපය නිවී නොතිබිණ.

මම ශබ්ද නැගෙන සේ අඩි තබමින් මට හිමිව තිබූ කාමරයට ගියෙමි. මම දොර වේගයෙන් වසා ඇඳ මත වාඩි වී වූයේ කුමක් දැයි මෙනෙහි කරමින් සිටියෙමි.

කුඩම්මාට පහර දීම පිළිබඳව පසුතැවිල්ල මුසු හැඟීමක් මහිතෙහි ඇති වෙමින් තිබිණි.

මම හැඳ සිටි ඇඳුම් පිටින්ම යහන මත වැතිර ගතිමි. සිතට මෙන්ම ගතට ද දැඩි වෙහෙසකාරී බවක් තැවුල් බවක් දැනේ. මම ගෙතුළින් ඇසෙන හඬට සවන් පෑවෙමි. කිසිදු හඬක් නොනැගේ. නිසල බව කිසියම් සසල දෙයක ඇරඹුම යැයි මගේ යටි හිතට දැනෙමින් තිබිණි. කෙසේ හෝ මේ සියලු සිතුවිලි මධ්‍යයේ මට නින්ද ගොස් තිබිණි. කොපමණ වේලාවක් මට නින්ද ගොස් තිබිණි දැයි කියන්නට මම වා නොදැන සිටියෙමි. මා අවදි වූයේ කිසිවෙකු විසින් දොරට ට්ටු කරනු ලැබීමෙනි.

මේ නම් බාප්පාම විය යුතුය. කුඩම්මාට මා පහර දීම නිසා මියෙන රුම තැලුම් කන්නට අද සිදු වන බව මට වැටහිණි.

ම දොර හැරියෙමි. මා අබියස සිටි ඔහු නිසා විස්මයට පත්





වූයෙමි.

''මොකක්ද භාෂිණී ඔයා මේ කර ගත්තෙ..?'' ඔහු විමසීය. මම නිහඬවම බලා සිටියෙමි.

''ඔයා හිතනවද භාෂිණී මේ මිනිස්සු දැන් නිකං ඉඳීවි කියලා..?''

''මං දන්නෑ සුභාෂ් අයියෙ මට මොනව වුණාද කියලා.. මගේ අම්මට මහ ගෑනියි කියන කොට මට හරියට තරහ ගියා..'' මම පැමිණිලි කරනා කුඩා දරුවෙකු සේ කියා සිටියෙමි.

''ඔයා කරගත්ත මෝඩ වැඩේ භයානක කම ඔයාට තේරෙයි.. මං දැන් කියන්න යනදේ ඇහුවම..'' සුභාෂ් අයියා කීය.

''මොකක්ද..?'' මම විමසා සිටියෙමි.

මම සුභාෂ් අයියා වෙතින් පිළිතුරු පතා බලා සිටියෙමි.

''එයාලා කතා වුණා ඔයාව මෙහෙන් එළවන්න..'' ඔහු කීවේය. මම සිනාසීමි. ඔව් වියරුවෙන් මෙන් හඬ නගා සිනාසුණෙමි.

''මොකද ඔයා හිනා වෙන්නෙ..?'' සුභාෂ් අයියා නොරුස්නා ස්වරූපයෙන් ඇසීය.

''මාව එලවන්න.. මේ මාව.. මාව එළවන්න එයාලට කවදාවත් බෑ සුභාෂ් අයියා..'' මම තිර හඬින් කීවෙමි.

''භාෂිණී නංගී ටිකක් හිතන්න ඔයා තනියම.. ඒත් එයාල එහෙමද? එයාලට පිරිස වැඩියි.. ඕන දෙයක් කරන්න පුළුවන්.. සමහර විට ඔයාගෙ ජීවිතේට වුණත් අනතුරක් කරන්න බැරිවෙන එකක් නෑ..'' සුභාෂ් අයියා අවවාදාත්මක ලෙසින් කීවේය.

''මේ තරම් දේවල් නැති වෙලා ගිය එකේ ජීවත් වෙනවට වැඩිය මට හොඳයි මැරෙන එක.. මට මගේ ජීවිතේ නැති කර ගන්න බැරි එකේ මාව නැති කරන උන් අතින්ම නැති වෙලා යන එක මට සැපයි සුභාෂ් අයියා..'' මම කලකිරීම මුසු හඬින් කීවෙමි.

''ඔයා නංගි හැම දෙයක් ගැනම හිතන්නෙ ඔයාට අසුබවාදී වෙ

විදියටමයි. සුබවාදී විදිහටත් ටිකක් හිතන්න පුරුදු වෙන්න..''

මහිත ඔහුගේ කතාවෙන් මඳක් රිදිණි. මම දිගු සුසුමක් හෙළා ළය සැහැල්ලු කර ගතිමි.

''භාෂිණී නංගී, මං ඔයාව මගේ යාලුවෙකුගෙ ගෙදර නතර කරන්නද..?'' සුභාෂ් අයියා මඳක් කල්පනා කරමින් සිට ඇසුවේය.

''මට බෑ අයියෙ..'' මම එක් වරම එසේ කීවේ ෂෙහාන් සිහි ගැන්වුණ නිසාමය. මා කළ යුත්තේ ෂෙහාන් කියන්නක් පමණි.

''ඔයා හරි අකීකරුයි භාෂිණී..'' සුභාෂ් අයියා තදින් කීවේය. මහිත කෝපයෙන් පිරිණ. කිසිවෙකු විසින් මා අකීකරු යැයි හඳුන්වනවාට මා කවදත් අකැමැතිය. කවුරුන් හෝ මා එසේ හැඳින්වූයේ නම් ඒ මා නියමාකාරයෙන් තේරුම් නොගත් කෙනෙකු පමණි.

''මගෙ අකීකරු කමින් ඔයාට වැඩක් නැනෙ..'' මම තරහින් කීවෙමි. ඔහු එක එල්ලේ මදෙස මොහොතක් බලා සිට යන්නට ගියේය. ඒ බැල්මෙහි වූ අසරණකම වේදනාකාරී පසුතැවිලි බව වහා මට හඳුනා ගත හැකි විය.

මහිත යළිත් දුකින් පිරිණ. මම කාමරයෙන් පිටව සෙමෙන් කුස්සිය දෙසින් එළියට ගියෙමි.

පෝ දා ආසන්නව තිබූ බැවින් සඳ එළිය, පිටුපස මිදුල වටා වැටී තිබිණ. කිසියම් නිහඬ නිසංසල බවක් මහිතට ඇතුලු වෙමින් තිබිණ. තැනින් තැන වැඩී තිබුණ තණ පතක සීතල පහස මගේ නිරාවරණය වූ දෙපතුළට දැනෙමින් තිබිණ.

මම ගාඩිනියා පඳුරකට මුවා වී සැහැල්ලු ලෙස දෙපා දිගු කරමින් බිම හිඳ ගතිමි.

මම නිල්වන් වලාකුළින් පිරී ගිය අහස් ගැබ දෙස බැලීමි. මහිත මෙන් තනි වූ තවමත් නොපිරරුණු සඳ අසල එකමෙක තරුවක් විනි. මම අහස සිසාරා දෙනෙත් ඇද්දුවෙමි. තව එකදු තරුවක් මා





නෙත හසු නොවීය.

මා සිතට නන්දා මාලිය ගේ ගී පද වැලක් නැගිණි. මම එය සිහින් සරින් ගැයුවෙමි.

තරුද නිදන මහ රෑ
නිදමි මහද නිදි නෑ
මතක පොතේ කඳුළින් කටු ගෑ
කවි කියවෙයි මහ රෑ

සැනින් ඇසුණ කිසියම් රළු හඬකින් මම තිගැස්සුණෙමි.

''කෝ ඕකි..?'' එකී හඬ හඬ බාප්පා ගේ බැව් මට වැටහිණි. මම තව තවත් ගාඩිනියා පඳුරට වහන් වීමි.

''වල් බැල්ලි මං අද මරණවා ඕකිව..'' බාප්පාගේ වියරු කට හඬ නිවස දෙදරා ඇසිණි. මහිත වේගයෙන් ගැහිණි. මම නිහඬවම දෙපා අකුලාගෙන ගෙතුළින් ඇහෙන හඬට සවන් පා සිටියෙමි.

'හැංගිලා ඉන්න තැනකින් වරෙං එළියට. මගෙ ගෙදර මට ඕන විදියට මිසක් එක එකීලට ඕන විදියට ඉන්න බෑ..'' බාප්පා නොනවත්වා කෑගසයි.

වෙලාව ගත වෙත්ම බාප්පා ගේ හඬ තුනී වී ගියේය. මම සැනසුම් සුසුමක් හෙලුවෙමි. එහෙත් කුමන මොහොතක හෝ බාප්පාට මා අසුවුවහොත් තැලුම් කන්නට වන බව මම දැන සිටියෙමි.

පැයකට පමණ පසු මා හුන් පෙදෙසට ගෙතුළින් විදුලි පන්දමක එළිය වැටිණි. බාප්පා විය හැකි යැයි මට සිතිණි. මම දෙවරක් නොසිතාම හියක වේගයෙන් වත්ත පහළට දිව යන්නට වූයෙමි. මා පසු පසින් බාප්පා දිව එතැයි මට සිතිණ. වත්ත පහළට වන්නට තුරු වදුල් නිසා අන්ධකාරය බෝ වැඩිය.

දිව යන අතරේම මට පිටුපසින් කිසියම් ශබ්දයක් ඇසින ''බාප්පාද..?'' මහිත මගෙන්ම ප්‍රශ්න කර සිටියේය. පසුපස හැරී බල

දුවද්දී ගලක් වැනි යමකට පය පැකිලී මම ඇද වැටුණෙමි.

ඒ ඉරියව්වෙන්ම සිට බලද්දී මා අසලට කිසිවෙකු පැමිණෙනවාක් මෙන් අඳුරේ මට දැනිණි. ''මේ නම් බාප්පාම විය යුතුය..'' දණ හිස් වලින් නැගෙමින් තිබූ වේදනාව ද පරයා දැනෙමින් තිබුණේ දැඩි බියකි.

''බට්ටි..'' මට අර හුරු පුරුදු ආදරණීය ම හඬ ඇසිණ. මා කිසිවෙකු විසින් දෝතින් ඔසවන්නාක් මෙන් දැනිණ. දිවීමේ වෙහෙස කර බවත් හති ලැමත් මධ්‍යයේ මම ක්ලාන්ත වීමි.

මම යළි සිහි ලබද්දී කිසිවෙකු මගේ මුහුණට නැඹුරුවී සිටියේය. මම ඒ කවුදැයි වටහා ගන්නට උත්සාහ ගතිමි

''බාප්පා.. කෝ බාප්පා..?'' මම බිය මුසුව තෙපලුවෙමි. මගේ මුළු ගතම දහදියෙන් නැහැවී ඇති සෙයක් මට දැනේ.

කිසිවෙකු මා පසුපස දිව ආවා මට මතකය.

''බට්ටි.. මොකද ඔයාට දැන්..?'' එකී හඬින් ඒ කවුරුන් දැයි වහා මම හඳුනා ගතිමි.

''ෂෙහාන්..'' මම තොල මැතිරුවෙමි. මා ඔහුගේ උකුළ මත හිස තබාගෙන සිටින බව මට දැනිණ.

''ඔයා කොහොමද මේ වෙලාවෙ මෙතෙන්ට ආවෙ..?'' මම අදහාගත නොහැක්ක විශ්වසනීය කර ගැන්මට කරුණු විමසුවෙමි.

''මට සුභාෂ් අයියා ඇවිත් කිව්වා කුඩම්මලා බාප්පලා ඔයාව මෙහෙන් එළවන්න හදනවා කියලා.. ඒ සැරේ මං එයත් එක්ක ආවා..'' ෂෙහාන් මහිස මුදු ලෙස පිරිමදිමින් කීවේය.

''මේ ඨ..?'' මම විස්මයෙන් යුතුව විමසාලූයෙමි.

''ඔව්.. මට සුභාෂ් ගැන පුදුම දුකක් දැනුණා..'' ඔහු සුසුමක් හෙළමින් කීවේය.

'කෝ දැන් සුභාෂ් අයියා..?''





''අර ඉන්නෙ..'' මම ෂෙහාන් අත පා පෙන්වූ දෙස බැලීමි. ගසකට හේත්තුවී හුන් රුවක් අඳුරේ මට පෙනිණි.

''එතකොට මං පස්සෙ දුවගෙන ආවෙ කවුද..?'' මම කුතුහලයෙන් යුතුව විමසුවෙමි.

''මම..'' ෂෙහාන් කීවේය.

''ඔයාල කොහෙද ෂෙහාන් හිටියෙ..?''

''අපි දෙන්න බයික් එකේ ඇවිත් බයික් එක සුභාෂ්ගෙ යාලුවෙකුගෙ ගෙදර දාලා පයින් මේ ටික ආවා. ඒ එනකොට අපිට බාප්පා කෑ ගහනව ඇහුණා. අපි දෙන්න දුවගෙන ඇවිත් ගේ පිටි පස්සට වෙලා මොකද වෙන්නෙ කියලා බලාගෙන හිටියා. එතකොටම තමයි බාප්පා කුස්සිය පැත්තට ආවෙත්.. ඔයා දුවන්න පටන් ගත්තෙත්..'' ෂෙහාන් පැහැදිලි කළේය.

''දැන් මොකද ෂෙහාන් මම කරන්නෙ..?'' නොදරුවෙකු සේ මම ෂෙහාන්ගෙන් විමසා සිටියෙමි.

''සුභාෂ්..'' ෂෙහාන් ඇමතුවේය. ඔහු අප අසලට එනු අඳුරේ මට පෙනිණි.

''මොකද්ද දැන් කරන්නෙ..?'' මම එසේ කියමින් අඬන්නට වූයෙමි.

''බට්ටි හැම දේකටම ඇස් වලට කඳුළු අරගෙන හරියනවද..? කඳුළු වලින් මේ ප්‍රශ්න විසඳනවා නම් මං අඬන්නං.. ඇස් වලින් ලේ පනිනකන්..'' ෂෙහාන් තරවටු හඬින් කියද්දී මම මුහුණ ඔහුගේ උකුළෙහි සඟවා ගතිමි. ෂෙහාන් මගේ පිට සෙමෙන් පිරිමදිනු මට දැනිණි.

''ෂෙහාන්.. ගේ පැත්තෙන් කිසිම සද්දයක් නෑ මං කියන්නද වැඩක්..'' මට සුභාෂ් අයියාගේ හඬ ඇසිණි.

''මොකද්ද..?''

''ඔය කොච්චර කෑගැහුවත් අන්කල්ගෙ කේන්ති දැන් ටිකක් නිවිල



Scanned by CamScanner

ඇති. හෙමින් සැරේ කාමරේට ගිහින් හාෂිණීට තිදා ගන්න කියමු.. හෙට උදේ මොනව හරි වුණොත් මං බලා ගන්නම්..''

''ඔව්.. මමත් හිතනව ඒක තමයි හොඳම දේ කියලා.. කියන තරම් යකා කළු නැහැනෙ නේද..?'' ෂෙහාන් සන්සුන් හඬින් කීවේය.

මම හිස ඔසවා ඔහු දෙස බැලීමි. තරු එළියෙන් වුව ද ඔහුගේ දීප්තිමත් දෙනෙත මට දැක ගත හැකි විය.

''බට්ටි.. එහෙනම් ඔයා හෙමින් සැරේ යන්න.. උවමනාවකට ගන්න මෙතන සල්ලි ටිකක් ඇති..'' ෂෙහාන් මුදල් නෝට්ටු කිහිපයක් මගේ ගවොම් සාක්කුවට එබුවේය.

''ඔයා යන්නෙ කොහොමද.. දූන්..?'' මම ඇසුවෙමි.

''මං කොහොම හරි යන්නම් කො.. ඔයා බය වෙන්න එපා.. සුභාෂ් අයියා ඔයා ළඟ ඉඳියි මොනව හරි වුණොත්..'' ඔහු මට සමු දෙන්නට මෙන් මගේ නළලත සිප කීවේය.

මම අසරණ දැරියක සේ ඔහු අතෙහි එල්ලී ඔහු දෙසම බලා සිටියෙමි.

''හොඳ ළමය වගේ යන්න ඉතින්..'' ෂෙහාන් එලෙස කී විට මම ගුරු අණ පිළිපදින කීකරු සිසුවියක සේ නිවස දෙසට පා ඔසවන්නට වීමි. සුභාෂ් අයියා සමග ෂෙහාන් ද මඳ දුරක් පැමිණ නතර විය.

මම පිටුපස හැරි හැරී බලමින් නිවසේ පිටුපස දොරෙන් ඇතුළු වන්නට සමත් වීමි. ශබ්ද නොනැගෙන සේ දොර වසා අගුළු දැමූ මම යහන මත වාඩි වූයේ කුමක්දැයි කල්පනා කරන්නට වූයෙමි.

එක්වරම ජනෙල් කවුළුව දෙසින් ඇසුණු ශබ්දයකින් මම තිගැස්සුණෙමි. කිසිවෙක් කවුළු දොරට සෙමෙන් තට්ටු කරන්නාක් සේ මට දැනිණ.

''කවුද..?'' මම ඇසුවෙමි.

''මම..'' මට ෂෙහාන්ගේ කටහඬ ඇසිණි. මම සැනසුම් සුසුමක්





හෙළමින් ජනෙල් පියන්පත විවර කළෙමි.

''එහෙනං බට්ටි මං යනවා..'' ෂෙහාන් එසේ කියමින් ග්‍රිල් අතරින් අත දමා මගේ දෝත මිරිකාගෙන මොහොතක් වේලා බලා සිටියේය. සත්තකින්ම එකී මොහොත බෙහෙවින් හැඟුම්බර විය.

මම ''හා'' කියාගත නොහැකිව බලා සිටියෙමි. අවසන ඔහු යන්නට ගියේය. මගේ දෑස කඳුළින් පිරී ගියේය.

සිනහවක් ඇත්තේම නැති මගේ ජීවිත කතාව ඇසුවෙකුට එය එපා වෙනු ඇත. ෂෙහාන් නොසිටියා නම් මේ වන විට මා මගේ ජීවිතය තුරන් කොට අවසානය. මා මෙලොව මෙලෙසින් රඳවන එකම රැඳවුම ෂෙහාන් විය.

ඔහුගේ දයාබරිත, ආදරණීය බව හමුවේ සෙනෙහස විඳිමින් මම ජීවත් වන්නෙමි.

අම්මාගේ ආදරණීය සෙනෙහස මා විඳගෙන ඇත්තේ අල්ප කාලයක් වුවද එකී සෙනෙහස ම'දිවිය පුරාවටම ගලා ගොස් තිබිණ. එකී සෙනෙහස් සුවඳ ඔස්සේ ඉව අල්ලමින් මම මුලදී ජීවිතය ගෙන ගියෙමි. එහෙත් දෛවය මට කිසිදු විටෙක කාරුණික නොවිණ. බාප්පාගේත් කුඩම්මාගේත් කර්කාශ්ඨක, රළු පරළු, ඇණුම් බැණුම් පිළිලයක් සේ මගේ ජීවිතය වසා ගත්තේය. ඉදින් මම ජීවත් වූයේ ෂෙහාන් නිසාම නොවන්නෙහිද?

''ෂෙහාන්.. මගේම ෂෙහාන්..'' මම නෙත් පියා තොල් මතුළෙමි.

''දොර අරිනවා..'' සිහිනෙන් මෙන් ඇසුණ එකී රළු හඬින් මම තිගැස්සී ගියෙමි. එය ඇසුණේ සිහිනෙන්වත් දැයි මට සිතිණ. මම යළිත් වරක් සවන් පෑවෙමි.

''දොර අරිනවා..'' පෙරටත් වඩා තදින් එසේ කියැවිණ.

කතා කරනුයේ කවරෙක් දැයි මට සිතාගත නොහැක. මම සෙමෙන් දොර විවර කළෙමි.



Scanned by CamScanner

මා අබිමුවේ සිටියේ තමාලිය. ඇගේ මුහුණ රළු පෙනුමින් යුතු විය.

"නපුරි.." ඇය මට එක්වරම චෝදනා කළාය. මම නිහඬව සිටියෙමි.

"මොන සමයමකද ගිහින් හිටියෙ..? චණ්ඩිය වගේ ගහල අන්තිමට මොකද හැංගුණේ?" තමාලි ඇසුවාය.

"තමාලි මට මගෙ පාඩුවෙ ඉන්න දීලා ඔයා ගිහින් ඔයාගෙ වැඩක් බලා ගන්න.." මම කීවෙමි.

ඇය මට ගස්සාගෙන ආපසු හැරෙද්දී සුභාෂ් අයියාගේ ඇගේ හැපිණි.

ඔහු එක්වරම ඇගේ උරහිසින් අල්ලා ගත්තේය.

"මේ තමාලි. කරුණාකරලා මේ අහිංසක කෙල්ලට පාඩුවේ ඉන්න දීලා ඔයා පැත්තකට වෙලා ඉන්න.." සුභාෂ් අයියා සැරෙන් කීය.

"ඔයාට තියෙන අමාරුව මොකද්ද..?"

"ඒකම තමයි මටත් ඔයාගෙන් අහන්න ඕනැ.."

"ඔයත් ඉතිං මේකිගෙ මායම්වලට රැවටිලානෙ.." තමාලි එසේ කියා හැරී යන්නට ගියාය.

අපි දෙදෙනා මුහුණෙන් මුහුණ බලා ගතිමු.

"ඔයා කාමරේ වහගෙන නිදා ගන්න නංගී.. මෙන්න මම ඔයාට කඩෙන් කෑම එකක් ගෙනාවා.." සුභාෂ් අයියා කියද්දී මගේ දෙනෙත කඳුළින් පෙඟිණි. ඔහු මොහොතක් වේලා මගේ දෙනෙත් දෙස බලා ගත්වනම සිටියේය. මම වහා ඉවත බලා ගතිමි.

"හැම දෙයක්ම විඳ දරා ගන්න පුළුවන් ඒත්.. ඔය ඇස් දෙකට කඳුළු පිරෙන කොට තමයි බලා ඉන්න බැරි.." සුභාෂ් අයියා කීය. මම නිහඬවම සිටියෙමි.

"මං දන්නෙ නෑ.. මට තේරෙන්නෙ නෑ.." ඔහු කීවේය. ඔහු ඉන්





අදහස් කළේ කුමක්දැයි යන්න පවා මට ගැටලු සහගත වී තිබිණි.

"ඔයා කාලා නිදා ගන්නකො.." සුභාෂ් අයියා යන්නට ගියේය. මම දිගු සුසුමක් හෙළා කාමරයෙහි දොර වසා ගතිමි. කුසගින්න මඳ වශයෙන් තිබුණ ද කෑම ගැනීමට තරම් ප්‍රියතාවයක් නොතිබිණ. එහෙත් මම කෑම පාර්සලය දිග හැර ඉන් අඩක් පමණ කා වතුර බීවෙමි.

යහනෙහි වැතිරී මම බොහෝ දෑ කල්පනා කළෙමි. එකී කල්පනාවලිය අම්මා, ෂෙහාන්, තමාලි, කුඩම්මා, බාප්පා, මේරි නැන්දා.. දක්වා විහිදිණ. ෂෙහාන් හැරුණු විට මා වෙනුවෙන් අන් කිසිවෙකු ඉතිරිව නැති බව මම වටහා ගතිමි. මගේ ජීවිතය ඉදිරිය ගැන සිතත්ම මගේ සිතට දැනුණේ බියකි. එසේ සිතෙත්ම ෂෙහාන් නිරතුරුවම කියනවාක් මෙන් කළ යුත්තේ ඉගෙන ගැනීම නොවේදැයි මට සිතිණි.

කුමන ප්‍රශ්න මැද හෝ ඉගෙන ගතහොත් කුමක් හෝ රැකියාවක් ලැබ මේ අපායෙන් මිදිය හැකි වෙනු ඇතැයි මට හැඟිණි. නැතිනම් මට සිදුවනු ඇත්තේ මේ රුදුරු මිනිසුන් හා ගැටී හඬා වැටීමටය. මම ඒ පිළිබඳව බොහෝ දෑ සිතුවෙමි. ඒ සිතුම් අවසානයේ මම දැඩි තීරණයකට බැස ගතිමි. ඒ කෙසේ හෝ පාඩම් කොට දෙසැම්බර් සාමාන්‍ය පෙළ විභාගයට සාර්ථකව මුහුණ දෙනවායි කියාය.

මම තවත් දෙවරක් නොසිතාම පාඩම් කරන්නට ගතිමි. මැදි රැය ගෙවෙන තුරුත් අවදියෙන් සිට පාඩම් කළ මම නින්දට වැටුණෙමි.

උදෑසන මම දෙපැයක් පමණ පාඩම් කළෙමි. හිතට කිසියම් තුෂ්ටිදායක හැඟුමක් ඇතුළු වී තිබිණි. ඒ හැඟුම ඔස්සේ කෙසේ හෝ ක්‍රියා කරන්නට මම සිතා ගතිමි.

නිවසේ සියළු දෙනා පිටව යන තුරු මම කාමරයට වැදී සිටියෙමි. ඔවුන් සියළු දෙනා පිටව ගිය පසු මම කාමරයෙන් පිටතට ආවෙමි.

මට සුභාෂ් අයියාගේ කාමරය ඇර දමා ඇති බව පෙනිණි.



Scanned by CamScanner

මම කාමරයට හිස පොවා බැලීවි. මගේ මුවට සිනාවක් නැගිණ. සුභාෂ් අයියා කුඩා දරුවෙකු් සේ යහනෙහි වැතිර නිදා සිටියේය. එසැනින් ඒ සිනාව අතුරුදන් වූයේ යහන යට තබා තිබූ මත්පැන් බෝතලය මා දැකීමෙනි. දෙවියනේ.. සුභාෂ් අයියා පෙරදා රැයෙහි වෙරි මතින් නිදාගන්නට ඇතැයි යන හැඟුම මසිතෙහි ඇති විණ. මට ඔහු පිළිබඳ අනුකම්පා සිතිණ. මම ඔහු අසලට ගියෙමි.

''සුභාෂ් අයියෙ..'' මම ඔහුගේ උරයට අත තබා ඇමතුවෙමි. සැනින් ඔහු තිගැස්සී අවදිව බලා විස්මය මුසු බැල්මක් මුහුණට නගා ගත්තේය.

''ඔයා මොකක්ද මේ කරගන්න යන විනාසෙ..?'' මම ඇසුවෙමි.

''මොකද්ද..?'' ඔහු කුඩා දරුවෙකු ලෙසින් අඩ සිනාවක් මුහුණට නගාගෙන විමසුවේය.

''නොදරුවෙක් වෙන්නෙපා..'' මම තරවටු හඬින් කීවෙමි.

''මං මොනවද කළේ..?'' සුභාෂ් අයියා නිවුණ හඬින් විමසද්දී මහිත දුක් විය.

''ඇයි සුභාෂ් අයියෙ ඔයා මේ විදියට බොන්නෙ..?'' මම විමසුවෙමි.

''කවුද කියන්නෙ මං බොනව කියලා..?''

''කවුරුත් කියන්න ඕනද..? මේ ඇඳ යට තියෙන ඒව දැක්කම මට හිතාගන්න පුළුවන්..''

ඔහුගේ වත මා බලා සිටියදීම අඳුරු වී ගියේය.

''ඇයි සුභාෂ් අයියෙ ඔයා මේ විදියට බොන්නෙ..?''

''ඔයා හිතන්නෙ මං මේ බොන්නෙ ආසාවට කියලද..? මට මගේ හිතේ තියෙන වේදනාව අමතක කරන්න ඕනවට මං බොන්නෙ.. ඒක කාටවත් තේරෙන්නෙ නෑ..''

ඔහුගේ එකී කතාව මට විස්මයට කරුණක් විය. ඔහුට මානසිකව දුක් විඳින්නට තරම් දෙයක් නැති බව මම දනිමි.





''ඔයාට දුක් වෙන්න හේතුවක් තියෙන එකක්යැ.. අන්න ඒ හේතුව කියන්න..'' මම ඇසුවෙමි.

''මං දුක් විඳින්නෙ ඔයා නිසා භාෂිණී.. ඔයා නිසා. මගෙ හිත නාමත් ඔයාට ආදරේ කරනවා..''

''මොනවා..?''

''ඔව් භාෂිණී.. කොල්ලෙකුගෙ හිතේ ඇති වෙන ආදරය කවදාවත් කෙල්ලෙක් නියම විදියට වටහා ගන්නෙ නෑ.. ඔයත් කෙල්ලෙක්නෙ..'' සුභාෂ් අයියා නපුරු දැසින් මදෙස බලාගෙන කීවේය.

මම යටිතොල සපාගෙන බිම බලා ගතිමි.

''ඔයාට නං මේක සුළු දෙයක් වෙන්නැති..'' ඔහු දිගින් දිගටම මා රිදවාලන්නට විය.

''ඔයා හොඳටම දන්නවනෙ සුභාෂ් අයියෙ මට තවත් කෙනෙකුට ආදරය කරන්න බැහැ කියලා.. ඒ දැන දැනත් ඇයි ඔයා මට ඔහොම කතා කරන්නෙ..?'' සුභාෂ් අයියාගෙන් චෝදනා අසා අවසානයේදී මම විමසාලූයෙමි.

''ෂෙහාන්ට කලින් මං ඉස්සර වුණා නම් මෙලහකටත් මං ඔයාට මෙතනින් අරගෙන ගිහින් භාෂිණී..'' සුභාෂ් අයියා කියද්දී මම තිගැස්සී ගියෙමි.

''ඔයා මොනවද සුභාෂ් අයියෙ මේ කියන්නෙ..?'' මම එක එල්ලේ ඔහු දෙස බලමින් කීවෙමි.

''හිතේ තියෙන දේවල් මං කියන්නෙ.. හිතේ තියෙන දේවල්..''

''මට තේරෙන්නෙ නෑ සුභාෂ් අයියෙ..''

''ඔයාට ඒක තේරෙන්නෙ නැතුව නෙමෙයි භාෂිණී.. ඔයා ඒක තේරුම් ගන්න උත්සාහ කරන්නෙ නෑ භාෂිණී..''

''ඔයා මට මොකද්ද කරන්න කියන්නෙ සුභාෂ් අයියෙ..?'' මම තදින් අසා සිටියෙමි.



Scanned by CamScanner

''ඔහොම ඇහුවට වැඩක් නැහැනෙ හාෂිණී..'' සුභාෂ් අයියා බිම බලාගෙන සෙමෙන් කීවේය.

''මං ගැන තියෙන බලාපොරොත්තු අතැරගන්න සුභාෂ් අයියෙ.. මට ෂෙහාන් ඇරුණම වෙන කෙනෙක් ගැන හිතන්න බෑ.. මං මගේ ජීවිතේ පළමුවැනි වතාවට වගේම අවසාන වතාවටත් ආදරය කරන්නෙ ෂෙහාන්ට විතරමයි.. ෂෙහාන්ගෙන් තොර ජීවිතයක් මට නෑ සුභාෂ් අයියෙ..'' මම එසේ කියාගෙන කාමරයෙන් පිටතට ආවෙමි.

මහිත බෙහෙවින් නොසන්සුන් වී තිබිණි.

මම ගෙමිදුල දෙසට ගියෙමි. සේපාලිකා ගහ යට වූ පුංචි බංකුවේ මම අසුන් ගෙන ඔහේ බලා සිටියෙමි.

සුභාෂ් අයියා මා නිසා බොනවායි අසන්නට ලැබීම කෙතරම් හිත් රිදවන්නක්ද..?''

එක්වරම මගේ දෙවුරට දැනුණ ස්පර්ශයකින් මම තිගැස්සී හැරී බැලීමි.

''සුභාෂ් අයියෙ..'' මම බිය මුසු විස්මයෙන් යුතුව තෙපලුවෙමි. ඔහුගේ දෙනෙත එක එල්ලේම මගේ දෙනෙතට එල්ල වී තිබිණි. මා නොසිතූ මොහොතක සුභාෂ් අයියා එක්වරම මා වැළඳගෙන මගේ කොපුල් තලයක් සිප ගත්තේය.

එසැනින් මගේ සුරත ඔහුගේ කම්මුල හරහා චටාස් හඬින් පතිත විය.

''බලු වැඩ කරන්න එපා..'' මම වියරු හඬින් කෑ ගැසුවෙමි.

''හාෂිණී..'' ඔහු මා අමතාලද්දී මගේ කෝපය තව තවත් වැඩි වෙන්නට විය.

''කවුද හිතුවෙ ඔය වගේ ජරා වැඩ කරන මිනිහෙක් කියලා.. මේ වගේ කෙනෙකුට මමත් අයියා අයියා කිව්වට මටයි හෙණ ගහන්න ඕන..'' මම තරහින් කියාගෙන ගියෙමි.





සුභාෂ් අයියා ඔහේ බලාගෙන සිටියේය. මම දිව ගෙන විත් කාමරයට වැදී දොර වසා ගතිමි.

සුභාෂ් අයියා කළ දෙයින් මහිතට ඔහු පිළිබඳව පිළිකුලක් ඇති වෙමින් තිබිණි. මම යහනට වැටී හඬන්නට වූයෙමි.

ෂෙහාන් මේ බව දැන ගත්තොත් කුමකින් කුමක් වේ දැයි සිතා ගත නොහැක.

''හාෂිණී දොර අරින්න..'' සුභාෂ් අයියාගේ කටහඬ දොරට පිටින් මට ඇසිණි. මම තරහට නිහඬව සිටියෙමි.

''හාෂිණී දොර අරින්න.. ඔයාගෙ යාළුවො කට්ටියක් ඇවිත්..'' ඔහු කී දෙයින් මම කුතුහලයට පත් වීමි. මම තවත් මොහොතක් වේලා සිට දොර ඇර ආලින්දය දෙසට ආවෙමි. දෙවියනේ අනෝජාත්, දීප්තිත්, මධුකාත් සිනාසෙමින් බලා සිටියහ.

''වරෙල්ලා වරෙල්ලා ඇවිල්ලා වාඩි වෙයල්ලා..''

''අපිම එන්න ඕන ඉතින්.. උඹව හොයාගෙන..'' මධුකා කීවාය.

''ඒක ඇත්ත..'' දීප්ති කීවාය.

''ඒක නෙමේ කෝ උඹගෙ අර නපුරු කුඩම්මා..'' අනෝජා ඇසුවාය.

''උදේම කොහෙද ගියා..''

''මේ අර බෝයි කවුද..?'' මධූකා විමසුවාය.

''මොන බෝයිද..?''

''අර දැන් මෙතනින් ගියේ..''

''ආ.. එයාද..? එයා තමයි සුභාෂ් අයියා.. ඇයි උඹට හිත ගියාද..?'' මම ඇසුවෙමි.

''පලයන් යන්න..'' ඔවුන්ගේ සතුටු සිනා කතා බහ මැද කාලය ගෙවෙනවා මට නොදැනිණි.

''සියළු සතුට සැනසුම් බව නසාලමින් කුඩම්මා පැමිණියාය. ඇය

රියෙන් බසින්ම මහිත තිගැස්සිණි. මමිතුරියෝ මුහුණෙන් මුහුණ බලාගත්හ.

"ඒයි උඹලගෙ කුඩම්මා නේද..?" අනෝජා සෙමෙන් ඇසුවාය. මම හිස වැනුවෙමි.

"කවුද මේ..?" කුඩම්මා මා දෙසත් යෙහෙළියන් දෙසත් මාරුවෙන් මාරුවට බලමින් ඇසුවාය. මම නිහඬවම සිටියෙමි.

"ආන්ටි අපි භාෂිණීගෙ යාළුවො.. මේ පැත්තෙන් යන ගමන් අපිට හිතුණා භාෂිණීව බලන්න එන්න.." අනෝජා විස්තර කළාය.

"ඔය ළමයි මෙහෙ ආවට මගෙ කිසිම අමනාපයක් නෑ.. ඒ වුණාට මේ වගේ ළමේක් ආශ්‍රය කරනවට කවදාවත් ඔය ළමයින් ගෙ දෙමවුපියො නං කැමති වෙන එකක් නෑ.." කුඩම්මා කීවාය.

"ඒ වුණාට ආන්ටි, භාෂිණීව අපේ ගෙවල්වල අය හොඳට අඳුරනවා.." දීප්ති සියල්ලටම පෙර කට ඉස්සර කළාය.

"ඔය ළමයින්ගෙ අම්මල තාත්තල මෙයාගෙ හැටි දන්නව නං කවදාවත් ඔයාලට මෙයාව ආශ්‍රය කරන්න ඉඩ දෙන්නෙ නෑ ළමයිනේ.." කුඩම්මා එසේ කියද්දී මගේ දෙනෙතට කඳුළු පිරිණි.

"අනේ ආන්ටි භාෂිණී තරම් හොඳ යාලුවෙක් අපිට කවදාවත් හමුවෙන එකක් නෑ.." මධූකා මා රැක ගන්නට මෙන් කීවාය.

"ඒ ඔයාලා මෙයාගෙ හැටි තාම දන්නෙ නැතුව.. මෙයාගෙ තියෙන අවාසනාවට පොඩි කාලෙදිම අම්මත් නැති වුණා.. අයියගෙ දුව කියලා අපිත් මෙහෙට ගත්තෙ.. ඒත් එයා නිසා අපිටත් කරදරයි.. ඕක උපතින්ම ගෙනාව අවාසනාවන්තකම.. ඒක කාටත් නැති කරන්න බැහැනෙ.. අපිත් මේ පූරුවෙ පවක් ගෙවනවා.." කුඩම්මා එක දිගට කියාගෙන කියාගෙන ගියාය. ඇයට අවශ්‍යව ඇත්තේ මට ලැජ්ජා කිරීමට බව මට වැටහිණ.

මමිතුරියෝ නිහඬවම බිම බලාගෙන සිටියහ. මට ඉකි ගැසිණ. මා





මොන තරම් අසරණයෙකු දැයි සිතෙන විට මා පිළිබඳව දැනෙන දුක තවත් වැඩි වේ. මගේ ආත්මයම පාවා දී පිට අය ඉදිරියේදී මා මෙසේ හෙළා තලා කතා කිරීමේදී මා කෙළෙස ඉවසාලන්නද? මම දෝතින්ම මුහුණ වසාගෙන අඬන්නට වූයෙමි.

"භාෂි අඬන්නෙ නැතුව ඉන්න.. අපි යනවා.." මට හැඬුම අතරේ අනෝජාගේ හඬ ඇසිණි.

"ඔයාලත් මේ අපායේ මාව තනි කරල යනවද..?" බොළඳ දැරියක සේ මම ඇසීමි.

"උඹ මේක අපායක් කර ගත්තට අපි මොනව කරන්නද..? කාලකණ්ණිකම, කාලකණ්ණිකම.." කුඩම්මා එසේ කියමින් ගෙතුළට ගියාය.

"භාෂි අඬන්නෙපා.." මධූකා කීවාය.

"මේව අහගෙන මං තවත් කොහොමද මේ ගෙදර ඉන්නෙ..? ඇයි දෙයියනේ මට මෙහෙම ලැජ්ජා කරන්නෙ..?" මම හඬ හඬාම ඔවුන්ගෙන් ඇසුවෙමි.

"අපිට තේරෙනව භාෂි ඔයාගෙ දුක.. ඒත්.." කියමින් අනෝජා නිහඬ වූවාය.

"මං කොහොමද මූණ දෙන්නෙ මෙහෙම ලැජ්ජා කරන කොට.." මම ඇසුවෙමි.

"අපි ගාව ඔයා ලැජ්ජා වෙන්න ඕන නෑ භාෂි.. අපි ඔයා කියල තිබුණටත් වැඩිය හොඳට කුඩම්මා ගැන දැන් දැන ගත්තනෙ.. ඒ හින්දා ඔයාට කනගාටු වෙන්න දෙයක් නෑ.." දීප්ති මගේ හිස පිරිමදිමින් කීවාය.

"අපි දැන් යන්නම් කොලේජ් එකේදි හමුවෙමු.." මධූකා කීවාය.

ඔවුන් තවත් මඳ වේලාවක් සිට යන්නට ගියහ. ඔවුන් ගිය පසු මට දැනුණ පාළුව මෙතෙකැයි කිව නොහැක. මම හඬමින් කාමරයට



Scanned by CamScanner

වැදුණෙමි.

''මූසලකමට හැම තිස්සේම කඳුළු පෙරාගෙන.. ඔහොම ගියාම මේ ගෙදරට හරියාවිද..? අපිට වද නොදී පලයන්කො යන දිහාක..'' කුඩම්මාගේ ගෝරනාඩු හඬ මට ඇසිණ.

''අනේ මං මොන වරදක් කළාටද මට මෙහෙම වද දෙන්නෙ..? ළමයි දැන් ඕව ඉස්කෝලෙත් කියාවි..'' මිතුරියන් එසේ නොකිත බව දැන දැනත් මම එසේ කීවෙමි.

''කියන්න තමයි මං කිව්වෙ..'' කුඩම්මා සැර හඬින් කීවාය.

''මට ඉස්කෝලෙ ගියාම විතරයි සැනසිල්ලෙ ඉන්න පුළුවන්.. දැන් ඒකත් නැති කරන්නයි හදන්නේ..?'' මම හඬ හඬාම කීවෙමි.

''කට වහගෙන හිටපන්..''

''ඔව් කොහොමටත් දැන් කට වහගෙන තමා මට ඉන්න වෙලා තියෙන්නෙ.. කමක් නෑ වැඩි දවසක් නැනෙ..'' මම එසේ මටම කොඳුරා ගතිමි.

මම ඔහේ ඇඳ මත වාඩිවී බලා සිටියෙමි. ගෙතුළින් නුපුරුදු කටහඬක් මට ඇසිණ. මම ඊට සවන් පෑවෙමි.

එහෙත් ඒ කටහඬ කාගෙදැයි හඳුනා ගැනීමට මට නොහැකි විය. මම තවත් ඕනෑකමින් සවන් දුන්නෙමි. එහෙත් ඒ ස්වරය අපැහැදිලිය. කුඩම්මාගේ නෑදෑයෙකු පැමිණෙන්නට ඇතැයි මට සිතිණි.

මම අවුල්ව තිබූ කාමරය මඳක් අස්පස් කළෙමි. මෙතෙක් දවස් මම කාමරය ගැන කිසිදු සැලකිල්ලක් නොදැක්කුවෙමි.

පොත් පත් ඇඳුම් පිළිවෙළට අසුරද්දී මට අමුතු කල්පනාවක් ඇති විණ.

ඒ මගේ අවශ්‍යම කරන සහතික, ඇඳුම් පැළඳුම් ආදිය පහසුවෙන් ගත හැකි තැනක තැබීමයි. කවදා හෝ දිනෙක මේ නිවහනින් පිට වන්නට මට සිදුවෙනු ඇත. එදිනට පෙර සූදානමක් වශයෙන් මම





එලෙස කළෙමි.

''කෝ දැන් භාෂිණී..?'' එක්වරම මට අර නපුරු කටහඬ ඇසිණ. මා ගැන අසන මා නොදන්නා තැනැත්තිය කවරෙක් දැයි මට කුතුහලයක් ඇති විය.

''කාමරේට රිංගගෙන ඇති. අපෙත් පූරුවෙ කරුමයක් පල දෙනවද කොහෙද?'' කුඩම්මා එසේ කියනු මට ඇසිණ.

''ඔයාගෙ වැරැද්දනෙ.. ඔයා මුලදි කැමති වුණේ මොකටද භාෂිණීව තියා ගන්න.. ඒකනෙ ඔහොම වුණේ..?'' මා නාඳුනන තැනැත්තිය කීවාය.

''ඒ ඇයි කියලා ඔයා දන්නෙ නැහැනෙ පුෂ්පා..'' කුඩම්මා එසේ කියද්දී ඇය හා කතා කළ තැනැත්තිය පුෂ්පා බව මට වැටහිණි. කුඩම්මාට පුෂ්පා නම් මිතුරියක් සිටින බව මම අසා ඇත්තෙමි. මේ එම මිතුරිය විය යුතුය.

''ඔයා දන්නෙ නෑ ෂුප්ෂා.. භාෂිණීට එයාගෙ අම්මගෙන උරුමෙට ලැබුන හොඳ ඉඩම් කීපයක්ම තියෙනවා..'' කුඩම්මා කීවාය.

''ඔහේ.. ඒකයි මේ ඔයා භාෂිණීව තියා ගත්තෙ? ඔයාගෙ මොළේ නං..''

''එහෙම තමයි මං වැඩ කරන්නෙ හොඳට කල්පනා කරලා බලලා..'' කුඩම්මා හපන් කමක් කළාක් මෙන් කියනු ඇසෙද්දී මහිත කෝපයෙන් බර විණ. සත්තකින්ම ඇයවන් කපටි මායාකාර ගැහැනියක සමග සිටීම පවා බියජනකය.

මම නිහඬවම ඔවුන් කියන දෑ අසා සිටියෙමි.

''කොහොම හරි ඔය ඉඩං කෑලි ටික අපේ නමට හරව ගත්තොත් නං මං දිනුම්..'' කුඩම්මා කීවාය.

''ඉතිං ඔයා මොකද කරන්න හිතාගෙන ඉන්නෙ..?'' පුෂ්පා අසනු මට ඇසිණි.

''ඒක තමයි අනේ.. මට තියෙන උනන්දුව අපේ ගෙදර මිනිස්සුන්ට තිබුණ නං මෙලහකටත් මේ කරදර ඉවර වෙලා හුඟක් කල්..'' කුඩම්මාගේ හඬෙහි පැවැති පසුතැවිලි බව මහිත තව තවත් කෝපයෙන් පුරවමින් තිබිණි.

''මං හාෂිණීත් එක්ක ටිකක් කතා කරල බලන්නං.. සමහර විට ඕකට හොඳ අදහසක් මටත් එන්න පුළුවන්..'' පුෂ්පා කීවාය.

''ඔව් ඔව් ඒකනං ඇත්ත..'' කුඩම්මා කීවාය.

මොහොතක් ගත වන්නටත් පෙර කිසිවෙකුගේ පා ගැටෙන හඬක් මා දොර අබිමුවෙහි ඇසිණ. ඒ නම් පුෂ්පා විය යුතු යැයි මම සිතීමි.

''ටක් ටක්..'' හඬින් දොරට තට්ටු කරනු මට ඇසිණ. මම ඒ නැසුණ සේ හිඳින්නට උත්සාහ ගතිමි.

''හාෂිණී.. හාෂිණී..'' මට පුෂ්පා ගේ කටහඬ ඇසිණි. මේ මොන කරදරයක්දැයි සිතමින් මම දොර ඇරියෙමි.

''ආ.. හාෂිණී. මොකද බය වෙලා වගේ..? මාව අඳුරන්නෙ නැද්ද..? ඇය බලෙන්ම වාගේ කාමරයට ඇතුළු වී මගේ යහන මත හිඳ ගත්තාය.

මම මගේ තරහ බොහෝ වෑයමින් නොපෙන්වා සිටියෙමි.

''නෑ මම අඳුරන්නෙ නෑ..'' මම කෙටියෙන් කීවෙමි.

''අයියෝ ඔයාගෙ කුඩම්මගෙ හොඳ යාලුවෙක් මම..'' ඇය කීවාය.

''ඒකනං හොඳට පේනවා..'' ඇගේ වාචාල මුව දෙස බලමින් මම එසේ සිතුවෙමි.

''ඉතිං කොහොමද දුව.. ඔයාගෙ අම්මිත් මං ටිකක් අඳුරනවා.. පව් ඔයා වගේ කෙනෙකුට අම්ම නැති වුණ එක නේද..?'' ඇය වත් තැනැත්තියක ගේ බොරු ආදරයට ලක් වෙනවාට මම අකැමැති විමි.

''දැන් ඉතිං ඒවා ගැන කතා කරල වැඩක් නෑනෙ..'' මම මඳක්





තදින් කීවෙමි.

''ඔයාට හරියට තරහ යනවනෙ..'' ඇය සිනාසුණාය.

''මං ඇත්තම කියන්නං ආන්ටි.. ඔය වගේ දෙපිටකාට්ටු වැඩ කරන අයට මං කැමතිම නෑ..'' මම ඇය දෙස රවා බලා කීවෙමි.

''කවුද දුව දෙපිටකාට්ටු වැඩ කරන්නෙ..? අපි නං නෑ.. දුව කාගෙද බොරුවකට රැවටිලා..'' ඇය අන්දමන්දව කීවාය.

''කවුරුවත් බොරු කියන්න ඕන නෑ.. මට මගෙ කන් දෙක විශ්වාසයි..'' මා එසේ කියද්දී ඇගේ දෑස් බලා සිටියදීම විසල් විය. ඇයත් කුඩම්මාත් කළ කතාව අසා සිටි බව ඇයට වැටහෙන්නට ඇත.

ඇය එක්වරම යහනෙන් නැගිට කාමරයෙන් පිටවන්නට ගියාය.

''ඔය ආන්ටි අනුන්ගෙ කුණු කන්දල් හොයන්නෙ නැතුව ගිහින් තමන්ගෙ වැඩක් බලා ගන්න..'' මම ඇය පිටුපා යනු දැක කීවෙමි.

මේ සෙවන යටට පැමිණෙන හැම කෙනෙකුම මට සතුරුකම් කරන්නට පෙළඹෙන හැටි..



Scanned by CamScanner

# 7

මෙලෙසින් කාලය ගෙවී යමින් තිබිණි. නැවුම් දවසකට පෙරුම් පුරන්නට තරම් බලාපොරොත්තුවක් හිත අහලකවත් නොතිබිණ. කෙසේ නමුදු මම පාඩම් වැඩ අතපසු නොකළෙමි.

මේ වකවානුව තුළ අපට තවත් අභියෝගයකට මුහුණ දෙන්නට සිදුවිය. ඒ දිස්ත්‍රික් හොකී ශූරතාවය ලබා ගැනීමය. විභාග කටයුතු අස්සේ එවැන්නකට පුහුණුවීම ගැන බොහෝ ගුරුවරු ගුරුවරියන් අකැමැත්ත පෑව ද අපි එයට බෙහෙවින් ඇළුම් කළෙමු. පොත් පත් අතරට සිරව සිටි දෙනෙත් තණ තිල්ලේ ඇදී එන බෝලයක ඉලක්කය සොයන්නට ආශා කළ බැව් මම දත්තෙමි.

''හාෂි, ගිය සැරෙත් කප් එක සංඝමිත්තෙටම ගියා. මේ සැරේ නං ඒක කොහොම හරි කඩන්න ඕනැ..'' මධූකා කීවාය.

බොහෝ විට හොකී තරගාවලියකදී සංඝමිත්තාවෝ අපට වඩා දස්කම් පෑහ. ඒ ඔවුන්ට ලැබී තිබූ ක්‍රීඩා භූමි පහසුකම් නිසාය. එනිසාම ඔවුන් ජය ගත්හ. මෙවරත් සැහෙන තරගයකට මුහුණ දීමට සිදුවන බැව් මම දැන සිටියෙමි.

කෙසේ හෝ අඩු කාල සීමාවක් තුළ අපි උපරිම අයුරින් පුහුණුවීම් කටයුතු කළෙමු. බාලිකා පාසල්වලත් වඩා තරගය පිළිබඳව උනන්දුවක් පැවතියේ පිරිමි විද්‍යාලයටත්ටය.

තරගාවලියට දෙදිනක් තබා ෂෙහාන් මා හමුවිය.

''ඉතිං බට්ටියෙ? මේ සැරේ කප් එක ගන්න පුළුවන් වෙයිද?''





ගාලු නගර සභා ක්‍රීඩාංගණයේ පියගැට පෙළ අසලදී ෂෙහාන් විමසීය.

''කෙල්ලො ටික නං කියන්නෙ ෆුල් ට්‍රයි එකක් දෙමු කියලා..'' මම කීවෙමි.

''විභාගෙත් ළඟයි නේද..?''

''ඔව් ෂෙහාන් මොනවා වුණත් තරගෙ කැන්සල් කරාවියැ විභාගෙ කියලා..'' මම කීවෙමි.

''කමක් නෑ දවස් දෙකනෙ..'' ෂෙහාන් සෙමෙන් කීවේය.

''ඔයා එනවනෙ..' මම නෙතඟින් ඔහු දෙස බලමින් ඇසුවෙමි.

''කොහෙද?''

''අපි සෙල්ලම් කරනව බලන්න..''

''වැඩේමයි..''

ඔහු ඔච්චම් හඬින් කීවේය. මම බුම්මා ගතිමි.

''මේ..'' ඔහු මා ඇමතුවේය. මම නිහඬව ම ඉවත බලා සිටියෙමි.

''අනේ.. අනේ.. මේ කෙල්ලට තරහා යන එක්මන.. මම විහිලුනෙ කළේ ළමයො..'' ෂෙහාන් එසේ කියමින් මගේ සුරතින් ඇද්දේය.

''යන්න, අපේ දේකට එන්න කිව්වොත් තමයි බැරි..'' මම නොක්කාඩුවට කීවෙමි.

''කවුද බෑ කිව්වෙ..? මං කොහොම හරි එනවා එදාට.. කොයි ලෝකේ හිටියත්..'' ෂෙහාන් කීවේය.

''එයි තමා..''

''එනව ළමයො එනව.. නපුරු කමට මූණෙ හැටි නපුරි..'' ෂෙහාන් එසේ කියූ විදියට ට සිනා ගියේය.

''ඔයානෙ නපුරා..''

''මටද දැන් කේන්ති ගියේ..?''

''හරි හරි මටයි කේන්ති ගියේ.. ඇත්තටම ඔයා එනව නේද එදාට..?''



Scanned by CamScanner

මම ඔහු දෙනෙත දෙස බලාගෙන ඇසීමි.

"ඔව් ඔයාට මොනව හරි ඕන කරන දේවල් එහෙම තියෙනවද...?" ෂෙහාන් විමසුවේය.

"නෑ ෂෙහාන්.." මම කීවෙමි. ඔහුගේ ආදරණීය සොයා බැලීම ගැන මහිත සතුටින් පිරෙනුයේ නිතැතිනි. සැබැවින්ම ඔහු විටෙක මට පියකු බඳුය. යහළුවකු බඳුය. සොයුරෙකු බඳුය. එහෙත් සත්තකින්ම ඔහු මගේ සදාදරණීයම සුපෙම්වතාය.

"මේ දෙන්න මෙතන.. හැබැවටම අපි ප්‍රැක්ටිස් කරන්නවත් දෙන්නෙ නැද්ද ෂෙහාන් අයියෙ.." දීප්ති සිනාසෙමින් ඇසුවාය.

"අනේ නෑ මගෙන් කිසිම බාධාවක් නෑ ඔයාලට.. මේ ඉන්නෙ එක්ක යන්න.." ෂෙහාන් කීය.

"එක්ක යන්න නෙමේ, කැන්දන් යන්න කෙනෙක් ඉන්න කොට අපි මොකටද නේද..?" අනෝජා කෑ ගැසුවාය.

"යකෝ කට.. කට තිබුණ පලියට කෑගහන්න එපා.." මම ඇගේ කනින් ඇද කීවෙමි.

"අපෝ ඔයාලගෙ කටවල්වල සද්දෙ.." එලෙෂ කියමින් අප දෙසට ආවේ දිලීප් අයියාය.

"එහෙම තමයි.." අනෝජා කීවාය.

දවස මෙලෙසින් සතුටින් ගෙවෙමින් තිබිණ. තරගාවලිය ඇරඹෙන දින උදාවෙන තුරු අපි උද්‍යෝගිමත් සිතින් බලා සිටියෙමු.

තරගාවලිය ඇරඹෙන දිනයෙහි උදෑසනින් අපි සියල්ලෝම සංඝමිත්තාවට යන්නට තීරණය කරගෙන සිටියෙමු. සැබැවින්ම කණ්ඩායමට අයත්ව සිටි අපටත් වඩා ප්‍රීතිමත්ව සිටියේ අප විද්‍යාලයේ අනෙක් ශිෂ්‍යාවන්ය.

උදෑසන හත පමණ වෙද්දී අපි සංඝමිත්තා ගේට්ටුවෙන් ඇතුළු වීමු. ඉදිරිපස කහ මැයි ගස් පෙළත් කහ බාලොලියා මල් පාත්තිත්,





පසුබිමෙහි වූ සුදු ගොඩනැගිලිවලට අමුතු සුන්දරත්වයක් එක්කොට ඇතැයි මට සිතිණි.

විද්‍යාලයේ ශිෂ්‍ය නායිකාවෝ කිහිප දෙනෙකු පැමිණ අප පිළිගෙන අපට අදාළ ස්ථාන පෙන්වූහ.

අපි ඔවුන් පෙන්වූ පන්ති කාමරයට ඇතුළු වූයෙමු. යුහුසුලුව ක්‍රීඩා ඇඳුම් හැඳගත් අපට යෙහෙළියෝ බොහෝ දෑ කියන්නට වූහ.

"අනේ කොහොම හරි ට්‍රයි කරලා සංඝමිත්තේ කප් එක අපි ගන්න බලමු.."

"බය වෙන්න එපා, එයාලගෙ තැනට ඇවිත් දිනල ගියොත් තමයි වටිනාකම වැඩි.."

"අනේ හාෂි ඔයාගෙ අතේ තමා වැඩේ තියෙන්නෙ.. එයාලට එක ගෝල් එකක්වත් ගන්න ඉඩ තියන්න එපා.."

අපේ ක්‍රීඩා උපදේශක ගු-රුතුමිය ද අපට බෙහෙවින් අවවාද කළාය. අපි මේ සියල්ල මැදම බෙහෙවින් සිත දිරිමත් කර ගත්තෙමු.

"ෂෙහාන් ඇවිල්ලද දන්නෙ නෑ.." මම අනෝජාගේ සවනට කොඳුළෙමි.

"මේවත් ඇඳගෙන ඇවිදින්න පුළුවන්ද..?" මම කෙටි සාය ඇයට පෙන්වා ඇසීමි.

"ඒකත් ඇත්ත.. ඒත් දූන් අපිට සෙල්ලම් කරන්න වෙන්නෙ ඕකත් නැතුව.. ෂෝට පිටින්මයි.."

"කරුණාකර විද්‍යාලවලින් පැමිණි සියළුම කණ්ඩායම් ක්‍රීඩා භූමියට වාර්තා කරන්න.." යකඩ කට මොර දෙනු ඇසෙද්දී අපි කලබල වීමු.

"ළමයි ඉක්මන් කරන්න.." ගුරුතුමිය කියද්දී අපි දෙදෙනා බැගින් පේළියක් වී ඉදිරියට ආවෙමු.

අනෙක් විද්‍යාල කණ්ඩායම් අතුරෙන් අපේ කණ්ඩායම බෙහෙවින් කැපී පෙනුණි. සුදු කෙටි සායත්, එම පැහැයෙම ටී ෂර්ටයත් ඇඳ



Scanned by CamScanner

සිටියෙමු. අපි සියලු දෙනාම එකම වර්ගයේ සුදු කැන්වස් පාවහන් පැළඳ සිටියෙමු.

සියලුම කණ්ඩායම් ක්‍රීඩාංගනයේ පෙළ ගස්වනු ලැබීය. ඒ අවසරයේ දී මම පැමිණ සිටි සෙනඟ අතුරෙහි ෂෙහාන් සෙව්වෙමි.

''බඹරෙ වගේ කැරකෙන්නෙ නැතුව හිටපන්.. අර ඉන්නෙ කුමාරයා.. පිරිවරත් එක්කම..'' අනෝජා මගේ පිටුපසින් සිට කීවාය. මම ඇ පෙන්නූ දෙස හැරී බැලීමි. හුරු පුරුදු මහින්දයන් රැනත් සමග ෂෙහාන් සිටියේය. ක්‍රියාන්තයියා අත වනනු මට පෙනිණි. සැනින් එතැන හුන් තවත් කවුදෝ ඔහුගේ අත ඇද දමා අතවනන්නට විය.

''ඒ පාර අන්න පොර කකා අත වනනවා..'' අනෝජා කියද්දී මම සිනා කාගෙනම ඉවත බලා ගත්තෙමි.

සාය ඉවත් කොට කෙටි කලිසමින් තරග බිමට පැමිණෙද්දී මහිතට ලැජ්ජාවක් දැනිණ. මේ තරම් පිරිසක් මැද එලෙස සෙල්ලම් කරන්නට මා අකැමැතිය. එහෙත් කුමක් කරන්නද..?''

වෙනත් විද්‍යාලයක් සමග මුල් වටය සඳහා තරග වදින්නට අපට සිදු විය.

අප කණ්ඩායම බෙහෙවින් ඉදිරියට එමින් සිටියහ. අප ලබා ගන්නා හැම ලකුණක් පාසාම බලා හුන් පිරිස අතරෙන් ඔල්වරසන් නැගිණි. අවසානයේ දී අපි ජය ගතිමු. අපි එකිනෙකා බදා සිප වැළඳ ගත්තෙමු.

තවත් තරඟ වට කිහිපයකට පසු අප සතුටින් ඔකඳ කරවමින් අපේ කණ්ඩායමත්, සංඝමිත්තා කණ්ඩායමත් අවසාන වටයට තේරිණි. එහෙත් වෙලාව මඳ බැවින් අවසාන තරගය පසු දිනට කල් තැබිණ. එය අපට මහත් රුකුලක් විණ.

අපි වෙහෙසකර බවින් යුතුව සමු ගත්තෙමු. අප භාරව පැමිණි ගුරුතුමිය වක්වැල්ල බසයක නැග ගිය බැවින් අපි ෂෙහාන්ලා පැමිණෙන තෙක් සංඝමිත්තාව ඉදිරිපස බස් නැවතුමට වී බලා





සිටියෙමි.

''ඔයාගෙ නම භාෂිණී නේද..?'' අප අසලට පැමිණි පාසලේ නිල ඇඳුමින් සැරසුණු පිරිමි ළමුන් තිදෙනෙකුගෙන් එක් අයෙකු අප බලාපොරොත්තු නොවුණ මොහොතක එසේ ඇසුවේය. මම කුහුල් දෑසින් ඔහු දෙස බලද්දී මිතුරියෝ මා දෙසත් ඔහු දෙසත් මාරුවෙන් මාරුවට බලන්නට වූහ.

''ඇයි කතා නොකරන්නෙ..?'' ඔහුම යළිත් විමසීය.

''ඔව් භාෂිණී නං තමයි.. අයියලා..?'' මම වදනක් ඉතිරි කොට තබා බලා සිටියෙමි.

''ආ.. අපි රිච්මන්ඩ් එකේ.. මේ මගේ යාළුවො දෙන්නෙක්.. අපි බලාගෙන හිටිය ඔයාල සෙල්ලම් කරනව ඔයා හොඳට සෙල්ලම් කළා..'' ඔහු මඳ සිනාවකින් යුතුව කීවේය.

''තැන්ක්ස්.. ඒත් තාම ඔයාලගෙ නම් කිව්වෙ නැහැනෙ..?'' මම කීවෙමි.

''මම රොහාන්.. මේ තුෂාර.. මේ තිලන්ත..'' ඔහු හඳුන්වා දුන්නේය.

අපි සුළු සුළු විස්තර කතා කළෙමු. ඒ අතර වාරේ මගේ දෙනෙත් දිව ගියේ ෂෙහාන් පැමිණේදැයි බැලීමටය. අවසානයේදී ෂෙහාන්, දිලිප් අයියාත්, ක්‍රිෂාන්තයියාත් සමග පැමිණියේය. එහෙත් රොහාන්ලා දුටු සැණින් මුහුණු අඳුරු කරගෙන අපට මඳක් ඈතින් නතර විණ.

රොහාන් හෙට දින තරඟයට අප සියලු දෙනාටම සුභ පතා අනෙක් දෙදෙනාත් සමග යන්නට ගියේය. මම ෂෙහාන් අසලට ගියෙමි. දිලිප් අයියාත්, ක්‍රියාන්තයියාත් මිතුරියන් අසලට ඇදුණහ.

''ෂෙහාන්..'' මම ඔහු අමතාලීමි. එහෙත් ඔහු බෙරි කරගත් මුහුණින් ඉවත බලාගෙන සිටියේය.

''මොකද අනේ අද ඔයාට වෙලා තියෙන්නෙ..?'' මම ඇසුවෙමි. ඔහුගේ එකී පෙනුම මහිතට ගෙන ආවේ ඔහු පිළිබඳ සුරතල් හැඟුමකි

''ඔයා දැන් අර කා එක්කද කතා කර හිටියෙ..?'' තවත් මොහොතක් ගෙවී ගියාට පසු ෂෙහාන් ඇසුවේය. මට මහ හඬින් සිනා ගියේය. මිතුරියෝ පවා මදෙස හැරී බැලූහ.

''අයියෝ ඔයා මේ ඒකටද බුම්මාගෙන ඉන්නෙ..?'' හිනාව අතුරින්ම මම ඇසුවෙමි.

''ෂෙහාන් එයාල මං සෙල්ලම් කරනව දැකල මං එක්ක කතා කළා..'' මම ඔහුට සියල්ල විස්තර කළෙමි.

එහෙත් ඔහු තවමත් පහ නොවූ අඳුරෙන් යුතුව ඉවත බලාගෙන සිටියේය.

''ෂෙහාන් ඔය විදියට ඔරවගෙන ඉන්න තරම් මං වරදක් කළේ නැහැනේ..'' බැරිම තැන මම කීවෙමි. ඔහු කතා නොකළේය. මගේ දෙනෙතට කඳුළු ගලා එමින් තිබිණි.

''ෂෙහාන්..'' මා යළිත් ඇමතුව ද ඔහු කතා නොකළේය. තවදුරටත් සිටිය හොත් හැඬෙතැයි බියෙන් මම එතැනින් ඉවත්ව මිතුරියන් හුන් තැනට ආවෙමි.

''ඇයි මේ..?'' මගේ වෙනස මුලින්ම දුටුවේ අනෝජාය. සියල්ලන් ම මදෙස බැලුවේ එවිටමය. මම කඳුළු මුවා කරගන්නට දැඩි වෑයමක් ගනිමින් සිටියෙමි.

''භාෂිණී නංගී මොකද..?'' දිලිප් අයියා මට ළංවෙමින් ඇසීය.

''අරූ මොකක් හරි කියන්න ඇති..'' ක්‍රියාන්තයියා ෂෙහාන්ට අත දිගු කරමින් කීය.

''ඇයි නංගී..?'' දිලිප් අයියා කාරුණික හඬින් යළිත් විමසීය.

''තරහ වෙලා..'' මම යාන්තමට කියාගන්නට උත්සාහ කළෙමි.

''ඇයි ඒ..?''

''අනේ මන්දන් නෑ දිලිප් අයියෙ..'' මම කීවෙමි. ෂෙහාන් අප සලට එනු මට යාන්තමට පෙනිණ.





ගාල්ල බලා යන බසයක් පැමිණියේය. කාටත් පෙර මම දුව ගොස් බසයට නැග ගතිමි. මට අවැසි වූයේ සියල්ලන්ගෙන් ම මිදී හුදෙකලා වන්නටය. එහෙත් අනෙක් සියලු දෙනා ද ඒ බසයට නැග ගනු මම යාන්තමට දිටිමි.

මම බසයේ ඉදිරියටම ගොස් සිට ගතිමි. ෂෙහාන්ට මා සමග අමනාප වන්නට තරම් දෙයක් මා අතින් නොවූ බව මම දනිමි. මගේ නිදොස් බව හමුවේ පවා මට සිදුව ඇත්තේ වැළපෙන්නටය. අද වන් ප්‍රීතිදායක දිනයක ද මට මහිත දුකින් පුරවා ගන්නට සිදු වූ හැටි.. දිලිප් අයියා මා අසලට පැමිණ නැවතිණ.

''නංගී මොකද වුණේ..?'' ඔහු කාරුණිකව විමසීය.

''මං දන්නෙ නෑ අයියෙ.. එයාට චුට්ටක් ඇතිනෙ තරහ වෙන්න..'' මම සෙමින් කීවෙමි.

''ඔය විදියට දෙන්න ෆයිට් කරන්න ගියොත් නං..'' කියා දිලිප් අයියා නිහඬ විය.

''මගෙ වැරැද්දක් නං මට දුක නෑ දිලිප් අයියෙ.. ඒත් එයා නිකරුණේ මාත් එක්ක තරහෙන් ඉන්න කොට කොහොමද දරා ගන්නෙ..?'' මම ලේන්සුව දෙනෙතට තද කර ගනිමින් කීවෙමි.

''නංගී අඬන්න නං එපා මිනිස්සු බලාවි.. මං පිටි පස්සට ගිහින් ෂෙහාන් එක්ක කතා කරල බලන්නං..'' ඔහු එසේ කියා බසයේ පිටුපසට ගියේය.

සැබැවින්ම මේ තරම්ම ළඟින් සිටත් ෂෙහාන්ට ඇතැම් විට මා වටහා ගන්නට බැරි සැටි.. මහිතෙහි කිසියම් කලකිරීමක් උපදිමින් තිබිණ. ඒ කලකිරීම මධ්‍යයේ ගාල්ලේ දී මම බසයෙන් බැස ගතිමි.

මම ඉක්මන් ගමනින් ගාලු බස් නැවතුම් පළ දිගේ ඉදිරියට එන්නට වීමි.

''ඔහොම හිටපන්..'' අනෝජා මා පසුපසට දිව එමින් මගේ ගමන



Scanned by CamScanner

වළකාලන්නට උත්සාහ ගත්තාය.

''කියන දේ අහල හිටපන්.. කෝච්චිය වගේනෙ..'' ඇය මගේ අතකින් අල්ලාගෙන කීවාය.

''මට පරක්කු වෙනවා.. ඉක්මනට යන්න ඕනැ..'' මම කීවෙමි.

''පලයන් යන්න.. දැන් තමා උඹට හදිස්සි වුණේ.. ගැනියි මිනිහයි දෙන්නම එකයි.. චීන පටස් වගේ..'' අනෝජා සිනාසෙමින් කීවාය.

''හරි උඹ මොකද්ද මට කියන්නෙ..?'' මම නතරවී ඇසුවෙමි.

''උඹ හැම දෙයක් ගැනම හරහටමයි හාෂි කතා කරන්නෙ. ඇයි ඒ? හොඳයි ඔය තරහෙන්ම උඹට ගෙදර ගිහින් ඉන්න පුළුවන් නම් පලයන්.. හැබැයි හෙට උදේ මී හරකි වගේ අඬාගෙන එන්න බෑ..'' අනෝජා දැඩි ලෙස කීවාය. මම නිහඬවම සිටියෙමි.

''වරෙන්, මෙතන ගල් පිළිම වගේ හිටගෙන හිටියම අනිත් මිනිස්සු යන්නෙ එන්නෙ කොහොමද..?'' අනෝජා මා ඇදගෙන අයිනකට වූවාය.

දිලිප් අයියාත්, ක්‍රිෂාන්තයියාත් සමග ෂෙහාන් එනු මට පෙනිණි. මම ඉවත බලා ගතිමි.

''බට්ටි..'' ෂෙහාන් මා ඇමතුවේය. මම නෑසූ සේ නිහඬවම සිටියෙමි.

''ඒ පාර උඹ ගණන් උස්සනවද?'' අනෝජා මගේ උරහිසට අනිමින් ඇසුවාය.

''බට්ටි මාත් එක්ක තරහද..?'' ෂෙහාන් එලෙසින් අසද්දී මා හට නිහඬව සිටීමට නොහැකි විණි.

''මම නෙමේනෙ ඉස්සර වෙලා තරහ වුණේ ඔයානෙ..'' මම නෝක්කාඩු හඬින් කීවෙමි.

''මට තරහ ගියේ ඔයා අර යකත් එක්ක කතා කර කර ඉන්නවා දැක්කම..''

ෂෙහාන් කීවේය.





මට හිනා ආවේය.

''මොන යකාද..?'' මම සිනාසෙමින් ඇසුවෙමි.

''රිච්මන්ඩ් එකේ රොහාන් එක්ක..''

''මං දැක්කෙත් අදමයි.. ඒ ළමයා කතා කරපු නිසයි මං කතා කළේ.. ඉතිං මාත් එක්ක තරහ වෙලා හරියනවද..?'' මම ඇසුවෙමි.

''රොහාන්ට ගර්ල්ස්ල පෙන්නන්න බෑ.. ඔයා මොනවටද ඒ වගේ කෙනෙක් එක්ක කතා කළේ..?'' ෂෙහාන් ඇසීය.

''මෝඩයා මේ ළමය දන්නවද රොහාන් ගැන..? උඹට තිබුණ එයාගෙ හැටි භාෂිණී නංගිට කියන්න.. උඹ මෝඩය වගේ වැඩ කරනවට මේ ළමය පලිද..?'' දිලිප් අයියා කියද්දී ක්‍රිෂාන්තයියා සිනාසුණේය.

''බට්ටි හෙට අපි කතා කරමු.. දැන් ඔයා යන්න..'' ෂෙහාන් කීවේය. ඔහුගේ තරහ තවමත් නිවී නැති බව මට වැටහිණ.

මම නිහඬව මොහොතක් බලා සිටියෙමි. තවත් කිසිවක් කියන්නට ගියහොත් ඔහුට තවත් තරහ යනු ඇතැයි මට සිතිණ. එනිසාම මම සියල්ලන්ගෙන්ම සමුගෙන තනිවම මාපලගම කිව් එක අසලට ගියෙමි. එහෙත් මගේ හිත දුකින් බරවී තිබිණ.

මා ගෙදර ආවේ ද ඒ සිතින්මය. කුමක් වුවද හෙට දින තරගයට මා සාර්ථකව මුහුණ දිය යුතුව තිබිණි. සියල්ලන්ගේම බලාපොරොත්තු රැඳී තිබුණේ අපේ කණ්ඩායම කෙරෙහිය. සැබැවින්ම සංඝමිත්තාවත්, අපේ බාලිකාවත් ගැටෙන මේ මොහොත තීරණාත්මක මොහොතක් වනු ඇතැයි මට සිතිණ.

දැඩි වෙහෙසින් හෙම්බත්ව සිටි මම කෑම කෑ විගසම නින්දට වැටුණෙමි.

* * * * *

පසුදා උදෑසනින්ම අවදිව සූදානම් වූ මම සංඝමිත්තාව



Scanned by CamScanner

පැමිණියෙමි. නුහුරු නුපුරුදු බොහෝ නෙත් මා කරා යොමු වී තිබෙනු බව මට දැනිණ. මහිතට සියුම් ලැජ්ජාවක් බඳු හැඟීමක් ඇති වෙමින් තිබිණි.

''ගුඩ් මෝර්නින්..'' කාගෙදෝ හඬකින් මම සංඝමිත්තා බුදු ගෙය අසල දී හැරී බැලීමි. අසල පියගැට පෙළ බසිමින් මා අසලට පැමිණෙමින් සිටියේ පෙරදා සවස මුණ ගැසුණු රොහාන්ය.

මහිත මොහොතකට තිගැස්සී ගියේය. එහෙත් ඒ තිගැස්සුම් බව නොපෙන්වා මම ඔහු හා කතා කළෙමි.

''ගුඩ් මෝර්නින් අද උදෙන්ම නේද..?'' මම ඇසුවෙමි.

''ඔව්.. අද ඔයාලට හොඳ සටනක් දෙන්න වේවි නේද..?'' ඔහු ඇසීය.

''ඔව් අනේ.. කොහොමටත් සංඝමිත්තෙ ටීම් එක දක්ෂයිනෙ.. මම එහෙනම් යන්නද?'' අත රැඳි කුඩා ඔරලෝසුව දෙස නෙත් හෙළමින් මම කීවෙමි.

''හොඳයි අපි පස්සෙ කතා කරමු..'' ඔහු එසේ කීවේය.

මම ඉක්මනින් අපට දී තිබූ කාමරය දෙසට ගියෙමි. ඒ වන විටත් අනෙක් සියල්ලෝ ම පැමිණ සිටියහ.

''භාෂිණී ඔයාගෙ අතේ තමයි වගකීම තියෙන්නෙ.. හැබැයි කිසිම දේකට බය වෙන්න එපා.. ඔයාලා දිහා බලාගෙන අපි ඉන්නව භාෂිණී..'' ක්‍රීඩා ගුරුතුමිය මගෙ ළඟට වී කීවාය.

''මං දන්නව මිස්. මට මගෙ කණ්ඩායම ගැන විශ්වාසෙ තියන්න පුළුවන්..'' මම තිර හඬින් කීවෙමි.

''ක්‍රීඩාවේ අරමුණ ජය පරාජය දෙකම එක විදියට විඳ ගන්න පුරුදු වෙන එක.'' ඇය කීවාය. අපි ලහි ලහියේ ක්‍රීඩා ඇඳුම් වලින් සැරසමින් සිටියෙමු. සත්තකින් ම එකී කලබලකාරී මොහොතේ අපට බාහිර ලෝකය අමතක වී තිබිණි.





මම මගේ කණ්ඩායම පෙරදැරි කොට ගෙන ක්‍රීඩා පිටියට අවතීර්ණ වෙමින් සිටියෙමි. සියළු නෙත් අප වටා යොමු වෙමින් තිබෙන බැව් මට වැටහිණ. සියුම් ආඩම්බර හැඟුමක් මහිත පුරා දිව යමින් තිබිණ.

ක්‍රීඩා පිටියේදී අප කණ්ඩායම නිසිතැන් ගනිද්දී පිටිය වටා හුන් අයගෙන් අත් පොළසන් නාදයක් පැතිර ගියේය. මහිත වඩ වඩාත් දිරිමත් වෙමින් තිබිණි. ''මගේ විදුහල්පති මැණියන්ටත්, ගුරු මැණිවරුන්ටත් මගේ පාසලටත් ගෞරවය ජයග්‍රහණය ගෙන එමි..'' මම එලෙසින් සිතින් ප්‍රතිඥා දුන්නෙමි.

හරියටම පෙරවරු නමයට සියළු ප්‍රීති ඝෝෂා මධ්‍යයේ තරගය ඇරඹිණ.

බොහෝ වේලාවක් උත්සාහ කර ගෝල් එකක් ලැබුම සඳහා සංඝමිත්තාවෝ බෝලය මා අසලටම ගෙන ආහ. එකී බෝලය දිනුම් සීමාවට යන්නට නොදී මම සාර්ථකව රැක ගත්තෙමි.

අපේ කෙල්ලෝ දිව විත් එක පොදියට මා සිප ගත්හ. එහෙත් අප ලද ඒ සතුට වැඩි වේලාවක් රැඳී නොතිබිණ. නොසිතූ ලෙස සංඝමිත්තා කණ්ඩායම විසින් ලකුණක් හිමි කර ගන්නා ලදී. මම බෙහෙවින් පසුතැවිලි වීමි. ඒ සමග කාල වේලා ගෙවී ගොස් තිබුණ බැවින් තරගයේ පළමු වටය නිමා විය.

මම සියල්ලන්ටම පෙර අපේ විවේකාගාර කාමරයට දිව ගියෙමි. ලකුණින් හෝ ඔවුන් ලද දිනුම මහිත වේදනාවෙන් බර කොට තිබිණ.

අසුනකට වැඩුණාක් සේ හිඳගත් මම පුටු ඇන්දට බර වී හිස ඒ මත සඟවා ගෙන හඬන්නට වූයෙමි.

''භාෂි.. මොකද මේ..?'' අපේ යෙහෙළියන්ගේ කටහඬ ඇසිණ. ඒ ඇසෙත්ම මගේ හැඬුම් වැඩි විණ.

''පිස්සු කෙල්ල.. තාම තරගෙ පටන් ගත්ත විතරයි.. එක ගෝල්



Scanned by CamScanner

එකකට මෙයා මේ අඬනව..'' මට අනෝජාගේ කටහඬ ඇසිණ.

''ඔන්න මිස් එනවා..'' ඒ සමගම මට ඇසිණ.

''මොකද මේ..?''

''ගෝල් එක මිස් වුණාට..''

''භාෂිණී අයියෝ ඇයි මේ.. ඔයා හරියට තාම පොඩි ළමයෙක් වගේනෙ..'' එලෙස කියමින් ගුරුතුමිය මා අසලින් වාඩි වූවාය. මම ඇගේ උරහිසේ එල්ලී ගතිමි.

''භාෂිණී මේ බලන්න.. තාම අපි ඉන්නෙ තරගෙ ආරම්භයේ. ඔයා ධෛර්යයමත් වෙන්න ඕන වෙලාවක අඬල හරියනවද..?'' ගුරුතුමිය තිර හඬින් කීවාය. මම ඇගේ වදන් අසා කඳුළු පිසදා ගතිමි. ඔව් තවමත් අපට අවසර ඇත. කාලයා අපට නිසි තැන් දෙනු ඇත.. මට එසේ සිතිණ.

දෙවන වටයට මා මුහුණ දුන්නේ එලෙසින් සිතට කා වද්දමිනි. තරග වටය නිමා වන්නට ඔන්න මෙන්න තිබියදී අපි ගිලිහී ගිය ගෝල් එක රැක ගතිමු. ප්‍රීතිය, සතුට අප වටා ගලා යමින් තිබිණ. කණ්ඩායම් දෙකම සමතැන් ලබා තිබිණ. විනිසුරු මඬුල්ලේ තීරණයට අනුව යළිත් වරක් තරගය පැවැත්විණ. ඔව්.. අපේ ම ...වාසනාව අපට ලබා දෙමින් අපි දෙවන ලකුණ ලබා ගතිමු.

අපි එක පොදියට තුරුලු වී කෑ ගැසුවෙමු. සිප වැළඳ ගත්තෙමු. ...ගින් දිගටම පැවතුණ සංඝමිත්තා වාර්තාව කඩන්නට තරම් අප ...ක්ෂයන් වී සිටියදී තවත් කුමන ජයග්‍රහණයන්..?''

... සුබ පතන්නන් ගෙන් අඩුවක් අපට නොවිණ. දිස්ත්‍රික් ශූරතාව ...මගින් සමස්ත ලංකා තරග වටයට ඇතුල්වීමේ සුදුසුකම අපි ලබා ...න තිබුණෙමු. මගෙ දෙනෙත කඳුළින් පෙඟී තිබිණ. විවේකාගාරයට ...මිණී අපි ලහි ලහියේ ඇඳුම් මාරු කර ගතිමු.

''භාෂිණී අන්න ඔයාව මීට් වෙන්න කවුද ඇවිල්ලා..'' කිසිවෙකු





පැමිණ මට කීය. මම කුහුලින් දැස් කුඩා කොට ගෙන මොහොතක් වේලා බලා සිටියෙමි.

''ගිහින් බලපං කවුද කියලා..'' අනෝජා කීවාය. මම විවේකාගාරයෙන් පිටතට ආවෙමි.

මා ඉදිරියෙහි සිනාසෙමින් සිටි ඔහු දුටු සැනින් මගේ දෙපා ගල් ගැසුණා සේ විය. දෙවියනි මට ගැලවුමක් නැතිද?

''මයි කන්ග්‍රැජුලේෂන්ස්..'' ඔහු මට අත පෑවේය. මම ද කළ යුතු කිසිවක් නොවූ හෙයින් තැන්ක්ස් කියමින් අත දුන්නෙමි.

රොහාන් මගේ අතගෙන දෝතින්ම මිරිකා ගත්තේය. මම වහා අත ඇද ගතිමි.

''මම දැනගෙන හිටිය දිනනවා කියලා..'' ඔහු කීය.

''ඒ කොහොමද..?''

''ඔයා ලකීනෙ.. ඒකයි..''

''මම නෙමේ මගෙ ටීම් එක ලකී..'' මම මදක් තදින් කීවෙමි.

''ඒක නෙමේ අපි ආයෙ කොහොමද මීට් වෙන්නෙ..?'' රොහාන් විමසද්දී මහිත කෝපයෙන් පිරිණි. දිනක් දෙකක් කතා කළ පමණින් හමුවෙන්නට පතන කොල්ලන්ට මා කවදත් අකැමැතිය.

''අ'ම් වෙරි සොරි.. මං කැමති නෑ කවුරුවත් එහෙම මීට් වෙන්න..'' මම දැඩි ලෙසින් කීවෙමි.

''නපුරු වෙන්නෙපා ඔය තරමට..'' ඔහු අයැදුම් හඬින් කීවේය.

''මගේ නපුරුකම මට හොඳයි..'' මම ඔහුට ඉඩක් නොතබාම කීවෙමි.

''මං කතා කරනවට ඔයා අකැමැතිද භාෂිණී..?'' රොහාන් ඇසීය.

''නෑ ඕනවට වැඩිය වදයක් වෙනවට මං කැමති නෑ..''

''මං ඔයාට වදයක් වුණේ නැහැනෙ භාෂිණී..'' ඔහු සෙමින් කීය.



Scanned by CamScanner

''ඒත් මොකටද අපි නිකරුණේ මූණ ගැහෙන්නෙ..?'' මම ඇසුවෙමි.

''මට ඔයත්තෙක්ක ටිකක් කතා කරන්න ඕනැ..''

''මාත් එක්ක කතා කරන්න ඕන නම් දැන් කියන්න.. දැනුත් අපි හමුවෙලානෙ ඉන්නෙ..'' මම සිනාසෙන්නට උත්සාහ ගනිමින් කීවෙමි.

''මෙහෙම කලබලේ කතා කරන්න බැහැ..''

''මට පරක්කු වෙනවා..'' මම එකී අවස්ථාව මඟ හරිමින් කීවෙමි.

''කියන්න මට.. ආයෙ මාව මීට් වෙනවද කියලා..?''

''මං මොකටද ඔයාව මීට් වෙන්නේ..?''

''ප්ලීස් භාෂිණී මාව එක පැයකට මීට් වෙන්න..'' එසේ කියමින් රොහාන් මගේ අතින් ඇල්ලීය.

මහිත කෝපයෙන් පුපුරු ගැස්විණ. දෙවරක් නොසිතාම මම අත්ල දිග හැර ඔහුට පහරක් ගැසුවෙමි.

''භාෂිණී..'' එලෙස කෑ ගසමින් මගේ මිතුරියෝ මා අසලට දිව ආහ.

''ඔයාට පිස්සුද භාෂිණී..?'' මිතුරියෝ මා ඉවතට ඇදගෙන යමින් ඇසූහ.

''මට නෙමෙයි පිස්සු උෟට..'' මම තරහින් කීවෙමි.

''ඔයා නම් මහ පල් වැඩක් කළේ..'' අනෝජා මට චෝදනා කළාය.

''මොකක්ද මම කරපු පල් වැඩේ..?'' මම කෑ ගසා ඇසුවෙමි.

''මේ දැන් ඒ දේ වෙලා ඉවරයිනෙ.. අපි පස්සෙ ඒ ගැන කතා කරමු.. මිස් දැන ගත්තොත් එහෙම මෙතන විසුමක් වෙන්නෙ නැහැ.. දැන් යමු..'' දීප්ති සියල්ල සමථයකට පත් කරන්නට මෙන් කීවාය. එහෙත් මහිතෙහි ඇවිලී ගිය කෝපය නොනිවී තිබිණ.

අපි ගුරුතුමියගෙන් සමුගෙන සංඝමිත්තාවෙන් පිට වෙන්නට ගියෙමු. දිලිප් අයියා කලබලයෙන් මෙන් අප වෙත එනු මට පෙනිණි.





මම නැවතී බලා සිටියෙමි.

''දිලිප් අයියෙ ඇයි..?''

''නංගී ෂෙහාන්ව දැක්කෙ නැද්ද..?'' ඔහු හතිලමින් ඇසීය.

''නැහැ ඇයි ඒ..?'' මම විමසුවෙමි. දිලිප් අයියා නිහඬවම නළල රැලි කරගෙන කල්පනා කරන්නට විය.

''ඇයි අයියෙ මොකද? ෂෙහාන්ට කරදරයක්ද..?'' මම කලබලයෙන් මෙන් ඇසුවෙමි.

''ෂෙහාන් තවත් කට්ටියක් එක්ක රොහාන්ව ඇදගෙන ගියා කියලා මට පණිවිඩයක් ලැබුණා..''

''මොනවා..'' මම විස්මයෙන් තෙපලුවෙමි.

''මං දන්නෑ මේ යකා මොනව කරගනීද කියලා..'' දිලිප් අයියා කීය.

''අනේ දිලිප් අයියෙ බලමු කොහෙද කියලා..'' මම ඇවිටිලි හඬින් කීවෙමි. මහිත බෙහෙවින් බියපත්ව තිබිණ.

''අනෝජා..'' මම ඇය ඇමතුවෙමි.

''ඇයි..?''

''ලොකු හදිස්සියක්. අනිත් අයට යන්න කියලා උඹ වරෙන් අපිත් එක්ක..'' මම කීවෙමි.

ඇය අනෙක් යෙහෙළියනය් වෙත දිව ගොස් යමක් කියා යළි මවෙත දිව ආවාය.

''ඉස්සර වෙලා මට කියපං මොකද වෙලා තියෙන්නෙ කියලා..'' අනෝජා විමසුවාය. මම ඇයට කෙටියෙන් ඇතිව ඇති තත්ත්වය පැහැදිලි කොට දුනිමි.

''මට නිකමට හිතෙනව ඉන්න තැන.. එන්න යමු..'' දිලිප් අයියා එලෙස පවසා ඉස්සර විය.



Scanned by CamScanner

අපි ඔහු පසු පස්සෙ ඉක්මන් ගමනින් ඇවිද ගියෙමි. එය ඇවිද්දාට වඩා දිව යාමක් විය.

අපි සංඝමිත්තාවට එහායින් තිබූ මහින්දයට යන මාවතට හැරුණෙමු.

''මට බයයි අනෝජා..'' මම ඇගේ අතින් අල්ලා ගනිමින් කීවෙමි.

''මටත් හිතා ගන්න බෑ වෙන්න යන්නෙ මොකද්ද කියලා.. උඹ ඉස්සෙල්ල රොහාන්ට ගැහුවා.. දැන් ෂෙහාන්.. පව් බං මොනව වුණත් රොහාන් අහිංසකයෙක්..'' අනෝජා දොස් නගන්නට වූවාය.

''උඹ මොකද්ද අනෝ මට දැන් කරන්න කියන්නෙ..?'' මම විමසුවෙමි.

''මොනව කරන්නත් දැන් ෂෙහාන් ඉන්න තැනක් හොයා ගන්න එපායැ.. රොහාන්ව මැරුවද දන්නෙත් නැහැ.. එහෙමට උන්නෙ තරහ ආවම..''

''නංගී අපි ගැන වැරදි විදියට හිතාගෙන ඉන්නෙ.. රොහාන් අතින් මොකක් හරි වැරැද්දක් වෙන්න ඇති.. නැත්තං ඔහොම අරන් යන්නෙ නෑ..'' දිලිප් අයියා කීය.

''වැරැද්ද මෙන්න වැරැද්ද..?'' අනෝජා මාව ඔහුට පෙන්නුවාය.

''දැන් ඕව ගැන කතා කරල වැඩක් නෑ.. උං කොහෙද කියලා හොයාගෙන ඉන්න එපායැ..'' දිලිප් අයියා ගමන ඉක්මන් කරමින් ...වේය.

අපි කන්ද නගිමින් සිටියෙමු. දිලිප් අයියාට නැගුම ගාණක් නොවුණ අනෝජාටත් මටත් එක ගැම්මට කන්ද නැගීම අපහසු විය. එහෙත් ...හසුවෙන් හෝ යා යුතුව තිබිණ. අප වංගුව පසුකළා පමණි. ...හානුත් අනෙක් මිතුරු කැළත් අපට මුණ ගැසිණි.

...උඹල කොහෙද මේ..?'' ක්‍රිෂාන්තයියා අප දුටු සැනින් විමසීය.

...ට ඉස්සෙල්ලා කියපන් දැන් කෝ රොහාන්..?'' දිලිප් අයියාගේ





එකී පැනයත් සමග ඔවුන් සියලු දෙන මුහුණින් මුහුණ බලාගනු අපට පෙනිණ.

''ඔයා මොකද්ද ෂෙහාන් මේ කරපු අපරාදෙ..?'' මම හඬමින් ඇසුවෙමි.

''මොකද්ද..?'' ෂෙහාන් කිසිවක් නොදත්තෙකු ලෙසින් අසද්දී මහිතට සිහින් කෝපයක් ගලා ආවේය.

''කෝ රොහාන්..?'' දිලිප් අයියා උස් හඬින් ඇසීය.

''උඹ හිතුවද මේක රිච්මන්ඩ් එක කියලා රොහාන්ව හොයන්න..?'' ක්‍රිෂාන්තයියා ඇසීය.

''උඹල ඒ අහිංසකයට ගැහුවද..?''

''නෑ දෙක තුනක් අතගාලා යන්න ඇරියා..'' ෂෙහාන් නපුරු හඬින් කියද්දී මට ඔහු දෙස බැලිණ.

''උඹ වගේ බූරුවෙක් නෑ..'' දිලිප් අයියා කීය.

''මං බලාගෙන මිනිහා මෙයාට සංඝමිත්තෙදි පාර්ට් දානවා.. බට්ටි මිනිහට ගහපු එකත් මං බලාගෙන..'' ෂෙහාන් කීවේය.

''ඔයත් ගැහුවද..?'' දිලිප් අයියා විස්මයෙන් මදෙස බලමින් ඇසීය. මම බිම බලා ගතිමි. මා කළ දේහි බරපතලකම මට දැනෙමින් තිබිණි.

''දෙන්නම එකයි..'' දිලිප් අයියා කීය.

''රොහාන්ට තුවාලද..?'' මෙතෙක් නිහඬවම සිටි අනෝජා ඇසුවාය.

''නෑ. ඒත් මිනිහට තව දෙකක් ඇන්නානං හරි..'' ක්‍රිෂාන්තයියා අසන හුන් මා හඳුනන තවත් කෙනෙකු කීය.

''පලයල්ලා යන්න.. ගැරඬි මරල පව් ගන්න එපා.. මං එළියට ගිය ටිකටනෙ මේ හැම දෙයක්ම වුණේ..'' දිලිප් අයියා නොපහන් හඬින් කීවේය. දිලිප් අයියා ඕනෑම දෙයක් ගැන සාධාරණ ලෙස සිතන බව ඔහු හඳුනාගත් දා සිටම මම දැන සිටියෙමි. ඔහු සිටියා නම් මෙවන්



Scanned by CamScanner

දෙයක් සිදු නොවනු ඇත.

මම නිහඬවම ආපසු හැරී එන්නට වීමි.

''බට්ටි ඔහොම ඉන්න..'' මට ෂෙහාන්ගේ කටහඬ ඇසිණි. එහෙත් මහිත බෙහෙවින් රිදී තිබිණ. මම නිහඬවම ඉදිරියට පා එසවීමි.

''මුං දෙන්න නම් මොන නැකතක උපන් දෙන්නෙක්ද මන්දා හැම තිස්සෙම තරහ වෙනවා..'' ක්‍රිෂාන්තයියා කියනු මට ඇසිණ. සියල්ලෝම මා පසුපස පැමිණියහ.

''උඹ මාවත් එක්කන් ඇවිල්ලා අන්තිමට මාව අමතක කළා නේද..?'' මා අසලට දුව ආ අනෝජා කීවාය.

''සොරි.. මගෙ හිත හොඳටම අවුල් වෙලා අනෝජා..'' මම සෙමෙන් කීවෙමි.

''උඹ විහින් අවුල් කරගෙන..'' ඇය කීවාය. ඇගේ ස්වරයෙහි පැවැති නොපහන් බව මට වැටහිණ.

''උඹ මාත්තෙක්ක ළඟකදි ඉඳල තරහෙන්මයි කතා කරන්නෙ.. ඇයි ඒ..?'' මම ඇසුවෙමි.

''ඒ උඹට හිතෙන හැටි..''

''නෑ.. නෑ.. ඕන පුංචිම පුංචි වෙනසක් වුණත් මගෙ හිතට හොඳට දැනෙනවා අනෝජා..'' මම කීවෙමි.

ෂෙහාන් මා සමග එක පෙළට වැටිණි. අනෝජා මඳක් නැවතී දිලිප් අයියලාට එකතු වූවාය.

''බට්ටි ඔයාට තේරෙන්නෙ නෑ..'' ෂෙහාන් මා අසලම දුවටෙමින් කීය.

''ඔව් මට තේරෙන්නෙ නෑ.. ඔයාටනෙ ඔක්කොම තේරෙන්නෙ..'' මම නෝක්කාඩු ලෙසින් කීවෙමි.

''නෑ බට්ටි.. මං ආදරේ කරන කෙනාට තවත් කෙනෙක් ආදරේ





කරනව දකින්න මං ආස නෑ.. ඔයා පස්සෙ රොහාන් එල්ලිලා එනවට මං කොහොමත් කැමති නෑ බට්ටි.. ඒකයි මං ඌට එහෙම පනිෂ්මන්ට් එකක් දුන්නේ..'' ෂෙහාන් කීවේය.

''රොහාන් ඔයාගෙන් පලි ගනීවි ෂෙහාන්.. මං ඒකයි කියන්නෙ.. ඔයාට මාව විශ්වාස නම් එච්චරනෙ.. ඔයා මොකටද කා ගැනවත් හිතන්නෙ..?'' මම සෙමෙන් ඔහුගෙන් අසා සිටියෙමි.

''ඒ වුණාට මට තරහ එනවා..'' ඔහු කුඩා දරුවෙකු සේ තෙපලද්දී මට සිනා නැගිණ.

''ඇයි ඔයා හිනා වෙන්නෙ..?'' ඔහු ඇසීය.

''පොඩි ළමයෙක් වෙන්නෙපා ෂෙහාන්..'' මම සිනාසෙමින් කීවෙමි.

''මං පොඩි ළමයෙක් තමා..''

''පේනවා.. පේනවා.. ඒ වුණාට රණ්ඩු වෙන්න ගියාම..?''

''මං රණ්ඩු වුණේ නැනෙ බට්ටියෙ..'' ඔහු අහිංසක ලෙසින් කියද්දී මහිතට දැනුණේ ඔහු පිළිබඳ දැඩි සෙනෙහසකි.

''නැත්තෙ මොකද රොහාන් එක්ක රණ්ඩු වුණේ නැද්ද..?'' මම ඇසුවෙමි.

''ඒ ඉතින්..'' කියමින් ඔහු සිනාසී මදෙස බැලුවේය.

''ඊර්ෂ්‍යාව..'' මම කීවෙමි.

''ආදරේ කරන ඕනම කෙනෙක්ගෙ හිතේ ඊර්ෂ්‍යාව කියලා දෙයක් තියෙනව බට්ටි.. මං මොනව කරන්නද ඒකට..?'' ඔහු එලෙසින් කියද්දී මට යළිත් සිනා නැගිණි.

''අහන හැටි විතරක්..'' මම නෙතඟින් ඔහු දෙස බලා කීවෙමි.

''ඒ පාර උන් දෙන්නා යාළුවෙලා.. අපිවත් අමතක වෙලා..'' මට ක්‍රිෂාන්තයියාගේ කටහඬ පිටුපසින් ඇසිණ. මම නැවතී සිනාසෙමින් පසුපස හැරී බැලීමි. ෂෙහාන් ද මා අනුව නැවතිණි.



Scanned by CamScanner

දිලිප් අයියා නිහඬව ම සිටිනු මට පෙනිණි.

''දිලිප් අයියා ඇයි?'' මම ඇසුවෙමි.

''නෑ නංගී මුකුත් නෑ..'' ඔහු කීය.

''නෑ නෑ මුකුත් නැති වෙන්න බෑ..''

''නෑ මම කල්පනා කළේ ඊළඟට රොහාන් ගහන්න එනකොට ගුටි කන්නත් එපායැ..'' දිලිප් අයියා කීය.

''අයියෝ සිම්පල්නෙ.. ගුටි කමුකො හවුලෙ..'' ක්‍රිෂාන්තයියා, දිලිප් අයියාට තට්ටුවක් දමමින් කීය.

සියලු විහිළු තහළු මැද අපි බසයක නැගී ගාල්ලට පැමිණියෙමු. සියල්ලන් සමුගෙන යද්දී ෂෙහාන් මා ඇරලන්නට පැමිණියේය.

''නපුරුකමට අදත් තරහ වෙලා ගියා නම් නෙ වැඩේ..'' ෂෙහාන් බස් නැවතුම හරහා යද්දී කීවාය.

''මොකද කරන්නෙ ඔයා..?'' මම විමසුවෙමි.

''ආයෙ ජීවිතේටටම කතා කරන්නෙ නෑ..''

''ඔයාට පුළුවන්ද එහෙම මාත් එක්ක කතා නොකර ඉන්න..? ඔයාට පුළුවන් නම්..'' එතනින් එහාට කිසිවක් කියා ගත නොහැකිව මම නිහඬ වූයෙමි.

''මෝඩි, ටක් ගාල තරහ ගස්සන්න පුළුවන්.. අන්න බස් එක තියෙනවා.. යන්න මං මෙතනින් නතර වෙන්නම්..'' ඔහු මවෙත වඩාත් ළංව කීවේය.

''ඔයත් පරිස්සමින් යන්න.. මං එහෙනම් යන්නම්..'' මම ඔහුගෙන් සමුගෙන දිවවිත් බසයට නැග ගතිමි.

මහිත පුරා ඉතිරී තිබූ සතුට පිටුපස කිසියම් තැවිල්ලක් සැඟව තිබිණි. ඒ රොහාන් නිසා බව මට දැනිණි.

මා නිවසට පැමිණෙද්දී යාන්තමට අඳුර ගලා එමින් තිබිණ. මම





කාමරයට ඇතුලු වෙද්දී කිසිවෙකු විසින් මගේ කාමරය අවුස්සා දමා ඇති බවක් මට දැනිණ.

මා නැති විටෙක මෙලෙසින් කාමරය අවුස්සා සොයන්නේ කුමක්දැයි මට සිතා ගත නොහැක. ඇඳුම් මාරු කරගෙන ඇඟ සෝදා ගත් කල දැනුණේ කිව නොහැකි අන්දමේ සුව පහසු බවකි. ගිනි මද්දහනේ දූවිල්ලෙහි පෙරළෙමින් සෙල්ලම් කොට, දහදිය කුණු වැකුණු කය සිහිල් දියෙන් සතපාගත් විට දැනෙන සහනය..

මම සැහැල්ලු ගවුමකින් සැරසී තුවාය කර වටා දමාගෙන ගෙමිදුලෙහි සේපාලිකා ගස යට වූ බංකුවෙහි වාඩි වීමි. වෙහෙස නිසාම දෙපා මඳක් ඇදුම්කනු මට දැනිණ. මම දෙපා ඔසවා බංකුව මතට ගත්තෙමි. මට කොහේදෝ නිවසට ගු-වන් විදුලියෙන් නැගුණ ගී හඬක් ඇසිණි. මම ඊට සවන් පෑවෙමි.

''මවකගෙ උණුහුම නොලබා

සැපට නිදන පුතේ

ඔබටත් මට මෙන් තනිකම

දැනෙනවාද පුතේ..''

සැබැවින්ම එකී රාවය මහිතට යවුල් පහරක් සේ විය. මගේ ම රත්තරන් අම්මා සිහිපත්වීම තරම් තවත් වේදනාවක් මේ මිහිමත මට නොවීය. මගේ දෙනෙත කඳුළින් පෙඟී යමින් තිබිණ.

''භාෂිණී ඇයි මේ..'' කාගෙදෝ කට හඬකින් මම තිගැස්සී ගියෙමි.

''ඇයි ඔයා අඬන්නෙ..?'' සුභාෂ් අයියා මවෙතින් ඇසීය.

''ප්ලීස් සුභාෂ් අයියා.. මෙතනින් යන්න.. මට මගෙ පාඩුවේ ඉන්න දීලා..'' මට ඔහු කෙරේ දැනී තිබූ අප්‍රසාදය තවමත් තුනී වී නොතිබිණ.

''කමක් නෑ භාෂිණී මම යන්නම්.. මම ඔයාට කරදරයක් කරන්නෙ නෑ..'' සුභාෂ් අයියා බිඳුණු හඬින් කියා යන්නට ගියේය. මම ඔහු යන දෙස ඔහේ සිත් පිත් නැත්තියක සේ බලා සිටියෙමි.



Scanned by CamScanner

# 8

**එක** සෙනසුරාදාවක ෂෙහානුත්, මමත් ගාලු කොටුවේ ප්‍රදීපාගාරය අසලට ගියෙමු.

ඔහු නිසංසලව මුහුද දෙස බලාගෙන සිටියේය. මම ඔහුට නොදැනෙන්නට ඔහු වත දෙස බලා සිටියෙමි. ඔහුගේ වත දෙස බලා හිඳින්නට, බලා හිඳින්නට මහිතෙහි සෙනෙහස දෝරේ ගලා යමින් තිබිණි.

මොහොතකට පසුව මා ඔහු දෙස බලා හිඳින බව ඔහු දුටුවේය.

''ඇයි..?'' අඩ සිනාවක් මුවට නගා ගනිමින් ෂෙහාන් ඇසීය.

''ලස්සන බලන් හිටිය..'' මම හිස ඇලකොට කීවෙමි.

ඔහු සෙමෙන් මා වතට පහත් විණ. සෙනෙහස නළලත තවරා ගන්නා ආශාවෙන් මම දෙනෙත පියා ගතිමි. ඔහු දෙතොලත මා නළලත හාදු වෙද්දී මම ඔහු උරහිස මත හිස තබා ගත්තෙමි.

''බට්ටි..'' ඔහු දයාබර ලෙසින් තෙපලීය.

''මිහ්..''

''කවදාක හරි අපි බලාපොරොත්තු වෙන දේවල් ඉෂ්ට කරගන්න අපිට ඉඩ ලැබෙයිද..?'' ෂෙහාන් ඇසීය.

''ඇයි ෂෙහාන් ඔයා එහෙම ඇහුවෙ..?'' මම ඔහුගේ දෙනෙතට එබෙමින් ඇසුවෙමි.

''මම දන්නෙ නෑ බට්ටි.. අපේ අනාගතේ කොහොම වේවිද කියල





කාටද දෙයියනේ කියන්න පුළුවන්..'' ඔහු දුරක නෙතු රඳවාගෙන කීය.

''මෙච්චර කාලයක් තිස්සෙ මගේ ජීවිතේ හැමදේම සිද්ද වුණේ මටම අවාසි වෙන විදියට.. සමහර විට මටත් ඔයත් නැතිවෙයි.. එහෙම වුණොත්..'' මම කතාව නවතාලීමි.

''එහෙම වුණොත් ඔයා මොකද කරන්නෙ බට්ටි..?''

මට ඊට පිළිතුරක් දී ගත නොහැකි විය. මා දෙනෙත කඳුළින් පෙඟුණි.

''ඔය.. ඔයා අඬනව.. ළමයො ජීවිතේ කියන්නෙ ප්‍රශ්න ගොඩාක්.. ඒ හැම ප්‍රශ්නෙකටම අපි මූණ දෙන්න ඕනැ බට්ටි..'' ඔහු මට අවවාදාත්මකව කීවේය.

''ඔයා දන්නවනෙ ෂෙහාන්.. මං අම්ම තාත්තවත් හරියට නැති කෙල්ලක්.. මගෙ හිතට තියෙන එකම එක සැනසීම ඔයා විතරයි.. මට ආදරේ කරන්න ඉන්නෙ ඔයා විතරයි.. එහෙම එකේ මං ඔයා නැතුව ඉන්නෙ කොහොමද..?'' මම හඬා වැටෙමින් ඇසීමි.

''මං දන්නව බට්ටි.. ඒ සේරම මං දන්නව.. ඒ සේරම දැන ගත්තු හින්ද තමයි මං ඔයාට වැඩියමත් ආදරේ..''

''මගෙ ජීවිත කතාවත් හරියට ෆිල්ම් එකක් වගේ.. කෙනෙකුට අදහන්නත් බැරි තරම්..'' මම කීවෙමි.

''පිස්සු කෙල්ල ඕව ගැන හිතන්නෙ නැතුව එන්න..'' ෂෙහාන් නැගිටිමින් කීය.

මම හිඳ සිටි තැන එසේම සිට ඔහු දෙස බලා සිටියෙමි.

''මෙහෙ එනවා..'' ඔහු සිනාසෙමින් කියා දෙඋරහිස්වලින් අල්වා මා නැගිටවීය.

''එනවා කියන්න එපා..'' මම නෝක්කාඩු ලෙසින් කීවෙමි.

''හරි හරි එන්න මගෙ හොඳ කෙල්ලනෙ..''



Scanned by CamScanner

මම බොරුවට අකැමැත්ත පා නැගිට්ටෙමි.

"කොහෙ යන්නද මේ මාව අදින්නෙ..?"

"අම්මෝ මේ කෙල්ලට යන තරහ.. මූණෙ හැටි.. රැල්ල පාගන්න යන්න කතා කළේ.." ෂෙහාන් කීය.

"ආ.. රැල්ල පාගන්න නං මං එන්නම්.." මම සතුටින් කීවෙමි.

අපි පාවහන් ගැලවීමු. මම ඔහුගේ වමතෙහි එල්ලුණෙමි. සුදු පෙන පිඩු අපේ දෙපා සිප ගනිද්දී මම දඟකාර ලෙස වතුරට පයින් ගැසීමි.

"තියෙන දඟේ.." ෂෙහාන් මා තවත් තුරුල් කර ගනිමින් කීවේය.

මම එක්වරම ඔහුගෙන් මිදී වතුර දෝතක් ගෙන ෂෙහාන් දෙසට විසි කළෙමි.

"ඒයි.." ෂෙහාන් කෑ ගැසීය.

මම මහ හඬින් සිනාසුණෙමි.

වෙරළෙහි එයා රැඳී හුන් කිහිප දෙනෙකු ද අප දෙස බලනු මම දුටුවෙමි. එහෙත් මම එය ගණනකටදු නොගෙන සිනාසුණෙමි. ෂෙහාන් නොමනාපයෙන් මෙන් මදෙස බලා හුන්නේය.

"ෂෙහාන් ඇයි මේ..? මම විහිලුවක්නෙ කළේ.." මම ඔහු අසලට යමින් කීවෙමි.

"බට්ටි ඔයා ඔය විදියට හිනා වෙන්නෙපා.." ඔහු මට තරවටු කළේය.

"ඇයි ඒ..?" මම ළදරුවෙකු සේ ඇසුවෙමි.

"ගෑණු ළමයෙක් කියන්නෙ මලක් වගේ පිවිතුරුයි කියන එක. ඒ පිවිතුරු කමට හානියක් වෙනවට මං කැමති නෑ බට්ටියෙ.."

"හිනා වුණා කියලා පිවිතුරුකම නැති වෙනවද ෂෙහාන්.? එහෙමනං ඉතින් හිනා නොවී බුම්මගෙන ඉන්න තමා වෙන්නෙ.."





මම නොරිස්සුම් ලෙස කීවෙමි.

"ඔය ඉතින්.. ඔයා මං කියන දේ තේරුම් ගන්නෙ නැහැනෙ. මං දන් හිනාවෙන්න එපා කියල කිව්වද..?" ෂෙහාන් මගේ නිකටින් අල්ලා සොලවමින් ඇසුවේය.

මම නිහඬවම නොමනාපයෙන් යුතුව බලා සිටියෙමි.

"තරහ යන හැටි.. නපුරි.." ෂෙහාන් අඩ සිනාවකින් යුතුව කියද්දී මහිත රිදිණි.

"මං නපුරියක් තමා.. ඔයා තරම් කරුණාවන්ත නැති බවත් ඇත්ත. මගෙ නපුරුකම මට තිබුණාවෙ. නපුරු අය ළඟින් ඈත් වුණාම ඉවරනෙ.." මම සෙමෙන් කීවෙමි.

"බට්ටි.. අම්මේ මේ කෙල්ල හිතල තියෙන දුර.. මං විහිලුවටනෙ කිව්වෙ.. මේ බලන්න.." ඔහු මා, ඔහු වෙතට හරවා ගන්නට උත්සාහ ගත්තේය.

"ඇයි ඉතින්..?" මම ඔහුගේ අත ගසා දමමින් කීවෙමි. ඔහුගෙන් මිදෙන්නට ඇසිල්ලක් නොතබාම ඔහු එක්වරම මා තුරුලට ගෙන සිප ගන්නට විය. මම ඔහුව තල්ලු කළෙමි. එහෙත් ෂෙහාන්ගේ දෑතෙහි ලිහිලක් නොවිණ.

"එපා ෂෙහාන් එපා.." දැඩි වෙහෙසින් යුතුව මම කීවෙමි.

"එහෙනම් මා එක්ක තරහ නෑ කියන්න.."

"තරහ නෑ.. නෑ.. නෑ.." මම කුඩා දැරියක සේ කීවෙමි. ඔහු මා අත හැරියේය.

මම වෙරළේ එහා ඉම දෙස බැලීමි.

"ෂෙහාන්.." මට එක්වරම විමතියෙන් යුතුව කියැවිණි.

රොහාන් තවත් කවුදෝ සමග අප දෙස බලාගෙන සිටියේය. මසිත කිසියම් වටහාගත නොහැකි බියකින් සලිත වෙමින් තිබිණ.



Scanned by CamScanner

''රොහාන්ල නේද..?'' ෂෙහාන් විමසීය.

''ඔව්, මට බයයි ෂෙහාන්..'' මම ෂෙහාන්ගේ අතේ එල්ලී කීවෙමි.

''මොනවටද බය වෙන්නෙ..? ඔයා ගණන් ගන්නෙ නැතුව ඉන්න..'' ෂෙහාන් කීවේය.

එහෙත් කුමක් හෝ වෙනස් දෙයක් සිදුවෙතැයි යන බිය මහිතට දැනෙමින් තිබිණ.

''අපි අර පැත්තෙන් යමු..'' මම රොහාන්ලාට ප්‍රතිවිරුද්ධ දිශාව ෂෙහාන්ට පෙන්වමින් කීවෙමි.

''අපි මොකටද කාටවත් බයේ දුවන්නෙ..?'' ෂෙහාන් මදෙස දෑඩි බැල්මක් හෙලමින් කීවේය.

රොහාන්ලා අප වෙතට එමින් සිටිනු මට පෙනිණි.

''බලමු මොකාටද එන්න හදන්නෙ කියලා..'' ෂෙහාන් ඇසෙන නෑසෙන හඬින් කීය.

ඔවුන් අප වෙත ළංවෙන්නට, ළංවෙන්නට මහිත ගැහෙන හඬ මටම ඇසෙමින් තිබිණ.

''ෂෙහාන් තමුසෙ මහ චන්ඩියෙක් වෙලා නේද..?'' රොහාන් අප ඉදිරියට පැමිණ ඇසීය.

''මගෙ චන්ඩිකම් ගැන දැන ගන්න ඕනැද..?'' ෂෙහාන් ඇසීය.

''අනේ ෂෙහාන් අපි යමු..'' මම ඔහුට ඇවිටිලි කරන්නට වීමි. එහෙත් ඔහු එය ගණනටවත් නොගත්තේය.

''තමුසෙලා එදා කට්ටියක් වටකරගෙන ගැහුවෙ තනි මටනෙ.. දැනුත් පුළුවන් නං ඒ චන්ඩිකම් පෙන්නනව..'' රොහාන් තර්ජනාත්මකව කීවේය.

''චන්ඩිකම් බලාගන්න ඕන නං එනව ළඟට..'' ෂෙහාන් එසේ කියමින් පියවරක් ඉදිරියට තැබුවේය.





''ෂෙහාන්..'' මම කෑගැසුවෙමි.

''බට්ටි ඔයා පැත්තකට වෙන්න..'' ෂෙහාන් අණ දෙන සේ කීවේය.

''මොකද්ද රොහාන් ඔයාලා මේ කරන්න හදන්නෙ..? කරුණාකරලා අපිට අපේ පාඩුවේ ඉන්න දීලා යන්න රොහාන්..'' මම මඳක් වේගවත්ව කීවෙමි.

රොහාන් මදෙස මොහොතක් වේලා බලා සිටියේය.

''කරුණාකරලා යන්න රොහාන්.. යන්න..'' මම උස් හඬින් කීවෙමි.

තවත් මොහොතක් නිහඬව බලා හුන් රොහාන් ආපසු හැරී ඔහු සමග පැමිණි අයත් සමග යන්නට ගියේය.

මට එය අදහාගත නොහැකිවාක් මෙන් ඔවුන් ගිය දෙසම බලා සිටියෙමි.

''ඔයාට හරි කීකරුයි වගේ නේද..?'' ෂෙහාන් උපහාසාත්මකව අසද්දී මම ඔහු දෙස බැලීමි.

''මං බයේ ගැහුණ මෙතන මහා රණ්ඩුවක් යයි කියලා..'' මම කීවෙමි.

''ඇයි ඔයා ඒකට ඉඩ නොදුන්නෙ..? දැන් ඔය යකා ගියේ නිකං කියලද ඔයා හිතන්නෙ..?'' ෂෙහාන් තරහින් මෙන් ඇසීය.

''ඔයත් අහන්නෙ හරිම අපූරු දේවල් තමා.. රොහාන් ගිය එක ගැන සතුටු වෙනව නෙමෙයි තව රණ්ඩු අල්ලන්නයි හොයන්නෙ..'' මම නොමනාප ලෙසින් කීවෙමි.

''බට්ටි මට දුක තියෙන්නෙ ඌට ගහන්න බැරිවුණ නිසයි..'' ෂෙහාන්ගේ කටහඬ තරහින් පිරී තිබිණ.

''ෂෙහාන් ඔයා ඕනම දේකදි තරහ ගන්නව වැඩියි.. පොඩ්ඩක් ඉවසල කල්පනා කරල බලන්න..''

''හරි හරි මමනෙ දැන් වැරදිකාරයා නේද? රොහාන් හරි.. ඒකනෙ



Scanned by CamScanner

ඔයා කියන්නෙ..''

ඔහු එය කියූ ආකාරයට මට සිනා නැගිණ. මගේ සිනාවෙන් තවත් කෝප වූ ෂෙහාන් වෙරළ දිගේ ඉදිරියට යන්නට විය.

''ෂෙහාන්..'' මම ඔහු ඇමතුවෙමි. එහෙත් ඔහු නැසෙන සේ යන්නට විය.

''ෂෙහාන් ඔහොම ඉන්න..'' කියමින් මම ඔහු පසු පස දිව ගියෙමි.. මම ඔහු ඉදිරියට පැන ඔහුගේ දෙඋරේ එල්ලුණෙමි.

''ෂෙහාන් මොකද මේ..? මට පුංචි එකෙක් වගේ වැඩ කරන්න එපා කියලා දැන් ඔයාමනෙ ඒ විදියට හැසිරෙන්නෙ..?'' මම ඔහුගේ මුහුණ දෙස බලාගෙන කීවෙමි. එහෙත් ඔහු කතා නොකළේය.

''අනේ ෂෙහාන් කතා කරන්නකෝ..'' මම ඇවිටිලි හඬින් කීවෙමි.

''බට්ටි මගේ හිත රිද්දන්න එපා බට්ටියෙ..'' ඔහු මගේ දෙඋර මත දෝත තබා මා දෙසට එබීගෙන කීවේය. එකී හඬින් මහිත දුකින් පැරී ගියේය.

''මං හිතල ඔයාගෙ හිත රිද්දුවෙ නෑ ෂෙහාන්..'' මම ඔහුගේ ළමැදෙහි හිස හොවා ගනිමින් කීවෙමි.

ඔහු මගේ හිස සෙමෙන් පිරිමැද්දේය. ආදරය, රැකවරණය, විශ්වාසනීයත්වය මහිතට බෙහෙවින් දැනෙමින් තිබිණ. මම තව තවත් ඔහු ළමැදට හිස තදකර ගත්තෙමි.

''බට්ටි..'' ඔහු සෙමෙන් තෙපලුවේය.

''ෂෙහාන්..''

''කියන්න මට.. කවදාවත් මාව දාලා යන්නෙ නෑ කියලා..'' ෂෙහාන් මා සවන් අසල තෙපළීය.

''ඇයි ෂෙහාන් කවදාවත් නැතුව ඔයා එහෙම කියන්නෙ..?''

''මට මොකද්දෝ බයක් දැනෙනවා බට්ටි ඔයාව කවුරු හරි මගෙන්





වෙන්කර ගනී කියලා..'' ෂෙහාන්ගේ ස්වරය බෙහෙවින් දුක්බර විය. එකී දුක්බර බවට වන්දියක් සේ මගේ දෙනෙත කඳුළින් පෙඟී යමින් තිබිණි.

''නෑ නෑ ෂෙහාන් මගෙන් නං කවදාවත් එහෙම දෙයක් වෙන්නෙ නෑ.. ආත්ම ගානක ඉඳලා පෙරුම් පුරලද කොහෙද මේ ආත්මෙ අපි හමුවෙලා තියෙන්නෙ.. මට ඔයාව ඕන ෂෙහාන් මට ඔයාව ඕන.. මාව මගෙ කැමැත්තෙන් වෙන කාටවත් ම අයිති කර ගන්න ලැබෙන්නෙ නැහැ ෂෙහාන්.. සත්තමයි.. මාව විශ්වාස කරන්න..'' මම හඬ හඬාම තෙපලුවෙමි. ෂෙහාන් මගේ නළලත මුදු ලෙස සිප ගත්තේය.

''බට්ටි අපි දැන් යමුද..? අව්වත් සැරයි..'' ෂෙහාන් මුහුදු සුළඟත් සමග දඟ පාන මගේ කොණ්ඩය සකසමින් ඇසීය.

''අනේ ෂෙහාන් අද දවසෙම අපි ළඟට වෙලා ඉම්මු..'' මම ඇවිටිලි හඬින් කීවෙමි.

''මං හවස පුංචි වැඩක් දාගෙන තියෙනවා බට්ටි..'' ෂෙහාන් කල්පනාකාරී ලෙස කීවේය.

''මොකද්ද ඒ..?'' මම ඇසුවෙමි.

''දිලිප්ලත් එක්ක ෆිල්ම් එකක් බලන්න කතා කර ගත්තා..''

''මොකද්ද ඔයාලා බලන්න හිතාගෙන ඉන්නෙ..?'' මම හිස මඳක් ඇලකොට විමසුවෙමි.

''දෝස්ති..''

''අනේ මටත් ආසයි..'' මම කීවෙමි.

''ඔයාට ප්‍රශ්නයක් නැත්නම් කමක් නෑ බට්ටි.. මාත් ආසයි ඔයත් එනව නම්..'' අපි දෙදෙනා ගාලු බස් නැවතුම ඉදිරිපිට වූ හොටෙල් එම්පයර් එකට පැමිණ කෑම කෑවෙමු. සවස දෙක ආසන්න වෙත්ම ෂෙහානුත් මමත් වක්වැල්ල පාර දිගේ ඉදිරියට ඇදුණෙමු. අපි ක්වීන්



Scanned by CamScanner

සිනමා ශාලා භූමියට ඇතුළු වන විටත් දිලිප් අයියාත්, ක්‍රිෂාන්තයියාත් ප්‍රමුඛ ෂෙහාන්ගේ මිතුරන් කැල පැමිණ සිටියහ.

''අනේ බං තනියම එනවයි කිව්ව මිනිහා නේද මේ..?'' ක්‍රිෂාන්තයියා අප දුටු මතින්ම විමසීය.

''මදෑ ඕ.ඩී.සී. ගිහින් ෂේප් කාඩ්ගහන්න හිටියා.. දැන් ඉතින් බැල්කනිම යන්න එපායැ.'' දිලිප් අයියා ඉඟිමරමින් කීවේය.

''කටවල් වහගනිල්ලා.. අපි විතරක් නෙමෙයි තව මිනිස්සු මෙතන ඉන්නවා..'' ෂෙහාන් තරවටු හඬින් කීවේය.

ප්‍රවේශ පත්‍ර ගැන්මට අප පෝලිමට එකතු වෙද්දී අපට ඉදිරියෙන් හුන් කෙනෙකු වෙත මගේ දෙනෙත නිරායාසයෙන් යොමු විණ.

''ෂෙහාන් අර බලන්නකො කවුද කියලා..'' මම ෂෙහාන්ට රහසින් මෙන් කීවෙමි.

තමාලි තවත් කවුදෝ තරුණියෙකු සමග අපට ඉදිරියෙන් සිටියාය.

''බාප්පලට කියයිද ෂෙහාන්..?'' මම ඇසුවෙමි.

''නෑ අපිව දැක්කෙ නැතෙ.. අනික එයත් ඔය ඇවිත් ඇත්තෙ හොරෙන්නෙ.. දැක්කත් කියන එකක් නෑ..''

අපි ශාලාවෙහි අසුන් ගනිද්දී චිත්‍රපටිය පටන් ගැන්මට විනාඩි විස්සක පමණ කාලයක් තිබිණ. ෂෙහාන්ගේ මිතුරන් කැල අපට ඉදිරියේ අසුන් ගත්හ.

''දැන් ඔයාගෙ පාඩම් වැඩ කොහොමද..?'' ෂෙහාන් විමසීය.

''ලබන සතියෙ ඉඳලා අපිට ඉස්කෝලෙ නතර වෙලා පාඩම් කරන්න පර්මිෂන් දුන්නා..''

''ඒක වැඩිය හොඳයි.. කොහොමටත් ගෙදර ඔයාට පාඩම් කරන්න තරම් හොඳ වාතාවරණයක් නැතෙ..''

''විභාගෙ ගැන මතක් වෙනකොට මට නම් බයත් හිතෙනව





ෂෙහාන්..''

''හොඳට පාඩම් කළොත් බය වෙන්න දෙයක් නෑ බට්ටි..''

''අම්මාවරුනේ
අම්මාවරුනේ
සම්මා සම්බුදු
අම්මාවරුනේ''

නන්දා මාලිනියගේ එකී ගීතය ශාලාව නින්නාද කරවමින් ඇසිණ. මම සියලු කතා බහ නතර කොට එකී ගී හඬට සවන් පැවෙමි.

''දරුවන්ගේ දුක්
කඳුලු දකින දා
සුරලොව සිට අත පා
ඒ කඳුළැලි පිසිනා..

මහිත අම්මා පිළිබඳ මතකයෙන් රිදුම් දී දෙනෙතෙහි කඳුලු පිරිණි.

''බට්ටි..''

මම කඳුළු පිරුණ නෙතින්ම ෂෙහාන් දෙස බැලීමි.

''බට්ටි මං දන්නව ඔයාට දුක හිතෙනව කියලා..'' ඔහු මගේ උරහිස වටා වමත යවා මා ඔහුගේ සිරුරට වාරු කර ගනිමින් කීවේය. මම ඔහුගේ උරහිස මත හිස තබාගෙන හඬන්නට වූයෙමි.

''ඔයාගේ ජීවිතේ හැම අඩුපාඩුවක්ම මං සම්පූර්ණ කළත් මට කවදාවත් ඔය අඩුව නම් සම්පූර්ණ කරන්න බැරිවෙයි..'' ෂෙහා කාරුණික හඬින් කීය.

''අම්ම කෙනෙක්ගෙ අඩුව දරුවෙකුගෙ ජීවිතේට මොන තර බලපානවද කියලා මට දැන් තේරෙනව ෂෙහාන්..''

''ඕව ගැන හිතන්න එපා බට්ටි..'' ඔහු එසේ කියමින් මගේ නළල මුදු ලෙසින් සිප ගත්තේය.



Scanned by CamScanner

චිත්‍රපටිය අවසානයේ මම ෂෙහාන්ගෙන් සමුගෙන නිවසට පැමිණියෙමි. මා එනවිටත් තමාලි පැමිණ නොසිටියාය.

* * * * *

ඊළඟ සෙනසුරාදා සවස අනෝජා මා සොයා නිවසට පැමිණියාය. ඒ මොහොතෙහි කිසිවෙක් නිවසෙහි නොසිටි බැවින් මසිතට දැනුණේ සැහැල්ලු බවකි.

''මොකද උඹ කවදාවත් නැතුව..?'' මම කුතුහලයෙන් විමසීමි.

''කෝ ගෙදර මිනිස්සු..?'' අනෝජා මගේ පැනයට පිළිතුරු නොදීම විමසුවාය.

''එයාලා ගමනක් ගිහින්..''

''එහෙනං මං ආව කියල උඹට ප්‍රශ්නයක් වෙන්නෙ නැතෙ භාෂි..''

''ප්‍රශ්නයක් වුණත් මොකද..? උඹනෙ..'' මම ඇගේ අතකින් අල්ලා ඇයව ගෙතුළට කැඳවාගෙන යමින් කීවෙමි.

''ඒක නෙමේ භාෂි මාව මීට් වෙන්න රොහාන් ආවා..''

''රොහාන් ආවා.. උඹව මීට් වෙන්න..'' මම විස්මයෙන් යුතුව විමසුවෙමි.

''හ්ම්..''

''ඉතින් මොකද කිව්වෙ..?''

''උඹ ඌට ගහලත්, මොන දේවල් කළත් මිනිහා නම් උඹ ගැන තියෙන අදහස අත් ඇරගෙන නෑ භාෂි..''

''උඹ කොහොමද එහෙම කියන්නෙ..?''

''රොහාන් කියනව උඹත් එක්ක පැය භාගයක් කතා කරන්න අවස්ථාව දෙන්න කියලා..''

''උඹට විකාරද..?'' මම තරහෙන් ඇසීමි.





''පව් බං රොහාන් කියන්නෙ උඹල අපි හිතන තරම් නරක එකෙක් නෙමෙයි..''

''හොඳයි කියලා උඹ කියන්නෙ අහක යන නයි කරේ දාගෙන පස්සෙ කනවෝ කනවෝ කියලා කෑ ගහන්නද..?''

''මං එහෙම කිව්වද උඹට..'' අනෝජා නොමනාපයෙන් මෙන් කීවාය.

''හරි ඉතිං උඹ මොකද්ද මට කරන්න කියන්නෙ..?''

''භාෂි ඔයා ටිකක් කතා කරලා මිනිහගෙ හිත හැදුව නම් හරි..''

''ඒකෙන් වෙන්නෙ රොහාන් තවත් මං ළංවෙන එක විතරයි.. අනික ෂෙහාන්ගෙ හැටි උඹ දන්නවනෙ.. ඊට මීට වැඩිය හොඳයි මං මේ ඉන්න විදියට ඉන්නං..'' මම කීවෙමි.

''පව් බං..''

''පව් නං උඹ ගිහින් යාලු වෙයන්කො රොහාන් එක්ක..'' මම විහිලුවට කීවෙමි. ඇය තරහින් මුහුණ එල්ලා ගත්තාය.

''අනෝජා..'' මම ඇය ඇමතුවෙමි. එහෙත් ඇය තරහින් ඉවත බලාගෙන සිටියාය.

''අනෝජා උඹට තරහ ගියාද..?'' මම විහිලුවක් කළේ.

''විහිලු නෙමේ.. අන්න උඹලගෙ කුඩම්මද කොහෙද එනවා..'' අනෝජා කී බසින් මම තිගැස්සී ගියෙමි.

කුඩම්මා මා දෙස රවා බලමින් ගෙතුළට ආවාය.

''කවුද ඔය ළමයා..?'' කුඩම්මා අනෝජා දෙස බලමින් ඇසුවාය.

''මම භාෂිණීගෙ යාලුවෙක්..'' ඇය කිසිදු පැකිළීමක් නොමැතිව කීවාය.

''මේ වගේ ළමයෙක් එක්ක ඔය ළමය ආශ්‍රය කරනවද? ගෑණු ළමයෙක් හැදෙන විදියට නම් නෙමෙයි මෙයා හැදෙන්නෙ.. හරි



Scanned by CamScanner

හිතුවක්කාරයි.. මුරණ්ඩුයි.. ඔය ළමයින්ගෙ දෙමව්පියොත් ඔය ළමයින්ට ආදරේ ඇතිනෙ.. ඒ හින්දා මෙයාගෙන් ඈත් වෙලා ඔය ළමයි ඉගෙන ගන්න..'' කුඩම්මා එලෙස කියද්දී මට මා කෙරේ දැනී ගියේ පුදුමාකාර අසරණ බවකි.

''ආන්ටි අපි භාෂිණීගෙ හැටියි, ආන්ටිගෙ හැටියි හොඳට දැනගෙන තමා වැඩ කරන්නෙ.. ආන්ටි ඕගොල්ලෝ මේ කරන අපරාධවලට කවද හරි දඬුවම් විඳින්න වෙයි..'' අනෝජා මා නොසිතූ පරිදි කීවාය.

''හහ්.. මගෙ ගෙයිම ඉඳගෙන මට ඔහොම කතා කරන්නෙ.. කරුණාකරලා ආපු අතක් බලාගෙන යනවා..'' කුඩම්මා මහ හඬින් කීවාය.

''මං යනවා තමා ආන්ටි.. ඒත් මේ අහිංසක කෙල්ලෙකුට ඔහොම කරන්න එපා.. කවද හරි ඕවා සහගහනවා වගේ පත්තු වේවි..'' එසේ කියමින් අනෝජා හුන් තැනින් නැගිට්ටාය.

''භාෂිණී මං යනවා..'' එසේ කියමින් ඇය යන්නට ගියාය.

මම සිදුවූයේ කුමක්දැයි වටහාගත නොහැකිව විස්මයෙන් බලා සිටියෙමි. ඒ මොහොතෙහි හෙණ සැරක් සේ කාගෙදෝ අත්ලක් මගෙ කම්මුල මත පතිත වනු මට සිහිනෙන් මෙන් දැනිණි.

මම හැරී බැලීමි. බාප්පා මා අසල සිටගෙන සිටියේය. ඔහුගේ දෙනෙතින් දිස්වූයේ දැඩි කෝපයකි.

''මං අහගෙන සේරම..'' ඔහු හඬ නගා පැවසීය.

''උඹට ඕන ඕන විදියට නටන්න දෙන්න බෑ..'' බාප්පාගේ හඬ නිවස දෙදරවා ඇසෙමින් තිබිණි.

''පිට කෙල්ලෙක් නිසා මං ඉවසුව.. හැබැයි මීට පස්සෙ ඔය එක එකා මෙහාට ගෙන්නුවොත් ගහල පන්නනව මම..'' කුඩම්මා බාප්පාට පොහොර දමමින් කීවාය.

සැබැවින්ම ඔවුන් දෙදෙනාට මැදිව අසරණව සිටියේ මාය.





''අපි පොඩ්ඩක් එහෙට මෙහෙට වුණාම මේකි මොනව කරනවද කියනවද කවුද දන්නෙ..? කිසිම විශ්වාසයක් තියන්න පුළුවන් එකියක්ද..?'' බාප්පා කීවාය.

මම මහ හඬින් හඬාගෙන කාමරයට දිව ආවෙමි. ඔවුන් පවසාලනුයේ කිසිවෙකුට අසා සිටිය නොහැකි අන්දමේ ඒවා නොවේ.

ජීවිතය මට බොහෝ දෑ දායාද කොට ඇත. ඒ දායාද කඳුළ, සුසුම, කලකිරීම, පසුතැවිල්ල නොවන්නේද?

මම බොහෝ වේලාවක් කල්පනා කරමින් සිටියෙමි. මට ෂෙහාන් සිහිපත් විනි. ඔහුගේ දයාබර හඬ මට ඇසෙන්නා සේය.

මම අල්මාරිය හැරියෙමි. ඒ තුළ තිබූ රතු රිබන් පටියකින් ගැට ගැසූ රෝස පැහැති දවටනයෙන් යුතු පෙට්ටිය මම අතට ගතිමි.

මම එය සෙමෙන් විවර කළෙමි. ඒ තුළ වූයේ කුඩා බෝනික්කෙකි. ගිය වසරෙහි මගේ උපන් දිනයට මා ෂෙහාන්ගෙන් ලැබුවේ එකී තිළිණයයි.

සැබැවින්ම ඔහුගේ තිළිණය දයාබර විය.

''මේ වගේ තෑග්ගක් මං ඔයාට තෝර ගත්තෙ ඔයා ආසා වෙයි කියලා හිතාගෙන..'' ෂෙහාන් කීවේය.

''ඇත්තටම මං ආසයි ෂෙහාන්..'' මම කීවෙමි.

මම සෙමෙන් බෝනික්කාගේ නළල සිප පෙර තිබූ පරිදිම එය තැබුවෙමි.

පසුදා මම වෙනදාටත් වඩා වේලාසනින් පාසලට ගියෙමි. පන්තියේ කිසිවෙකු මා යන විට පැමිණ නොසිටියහ.

මම පන්තියේ පොත් ටික තබා පිටතට පැමිණියෙමි. උදෑසන රෑ දී තිබුණ නැවුම් බව මහිතට සතුටක් එකතු කරමින් තිබිණ.

''හේයි.. භාවනා කරනවද..?''එකී හඬින් මම තිගැස්සී ගියෙමි. මා

හැරී බලද්දී සිනාසෙමින් සිටියේ අනෝජාය.

''අද නම් පොළවෙන් වහියි.'' මම ඈ දුටු විගසම කීවෙමි.

''ඒ මොකද..?''

''අද උඹ කවදාවත් නැතුව උදෙන්ම ඇවිත්නෙ.. ඒකයි..''

''නෑ මං දැනගෙන හිටියා උඹ අද උදෙන්ම එනවා කියලා.. ඒකයි මං ආවෙත්.. මං හින්දා ඔයාට ගෙදරින් ප්‍රශ්නයක් ඇති වෙන්න ඇති නේද..?'' අනෝජා මවෙත තවත් ළංව කීවාය.

''ඒවා ගැන කතා කරලා වැඩක් නෑ අනෝජා.. මට නම් මේ හැම දෙයක්ම එපාවෙලා..'' මම දිගු සුසුමක් හෙළා කීවෙමි.

''මොකද වුණේ කියපන්, මං ආවට පස්සෙ..'' ඇය විමසා සිටියාය.

මම සිදුවූ සියල්ල ඇයට පැවසුවෙමි.

''මට සමාවෙයන් භාෂි..'' සියල්ල අසා සිටි ඇය මගේ දෑතින් අල්ලාගෙන කීවාය.

''ඒ මොකටද..?''

''මං ඒ වෙලාවෙ උඹට කරදර වෙයි කියල හිතන්නෙ නැතුවයි එහෙම කතා කරල එළියට බැහැල ආවෙ.. පස්සෙ තමා මට කල්පනා වුණේ මගෙන් ගන්න බැරිවුණ පලිය උඹෙන් ගන්න ඇති කියලා..''

''නෑ අනෝජා උඹ එහෙම කියල ආපු එක ලොකු දෙයක් එයාලා කවදත් බලාගෙන හිටියෙ මට ගහන්න බනින්නනෙ..'' මම සෙමෙන් කීවෙමි.

අපි බොහෝ වේලාවක් නිහඬවම ඔහේ අරමුණක් නැත්තන් සේ බලා සිටියෙමු.

''උඹල දෙන්න ඔතන භාවනා කරනවද..? අන්න දිල්හානි කියල අක්කා කෙනෙක් උඹව හොයන්න ඇවිත්..'' දීප්ති අප අසලට පැමිණ කීවාය.





අපි තිදෙනාම දිල්හානි අක්කා හුන් තැනට ගියෙමු.

''නංගී..'' දිල්හානි අක්කාගේ මුහුණ බෙහෙවින් වෙනස් වී තිබිණි.

''නංගී මේක අහල කලබල වෙන්නෙ අඬන්නෙ වැළපෙන්නෙ නෑ කියලා පොරොන්දු වෙන්න මට..''

''මොකද්ද..?'' මම ගැහෙන සිතින් යුතුව විමසුවෙමි.

''නංගී ෂෙහාන්ට පොඩි කරදරයක් වෙලා.. මහමෝදර හොස්පිට්ල් එකේ..'' මට දිල්හානි අක්කාගේ හඬ සිහිනෙකින් මෙන් ඇසිණ.

''ෂෙහාන්..'' මගේ දෑස තිලංකාර වෙනු මට දැනිණ. මම අනෝජාගේ උරහිසට වාරු වූයෙමි.

ටික වේලාවකට පසු මම නෙත් හැර බලද්දී සියල්ලෝ ම මා වටකර ගෙන සිටියහ.

''භාෂිණී මොකද දැන් ඔයාට..?'' අනෝජා විමසුවාය. එසැනින් මට ෂෙහාන්ව සිහිපත් විණ. මම ඉකි බිඳ බිඳ හඬන්නට වූයෙමි.

''මොකද දැන් කරන්නෙ..?'' දිල්හානි අක්කා අනෝජාගෙන් විමසුවාය.

''මං මෙයත් එක්ක ගිහින්, දවල්ට ෂෙහාන්ව බලන්න එක්ක යන්නම්.. තාම ඉස්කෝලෙ පටන් ගත්තෙ නැහැනෙ..'' අනෝජා කීවාය.

''ප්‍රශ්නයක් වෙයිද..?'' දීප්ති ඇසුවාය.

''ඉස්කෝලෙ පටන් ගන්න කලින්නෙ..''

මම හඬ හඬාම අනෝජාත් සමග පාසලෙන් පිට වූයෙමි.

''ෂෙහාන්ට මොකද දන්නෙ නෑ අනෝජා.. මට හරි බයයි..'' මම අසරණ ලෙසින් කීවෙමි.

''එච්චර අමාරු නෑ කියලනෙ දිල්හානි අක්කා කිව්වෙ.. ඔය අඬන්නෙ නැතුව ඉන්නකො..''



Scanned by CamScanner

''දැන් අපි කොහෙද යන්නෙ..?'' මම විමසුවෙමි.

''අපේ ගෙදර ගිහින් ඇඳුම් මාරු කරගමු.. නැතිනම් යුනිෆෝම් පිටින් ගිහින් ලෙඩක් වැටෙන්න පුළුවන්..'' මම ඇයට රිස්සක් කරන්නට ඉඩ දී නිහඬ වුණෙමි.

''අපි දැන් ගෙදර ගියාම අම්මා අහයි ඇයි කියලා..?'' මම කීවෙමි.

''නෑ.. අද ගෙදර ඉන්නෙ ආච්චි විතරයි..'' අනෝජා කීවාය. පැයකට පමණ පසුව අනෝජාත් මමත් ඇගේ ගෙදරට ගියෙමු.

මම අනෝජාගේ කාමරයට වැදී හඬන්නට වූයෙමි. ෂෙහාන් හට කුමක්වී ඇත්දැයි යන බය මහිත දැඩි වේදනාවකට පෙරළී ඇත.

''දැන් ඉතින් අඬන්නෙපා භාෂි.. අපි ගිහින් බලමුකො මොකද වෙලා තියෙන්නෙ කියලා..'' අනෝජා මහිස අත ගාමින් මා සනසන්නට උත්සාහ ගත්තාය.

මා ඉතිරි කාලයම ගත කළේ වේලාව බලමිනි. ඇඳුම් මාරු කර ගත් අපි ගාල්ලට පැමිණ බසයක නැගී මහමෝදර රෝහල අසලින් බැස්සෙමු. රෝහලට ඇතුළු වෙත්ම මම සීතලව ගියෙමි. මම වැරෙන් අනෝජාගේ අත අල්ලා ගතිමි.

''අත සීතල වෙලා..'' අනෝජා මදෙස බලමින් කීවාය.

මහිත ගැහෙමින් තිබිණ. අපි දෙදෙනා දිගු කොරිඩෝව ඔස්සේ ඉක්මන් ගමනින් ගියෙමු. අවසානයේදී ඔහු හුන් වාට්ටුව අපි සොයා ගත්තෙමු.

''ෂෙහාන් තාරුක ජයම්පති කියල පේෂන්ට් කෙනෙක් ඉන්නවද..?'' අනෝජා පුරුදුකාරියක සේ වාට්ටුවේ හෙදියක ගෙන් විමසුවාය.

''පොඩ්ඩක් ඉන්න..'' කියූ හෙදිය පොතක් ගෙන පෙරළා බැලුවාය.

''දොළොස් වැනි ඇඳේ බලන්න.'' ඇය කීවාය.

අපි ඇයට ස්තුති කොට ඇඳ ඉහපත් අංක බලමින් වාට්ටුව හරහා ගියෙමු.





''අර ඉන්නේ..'' අනෝජා දුරදීම කීවාය. මම ඉක්මන් ගමනින් එදෙසට ගියෙමි. දිලිප් අයියාත්, ක්‍රිෂාන්තයියාත් ඇඳ අසල සිටිනු මම යන්තමට දුටිමි.

''ෂෙහාන්..'' ඔහු දුටු සැනින් මට කෑගැසිණි. ඔහුගේ නළලත් දකුණු අතත් වෙලුම් පටි ඔතා තිබිණි.

''බට්ටි..'' ෂෙහාන් සෙමෙන් තෙපලුවේය.

''ඔයාට මොකද වුණේ ෂෙහාන්..?'' මම බිඳුනු හඬින් විමසුවෙමි.

ෂෙහාන් සිනාසෙන්නට උත්සාහ ගත්ත ද එය අසාර්ථක විය. ඔහුගේ නළල වෙලා තිබූ සුදු වෙලුම් පටිය පලාගෙන ලේ මතුවී තිබිණ. මගේ දෙනෙත කඳුළින් පිරෙමින් තිබිණ.

''මොකද වුණේ දිලිප් අයියෙ..?'' ෂෙහාන්ගෙන් පිළිතුරක් නොවූ තැන මම දිලිප් අයියාගෙන් විමසුවෙමි.

දිලිප් අයියා, ක්‍රිෂාන්තයියා දෙසත් මා දෙසත් මාරුවෙන් මාරුවට බැලීය. කුමක් හෝ නපුරු දෙයක් සිදුව ඇතැයි මට සිතිණ.

''කියන්න මොකද වුණේ කියලා..?'' මම ඔවුන්ට ඇවිටිලි කළෙමි.

''රොහාන් තව කට්ටියක් එක්ක ෂෙහාන්ට ගහලා..''

''මොනවා..'' මගේ දෙනෙත විස්මයෙන් මහත් විණ.

''මං කිව්වනෙ ෂෙහාන් ඔයාට, රොහාන්ලත් එක්ක කතාවට යන්න එපා කියලා.. මේ සේරම වුණේ මං හින්දනෙ..'' මං ඔහු වතට නැඹුරුව තෙපලුවෙමි.

''නෑ බට්ටි, ඔයා හින්ද කියලා ඔයා දුක් වෙන්න එපා..'' ඔහු ආයාසයෙන් මෙන් කීය.

''ඔයාට අමාරුද ෂෙහාන්..?''

''ඔලුවයි අතයි තමයි වැඩිය රිදෙන්නේ..'' ෂෙහාන් කෙඳිරිගාමින් කීය.



Scanned by CamScanner

"ෂෙහාන්ට ගහපු එකේ පලිය නං අපි උන්ගෙන් ගන්නවා නංගී.." ක්‍රිෂාන්තයියා ඇඳ වියලට තට්ටු කරමින් කීය. මම ඔහු දෙස බැලීමි. ඔහුගේ මුහුණ පුරා පැතිර තිබුයේ ප්‍රකෝපකාරී බවකි.

"එපා ක්‍රිෂාන්තයියා ඒකෙන් වෙන්නෙ එයාලා ආයෙමත් ඔයාල එක්ක රණ්ඩු වෙන එක.." මම කීවෙමි.

"ඒ වුණාට අපේ එකෙකුට ගැහුවට පස්සෙ අපි නිකං බලාගෙන ඉන්නද..?" දිලිප් අයියා කීවේය.

"මං දන්නෙ නෑ ඔයාලට ඕන ඉතින් පලිගන්නනෙ.." මම නෝක්කාඩු ලෙස කීවෙමි.

"බට්ටි ඔයා කොහොමද දැනගත්තෙ මං හොස්පිට්ල් එකේ කියලා..?" ෂෙහාන් මගේ සුරත ගෙන ළමැද මත තබා ගනිමින් ඇසීය.

"දිලිප් අයියගෙ අක්කා ඇවිත් කිව්වෙ..?" මම සෙමින් තොල මතුළෙමි.

"දිල්හානි අක්කා ඇවිත් කිව්ව විතරයි මෙයා අඬන්න ගත්තා.. අපිට නතර කර ගන්න බැරිවුණා.. හොඳ වෙලාවට ඉස්කෝලෙ පටන් ගන්න කලින් දැන ගත්තෙ.." අනෝජා මදෙස බලමින් කීවාය.

"මෙකි චූට්ටක්ක ඇත්නම් බයනෙ.." ෂෙහාන් මදෙස ආදරබර බැල්මක් හෙළමින් කීය.

මම නිහඬවම බිම බලා ගෙන සිටියෙමි.

"අනෝජා නංගී අපි ටිකක් එළියට යමු.." දිලිප් අයියා අවස්ථාව තේරුම් ගත්තාක් මෙන් අනෝජාවත්, ක්‍රිෂාන්තයියාවත් කැටුව වාට්ටුවෙන් පිටතට ගියේය.

"ෂෙහාන් ඔයා මීට වැඩිය පරිස්සම් වෙන්න ඕනැ.." මම ඔහු වෙතට තවත් ළංව කීවෙමි.

"ඔයා බයද මට මොනව හරි වෙයි කියලා.?"

"ඔව් ෂෙහාන්.. ඔයාට මොනව හරි වුණොත් මං කොහොමද





ජීවත් වෙන්නෙ..?"

"ඔය ඉතින්.. චූට්ටක් ඇත්නම් ඇස්වලට කඳුළු පුරෝගන්නවා.."

"මං ඔයාට මගේ පණටත් වඩා ආදරෙයි ෂෙහාන්.. ඒකයි මට මේ හැම දෙයක්ම දරා ගන්න බැරි.." මම ගැලූ කඳුළක් අතින් පිසලමින් කීවෙමි.

"භාෂි අපි යමුද දැන්..?" අනෝජා අප අසලට එමින් ඇසුවාය.

"අපි හින්දා ඔයාටත් හරි කරදරයි නේද අනෝජා..?" ෂෙහාන් අනෝජා දෙස බලා ඇසීය.

"අයියෝ ඒක සුළු දෙයක්.." ඇය සිනාසෙමින් කීවාය. ඇය වන් ළබැඳි යෙහෙළියක් මා හා හිඳීම කොතරම් භාග්‍යයක්ද..?

"ෂෙහාන් ඔයා මෙහෙ ඉඳිද්දි මං කොහොමද යන්නෙ..?"

"කමක් නෑ බට්ටි.. ඔයා ගිහින් එන්න.." ෂෙහාන් තෙපලුවේය.

මම බොහෝ දුකෙන් ඔහුගෙන් සමු ගත්තෙමි. රෝහලෙන් පිට වෙද්දී මගේ දෙනෙත කඳුළින් පිරී තිබිණි.

"ඔය කඳුළු පිහ දා ගන්න භාෂි.. මිනිස්සු දැක්කොත් හොඳ නැනෙ.." අනෝජා මගේ අතින් අල්ලා ගෙන දයාබරව පැවසුවාය.

"මං කොහොමද අනෝජා තට්ට තනියම මේ හැම දෙයක්ම විඳ දරා ගන්නෙ..? ෂෙහාන්ට මේ ටික වුණෙත් මං හින්දනෙ.. මං හරි පව්කාරියක්.."

"ඔයා මොනවා කරන්න භාෂි රොහාන්ලගෙ වැඩවලට.. දැන් ඕවා ගැන ඕනවට වැඩිය හිතන්න යන්න එපා.. විභාගෙටත් තව මාස කීයද? ඒ ගැන හිතන්න ඕන ඔක්කොටම ඉස්සෙල්ලා.." අනෝජා මට අවවාද කළාය. මම ඇය කියන දෑ නිහඬව අසා සිටියෙමි.

මගේ දිවියට නිතැතින්ම අවැසිව තිබූයේ ආදරයත්, සෙනෙහසත් රැකවරණයත්ය. ඒ සියල්ල උපතින්ම මා අහිමි කොට ගෙන ඉපදුණ ද ෂෙහාන් හා සෙනෙහසින් බැඳුණ පසු අහිමි වූ කිසිවක අහිමි බව



Scanned by CamScanner

මට එතරම් නොදැනිණ.

මෙතරම් කලක් මගේ ජීවිතයේ එකම රුදුම ඔහු පමණක්ම විය. වියපත් වූ කාලයත් සමගින් ඔහුත් මමත් වඩ වඩාත් ළංව සිටියෙමු. මවකගෙන් අහිමි වූ ආදරයත්, පියෙකුගෙන් නොලද රැකවරණයත්, සොයුරෙකුගෙන්, සොයුරියකගෙන් නොලද සෙනෙහසත් මම ඔහුගෙන් ලැබීමි.

ෂෙහාන් සතුව තිබූයේ දුලබ යහපත් ගති ගුණමය. ඔහු බෙහෙවින් පරිත්‍යාගශීලී විය. මා දැඩිව ආදරය කළ ඔහුට, කිසිවෙකුගෙන් වචනයක් හෝ වැරැද්දක් කරදරයක් වෙනු දැක්මට මම බෙහෙවින් අකැමැති වීමි.

එහෙත් මා නිසා රොහාන් ෂෙහාන්ට පහර දී ඇති බව සිහි වන්නට, සිහි වන්නට මහිත කිසියම් වෛරයක් පිළිසිඳෙමින් තිබිණ.

දෙදිනක් පමණ රෝහලේ ගත කළ ෂෙහාන් ගෙදර ගියේය.

එක් සෙනසුරාදා උදෑසනක මම 'ඉගෙනුම' පන්තියට යාමට ගාල්ලට පැමිණියෙමි. සුපුරුදු මාවත වූ කැනල් පාර ඔස්සේ මම ඇවිද ගියෙමි. සමරසිංහ ස්ටුඩියෝ එක හරියේදී පමණ පිරිමි ළමුන් කිහිප දෙනෙකු මා පසුපසින් එනු මට දැනිණි. මම එය එතරම් ගණනකට නොගත්තෙමි.

කඩපොළවල් හා ගෙවල් පසුවූ පසු එක්වරම මගේ නම කියා කිසිවෙකු අමතනු ඇසීමෙන් මම විස්මයට පත්ව පිටුපස හැරී බැලීමි.

දෙවියනි රොහාන් තවත් කිහිප දෙනෙකු සමග මවෙත එමින් සිටියේය.

''හාෂිණී ටිකක් නවතිනවද..?'' රොහාන් කීවේය. ඔහු කී නිසා නොව ඔහු හා ඇතිව තිබූ වෛරය නිසාම මම එක්වරම නැවතුණෙමි. ඔහු සිනාසෙමින් මා අසල නැවතිණ.

මම කිසිදු සිනාවක් නොමැතිව දැඩි බැල්මක් මුවට නගා ගෙන





එක එල්ලේ ඔහුගේ දෙනෙත දෙස බැලීමි. ඔහු ඉන් දැඩි අපහසුවට පත්වූවාක් මෙන් මට දැනිණි.

''ඇයි..? කට්ටියක් එක්කගෙන ආවෙ මටත් ගහන්නද..?'' මම සැරෙන් ඇසුවෙමි.

''මං මොනවටද හාෂිණී ඔයාට ගහන්නෙ? ඔයා මාත් එක්ක තරහෙන් වගේ ඇයි මේ..?'' ඔහු අසද්දී මහිත වඩ වඩාත් කෝපයට පත්විණ.

''තරහ වෙන්න මං ඔයත්තෙක්ක යාලු වෙලා හිටියද..?'' මම කෝපයෙන් ඇසුවෙමි.

''ඔහොම තරහ ගන්න මං ඔයාට වැරැද්දක් කළාද..?'' රොහාන්ගේ හඬ පවා මහිත තව තවත් කෝපයෙන් දවන සුළු විය.

''එක සැරයකුත් තමුසෙ මගෙන් ගුටි කාල තව ලැජ්ජ නැතුව එනවනෙ..'' මම කීවෙමි.

''හාෂිණී මම කියන දේ චුට්ටක් අහන්න..'' ඔහු යදින හඬින් කීවෙමි.

''තමුසෙ කියන දේවල් අහන්න මං පොඩ්ඩක්වත් සූදානම් නැහැ.. ඔක්කොම එකතු වෙලා අර අහිංසකයට ගැහුවා.. ආදරේ කියන දේ කවදාවත් කාගෙන්වත් බලෙන් ලබා ගන්න බෑ රොහාන්.. ෂෙහාන්ට මිසක් මං වෙන කාටවත් ආදරේ නෑ.. ආදරේ කරන්නෙත් නෑ.. ඒක නිසා කරුණාකරලා මීට පස්සෙ මටවත් ෂෙහාන්ටවත් කරදර කරන්න එපා..'' මම දැඩි ලෙස කියාගෙන ගියෙමි.

''හාෂිණී කෝ මට කතා කරන්න දෙන්නෙම නැහැනෙ..''

''මීට පස්සෙ කිසිම කතාවක් මාත් එක්ක ඕන නෑ.. හැබැයි මගෙ පස්සෙ ඇවිල්ල මට කරදර කළොත් එහෙම.. ඒකත් මං බලා ගන්නම්..'' මම එසේ කියා යන්නට ගියෙමි.

රොහාන්ට එලෙස කියා ගැන්මට තරම් ශක්තියක් මා තුළ තිබුණ



Scanned by CamScanner

බැව් සිතෙන්ම මට සිහින් සතුටක් දැනිණ.

මම ලහි ලහියේ පන්තියට පැමිණියෙමි.

''මොකද මේ කඩාගෙන බිඳගෙන..? යකෙක් ගැහුවද.. මගදි..?'' මා දුටු විගසම දීප්ති මගෙන් විමසුවාය.

''එක යකෙක් නෙමෙයි යක්කු රැනක්ම ආවා..'' මම හිනාවක් මුහුණට නගා ගනිමින් කීවෙමි.

''එහෙනම් උඹ අපිට නොදී පුලුටු මොනව හරි කන්න ඇති..'' එලෙස කියමින් අනෝජා ද මා අසලට පැමිණියාය.

''පලයන් යන්න..''

''මොකද වුණේ..?'' දෙදෙනාම එක්වරම මගෙන් විමසූහ. මම සිදුවූ සියල්ල ඔවුනට පැවසුවෙමි.

''මදෑ.. මීට පස්සෙ ඔය පාරෙන් උඹ තනියම යන්න එන්න එපා.. බස් එකක නැගල රුපියල් තුනක් දීලා වරෙන්..'' අනෝජා කීවාය.

''හොඳයි.. වැඩේ හැමදාම රුපියල් තුන ගානෙ දෙන්න ගියාම.. මං බය නෑ රොහාන්ලට..'' මම කීවෙමි.

''උඹ ඉතින් චන්ඩියනේ.. රුපියල් තුන වගේ නෙමෙයි මෝඩය කරදරයක් වුණොත්..?'' දීප්ති කීවාය.

''උඹලට නම් රුපියල් තුන එච්චර ලොකු ගානක් නෙමෙයි. ඒත් මට ඒකත් ලොකු ගානක්.. ගෙදරින් සත පහක් හම්බ වෙන්නෙ නැහැ.. ෂෙහාන්ගෙන් නොලැබෙන්න මට ක්ලාස් එකකටවත් එන්න වෙන්නෙ නැහැ..'' මම සෙමෙන් කීවෙමි.

''සොරි කෙල්ලෙ අපි එච්චර හිතල නෙමෙයි කිව්වෙ.. අනෝජා මීට පස්සෙ අපි භාෂිණී එනකං ස්ටෑන්ඩ් එකට වෙලා ඉමු..'' දීප්ති අනෝජා දෙස බලමින් කීවාය.

''ඔව්..අපි එකට ආවම ඉවරනෙ.. ඒක කෝකටත් හොඳයි..'' අනෝජා කීවාය.





''ඒක නෙමේ දැන් ෂෙහාන්ට කොහොමද?'' දීප්ති කටහඬ පහත් කොට මගෙන් විමසුවාය.

''දැන් හොඳයි ඒත් මට බයයි..'' මම කීවෙමි.

''භාෂිණී අන්න ඔයාට සර් කතා කරනවා..'' සිසුවියක් පැමිණ කීවාය.

මම කුතුහලයෙන් නළල රැලි ගන්වා මිතුරියන් දෙස බැලීමි.

''ගිහින් බලපං ඒ මොකද කියලා..'' අනෝජා කීවාය.

''අද නම් මහ නරක දවසක්.. තවත් තොප්පියක්ද දන්නෙ නැහැ..'' මම එසේ කියමින් ශාලාවෙන් එළියට ගියෙමි.

''සර් මට කතා කළාද..?'' මම ඔහු අසලට ගොස් ඇසීමි.

''ඔව් භාෂිණී ක්‍රීඩා කරලම හරියනවද..? පාඩම් කරන්නත් ගත්තොත් හොඳයි නේද?'' ඔහු අසද්දී මම නිහඬව සිටියෙමි.

''මොකද කතාවක් නැත්තෙ..?''

''මං පාඩම් කරනව සර්..''

''ඒක නෙමේ මං භාෂිණීට කතා කළේ වැදගත් දෙයක් කියන්න.. භාෂිණී වෙනසක් හිතන්න එපා.. මට ඔයා ගැන ටිකක් දැන ගන්න ලැබුණා..''

ඔහු එසේ කියද්දී ම තිගැස්සී ගියෙමි.

''මා ගැන.. මොනවද සර්..?''

''භාෂිණී බය වුණා නේද..? ඔයාගෙ ගෙදර ජීවිතේ ගැන. මගෙන් අහන්න එපා කවුද කිව්වෙ කියලා..'' ඔහු කතාව නතර කළ සැනින් මගේ දෙනෙත කඳුළින් පිරිණ.

''දුක් වෙන්න එපා භාෂිණී.. ඔයා හුඟක් ධෛර්යවන්ත ළමයෙ භාෂිණී.. අපි හැමෝටම ප්‍රශ්න තියෙනවා. ප්‍රශ්නයක් නැති කෙනෙ මේ ලෝකෙ නෑ.. අනික ප්‍රශ්නයක් නැත්නම් ඒක ජීවිතේකු



Scanned by CamScanner

නෙමෙයිනෙ නේද? ඒ නිසා ඒව ගැන අනවශ්‍ය විදියට කල්පනා කරන්නෙ නැතුව හොඳට පාඩම් කරල විභාගෙ පාස් කරගන්න බලන්න..''

හාෂිණී ගැන දැන ගත්තට පස්සෙ මම තීරණය කළා ඔයාට තෑග්ගක් දෙන්න.

''තෑග්ගක්..'' මම විස්මයෙන් තෙපලුවෙමි.

මම ගුරුවරයා කුමක් කියන්නට යන්නේදැයි අදහාගත නොහැකිව විස්මයෙන් බලා සිටියෙමි.

''විභාගෙ පටන් ගන්නකම් දිගටම ක්ලාස් එන්න ඔයාට ෆ්‍රී කාර්ඩ් එකක් දෙන්න මං තීරණය කළා. මං හිතන්නෙ ඔයාට ඒක ගොඩාක් ප්‍රයෝජනවත් වේවි..''

''සර්..'' මම සෙමෙන් කොඳුරා ඔහු දෙස බැලීමි. කාරුණික සිනහවක් ඔහු මුව ඇඳී යමින් තිබිණි.

''හාෂිණී ඒක මදිකමක් කියලා හිතන්න එපා..''

''නෑ සර් මං එහෙම හිතන්නෙ නෑ.. මං කොහොම සර්ට තෑන්ක්ස් කරන්නද මන්දා..?'' මම සෙමෙන් කීවෙමි.

''ඔයා මට කරන්න පුළුවන් ලොකුම ස්තූතිවන්තකම තමා හොඳට ඉගෙන ගෙන ඉහළින්ම විභාගෙ පාස් වෙන එක..''

මම නිහඬවම බිම බලාගෙන සිටියෙමි.

''හාෂිණීට හොඳට ඉගෙන ගන්න පුළුවන්.. දක්ෂයෙකුට අත දීම, ගුරුවරයෙකුගෙ ජීවිතේ තියෙන විශාලම සතුට. ඉතින් වෙනසක් හිතන්නෙ නැතුව වෙනදාටත් වැඩිය උනන්දුවෙන් ඉගෙනීමේ වැඩ කරන්න..'' ඔහු මට සමුදෙන නියායෙන් කීය.

මම ඔහුට තවත් වරක් ස්තූති කොට සමුගත්තෙමි.

''මොකද සර් කියන්නෙ..?'' මා දුටු මතින්ම යෙහෙළියෝ විමසූහ. මම නිහඬවම සිටියෙමි. කිසියම් සරණක් නැති අසරණ බවක් මහිත





වෙලා ගනිමින් තිබිණි.

''මොකද උඹට හිටපු ගමන් උනේ..?''

''සර් මොකද කිව්වෙ බැන්නද..?'' මිතුරියෝ විමසූහ. මම ඔවුන්

දෙස බලා යාන්තමට සිනාසුණෙමි.

''කියපන්කො.. අපිව පිස්සු වට්ටන්නෙ නැතුව..'' ඔවුන් ඇවිටිලි

කරන්නට වූහ. මම ඔවුන්ට සියල්ල පැවසුවෙමි.

''ෂහ්.. නියමයිනෙ.. උඹ නං මාර ලකී බං..'' ඔවුන් එය ඇසූ විට

කීහ.

''ඒත් මේකෙන් වෙන්නෙ මගෙ අසරණකම හැමෝටම ප්‍රදර්ශනය

වෙන එක විතරයි..'' මම කීවෙමි.

''උඹ නං මහා පුදුමාකාර සතෙක් බං..'' අනෝජා කීවාය.

''ඇයි ඒ..?'' මම විමසුවෙමි.

''උඹ හිතන හැටි, පතන හැටි හරිම පුදුමයි හාෂි..'' ඇය කීවාය.

අපේ කතා බහට එතරම් වෙලාවක් නොලැබුණි. පන්තිය ආරම්භ විණ. එහෙත් මහිත කුමක්දෝ හේතුවකට බෙහෙවින් සසලව තිබිණ.

''අද නම් උඹේ හිත පන්තියෙ නෙමෙයි..'' එක් මොහොතක දීප්ති මට වැලමිටෙන් ඇන කීවාය.

නිබඳවම පුංචිම පුංචි දෙයකින් පවා සසලවන මහිත සන්සුන් කර ගෙන පාඩම් කිරීමට මම උත්සාහ ගතිමි. ෂෙහාන් හමුවීම පවා මෙකී කාලය තුළ මම අඩු කළෙමි.

අගෝස්තුවේ උසස් පෙළ විභාගයට පෙනී සිටි ෂෙහාන් ද නිදහසේ කාලය ගත කරමින් සිටියේය. අවසානයේදී මගේ විභාගයට දිනක් තබා මමත් ෂෙහානුත් මුණ ගැසුණෙමි.

ඒ පන්සල් යාමටය. සුපුරුදු ලෙසින් ගාල්ල බස් නැවතුම් පොළේ දී හමු වූ අප දෙදෙනා ප්‍රධාන වීදිය ඔස්සේ පැමිණ ඕල්කට් මාවත ඔස්සේ ඇවිද ආවෙමු.



Scanned by CamScanner

ගාල්ල වැලිවත්තේ විජයානන්ද විහාරයට අප ඇතුළු වෙද්දී විහාර බිමේ කිසිවෙකුත් නොසිටියහ.

''පෝයකට වැඩිය මම ආසයි මේ වගේ දවසක පන්සල් එන්න.. සෙනඟ නැනෙ..'' මම සෙමෙන් කීවෙමි.

''ඒකනං ඇත්ත.. සෙනඟ හුඟක් ඉන්න කොට හිත එහෙ මෙහෙ යනව වැඩියි..'' ෂෙහාන් මා අනුමත කරන ලෙසින් කීය.

වැලි මිදුල අබියස පාවහන් ගැලවූ අපි විහාර ගෙට ඇතුළු වූයෙමු. මා නිවසින් ගෙන ආ අරලිය මල් තබා අපි වැන්දෙමු.

''මගේ ජීවිතය වෙනසක් වෙන විභාගයට සාර්ථකව මුහුණ දෙන්නට මට ශක්තියත්, ධෛර්යයත්, සැනසුමත් ලබා දෙන්න..'' මම බුදු හිමි අබියස දී එලෙස සිතින් ඉල්ලා සිටියෙමි.

පහන් දෙක බැගින් ළංකොට අපි දෙදෙනා පහන් දල්වාලූයෙමු. පහන් සිලු සුළඟෙහි ලෙළදෙද්දී මහිතට කිසියම් සතුටක් දැනිණි.

''මේ පහන් එළිය වගේම ඔයාගෙ මූණත් එළිය වැටිල බට්ටි..'' නිවෙන්නට ආසන්නව තිබූ පහනකට තෙල් වත්කරමින් ෂෙහාන් කීවේය. මම ඔහු දෙස බලා සතුටින් සිනාසුණෙමි.

''මල් පූජා කරල ඔයා මොනවද ප්‍රාර්ථනා කළේ..?'' මම ඔහුගෙන් විමසුවෙමි.

''හැමදාම ප්‍රාර්ථනා කරන දේට අද පුංචි විශේෂයක් කළා..'' ඔහු මගේ දෙනෙත දෙස එක එල්ලේ බලමින් කීය.

''මොනවද ඔයා හැමදාම ප්‍රාර්ථනා කරන දේ..? මොකද්ද අද කළ විශේෂත්වය..?'' මම ඔහුගෙන් විමසුවෙමි.

''මං හැමදාම ප්‍රාර්ථනා කරන්නෙ මේ පුංචි කෙල්ල මගේම වෙන්න කියලා.. අද මං විභාගෙ කරගන්න පුළුවන් වෙන්න කියලා එකතු කළා..'' ඔහු කීය.

මම ඔහු දෙස දයාබර ලෙසින් බැලීමි.





''ඒක නෙමෙයි ෂෙහාන්.. මට හෙට ගැන මතක් වෙන කොට කකුල් දෙකත් ගැහෙනවා.. හෙටින් පස්සෙ මගේ ඉරණම තීරණය වෙයි..'' මම විභාගය සිහිපත් වූ ඇසිල්ලේ කීවෙමි.

''චුට්ටක්වත් හිත බය කරගන්න එපා බට්ටි.. හොඳට ප්‍රශ්න කියවල පැහැදිලිව උත්තර ලියන්න.. ඔය හිතන තරම් විභාග අමාරු නෑ බට්ටි..'' ෂෙහාන් කීය.

''ඔයා ඔහොම කියන එකත් ලොකු දෙයක්..'' මම කීවෙමි.

''එහෙම නං අපි යමු නේද? ඉක්මනට යන එක ඔයාට හොඳයි.. විභාගෙ ඉවර වුණාම අපිට මුණ ගැහෙන්න නිදහස ඕන තරම් තියෙනවනෙ..'' ෂෙහාන් කීය. මම ඔහුගේ අදහසට එකඟ වූයෙමි.

එකී පූජනීය බිමේදී ම මම ඔහුට දණ ගසා වැන්දෙමි. ඉරණම් ගමනකට මුල පුරන මොහොතක වැඳ වැටී ආශිර්වාද ලබා ගන්නට මට මවක හා පියෙකු නැත. ඉදින් නිරතුරුවම මට ආදරය කරන, රැකවරණය සලසන ෂෙහාන් කෙරෙහි මහිතෙහි ඇතිව තිබුයේ දැඩි භක්තිමත් බවකි.

ඔහු මා දෙඋරින් ඔසවා නැගිට්ටවීය.

''මගෙ කෙල්ලට තුරුණුවන්ගෙම පිහිටයි.. හොඳට විභාගෙ ලියන්න..'' ඔහු මට කීය. තවත් මොහොතක් පමණ විහාර බිමේ ගත කළ අපි ඉන් පිටව ආවෙමු.

ගාල්ලේදී අපි වෙන්වීමි. ලහි ලහියේ නිවසට පැමිණි මම යළිත් පොත් ටික ළංකර ගතිමි. හෙට දින පෙනී සිටින විෂයට අවැසි මූලික කරුණු යළි යළිත් මම සිහිපත් කළෙමි.

අපට ලැබී තිබුණ විභාග මධ්‍යස්ථානය අපේම විද්‍යාලය විය. විභාගයේ පළමු දින මම සාර්ථක ලෙස නිමා කළෙමි. මා නිවසට ආවේ තෘප්තිදායක සිතිනි.

නිවහනේදී දෙවන දිනට ඇවැසි දෑ මම පාඩම් කරමින් සිටියෙමි.

එක්වරම මා හුන් කාමරයට කුඩම්මා පැමිණියාය.



Scanned by CamScanner

''හාෂිණී..'' ඇය මා ඇමතුවාය. මම ඇය දෙස බැලීමි.

''අර බණ්ඩාරවෙල ඉඩමක ඔප්පුවක් තියෙනවද නේද..? හදිස්සි වැඩකට ඒක මට හොයලා දෙන්න..'' ඇය නිවුණ හඬින් පැවසුවාය.

''ඒක මගෙ නමට තියෙන එකක්..'' මම කීවෙමි.

''ඒකට කමක් නෑ.. මට දෙන්න..'' මම කීවෙමි.

''කොහොම කිව්වත් ඒක දෙන්න බැහැ.. මගෙ අම්මා වෙනුවෙන් මට තිබුණාවෙ..'' මම තදින්ම කියා සිටියෙමි.

''ඒකත් එහෙමද? උඹ දන ගනින් උඹ ඉන්නෙ මගෙ වහලෙ යට කියලා..'' ඇය මට තර්ජනය කරන අයුරින් කියා සිටියාය.

මම නිහඬව ඉවත බලා ගතිමි.

''අපෙන් කකා අපටම ආඩම්බර පෙන්නනවා..'' ඇගේ දෙඩවීමෙහි නිමාවක් නොතිබිණ.

''දෙයියනේ කෑ නොගහ මට පාඩම් කරන්න ඉඩ දෙන්න.. හෙට මට විභාගෙ..'' මම හඬමින් කීවෙමි.

''විභාගෙ.. විභාගෙ නෙමෙයි මං උඹට කරවන්නෙ බලාගෙන හිටපන්..'' ඇය එසේ කියා වේගයෙන් යන්නට ගියාය.

මහිත බෙහෙවින් අවුල් සහගත තත්ත්වයක පැවතිණ. පාඩම් කරන්නට තබා එක තැනක හිඳින්නට පවා මට අසීරු විය.

ඒ සමගම හෙට උදෑසන පැවැත්වෙන විභාගය සිහිවෙත්ම මම බියෙන් සලිත වූයෙමි. හිත සන්සුන් කරගෙන පාඩම් කරන්නට මම දැඩි උත්සාහයක් ගතිමි.

පසුදා උදෑසන මම විභාග මධ්‍යස්ථානයට යාමට සැරසුණෙමි. මම සේපාලිකා මල් දෝතක් බුදු හිමි අසලත් මගේ රත්තරන් අම්මාගේ ඡායාරූපය අසලත් තබා ආශිර්වාද පතා සිටියෙමි.

මම සෙමෙන් ගෙතුළ සිට එළියට ඇවිදගෙන ආවෙමි.

''උඹ එහෙනං ඉඩමේ ඔප්පුව අපිට දෙන්නෙ නැහැ..'' මා ඉදිරියට





දිව ආ කුඩම්මා ඇසුවාය. මම ඇය කී දෙය නෑසුණා සේ යන්නට ගියෙමි. එහෙත් ඇය මගේ ගමන හරස් කරගෙන සිටියාය.

''උඹට ඕන විදියට නටන්න දෙන්න බැහැ.. කෝ ඒක මට මෙහාට දීල යන තැනක පලයන්..'' කුඩම්මා කෑගැසුවාය.

''බැහැ මාව මැරුවත් ඒක දෙන්න බැහැ..'' මම කියා සිටියෙමි.

''කාලකණ්ණි කෙල්ල උඹ හින්දා..'' ඇය එසේ කියමින් මගේ හිසට වැරෙන් පහර කීපයක් එල්ල කළාය. මම කෑ ගසමින් ඇගෙන් මිදී පාර දෙසට දිව ගියෙමි. මගේ දෙනෙතෙහි කඳුළු උතුරා යමින් තිබිණ. මහ පාර මැද වූ බැවින් මම ඉක්මනින් කඳුළු පිසලා ගතිමි.

විභාගය පැවැති කාලය තුළම මා වටා පැවතියේ එවන් වාතාවරණයකි. එකී දින කිහිපයෙහි මගේ මිතුරියෝ මා අස්වසා මගේ හිත හදන්නට උත්සාහ කළහ. සත්තකින්ම ඔවුන්ට පිං සිදු වෙන්නට මා සාර්ථක ලෙසින් විභාගයට මුහුණ දුන්නා යැයි මට සිතිණ.

විභාගය නිමාවූ දින අපි කූඩුවෙන් මුදා ලූ කිරිල්ලියන් රැනක් සේ විද්‍යාල ගේට්ටුවෙන් එළියට බැස්සෙමු.

''අද නම් මොනව හරි කාල බීල යන්න ඕනැ..'' කොටුවේ ලංකා බැංකු ගොඩනැගිල්ල අසලදී මම කීවෙමි.

''ඔව් ඔව් එකතු කරමු කාගෙ කාගෙත් පර්ස් වල තියෙන සල්ලි..'' අනෝජා ද මා හා එක් වෙමින් කීවාය.

අප සිව් දෙනා සතු මුදල් එකතු කර බැලූ විට රුපියල් දෙසිය දොළහකුත් ශත ගණනක් තිබිණ.

''දැන් කොහාටද යන්නෙ..?'' මධූකා විමසුවාය.

''ම්.. යන්නෙද..? මෙන්න මෙයාගේ ප්‍රේමයේ මූලාරම්භ ස්ථානයට.. ස්ටෑන්ඩ් එක ඉස්සරහ මිල්ක් බාර් එකට..'' අනෝජා අප හැම දෙනා සිනා ගස්සමින් කීවාය. අනෝජාගේ තීරණය පරිදි අපි මිල්ක් බාර් එකට පැමිණියෙමු.



Scanned by CamScanner

"මොනවද කන්නෙ..?" මම විමසුවෙමි.

"ඔය තියෙන ඔක්කොම කමු බං.." දීප්ති සෙමෙන් කීවාය.

"කාපං.. කාපං.. බිල ගෙවන්න බැරි වුණාම උඹ නැවතියං.. මුදලාලිත් එක්කම.." මම ඇයට උරහිසින් ඇන කීවෙමි.

"ඒකත් ඇත්ත.."

අපි චයිනීස් රෝල්ස් කා පෝටෙලෝ බීවෙමු. සැබැවින්ම අපේ සිත් බෙහෙවින්ම සැහැල්ලුවට පත්ව තිබිණ.

"ඒක නෙමේ දැන් ඉතින් සියළු බැමි වලින් නිදහස් නිසා ටිකක් එන්ජෝයි කරන්න හෙට අපි බීච් යමුද?" එක්වරම අනෝජා යෝජනා කළාය. අපි සියල්ලෝම ඇගේ අදහස සතුටින් අනුමත කළෙමු.

දවස ගතව ගියේ බෙහෙවින් සැහැල්ලු ලෙසිනි. එහෙත් නිවහනේ රැඳී හිඳින කාල සීමාව තුළ බෙහෙවින් පීඩාවට පත්වන්නෙමි.

විභාගය නිමා වීමත් සමගම ප්‍රතිඵල එන තෙක් අප පාසල් ගමන නැවතිණ. එයින් වඩාත්ම අසතුටට පත් වූ තැනැත්තිය මම වූයෙමි. නිවහනෙහි ගත කරන කාලය මා ගෙවන්නේ අපායකට වැටුණාක් මෙනි. ඒ තරමටම නිවසින් නිබඳව ලත් තාඩන පීඩන දැඩි විය.

හැකි හැම මොහොතකම මම නිවසින් පිටව ගත කළෙමි. එහෙත් වැඩිපුර කාලය ගත කරන්නට සිදුවූයේ නිවසේය.

තනිවූ ඇසිල්ලක ගතව ගිය කාල සීමාව ගැන මම කල්පනා කළෙමි. මා හට කී දෙනෙකුගෙන් නම් බලපෑම් ආවාද? එහෙත් ඒ කිසිවකින් මම වෙනස් නොවූයෙමි. සුභාෂ් අයියා ද මේ වන විට දකින්නට පවා නොසිටියේය. ඔහු කොහේ දැයි කියන්නට පවා මම නොදැන සිටියෙමි.

තමාලි ද වරින් වර නෙත ගැටුණද ඇය මට රැවීමකින් පමණක් ලිගෙන නිහඬ වූවාය.

කාලය ගෙවී යමින් තිබිණ. එක් සිකුරාදා උදෑසනක කුඩම්මාත්, ප්පාත්, තමාලිත් කොහේදෝ යන්නට ලහි ලහියේ සූදානම් වූහ.





ඔවුන් යන්නේ දුර ගමනක් බැව් කාරයට දැමූ බෑග් වලින් මම සිතා ගතිමි. ඔවුන් යනු දක්මට මම බෙහෙවින් කැමති වූයෙමි. කිසිවෙකු නැති විට මේ නිවසෙහි නිදහසේ සරන්නට මම අවකාශ ලබන්නෙමි.

ටික වේලාවකට පසු ඔවුන් රැගත් රිය පිටව යනු ජනෙල් කවුළු අතරින් මම බලා සිටියෙමි.

මොහොතකට පසු මම ෂෙහාන්ට ලිපියක් ලියන්නට තීරණය කළෙමි.

තනිකම සමගින් ආදරණීයම ෂෙහාන්ට..

මේ තත්පරයෙ නිවහනේ කිසිම කෙනෙක් නෑ. මගේ හිතට තනිවුණු හැම මොහොතකම දුව ගෙන එන්නෙ ඔයා.

ඔයා මේ වෙලාවට මොනව කරනව ඇද්ද? මට එහෙම හිතෙනවා. මං හිතින් ඔයාගෙ මූණ මවා ගන්න උත්සාහ කරනවා..

ෂෙහාන්.. ඔයා ගැන දැනෙන ආදරේ හැමදාමත් අළුත් වෙනව වගෙයි මට දැනෙන්නෙ.

මගේ ඇස් දෙක තුන් තිස් පැයේම ප්‍රාර්ථනා කරන්නෙ ඔයාව දකින්නයි. ඒ තරම්ම වචනයෙන් කියන්න බැරි තරම්ම.. මං ඔයාට ආදරෙයි.. ආදරෙයි.. ආදරෙයි..

මා එසේ ලියාගෙන යද්දී එක්වරම ඉදිරිපස දොරට තට්ටු කිරීමකි මගේ ලිවීම නැවතිණ.

"කවුරු විය යුතුද..?" මගේ හිත ප්‍රශ්න කළේය. මම අඩක් ලි ලිපිය සඟවා තබා සාලය දෙසට ගියෙමි.

"අනේ අනෝජා ඔයා..?" මම සතුටින් ඇය අසලට දිව යමි කීවෙමි.

"මට හිතුණා භාෂිව බලන්න එන්න.. ඒක නෙමේ කෝ අය..?" අනෝජා මවෙතින් විමසුවාය.

"එයාලා අද උදේම කොහේදෝ ගියා.." මම කීවෙමි.

''ඒක තමයි අද උඹ රජගෙදර පරවියා වගේ ඉන්නෙ..''

''වාඩි වෙයන්.. හිටගෙනම කතා කරන්නෙ..'' මම එසේ කියා ඇයට වාඩි වෙන්නට ඉඩ සැලැස්සුවෙමි.

''මේ ගෙදර උඹ තනියම ඉන්නවට වෙනම තෑග්ගක් දෙන්න වටිනවා..'' අනෝජා නිවස තුළ දෙනෙත් යවමින් කීවාය.

''පාළුයි කියලා මොනව කරන්නද අනෝජා.. මගෙ මුළු ජීවිතේටම තනිකම, පාළුව හොඳට හුරුවුණ දෙයක්. එක අතකට දන්න අඳුරන මිනිස්සු මැද්දෙ තනිවෙනවට වැඩිය කිසිම කෙනෙක් නැති තැනක තනිවෙන එක හොඳයි..'' මම සෙමෙන් කීවෙමි.

''ඔය ඉතින්.. දුක හිතෙන දේවල්ම කියල තවත් හිත රිද්දගන්න එපා හාෂි.. අපි හැමදේකටම මුහුණ දීල තැලිල පොඩි වෙලා ජීවිතේ ගැන තේරුම් අරන් ඉන්න එක හරිම හොඳයි හාෂි..'' ඇය කීවාය.

මම දිගු සුසුමක් හෙළීමි.

''ඔහොම ඉන්න මං බොන්න මොනව හරි ගේනකම්..'' මම එසේ කියා අනෝජාට බීමට යමක් සෑදීමට මුළුතැන් ගෙට ගියෙමි. ඇය ද පසුපසින් ආවාය.

මම ඇයට තේ සාදා දුනිමි.

''උඹ මොනවද උසස් පෙළට කරන්න හිතාගෙන ඉන්නෙ..?'' අනෝජා තේ බොන අතරතුරදී විමසුවාය.

''අනේ මන්දා මං තාම හිතුවෙ නෑ.. මොනව කරන්නත් පාස්වෙලා ඉන්න එපායැ..'' මම කීවෙමි.

''ෆේල් වෙන්න තරම් අපි නරක නැනෙ..'' අනෝජා සිනාසෙමින් කීවාය.

දෙපැයකට වඩා කාලයක් මා සමග ගත කළ ඇය මගෙන් සමුගෙන ගියාය.

ඇය ගිය පසු මම යළිත් හුදකලාවේ තනිවුණෙමි. යහනට වැටී



නිදන්නට උත්සාහ කළ ද නින්ද මා අසලකටදු නොආ. මම සෙමෙන් නිවසේ ඉදිරිපසට යන්නට ඉදිරි කාමර පසු කරමින් ගියෙමි.

එක්වරම මගේ නෙතට හසුවූ දෙයින් මම එහෙමම නතර වීමි. ඒ බාප්පාගේ කාමරයෙහි දොරේ යතුරු කටෙහි යතුරු කැරැල්ල එලෙසම තිබිණි.

උදෑසන ගමනේ කඩිසර බවට ඔහුට යතුරු කැරැල්ල අමතක වන්නට ඇත. නොඑසේ නම් මෙලෙස ඔහු යතුරු කැරැල්ල දමා නොයන්නේමය.

කාමරය පසෙක දෑවැන්ත පොත් අල්මාරියක් තිබිණ. මම එය විවෘත කළෙමි. පරණ පොත් පත්වලින් නික්මෙන ගඳක් ඉන් වහනය වන්නට විය. මම බිම දණ ගසාගෙන පහළ තට්ටුවෙන් පොතක් ඇද පෙරළා ගතිමි. එය ඩොස්ටොයොස්කිගෙ අපරාධය හා දඬුවම නම් පරිවර්තන කෘතිය විය.

මම එය තිබූ තැනම තබා තවත් පොතක් ඇද ගතිමි. මඩවල එස්. රත්නායකගේ කෘතියක් වූ බැවින් මම එහි පළමු පිටුව පෙරලූයෙමි. ''සුරමයා අත්තනායකගෙන් උපන් දින සිහිවටනයක්'' එහි පළමු පිටේ උඩින්ම නිල් තීන්තෙන් ලියා තිබිණි.

සුරමයා අත්තනායක යනු මගේ අම්මාගේ නම විය. එසේ නම් මේ ඈ ජීවත්ව සිටියදී මගේ පියාට (දැන් බාප්පාට) තිළිණ කළ පොතක් බැව් මට වැටහිණි.

මම ඇගේ අත් අකුරු මතින් මගේ සුරතෙහි දබරැඟිලි තුඩ ඇද්දුවෙමි. ''අම්මා..'' යන හැඟුම මගේ සිතෙහි දැඩි කම්පාවක් ඇති කරලමින් තිබිණි.

මම එකී පොත උකුලෙහි තබාගෙන තව පොත් කිහිපයක්ම ඇද බැලිවෙමි. එහෙත් වෙනත් කිසිදු විශේෂයක් ඒවායෙහි නොතිබිණ. අයිනට වන්නට තිබූ කළු බැම්මක් යෙදූ පොතක් විය. මම නිකමට මෙන් එය ගතිමි. එය දින පොතක් විය. එය අම්මාගේ අත් අකුරින්



Scanned by CamScanner

ලියැවී තිබෙනු දැකුමෙන් මම තිගැස්සී සිටියෙමි.

මම එහි පිටු පෙරළීමි.

**මාර්තු 14**

*අද දුවට ටිකක් සනීප මදි. මගෙ හිතට ලොකු බයක් දැනෙනවා. ඒ නිසාම මම ෆැමිලි ඩොක්ටර් ගාවට දුව එක්කන් ගිහින් බේත් අරන් දුන්නා..*

මම තව පිටු කිහිපයක් පෙරළුව ද වෙනත් විශේෂ යමක් ඒවායෙහි නොතිබිණ.

**අප්‍රේල් 02**

*අද දුව පළමු වතාවට මුනින් අතට පෙරලුණා.. දුවගෙ හිනාවට මගෙ හිතේ තියෙන හැම දුකක්ම මැකිලා යනවා කියලයි මට හිතෙන්නෙ.. මගේ අඳුරු ජීවිතේට තියෙන එකම එළිය මගේ මේ චූටි දුව විතරයි..*

**අප්‍රේල් 03**

*කිසිම හේතුවක් නැතුව මා එක්ක රණ්ඩු වුණා.. එයාට දුව ගැන කිසිම හැඟීමක් නෑ. අනේ මන්දා මට මේ කිසිම දෙයක් තේරුම් ගන්න බෑ..*

එතැන් සිට දින පොත පුරා නොයෙකුත් සටහන් වලින් පිරී පැවතිණි. එය මගේ කාමරයට ගෙන ගොස් කියවිය යුතු යැයි මට සිතිණ. තවත් දිනපොත් වේදැයි සෙවූ මට දිනපොත් හතරක් ලැබිණ.

මම දිනපොත් හතරක්ම ගත්තෙමි. එහෙත් එය ගත් බව කිසිවෙකුට නොදැනෙන ලෙසට මම අනෙක් පොත් ඇසුරුවෙමි.

පෙර තිබූ පරිදි කාමරය වසා දැමූ මම දිනපොත් ටික ගෙන මගේ කාමරයට පැමිණියෙමි.

කියාගත නොහැකි කුමක්දෝ හැඟෑමකින් මම පෙළෙමින් සිටියෙමි. මා පිළිබඳව විශේෂම වූ යමක් මේ දිනපොත් අතර වේදැයි මගේ සිත මට කියන්නට විය. දිනපොත් ටික මම මගේ ඇඳුම් අතර සඟවා





තබා මිදුලට ආවෙමි.

අම්මා පිළිබඳව මා දැන සිටියේ බෙහෙවින් සුළු විස්තරයකි. ඇය මිය ගිය ද මගේ හදවතේ තවමත් ජීවමානව වෙසෙන්නීය. ඇගෙන් ලැබූ පහසක සුමුදු බව තවමත් මා හට දැනෙන්නාක් මෙනි.

මගේ අම්මා පිළිබඳව තවෙකෙකුට විස්තර කිරීමට තරම් කිසිවක් මම දැන නොසිටියෙමි. මේරි නැන්දා පවා ඇය ගැන මට කියා තිබුණේ සුළු විස්තරයකි.

අඳුර වැටෙන්නට ඔන්න මෙන්න තිබියදී කුඩම්මලා ඇතුළු පිරිස පැමිණියහ. ඔවුන් පැමිණි පසු මෙතෙක් වේලා මා වෙත රැඳී තිබූ නිදහස් බව පලා ගියාක් මෙන් මට දැනිණි.

මම අනතුරක් දැක කටුව තුළට ඇදෙන ඉදිබුවෙකු සේ කාමරයට වැදී දොර වසා ගතිමි. අලස බවක් මා සිතට පිවිසෙද්දී බාප්පා ගේ කාමරයෙන් ගෙන ආ දින පොතක් කියවන්නට මට සිතිණ.

**අප්‍රේල් 10**

*..අළුත් අවුරුද්දක් ලබන්න තව දවස් කීයද තියෙන්නෙ? ඒත් හිතට කිසිම සතුටක් දැනෙන්නෙ නැහැ. විජේ එක්ක කලින් අවුරුදු කොච්චර සතුටින්ද ගත කළේ? ඒත් කාලයක් මගේ හිතේ තිබුණු ඒ සතුට අද හොරු අරගෙන වගේ.*

**අප්‍රේල් 11**

*දූ පැටියට ගවුමක් මැහුවා. ඒක අන්දලා බලනකම් මට ඉවසිල්ලක් නැහැ. මගෙ හිතට සතුට ගේන එකම කෙනා දූ පැටිය විතරයි.*

**අප්‍රේල් 13**

*අළුත් අවුරුද්දක්.. මේරියි ලිසියි කැවිලි හදලා.. ඒ දෙන්නට ඕව කරන්න හිතුණාට මට හිතුණෙ නෑ. සතුටක් නැති අවුරුද්ද අවුරුද්දක්ද? විජේ ආවෙ හුඟක් රෑ වෙලා.. ඒත් බීලා.. වෙනදා වගේ ම අදත් මං හැම දෙයක්ම හිත*

ඇතුළෙ හංග ගෙන වැලපුණා. දෙවියනේ මං කරපු වැරැද්ද මොකක්ද..?

ඉන් එහාට අප්‍රේල් නිමා වෙනතුරු වැදගත් යමක් ලියා නොතිබිණ.

**මැයි 01**

අද නිවාඩු දවසක්. ඒත් උදෙන්ම ලේස්ති වෙලා විජේ කොහෙද ගියා. මං ඇහුවට කිව්වෙ නැහැ. ඉස්සර නම් එයා හැම තැනම ගියේ මට කියලා. ඒත් එදාට වැඩිය අද හුඟක් වෙනස්.

දුව අද සෙල්ලම් කරන්න ගිහින් වැටිල නළල හැප්පුණා. නළල ගෙඩි ගැහිලා. කරන්න ඕන මොකද්ද කියලා හිතා ගන්න බැරුව මම දුව අතේ තියාගෙන අඬනකොට මේරි උණු අළු රෙදි කෑල්ලක දාලා ගෙනත් දුවගෙ නළල තැව්වා. අළුත් දෙයක් ඉගෙන ගත්තා. තැල්මකට උණු අළු වලින් තවනවා.

**මැයි 02**

විජේ අදත් උදෙන්ම කොහෙද ගියා. දුව ඉන්න නිසා මට කාලෙ ගත වෙනව තේරෙන්නෙ නෑ. ඇත්තටම අද මට හරිම සතුටු දවසක්. දූ පැටිය අද ''අම්මා'' කියන වචනෙ හරියට කිව්වා. මේරිත් දුවට හරිම ආදරෙයි. මගේ කෙල්ල දකින කාටද ආදරේ නොහිතෙන්නෙ.

එකී දා තමින් යුත් කොටස කියවාගෙන යද්දී මගේ දෙනෙතට කඳුළු පිරිණි. සත්තකින්ම මගේ රත්තරන් අම්මාට තිබී ඇත්තේ මටත් වඩා කාරුණික මුදු හදක් බැව් මට වැටහිණි. එවන් රත්තරන් අම්මා කෙනෙක් මට නැතිව ගිය සැටි. මම කඳුළු පිස දමා ගනිමින් යළිත් දිනපොතට නෙත් හෙළීමි.

**මැයි 03**

විජේ ඊයෙ රෑ කීයට ආවද මන් දන්නෙ නෑ. රෑ දොළහ හමාර වෙනකම් බලල බැරිම තැන මං නිදා ගත්තා. උදේ බලන කොට එයා නිදි. කොහෙද ගියේ කියලා මං ඇහුවත් කිව්වෙ නෑ. දැන් එයා මං ගැන කිසිම සැලකිල්ලක්





නැති හැඩයි.

දුවට කිරි පොවද්දිත් මට කල්පනා වුණේ ඒකමයි. මගේ ඇස්වලට උනපු කඳුළු කැටයක් දුවගෙ නළලට වැටුණා. මට ඒ වෙලාවේ මගේ ගැනයි දුව ගැනයි, දැනුණෙ හරිම අසරණ බවක්. මං ඉක්මනට ඒ කඳුළු කැටය පිස දැම්මා.

**මැයි 04**

කළුකරේට වැස්ස පටන් අරගෙන. උදේ ඉඳන් චිරි චිරි ගගා වහිනවා. දුවට රෝස පාට වූල් ගවුම ඇන්දුවා. ඒත් එයත් එක්ක බෑ. ගවුම ඉස්සරහ ගැට ගහපු පටි දෙක අදින එකමයි එයාගෙ වැඩේ. දුවගෙ අත් දෙකට දාපු කළු වළලු හතෙන් තුනක්ම එයා දැන් බිඳගෙන. මගේ උණුහුමේ තුරුල් වෙලා එයා නිදා ගන්න හරි ආසයි. මගෙ රත්තරන් දූ පැටිය. මට එහෙම හිතෙනවා හැම වෙලාවෙම.

ඉන් එහාට කිසිවක් කියා ගත නොහැකි ලෙසට මගේ දෙනෙත කඳුළින් බොඳව තිබිණ.

හිත ඇතුළේ මහා විලාපයක් ගොඩ නැගෙමින් තිබිණ. කෑ ගසා විලාප දී හඬන්නට මට ඇවැසි විය. ඒ අනෙකක් නිසා නොව මා හට මේ තරමටම ආදරය කළ මගේ රත්තරන් අම්මා වෙනුවෙනි. දිනපොත කියවීමේ ආශාව තිබුණද මා හට එය කියවා ගත නොහැක. එපමණටම මහිත බෙහෙවින් සසලව තිබිණ.

බෙහෙවින් ව්‍යාකූල වූ සිතැතිව මම නින්දට ගියෙමි. පසුදා මා ෂෙහාන් හමුවීමට යොදා ගෙන තිබිණි.

''අද මට ඔයත්තෙක්ක කියන්න වැදගත් දෙයක් තියෙනවා..'' ගාලු බස් නැවතුමේදී ඔහු හමුවූ ඇසිල්ලෙහි මම කීවෙමි. ෂෙහාන් කුතුහලයෙන් දෙනෙත පුංචි කොට මදෙස බැලීය.

මම සෙමින් ඉවත බලා ගතිමි.

''බට්ටි ඔයා අඬලා..'' ඔහු සෙමින් කියනු මට ඇසිණ. මම දිගු සුසුමක් හෙළීමි.

''අපි අරලිය එකට යමු..'' ෂෙහාන් කීවේය. මම ඔහුගේ අතෙහි එල්ලී පාර පැන්නෙමි.

මුහුදු සුළඟ මගේ රැලි සාය හා පැටලී දඟ කරන්නට විය. වෙනදා එය මට සිනහවට කරුණක් වුව ද අද මගේ සිනාව දුරින් දුරටම පලා ගොස් තිබිණ.

මම නිහඬවම ගමන් කළෙමි. ෂෙහාන් ද කිසිවක් නොකීය. ලංකා බැංකුව ඉදිරිපසින් වූ පාර ඔස්සේ අපි යුද හමුදා කඳවුර පසුකොට රැම් පාට් වීදියට වැටුණෙමු. වීදිය පාළු වී තිබිණ. ෂෙහාන් මගේ උරහිස වටා අතක් යවා ඔහු සිරුරට මා තවත් ළංකොට ගත්තේය. එකී රැකවරණයෙන් මම බිඳකට සැනහී ගියෙමි.

''ඉතින්..'' අරලිය එකේ අසුන් ගත් විගස ෂෙහාන් මගේ මුහුණට එබෙමින් කීවේය. මම නිහඬවම රවුම් මේසය මත දෑත තබා ගතිමි.

''හිනාවක් නෑ.. කතාවක් නෑ.. මොකද ළමයො.. මට කියන්න..''

මගේ සුරත මත ඔහු සුරත තබමින් කීවේය.

''අම්මා..'' යි මට කියවිණ. ඒ සමගම මට ඉකිබිඳිණ. මම මගේ අතත්, ඔහුගේ අතත් යටවන සේ ඒ මත නළල තබා හඬන්නට වීමි.

''බට්ටි මෙහෙට හැරෙන්න..'' ෂෙහාන් දයාබරිත ලෙසින් කීය. මට ඔහුගේ දයාබර බව හමුවේ අවනත වන්නට සිදුවිය.

ඔහු මගේ නිකටින් අල්ලා මගේ මුහුණ ඔහු වෙතට හරවා ගත්තේය.

''බට්ටියේ මට කියන්න බැරි දෙයක් ඔයාට නැහැනෙ.. කියන්න හොඳ ළමය වගේ කියන්න..''

මම ඔහුට දිනපොත් පිළිබඳව කීවෙමි. ඒ අසා සිටි ඔහු දැඩි කල්පනාවකට වැටුණේය.

''ෂෙහාන්..'' ඔහුගේ කල්පනාවේ සීමාවක් නොදුටු තැන මම ඔහුගේ අතින් අල්ලා සෙලවූයෙමි. ඔහු තිගැස්සී මදෙස බැලීය.

''මොනවද ඔයා කල්පනා කළේ..?'' මම විමසුවෙමි.





''නෑ මුකුත් නෑ.. ඒක නෙමේ කෝ දැන් ඒ දිනපොත්..?'' ෂෙහාන් විමසුවේය.

''මං ගාව.. මං ඒවා හංගල තිබ්බා..'' මම කීවෙමි.

''බට්ටි ඔයා හෙටම ඒ ටික මට ගෙනත් දෙනවද..?'' ෂෙහාන් කල්පනාකාරී ලෙස විමසීය.

''හෙට.. මං ඒව තාම කියෙව්වෙත් නැහැනෙ..''

''ඔයාට කියවන්න පස්සෙ පුළුවන්නෙ.. ඉස්සර වෙලා මට ගෙනත් දෙන්නකෝ..'' ඔහු කීය.

''හා..'' මම ඔහුට එකඟ වූයෙමි.

''මොනවද බොන්නෙ..?''

ෂෙහාන් සුපුරුදු ඉරියව්වට පමිණෙමින් විමසීය.

''දන්නවනෙ මොනවද කියලා..'' මම අඩ සිනාවකින් යුතුව කීවෙමි.

''පෝටෙලෝ..?''

''හ්ම්..''

''ඉන්න මං අරන් එන්නම්..'' ඔහු එසේ කියා නැගිට ගියේය.

අරලිය එකෙහි බොහෝ වේලාවක් ගත කළ අප ඉන් පිටව ආවේ පසුදින හමුවන බලාපොරොත්තුවෙනි.

''මතක ඇතුව හෙට ඩයරිස් ටික අරන් එන්න..'' වෙන් වෙන මොහොතේදී ෂෙහාන් කීවේය.

නිවසට පැමිණ මඳක් විවේකීව සිටි මම කලින් දින කියවා අතරමඟ නතර කළ දිනපොත අතට ගතිමි.

**මැයි 05**

උදේම call එකක් ආවා. මම ගත්තා. එහා පැත්තෙන් ඇහුණෙ ගෑනු කට හඬක්. මිස්ට විජේකෝන් ඉන්නවද කියලා ඇහුවා.. කවුද කතා කරන්නෙ කියලා ඇහුවට කිව්වෙ නෑ. මං විජේට කතා කරල call එකක් කියල කිව්වත්

මගෙ හිතට මොකක්දෝ වෙනසක් දැනුණා.

ඒ කවුද කියලා විජේගෙන් ඇහුවට එයා කිව්වෙ නෑ. දෙයියනේ ඇයි මේ තරමට මගෙන් එක එක දේවල් හංගන්නෙ? මං දැනුවත්ව නම් මගෙ අතින් විජේට අබ මල් රේණුවක තරම්වත් වැරැද්දක් වෙලා නැහැ.

**මැයි 06**

මගෙ දුක සැප බලන්න දැන් ඉතිරි වෙලා ඉන්නෙ මේරි විතරයි. ඒත් හැම දෙයක්ම මේරිත් එක්ක කියන්න පුළුවන් කමක් මට නැහැ.

මම දින පොත වසා දැමුවෙමි. අම්මා මොන තරම් සිත් වේදනාවකින් පෙළෙමින් සිටින්නට ඇත්දැයි මට සිතිණ.

මගේ සිතුවිලි වෙනස්ව ගියේ ගෙතුළින් ඇසුණු කටහඬකි. මම ඊට සවන් දුනිමි.

''මගේ ගෙදර මට ඕන විදියට වැඩක් කරන්න බැරි හැටි..'' කුඩම්මාගේ වේගවත් හඬ ඇසිණ. ඇය මේ චෝදනා නගනුයේ කාහටද? මම වඩාත් උවමනාවෙන් සවන් දුන්නෙමි.

''ඇයි කවුරුවත් එපා කියල තියෙනවද..?'' මට බාප්පාගේ හඬ ඇසිණි.

''කවුරුවත් එපා කිව්වත් නැතත් මං මට ඕන දේ කරනවා..''

''එහෙනං මොකටද මේ කෑගහන්නෙ..?''

''ඔයා හැමදාම ඔහොම ඇහැ කන පියාගෙන හිටියාම හරියාවි..''

''මොකද්ද මානෙල් ඔයා මට කරන්න කියන්නෙ..? කියන දෙයක් කියන්නකො තේරෙන සිංහලෙන්..'' බාප්පාගේ හඬ මඳක් වේගවත් විය.

''සිංහලෙන් තියා දෙමළෙන් කිව්වත් ඔයා නම් තේරුම් ගන්නෙ නෑ. මං කියන්නෙ මේ ගේ සින්න වෙන්න කලින් අර බණ්ඩාරවෙල ඉඩම විකුණලා ගේ බේර ගන්න කියලා..'' කුඩම්මාගේ කතාවෙන් මම අළුත් යමක් දැන ගතිමි. එසේ නම් මේ නිවස උකස් කර ඇත.





''අනුන්ගෙ නමකට තියෙන ඉඩමක් විකුණන්න බෑ මානෙල්..''

''අනුන්ගෙයැ ඔයාගෙම දුවගෙ නමටනෙ.. ඔයා ඒ ඔප්පුව අරන් දෙන්න.. ඉතුරු හරිය මං බලාගන්නම්..'' කුඩම්මා කියනු ඇසෙද්දී මගේ ලේ රත්ව යන්නාක් මෙන් මට දැනිණ. බාප්පා අවුස්සනුයේ කුඩම්මා විසින් බව වැටහෙත් ම මට ඇය කෙරේ දැනෙමින් තිබූ කෝපය ඉහවහා යන්නට විය.

''ඒකිගෙන් ඒක ගන්න පුළුවන් නම් ඔයා කියනකං ඉන්නෙ නෑ මම..'' බාප්පාගේ ගෝරනාඩුව ද නිමක් නොමැත.

''කවද හරි ඒකි අපිට කොකා පෙන්නල යනකං.. ඔයා ඔහොම කිය කියා ඉන්න.. මට ඒවයෙ ප්‍රශ්නයක් නෑ. ඒත් මේ ගේ සින්න වෙන්න කලින් කොහොම හරි බේර ගන්න ඕනැ..''

''ඔච්චර හයියෙන් කෑ ගහන්න එපා මානෙල්.. අහල පහළ මිනිස්සුන්ටත් ඇහෙනවා..''

''අහල පහල මිනිස්සුට කියලා ඕව හැමදාමත් හංගගෙන ඉන්න බෑ. ඒ මිනිස්සුත් කවදා හරි මේව දැන ගනීවි. එදාට අපිට වෙන්නෙ රෙදි නැතිව පාරට බහින්න..'' කුඩම්මා එක දිගට කියවාගෙන ගියාය.

''අනේ මානෙල් ටිකක් ඉන්නකෝ කෑ නොගහ.. මගෙ ඔලුවත් කකියනවා මේවා ඇහෙන කොට..''

''තවම ඔලුව කකියන්න ගත්තෙ නෑ. බලමුකො හෙට අනිද්දට..'' කුඩම්මාගේ අන්තිම වචන කිහිපය ඇසුණේ හීනවෙමිනි. ඇය බාප්පා අසලින් යන්නට ඇතැයි මට සිතිණි.

රාත්‍රී නමය පසුවෙන තුරුත් කල්පනාවෙන් කාලය ගත කළ මම නින්දට ගියෙමි. දැඩි නින්දකට වැටී සිටි මම කුමක්දෝ හේතුවක එක්වරම අවදි වූයෙමි.



Scanned by CamScanner

# 9

**කිසිවෙකු** මගේ කාමරයට ඇතු-ල් වී ඇති බව මට ඉවකින් මෙන් දැනිණ. මහිතට නපුරක් මුසු බියක් දැනී ගත සීතල වී ගියේය. මම ශබ්දයක් නොකොට පැමිණි තැනැත්තා කවුරුන් දැයි හඳුනා ගැනීමට උත්සාහ ගතිමි.

වීදුරු කවුළුව තුළින් යාන්තමට වැටුණ සඳ එළියෙන් මම ඔහු හඳුනා ගන්නට වෙර දැරීමි. ඔව්.. අවසානයේදී මම ඔහු හඳුනා ගතිමි. ඒ අන් කිසිවෙකු නොව බාප්පාගේ වෙසින් සිටින මගේ අප්පච්චිය.

ඔහු කුමක් කරන්නට සැරසෙත්දැයි මම අතක් පයක් නොසොල්ලාම බලා සිටියෙමි.

මගේ සිතට මගේ ජීවිතය පිළිබඳ බියක් ද ඇතුල් වෙමින් තිබිණ. මා හට මේ තරම් නපුරුකම් කරන මෙවන් තැනැත්තෙකු මාගේ ජීවිතය පවා නැසුමට ඉඩ ඇති බව මම දැන සිටියෙමි.

ඔහු මා දෙස එබී බැලීය.මම නෙත් පියා නිදි බව ඇඟවූයෙමි. මොහොතකට පසු සෙමෙන් නෙත් හැර බලද්දී ඔහු වටපිට බලනු මට පෙනිණ. ඒ සමගම සාලයේ තිබූ ඔරලෝසුවෙහි එක වදිනු මට ඇසිණි.

බාප්පා සෙමෙන් මගේ අල්මාරිය විවර කරනු මට පෙනිණ. මට එක්වරම දින පොත් සිහිවිය. මගේ පෙර වාසනාවකදෝ සවස ඒවා එළියට ගත් ගමන් ඒ වන විටත් ඒවා තිබුණේ මගේ හිස තබන කොට්ටයට යට කොටය.





අල්මාරිය විවර කළ බාප්පා පෙන් ටෝච් එකක් දල්වා කුමක්දෝ සොයන්නට විය.

ඔහු සොයනුයේ කුමක්දැයි වටහා ගත නොහැකිව ඒ කුමක් විය හැකි දැයි මම කල්පනා කළෙමි.

ඒ සමගම මගේ සිහියට ආවේ බණ්ඩාරවෙල මා සතුව තිබූ ඔප්පුවය. එය අල්මාරියේ යට ම තට්ටුවට එලා තිබූ පත්තර කඩදාසියට යටකර තිබිණි.

එය ඔහුට සොයා ගන්නට හැකි වෙතැයි මට නොසිතිණ. එහෙත් අවාසනාවකට මෙන් ඔහු තට්ටුවල එලා තිබූ පත්තර කඩදාසි ද උස්සා බලන්නට වූයේය.

තවත් බිඳක් හෝ ප්‍රමාද වුවහොත් ඔප්පුව බාප්පා අතට පත්වෙනු නියත බව මට වහා වැටහිණි. තවදුරටත් බලා නොසිට මා ක්‍රියාත්මක විය යුතු අවස්ථාව එළඹෙමින් තිබිණ. මම යහනෙහි සිටම විදුලි පහන් එළිය දැල්වීමි. තිගැස්සුණ බාප්පා මදෙස හැරී බැලීය. ඔහු ඉමහත් ලැජ්ජාවකට පත් වූ බව ඔහුගේ බැල්මෙන් මට දැනිණි. මම නිහඬවම මොහොතක් ඔහු දෙස බලා සිටියෙමි.

"හොරෙන් ඇවිත් ගන්න තරම් වස්තුවක් මට දීලා තියෙනවද..?" මම එක් වරම විමසා සිටියෙමි.

බාප්පා මොහොතකුදු නොරැඳී කාමරයෙන් පිටව ගියේය. ඒ සමගම මට බාප්පාගේ කාමරය දෙසින් කසුකුසුවක් ඇසිණ. පහත් හඬින් නැගුණ ඒ කතා බහට මම මහත් උවමනාවකින් සවන් පෑවෙමි. ඒ බාප්පාත් කුඩම්මාත් බව වැටහුණ ද ඇසෙන වදන් පැහැදිලිතාවයෙන් තොර බව මට වැටහිණි.

එසේ නම් මේ බාප්පා කුඩම්මාගේ අනුදැනුම ඇතිව ආ ගමනක් බැව් මට වැටහිණ. මගේ සිතට පිවිසි කෝපය මා වෙව්ලන තරම් විය. යහනින් නැගිට මම බාප්පලාගේ කාමරය අසලට ආවෙමි.



Scanned by CamScanner

''මගේ අම්මා මරා ගත්ත මදිවට පිට ගෑනියෙක් ගෙන්නලා දැන් මාවත් මරා ගන්න හදනවා..'' ඒ වදන් මා මුවට නැගුණේ කෙලෙසක ද යන්න පවා මට සිතාගත නොහැකි විය. එවන් සිතුවිල්ලක අංශු මාත්‍රයක් හෝ මා සිතෙහි නොතිබිණ. එහෙත් මා මුවින් එලෙස පිටවින. මගේ කටහඬ ඇසුණ සැනින් ඔවුනගේ කතා බහ නතර විණ.

''මෙහෙම වද දෙනවට වැඩිය හොඳයි ඉපදුණ වෙලාවෙම මගේ බෙල්ල මිරිකලා මරලා දැම්මනම්..'' මම වියරුවෙන් මෙන් කීවෙමි. වෙනදා මෙවන් මොහොතක බාප්පා මට පහරදීමට පැන ගෙන එන්නේය. එහෙත් අද ඔහු මුළුගැන්වී ඇති බව වැටහීමෙන් මගේ සිතට කුරිරු සතුටක් ඇති වෙමින් තිබිණ.

''අප්පච්චිට බාප්පා කිව් පලියට හිතන්න එපා හැම දෙයක්ම හංගන්න පුළුවන් වෙයි කියලා..'' මම වඩාත් උස් හඬින් කෑ ගැසුවෙමි.

''මොනවද හංගන්නෙ..?'' කුඩම්මා කාමරයෙන් එළියට එමින් ඇසුවාය. ඇය දුටු සැනින් මගේ කෝපය තවත් වැඩි විය.

''නැකම..'' මම එකටෙක කීවෙමි.

''උඹ නෑකම හොයා ගනින්.. උඹේ තැනකට ගිහිල්ලා..''

''එහෙම ලේසියෙන් එලවන්න හිතන්න එපා.. එලෙව්වත් මම යන්නෙත් නෑ..'' මම කෑ ගැසුවෙමි.

''උඹ ඔය කාට ඇහෙන්නද කෑ ගහන්නෙ..?''

''දරුවො හදල ඇස් කන් පියාගෙන ඉන්න උන්ට..'' මම වියරු වැටී කෑ ගැසුවෙමි.

''මේ වහල යට කරදරයක් නැතිව ඉන්න ඕන නං අර බණ්ඩාරවෙල ඉඩමෙ ඔප්පුව දියං..'' කුඩම්මා සන්සුන් ඉරියව්වක් පාමින් කීවාය.

''මගේ දෙයක් මං පිට ගෑනියෙකුට දෙන්නෙ නෑ.. ඒක මං දුන්නොත් මගෙ රත්තරන් අම්මටත් කරන ද්‍රෝහිකමක්..''





''මට නොමෙයි අප්පච්චිට දීපං.. මං පිට ගෑණි වුණාට අප්පච්චි පිට මිනිහෙක් නොමෙයිනෙ..''

''අප්පච්චි.. අප්පච්චි තමයි මේ ඔක්කොම කරදරවලට මුල. ඉඩම් ඔප්පුවකට විතරයි අප්පච්චිකං.. පිට මිනිහෙක්වත් අනුන්ගෙ දරුවෙකුට මෙහෙම කරන්නෙ නෑ..'' මගේ ස්වරය එන්න එන්නම උච්ච විය.

''උඹේ කාලකන්නිකම නිසා තමයි ඔහොම උනේ..'' කුඩම්මා කීවාය.

''මං වගේ කාලකණ්ණි කෙල්ලෙක් මේ ලෝකෙට ඉපද්දුවෙ මොකටද දෙවියනේ..?'' ඒ සමගම මට හැඬිණි.

''අඬපං.. මේ රෑ දෙමැද්දේ මූසල කමට අඬපන්..'' කුඩම්මා එසේ කියා කාමරයට ඇතුළුව වේගයෙන් දොර වසා ගත්තාය.

මම මගේ කාමරයට පැමිණියෙමි. ඒ වනවිටත් මගේ දෙනෙත්හි කඳුළු වියැකී නොතිබිණ.

මා දිවියේ බොහෝ රාත්‍රීන් ගෙවුණාක් මෙන් ඒ රැය ගෙවී ගියේ කඳුළිනි. රැය පහන් වූ මොහොතේ සිට මා බලා සිටියේ ෂෙහාන් මුණ ගැසෙන්නට යන වේලාව එළඹෙන තෙක්ය.

මම වේලාසනින් දින පොත් ටිකත් ගෙන නිවසින් පිටවූයෙමි.

''කමක් නෑ මොනව නැති වුණත් මට ෂෙහාන් ඉන්නවනෙ..'' මා සිත එලෙස කොඳුරමින් තිබිණ.

සුපුරුදු පරිදි බස් නැවතුම් පොළේ දී ෂෙහාන් මුණ ගැසිණ.

''කොහෙද යන්නෙ අද..?'' ඔහු මගෙන් විමසීය.

''කොහෙ ගියත් කමක් නෑ අද දවසම අපි එකට ඉදිමු..'' මම කීවෙමි.

''ඒක නෙමේ ඔයා අරක ගෙනාවද..?'' ඔහු එක්වරම විමසුවේය.



Scanned by CamScanner

''මොනවද?'' වටහාගත නොහැකිව මම විමසුවෙමි.

''ඩයරිස් ටික..''

''ඔව්..''

''බට්ටි ඔයා ඇඬුවද..?'' එක්වරම ෂෙහාන් මගේ දෙනෙත දෙස බලා ඇසුවේය.

මම කිසිත් නොපවසා ඉවත බලා ගත්තෙමි.

''අනේ මන්දා කෙල්ලෙ ඔයා මං ගාව හුඟක් සතුටින් හිනා වෙලා ඉන්නවා. ඒත් ගෙදරින් එන්නෙ ඒ සතුට, හිනාව හොරු අරගත්ත වගේ..'' ෂෙහාන් දුක්බරව කීවේය. මම දිගු සුසුමක් හෙළීමි.

''ෂෙහාන් මෙතන වැඩි වෙලාවක් ඉන්න බෑ. සෙනඟ බලනවා..'' මම ඔහුගේ අවධානය වෙනතකට යොමු කරමින් කීවෙමි.

''මං මේ කල්පනා කළේ කොහේද යන්නෙ කියලා..''

''කොහේ හරි යමු ෂෙහාන්. මට ඔයත්තෙක්ක කොහෙ ගියත් හරි සතුටුයි ෂෙහාන්..'' මම ඔහුගේ දෙනෙත දෙස බලාගෙන කීවෙමි.

''අපේ ගෙදර යන්ද..?''

''ඔයාලගෙ ගෙදර? අම්මෝ මට බෑ..'' මම කීවෙමි.

''ඇයි..?''

''මට බයයි ෂෙහාන්.. ගෙදර අය මොනව හිතයිද?'' මම කීවෙමි.

''අද ගෙදර අම්මා විතරයි ඉන්නෙ යමුද..?''

''මට බයයි..''

''බය වෙන්නෙපා අපේ අම්මා, කෙනෙකුගෙ මූණට එක පාරටම කඩා පනින්නෙ නැහැ. අනික කවද හරි මේවා ගෙදර දැන ගන්නත් එපායැ. මොකද කියන්නෙ යමුද..?''

මම පිළිතුරක් සිතාගත නොහැකිව ඔහේ බලා සිටියෙමි.

''මමනෙ බය වෙන්න ඕනැ.. ඔයත් එක්ක අපේ ගෙදර යන්න..''





ෂෙහාන් සිනාසෙමින් කීවේය.

අවසානයේ මම ඔහුගේ අදහසට එකඟ වූයෙමි. එහෙත් මගේ සිත බෙහෙවින් බියෙන් පිරී තිබිණි. ෂෙහාන් සමග ඔහු නිවසට ගිය විට කුමන තත්ත්වයකට මුහුණ දෙන්නට සිදු වේදැයි මට සිතා ගැන්මට පවා අපහසුය.

''මට බයයි ෂෙහාන්..'' ඔහු ගේ නිවස ආසන්නයේදී මම කීවෙමි.

''බය නැතිව එන්න ළමයො..''

බෙහෙවින් නිසංසල පෙදෙසක පිහිටා තිබුණු ෂෙහාන්ලාගේ නිවෙස දකුම්කළු විය.

ගෙමිදුල ක්‍රමානුකූලව සකසා අලංකාර ලෙස මල් වවා තිබිණ.

''ඔය අපේ අම්මගෙ වැඩ..'' මා මල් පාත්ති දෙස බලනු දුටු ෂෙහාන් කීවේය.

මම ෂෙහාන් පිටුපස විත් නිවසට ඇතුළු වීමි.

වේවැල් පුටු තබා පිළිවෙළකට සකසා තිබූ ආලින්දය මගේ සිත් ගත්තේය.

ෂෙහාන් මා කැඳවාගෙන ගොස් විසිත්ත කාමරයෙහි වාඩි කෙරෙව්වේය.

''ඔයා ඔහොම ඉන්න මං අම්මව එක්කං එන්නම්..'' මම බියපත්ව බලා සිටියදී ෂෙහාන් ගෙතුළට ගියේය.

වනයේ අතරමංව ගිය බියපත් මුවැත්තියක සේ මම වට පිට බැලීමි.

කැබිනට්ටුව මත ෂෙහාන්ගේ විශාල ඡායාරූපයක් තබා තිබිණි. ඊට උඩින් බිත්තියේ දිය ඇල්ලක සිතුවමක් එල්ලා තිබිණි.

මට ගෙතුළින් අඩි ශබ්දයක් ඇසින. මම එදෙස බලා සිටියෙමි. මොහොතකට පසු බෙහෙවින් ලගන්නා සිනාවකින් යුත් කාන්තාවක

මවෙත පැමිණියාය. ඇය පසුපස ෂෙහාන් පැමිණියේය. මම අසුනින් නැගී සිටියෙමි.

''වාඩි වෙන්න දුව..'' ඇය සිනාසෙමින් කීවාය. මම යළි අසුන් ගතිමි.

''මේ තමයි අපේ අම්මා.. අම්මා මේ භාෂිණී..'' ෂෙහාන් මම අම්මාටත්, අම්මා මටත් අඳුන්වා දෙමින් කීවේය.

''ඉතිං දුව.. කොහෙද ඉස්කෝලෙ යන්නෙ..?'' ඇය මගෙන් විමසුවාය. මම ඇයට පිළිතුරු දුනිමි.

''මං මෙයාට එන්න කතා කළාම බයේ ගැහි ගැහි හිටියෙ අම්මා බනී කියලා..'' ෂෙහාන් අම්මාගේ උරහිසට අත තබා කීවේය.

''මං මොකටද බනින්නෙ..?'' අම්මා එසේ කියමින් මා ඉදිරියේ වූ යුගල අසුනෙහි වාඩි වූවාය. ෂෙහාන් ද ඒ අසලින්ම වාඩි වී අම්මාගේ උකුලෙහි හිස තබා ගත්තේය.

''පේනව නේද..? පොඩි ළමයි නැති ගෙදර නාකි දණ ගානවා..'' අම්මා ෂෙහාන්ගේ හිස අතගාමින් ද දයාබරිතව කීවාය. ෂෙහාන් අම්මාගේ ගෙල වටා අත යවා හිස මඳක් පහත් කොට අම්මාව සිප ගත්තේය.

''එහාට වෙන්න..'' අම්මා සිනාසෙමින් ෂෙහාන්ව තල්ලු කළාය. මට ඇගේ දයාබරිත සෙනෙහස ගැන දැනුණේ කිව නොහැකි තරම් සොම්නසකි.

මවකගේ දයාබර බව මට අරුමයකි. එහෙත් මම දැඩි අසීරුවකට ලක්ව සිටියෙමි. ඒ මගේ සිත මගේ අම්මා කරා යොමු වෙමින් තිබුණ නිසාය.

''දුව විතරද පවුලෙ ඉන්නෙ..?'' ෂෙහාන්ගේ අම්මා මවෙතින් විමසා සිටියාය.

''ඔව්..'' මම සෙමෙන් කීවෙමි.





''දුව පවුලෙ එකම දරුව නම් අම්මයි තාත්තයි හුඟක් ආදරේ ඇති නේද..?''

මම කිසිත් නොපවසා බිම බලා ගතිමි.

''අම්මා මොකද කරන්නෙ..?'' ෂෙහාන්ගේ අම්මා ඇසූ එකී ප්‍රශ්නයෙන් මම අසරණ වූයෙමි. මම අසරණ දෑසින් ෂෙහාන් දෙස බැලීමි.

''එයාගෙ අම්මා නෑ අම්මෙ..'' ෂෙහාන් මා බේරා ගැනීමට මෙන් කීවේය.

''ආහ්..'' එක්වරම අම්මාට කියැවිණි. ඇය මගේ දෙස අනුකම්පාවෙන් යුතුව බැලුවාය.

''කමක් නෑ දුව ඉන්නකෝ.. මං ඔයාට බොන්න මොකුත් ගේන්න..'' ඇය ෂෙහාන් උකුළින් නැගිට්ටවා ගෙතුළට ගියාය.

''අම්ම දන්නෙ නැතුව බට්ටි ඇහුවෙ..'' ෂෙහාන් දුකින් මෙන් කීවේය.

මම සිනාවක් මුවට නගා ගන්නට උත්සාහ ගත්තෙමි.

''ඔයාලගෙ අම්මා හරිම කරුණාවන්තයි නේද..?'' මම ෂෙහාන්ගෙන් විමසුවෙමි.

''අපෝ ඔව් අම්ම තාම හිතන්නෙ අපි පොඩි උන් කියලා..''

''හොඳ පොඩි උන්.. අම්ම දන්නව නම් පොඩි උන් කරන වැඩ..'' මම කීවෙමි. ෂෙහාන් මට පුටු කොට්ටයකින් දමා ගැසුවේය. මම සිනාසෙමින් එය අල්ලා ගතිමි.

''තියෙන දගේ..'' මම සිනාසෙමින් කීවෙමි.

''තාම පෙන්නුවේ නෑ දගේ..'' ෂෙහාන් ද එකටෙක කීවේය.

''ඒව කොහෙද මගෙත්තෙක්ක.. දෙනව එකක් වැඩිය දඟලුවොත්..'' මම කීවෙමි.



Scanned by CamScanner

''බලමුකෝ..''

''මොනව බලන්නද..?'' මා කියද්දී ඔහු සිනාසුණේය.

''ඔයාට පේර ඕනද..?'' ෂෙහාන් මගෙන් විමසුවේය.

''ඕනද කියල අහ අහා ඉන්නෙ නැතුව දෙන්නකෝ..''

''එන්න දෙන්න..''

''කොහෙ යන්නද හදන්නෙ..?'' අප දෙසට එමින් සිටි අම්මා ඇසුවාය.

''පේර කඩන්න..'' ෂෙහාන් කීය.

''ඒ දරුවට තේ එකක් වත් නොදී එක්කගෙන යන්න හදන්නෙ..? තේ බිව්වට පස්සෙ යන්න..'' අම්මා මට කේක් තසිමක් පාමින් කීවාය.

මම කෑල්ලක් අතට ගතිමි.

''ලැජ්ජ වෙන්නෙ නැතුව කන්න.. වෙනදට ඔයා කේක් කන්න හරි පෙරේතයිනෙ..'' ෂෙහාන් මට විහිළු කළේය. අම්මා සිනාසුණාය.

''ඔයානෙ පෙරේත..'' මම කීවෙමි.

අම්මා හඬ නගා සිනාසී ගෙතුළට ගියාය.

මම ෂෙහාන්ට කේක් කෑල්ලක් පෑවෙමි. ඔහු මා අසලට පැමිණ කට ඇරියේය.

මම ඉක්මනින් කේක් කෑල්ල කටේ ඔබා ගතිමි.

''පෙරේතිම තමා..'' ෂෙහාන් මගේ කනෙන් ඇද කීවේය. මම ඔහුගේ අතට පහරක් ගැසුවෙමි. අම්මා තේ ගෙනාවාය.

ෂෙහාන්ගේ විහිළු මැද මම තේ බීවෙමි.

''ඒ ළමයට තේ ටිකවත් බොන්න දෙන්නෙ නෑ මෙයා ඉඳගෙන..'' අම්මා හිනාව හංගා ගනිමින් කීවාය.

තේ බී අවසාන වූ පසු ෂෙහාන් මා සමග වත්ත පහළට ආවේය.





''ඔයාට ගස් නගින්න බැරිද?'' පේර ගස යටදී ෂෙහාන් ඇසුවේය.

''මොකද බැරි මට හොඳට පුළුවන්..''

''හරි ලස්සනට තියෙයි ගෑණු ළමයි ගස් උඩ නැග්ගම..'' ෂෙහාන් මට කට ඇද කොට ගහට නැග්ගේය.

මම ද ඔහු පසුපස ගහට නැග්ගෙමි.

ෂෙහාන් ගහ දිගේ පහළට බසින්නට විය.

''බට්ටි බිමට බහින්න..'' ඔහු පහළට බැස කීය. මම අතේ දුරින් තිබූ පෙර ගෙඩි කිහිපයකුත් කඩාගෙන බිමට බැස්සෙමි.

''බට්ටි ඔයා ගස් නගිනවට මං ආස නෑ..'' ඔහු දයාබර ලෙසින් කීවේය. මම මඳ සිනාවක් මුහුණට නගාගෙන ඔහු දෙස බලා සිටියෙමි.

''ගෑණු ළමයෙකුට ඒ වගේ දෙයක් ඔබ්න්නෙ නෑ බට්ටි..''

''හරි මං මීට පස්සෙ නගින්නෙ නෑ ඉවරනෙ..'' මම නෝක්කාඩු ස්වරයෙන් කීවෙමි.

''ඔන්න ඔන්න කේන්ති ගියා.. අම්මෝ මූණෙ හැටි විතරක්.. ආ මේ පෙර ගෙඩිය කන්න එතකොට හරි..'' ෂෙහාන් විහිලුවට කීය.

මම ඔහුගේ අතට ගැසීමි. පේර ගෙඩිය ඉවතට විසි විය. මට හිනා නැගිණ. ඔහු යළි එය අහුලා ගත්තේය.

''බට්ටි ඔයා අපේ ගෙදර ඉන්නකොට මගෙ හිතට පුදුම සතුටක් දැනෙනවා..'' ෂෙහාන්කීය.

''එහෙනම් මං හැමදාම ඉන්නම්..'' මම සිනාසෙමින් කීවෙමි.

''ඒක තමයි මගෙ හිතේ තියෙන ලොකුම ආශාව..'' ෂෙහාන් දයාබර බැල්මක් දෙනෙතට නගා ගනිමින් කීය.

''මම එච්චරටම වාසනාවන්තද ෂෙහාන්..?''

''ජීවිතේ හැම තිස්සෙම අවතක්සේරුවෙන් හිතන්න එපා බට්ටි.. එහෙම හිතන්න හිතන්න අපිට ලැබෙන්නෙ මහ අවාසනාවන්ත



Scanned by CamScanner

ඒවා විතරයි..'' ෂෙහාන් කීය.

''ඔයා හරි පණ්ඩිතයෙක් වෙලානෙ..''

''එහෙම තමයි මිනිස්සු වයසට යනකොට ඉබේම පණ්ඩිත වෙනවා..'' ෂෙහාන් බොරු බැරෑරුම් බවක් මුහුණට නගා ගනිමින් කීවේය.

''මට එපා නාකි මිනිස්සු..''

''එපා..'' ෂෙහාන් දෑස් කුඩා කරමින් ඇසීය.

''නෑ.. නෑ.. ඕන..'' මම කුඩා දැරියක සේ කීවෙමි.

''පිස්සි..'' ෂෙහාන් මගේ උරහිස මත අත තැබීය.

''අපි ගෙදර යමුද? ඇවිල්ලත් හුඟක් වෙලා.. ඔයාගෙ අම්මා මොනව හරි හිතාවි..'' මම ඔහුට කීවෙමි.

''අපේ අම්මා එහෙම වෙනසක් හිතන්නෙ නෑ බට්ටි.. කෝකටත් අපි යමුකො ගෙට.. අම්ම මොනවද කරන්නෙ බලන්නත්තෙක්ක..''

අප නිවසට ඇතුළු වනවිට අම්මා පෙනෙන්නට නොසිටියාය.

''කුස්සියෙ වෙන්නැති.. අළුත් ලේලි පොඩ්ඩට කන්න හදන්න එපායැ..'' ෂෙහාන් රහසින් මෙන් කියද්දී මට සිනා නැගිණ.

''හිතාගෙන ඇති.. ඒව කොහෙද මාත්තෙක්ක..'' මම ඔහු අවුස්සන්නට සිතා කීවෙමි.

''ඒකත් එහෙමද..?'' ෂෙහාන් මුහුණ අඳුරු කර ගනිමින් කියද්දී මට දුක සිතිණ.

''විහිළුවක් ළමයො මම කළේ..'' මම කීවෙමි. ඔහුගේ මුහුණ සිනාවකින් විකසිත විය.

''එන්න අපි යමු කුස්සියට..'' ෂෙහාන් මා කැඳවාගෙන ඔවුන්ගේ මුළුතැන් ගෙය දෙසට ගියේය.

''ආ.. පේර කැඩුවද..?'' අම්මා අප දුටු විගසම සිනාවී විමසුවාය.





''ඔව්..'' ෂෙහාන් කීවේය.

අම්මා පොල් ගාන්නට සැරසුණාය.

''දෙන්න මම ගාල දෙන්නම්..'' මම ඇය අසලට යමින් කිවෙමි.

''මෙන්න මෙහාට වෙලා ඉන්නව හලෝ කලර්ස් පෙන්නන්නෙ නැතුව..'' ෂෙහාන් මගේ අතකින් ඇද පුටුවක වාඩි කරවීය.

''දුව ඉන්න මට පුළුවන් මේ ටික කරගන්න..'' අම්මා කාරුණික හඬින් කීවාය.

''ආ දුවට පොල් වතුර..'' අම්මා පොල් ගෙඩිය බිඳ වතුර වීදුරුවකට දමා මට දුන්නාය.

''දූන් පොල් වතුර බීල බඳිනදාට හෙණ ගගහ වහීවි..'' ෂෙහාන් කීය.

''ඇයි එහෙම කියන්නෙ..?'' ෂෙහාන් කියූ දෑහි අරුත වටහාගත නොහුණුව මම ඇසුවෙමි.

''ගෑණු ළමයෙක් පොල් වතුර බිව්වම බඳින දාට වහිනව කියල කතාවක් තියෙනවා..'' ෂෙහාන් පැහැදිලි කළේය.

''ඔය බොරු කතා දුව.. අපේ ළමයට පිස්සු...'' අම්මා මගේ හිස අතගාමින් කීවාය.

''බලමුකො ඒ සැරේ මට වැඩිය එයාට ආදරේ වෙලා..'' ෂෙහාන් කියද්දී අම්මාටත් මටත් සිනා නැගිණි.

සත්තකින්ම අම්මා කෙනෙකු කොතරම් කරුණාවන්තද..? සෙනෙහෙබරද.. ආදරණියද.. එහෙත් පව්කාර මා මවකගේ ඒ රත්තරං ආදරයට නොහිමිකාරියක වී ඇති සැටි.. මගේ අම්මාත් ජීවතුන් අතර සිටියා නම් මෙලෙසින් ආදරය කරනු ඇතැයි මට සිතිණ. සැබැවින්ම දුක හංගාගෙන සිටින ඇතුල් හද ගැබ ෂෙහාන්ගේ අම්මාගේ ආදරය විසින් අවුස්සා තිබිණි. මගේ දෙනෙතට මා කෙරේ උපන් ආත්මානුකම්පාවකින් කඳුළු පුරමින් තිබිණ.



Scanned by CamScanner

''දුව ඇයි මේ..?'' ෂෙහාන්ගේ අම්මා කෙරෙන් කඳුළු සඟවා ගන්නට මට ඉඩක් නොවීය.

''හාමි ඇයි..?'' ෂෙහාන් පවා මගේ වෙනසින් කලබලයට පත් විය.

''මට මගේ අම්ම මතක් වුණා.. මගේ අම්මත් හිටිය නං මට මේ වගේ ආදරේ වෙයි..'' මම බොඳ වූ නෙතු කඳුළින් කීවෙමි.

ෂෙහාන්ගේ අම්මා මා ඇගේ සිරුරට හේත්තු කරගනු මට දැනිණි. මම ඒ අප්‍රමාණ වූ මට නොහිමි වූ මව් සෙනෙහසේ සුවඳට තුරුලුවීමි.

''දුව අපි කාටවත් ජීවිතෙන් ඉල්ලන දේවල් ඒ හැටියටම ලැබිල නෑ.. හැම දුකක්ම විඳ දරා ගන්න අපි පුරුදු වෙන්න ඕනැ දුව.. ඒ වගේම අපිට හැමදාම දුක් විඳින්නම වෙන්නෙ නැහැ.. ඒ නිසා ඉස්සරහ අනාගතේ ගැන කල්පනා කරල සන්තෝෂ වෙන්න..'' අම්මා කාරුණික ස්වරයෙන් මට පැවසුවාය. මම ඇය කියන්න නිහඬව ම අසා සිටියෙමි.

''පුතා මේ දුවව එක්ක ගිහින් අර ඇල්බම්ස් ටික පෙන්නන්න..'' අම්මා ෂෙහාන්ට කීවේ මගේ හිත හදන්නට විය යුතුය.

''එන්න යමු..'' ෂෙහාන් මා කැඳවාගෙන මුළුතැන් ගෙයින් පිටවිය.

''එන්න මගේ කාමරේ පෙන්නන්න..'' ෂෙහාන් ඉදිරි කාමරයට ඇතුල් වෙමින් කීය. මම ඔහු පසුපස ඇදුණෙමි. කාමරයට හිස පෙවූ මට දකින්නට ලැබුණේ ක්‍රමවත් අයුරින් සකසන ලද සුන්දර කාමරයකි.

''හරිම ලස්සනයි ෂෙහාන්..'' මම කාමරය පුරා නෙත් යවමින් කීවෙමි. කාමරය පසෙක බිත්තියේ Lost Love සිතුවම එල්ලා තිබිණ.

''ඇයි මේ ලොස්ට් ලව් චිත්‍රය එල්ලගෙන ඉන්නෙ..?'' මම විමසුවෙමි.

''ඔය අපේ අයියගෙ වැඩ.. එයාගෙ වැඩ ඔහොම තමයි..'' ෂෙහාන් කීවේය.





මම ෂෙහාන්ගේ යහනෙහි හිඳ ගතිමි.

''මට වෙලාවකට ඔයා ගැන මහ පුදුම දුකක් දැනෙන්නෙ'' ෂෙහාන් සෙමෙන් කීය.

''ඇයි ඒ..?''

''මං කොච්චර ඔයාට ආදරේ වුණත් අම්ම කෙනෙකුගෙ අඩුව පුරවන්න බැහැනෙ.. ඔයා ඒ ගැන හිත හිතා දුක් වෙනව බලන් ඉන්න බෑ මට..'' ෂෙහාන් කියද්දි මම නිහඬවම බිම බලා ගතිමි.

''මේක මගේ පව ෂෙහාන්.. අම්ම කෙනෙකුගෙ ආදරේ ලබන්න මං පින් කරලා නැහැ.. ඔයා දුක් වෙන්න එපා...'' මම ආයාසයෙන් කීවෙමි.

එක්වරම දොර දෙසින් ඇසුණු අඩි ශබ්දයකින් අපි දෙදෙනාම එකවර හැරී බැලීමු.

''ආ.. මං මේ බැලුව කවුද අමුත්තෙක් ඇවිත් ඉන්නෙ කියලා..'' ඒ නොපුරුදු කටහඬින් මම තිගැස්සුණෙමි.

මගේ නෙත ගැටුණේ කාමරයට ඇතුළු වෙමින් හුන් නිශාන් වාරුක ජයම්පති වූ ෂෙහාන්ගේ ලොකු අයියා වෙතය. ඔහුගේ මුහුණෙහි මඳ සිනාවක් විය.

''කොහොම කොහොම හරි අන්තිමේදී උඹ ගෙදරටම එක්ක ආව නේද..?'' අයියා සිනාසෙමින් ෂෙහාන්ගෙන් ඇසීය.

''කෑගහන්න එපා මෝඩයො අම්මට ඇහේවි..'' ෂෙහාන් කීය.

''ඇහුණම මොනව වෙනවද..? කවද හරි ඕව දැන ගන්නත් එපායැ.. නේද නංගී..?'' අයියා එසේ කියමින් හිඳ ගත්තේය.

''ඉතිං නංගි කොහොමද..? ගොඩක් කාලෙකට පස්සෙනෙ මේ දැක්කෙ..''

''ඔව් එදා හොස්පිට්ල් එකේදි මුණගැහුණට පස්සෙනෙ..'' මම අතීතය සිහිකොට කීවෙමි.



Scanned by CamScanner

''ඒක නෙමේ කොහොමද අපේ කාමරේ..?'' අයියා දැත විහිදුවමින් ඇසීය.

''ලස්සනයි ලස්සනයි ඒත් මොකද මේ Lost Love පින්තූරෙ එල්ලගෙන ඉන්නෙ..'' මම විමසුවෙමි.

''ඇයි කෙනෙකුට නැතිවුණ ආදරයක් තියෙන්න බැරිද..?'' අයියා පෙරළා මගෙන් විමසීය.

''එහෙමත් එකක්ද?'' මම අඩ සිනාවකින් යුතුව ඇසීමි.

විහිලු තහලු මැද කාලය ගත කළ මට වෙලාව ගෙවෙනු නොදැනිණ. අම්මාගේ ඇමතුමෙන් අපි දවල් කෑමට වාඩිවීමු. අම්මා මටත්, ෂෙහාන්ටත්, අයියාටත් කෑම බෙදමින් සිටියා විනා ඇය කෑමට වාඩි නොවූවාය.

''අම්මත් වාඩි වෙන්නකෝ..'' ෂෙහාන් ඇවිටිලි කළේය.

''මං පස්සෙ කන්නම් පුතාලා කන්නකො..'' අම්මා කීවාය. ඇගේ කාරුණික බව මා හට පුදුමයට කරුණක්ම විය. මවකගේ සෙනෙහස කිසිදු විටෙක විඳ නොමැති මා හට මව් සෙනෙහස අරුමයක්මය.

''හරි රසයි ෂෙහාන්..'' මම මාළු ඇඹුල් තියල් යළිත් වරක් බෙදා ගනිමින් කීවෙමි.

''ආ.. අද අපි කාල ඉවරයි වගේ..'' අයියා කෑ ගැසුවේය. එවත් විහිලු තහලු මැද අපි කෑම කා අවසන් කළෙමු.

සවස් වූ පසු ෂෙහාන් මා සමග ගාල්ලටම පැමිණ මා බසයකට ැංවීය.

මගේ සිත බෙහෙවින් සතුටට පත්ව තිබිණ. මා යළි නිවසට නවිටත් එකී සතුට මා කෙරෙන් ඉවත්ව නොතිබිණ.

මා නිවසට ඇතුළු වනවාත් සමගම විසිත්ත කාමරයෙහි අසුන් න කතා කරමින් හුන් බාප්පාත්, පුංචි අම්මාත්, තමාලිත් මගේ න ගැටිණ.





''රස්තියාදු ගහල ගහල ඔන්න ගෑණු ළමේක් එන වෙලා..'' මට යන්නට හැර කුඩම්මා කියනු මට ඇසිණ. මම එය නෑසුණා සේ යන්නට ගියෙමි.

''පුංචි අම්මාගෙයි, බාප්පාගෙයි වැරැද්ද, ඕව ගැන හොයල බලනව නම් ඔය මොකුත් ප්‍රශ්නයක් නැහැ..'' මට තමාලිගේ හඬ ඇසිණි. ඇයට ඕනෑ නැති දෙයක් නැතැයි මට සිතිණ. මම කාමරයට වැදී දොර වසා ගතිමි.

ජීවිතේ අඳුරු ගැබේ
කදෝකිම්යෙකු වගේ
හෙමි හෙමින් දැල්වෙනා
සංතෝෂෙ ආලෝකෙ
හොරා ගන්නෙපා යළි
ජීවිතේ ගෙවෙන තුරු..

සටහන් පොතක අග පිටුවෙහි මම එලෙස කුරුටු ගෑවෙමි. කිසිදු වෙනසක් නොමැතිව තවත් තුන් දිනක් ගතව ගියේය. සිව් වන දිනයේදී මම පමණක් තනියම නිවසට වී සිටියෙමි.

කාමරයට වී පත්තරයක් බලමින් හුන් මට යතුරු පැදියක නලා හඬ ඇසිණි. මම ඊට මොහොතක් කන් දුනිමි. තවත් වරක් නළා හඬ ඇසිණ. මම නිවසේ ඉදිරිපස දො හැර බැලීමි. දෙවියනේ, මගේ දෙනෙත පවා අදහාගත නොහැකි තරම් විය. පැමිණ සිටියේ ෂෙහාන්ය.

''ෂෙහාන් ඔයා..'' මට එක්වරම කියැවිණ.

''බට්ටි ඇඳුමක් දාගෙන එන්න ටක් ගාලා..'' ඔහු කලබලයෙ මෙන් කීය.

''ෂෙහාන් ඇයි..?'' මම කිසිත් වටහාගත නොහැකිව විමසුවෙ



Scanned by CamScanner

''කියන දේ අහල ඉක්මනට එන්නකො ළමයො..'' ෂෙහාන් මදක් සැරෙන් මෙන් කීය. මම තවත් කිසිවක් නොඅසාම ගෙතුළට දිවගොස් ලහි ලහියේ ඇඳුම් ඇඟලාගන්නට වීමි.

ඉදිරි දොර වසා යතුර මල් පෝච්චියෙක් අස්සේ සඟවා ෂෙහාන් අසලට ගියෙමි.

''නගින්න'' ෂෙහාන් හෙල්මටයක් මවෙත පාමින් කීය.

''මං බස් එකේ එන්නං ෂෙහාන්.. මෙතනින් නගින එක හරි නැහැනෙ..'' මම කීවෙමි.

''කමක් නෑ නගින්න..'' ෂෙහාන් අණ කිරීමක් ලෙසින් කීවේය. මම ඔහුට අවනත වූයෙමි.

''කොහෙද මේ යන්නෙ..?'' ගාල්ලට ආසන්න වෙත්ම මම විමසුවෙමි. එහෙත් ෂෙහාන් කතා නොකළේය. ඔහුට සිදුව ඇත්තේ කුමක්දැයි වටහාගත නොහැකිව මම බර වූ සිතින් යුතුව කල්පනා කළෙමි.

ටික වේලාවකට යතුරු පැදිය ෂෙහාන්ලාගේ ගෙවල් පාරට හැරවිණ. එහෙත් මම ඔහුගෙන් කිසිවක් අසන්නට නොගියෙමි. තවත් ටික වේලාවකට පසුව යතුරු පැදිය ෂෙහාන්ලාගේ නිවස ඉදිරියෙහි නතර විණ. එහෙත් නිවසේ දොරවල් වසා තිබිණ.

''ඇයි දොරවල් වහලා..?'' යතුරු පැදියෙන් බසින අතර මම විමසීමි.

''අම්මල ගමනක් ගියා.. මං විතරයි ඉන්නෙ..'' ෂෙහාන් හැඟීමක් නැත්තෙකු සේ තෙපලීය.

''අම්මලත් නැති ගෙදරකට මොන එකකටද මාව එක්ක ආවෙ..?'' මම නොපහන් හඬින් විමසුවෙමි.

''ඇයි වෙනදත් මගේ ළඟට ආවෙ අම්මල ඉඳලද..?'' ෂෙහාන් වෙදාවත් නොමැති අයුරකින් විමසද්දී මගේ සිතට අමුත්තක් දැනිණි.

''එන්න ගෙට..'' ෂෙහාන් සාක්කුවට අත දමා යතුරක් ගෙන





නිවසෙහි ඉදිරිපස දොර විවර කරමින් කීය. එහෙත් මම සිටි තැනින් නොසෙල්වී බලා සිටියෙමි.

''ඒ සැරේ මොකද කරන්නෙ..? ගෙට එන්නෙ නැතුව..?'' ෂෙහාන් ඇසීය.

''ඔයාට මොකද ෂෙහාන් මේ හිටපු ගමන් වෙලා තියෙන්නෙ..?''

''ප්‍රශ්න අහන්නෙ නැතුව ගෙට එන්න..'' ෂෙහාන් මදක් තදින් මෙන් කීය.

''අම්මලත් නැති ඔය පාළු ගෙට මට එන්න බෑ..'' මම කීවෙමි.

''ළමයො කියන දේ අහන්නකො..'' ෂෙහාන් සන්සුන් අයුරින් කීය.

''ඔයාට තේරෙන්නෙ නැද්ද ෂෙහාන් ගෙදර කවුරුවත් නැති වෙලාවක මං එන එක හරි නැහැ කියලා.. ඔයාට මාත්තෙක්ක කතා කරන්න ඕන නම් අපි කොහෙ හරි යමු ෂෙහාන්..'' මම කීවෙමි.

''ගෙදර කවුරුවත් නැති වුණාට කමක් නෑ බට්ටි.. ඔයා වෙනසක් හිතන්න එපා.. මං ඔයාට කියන්න හදන්නෙ ඔයාගෙ අම්ම ගැන තොරතුරක්..'' ෂෙහාන් එසේ කියද්දී මගේ දෙනෙත විස්මයෙන් මහත් විණ.

''අම්ම ගැන.. ඔයා කොහොමද දැන ගත්තෙ..?'' මම ඇසුවෙමි.

''ඒක තමයි ළමයො මම ඔයාට ගෙට එන්න කිව්වෙ.. ඔයා මෙතන පිස්සු නටනවා..'' ෂෙහාන් තරහින් මෙන් කීය.

මම තවත් කිසිවක් නොකියාම ඇරුණු දොරින් ඇතුල් වීමි.

''ඔයා අර ඩයරිස් කොයි හරියකට වෙනකම් කියෙව්වද?'' ම අසුන්ගත් පසු මා අසලින් අසුන් ගනිමින් ෂෙහාන් ඇසීය.

''එක ඩයරියක මුල ටික විතරයි මං කියෙව්වෙ.. ඇයි ඔයා ඉ ගත්තනෙ මං කියවන්න කලින්..'' මම කීවෙමි.

Scanned by CamScanner

''මං ඒ ටික ඔක්කොම කියෙව්වා බට්ටි..'' ඔහු දෑත හිස පිටුපසට තබා පුටු ඇන්දට හේත්තු වී සිවිලිම දෙසම බලා ගෙන කීය.

''ඉතින්..?''

ඔහු මගේ දෙස අමුතු විදියකට බැලීය.

''ඇයි ෂෙහාන්..? ඒවයෙ අම්මගෙ විස්තර තියෙන්න ඇති..'' මම ඔහුගේ උරහිසට වාරු වෙමින් කීවෙමි.

''ඔව්.. හුඟාක් දේවල් ඔයාගෙ අම්ම ඩයරීස් වල සටහන් කරලා තිබුණ බට්ටි..'' මම ඔහු වෙතම දෑස් යොමා ගෙන සිටියෙමි.

''ඔයා හිතන්නෙ ඔයාගෙ අම්මා මොනව වෙලා නැති වුණා කියලද..?'' ෂෙහාන් එකවරම මවෙත නැඹුරු වී ඇසීය.

''අම්ම නැති වෙන කොට මං හුඟක් පුංචියි ෂෙහාන්.. මට යන්තමට මතක තියෙන්නෙ අම්ම බණ්ඩාරවෙල ඇල්ල රෙස්ට් හවුස් එක ඉස්සරහදි කාර් එකක හැප්පිලා නැති වුණා කියලා අප්පච්චි කියපු එක විතරයි.. ඒත් බණ්ඩාරවෙල අය කිව්වලු අප්පච්චිත්තෙක්ක ඉන්න බැරි නිසා අම්මා රාවණා ඇල්ලට පැනල සිය දිවි හානිකර ගත්තා කියලා.. ඔය කතාව මට කිව්වෙ මේරි නැන්දා..'' මම දුක්බර ලෙස කියා සිටියෙමි.

''ඒත් බට්ටි ඒ ඩයරීස් කියවගෙන යද්දි මට තේරුණා අම්මා ඔයාට කොයි තරම් ආදරෙන් ඉඳලද කියලා.. කොහොම හරි අම්මගෙ පණ වගේ තමයි ඔයාට ආදරේ කරල තියෙන්නෙ.. එහෙම ආදරේ කරපු අම්ම, ඔයාව අමතක කරල ජීවිතේ නැති කර ගත්තයි කියලා කියන්නෙ කොහොමද?'' ෂෙහාන් තර්කයක් ලෙස කීය.

''අනේ මන්දා ෂෙහාන්.. අම්ම ගැන මං දන්නෙ තවත් කවුරු හරි කියපු දෙයක් විතරයි.. එහෙම නැතුව අම්ම ගැන අවබෝධයක් ඇති කරගන්න පුළුවන් වයසක මං හිටියෙ නෑ..'' දෙනෙත කඳුළින් පෙගෙද්දී මම කීවෙමි.





''මට හිතෙන විදියට අම්මා නැතිවුණේ රාවණා ඇල්ලට පැනලවත් එහෙම නැතුව කාර් එකක හැප්පිලාවත් නෙමෙයි..'' ෂෙහාන් කියද්දි මම ඔහු දෙස පුදුමයෙන් බලා සිටියෙමි.

''එහෙනං කොහොමද දෙයියනේ අම්ම නැතිවුණේ..?''

''මට හිතෙන විදියට මේක මිනීමැරුමක් බට්ටි..''

''මිනී මැරුමක්..'' මගේ සවන් නැසී ගියාසේ මට දැනිණි. මගේ රත්තරන් අම්මා මරලා.. මට අදහාගත නොහැක. දරාගත නොහැක.

''කියන්න ෂෙහාන් කියන්න කවුද මගෙ රත්තරන් අම්මා මැරුවෙ.. කියන්න ෂෙහාන් කියන්න..'' මම වියරු වැටුණ සේ ඔහුගේ දෙඋරින් අල්ලා සොලවා ගෙන ගියෙමි.

''බට්ටි..'' ඔහු මගේ කර වටා අතක් දමා ඔහු වෙතට ළංකර ගත්තේය.

''එක පාරටම කවුද කියල සැක කරන්න බෑ බට්ටි.. ඒත් ඔයාගෙ අම්මගෙ ඩයරීස් වල තියෙන දේවල් දිහා බැලුවම හොඳට තේරෙනවා මේක මිනීමැරුමක් කියලා..'' ෂෙහාන් කීය.

''මගෙ රත්තරං අම්මව මැරුවෙ කවුද කියලා මට හොයලා දෙන්න ෂෙහාන්.. මට හොයලා දෙන්න ෂෙහාන්..'' මගෙ රත්තරං අම්මට කරපු අපරාදෙට පලිගන්න ඕනැ මට..'' මගේ ස්වරය එන්න එන්නම උච්ඡ වෙමින් තිබිණි.

''අනේ බට්ටි ඔය විදියට කලබල වෙන්න එපා.. ඔයා ඔහොම කලබල වෙයි කියල මට දැනුණ නම් මං මේව ඔයත් එක්ක කියන්නෙ නෑ බට්ටි..'' ෂෙහාන් මා සන්සුන් කරන්නට උත්සාහ ගනිමින් කීය.

''නෑ ෂෙහාන් මං මේව දැන ගන්න ඕනැ.. මගෙ අම්ම නැතුව මං විඳින දුක දන්නෙ මං විතරයි.. මම විඳින දුක ඒ දුකට කවුරු හරි අම්මව නැති කරපු ඒ අපරාධකාරයා වන්දි ගෙවන්න ඕන ෂෙහාන්..'' මම කීවෙමි.



Scanned by CamScanner

"බට්ටි ඔහොම කලබල වෙලා බෑ කෙල්ලෙ.. මේ අපි හුඟක් කල්පනාවෙන් ඉවසිල්ලෙන් වැඩ කරන්න ඕන වෙලාවක්.. අපි හෙමින් සැරේ මේ ගැන තව හොයමු.." ෂෙහාන් දයාබරව මා හට කීය. සැබැවින්ම මෙවන් මොහොතක ඔහු මා අසල රැඳී සිටීම කෙතරම් වාසනාවක්දැයි මට නිබඳවම සිතිණ.

"ෂෙහාන් මේ ප්‍රශ්නෙ විසඳන්න ඔයා මට උදව් කරනව නේද..?" මම ඔහුගේ ළමැදට මුහුණ ඔබාගෙන තෙපළීමි.

"සත්තයි කෙල්ලෙ මං හෙවනැල්ල වගේ ඉන්නවා.. ඒ ගැන වෙනසක් හිතන්න එපා.. ඔයාට මොනව දෙන්න පුළුවන් වුණත් මට ඔයාගෙ අම්මව ආපහු ලබා දෙන්න පුළුවන් කමක් මට නෑ බට්ටි.. ඒ වෙනුවෙන් මං අම්ම ගැන හොයා ගන්න ඔයාට උදව් වෙන්නම්.." ෂෙහාන් එලෙස සපථ කරද්දී මෙතෙක් හිරකොට ගෙන සිටි හැඬුම මා මුවින් ඉකිබිඳුමකට පිටවිය.

ජීවිතයේ යෞවන වසන්තයේ සිට අතීතයේ ඉපල් වූ මලානික මතකය යළි යළිත් මහිතෙහි අවදි වෙමින් තිබිණ. ආදරණීය අම්මාගේ බොඳ රුව මහදෙහි ඇඳෙමින් තිබිණ.

"බට්ටි ඔය තරමට කල්පනා කරන්නෙපා.." ෂෙහාන් මගේ නිකටින් අල්ලා ඔහු දෙසට හරවා ගනිමින් කීය.

"මගෙ හිත එකම අවුල් ජාලයක් ෂෙහාන්.." මම සෙමෙන් කීවෙමි.

"ඔයා හැම දෙයක් ගැනම ඕනවට වැඩිය කල්පනා කරනවා.." ෂෙහාන් කීය.

"කල්පනා කරනවා නෙමෙයි ෂෙහාන් මට කල්පනා වෙනවා.. ජීවිතේ මොන තරම් මායාවක්ද..?"

"ඔහොම බෑ බට්ටි අපි මේ ගැන හොයලා බලමු. පොඩ්ඩක් ඉන්න.. මෙන්න මේ ඩයරි එකේ මේ ටික කියවලා බලන්න.." ෂෙහාන් අම්මාගේ දිනපොත් වලින් එකක් ගෙන මා අතට පෙරළා දී කීවේය.





මම දිනපොත ඔහු අතින් ගෙන උකුළේ තබා ගතිමි. ගැහෙන සිතින් මම එකී අකුරු දිගේ දෙනෙත යැව්වෙමි.

**සිකුරාදා**

විජේ හා සම්බන්ධකමක් පවත්වන මානෙල් නම් ගෑණි හොයාගෙන මම දුවත් එක්ක ගියා. ඒ ගෑණිට හුඟක් සල්ලි තියෙන බව මට තේරුණා. කවදාවත් මේ වගේ ප්‍රශ්නෙකට තවත් ගෑනියෙකුගෙ කකුල් දෙක ගාවට යන්න වෙයි කියලා නම් මම හිතුවෙ නෑ.. ඒත් ඒ දේ මගේ රත්තරන් දූ පැටිය වෙනුවෙන් කරන්න මට අද සිද්ධ වුණා.

විජේ රෑ ගෙදර ආවෙ යක්ෂයෙක් වාගෙ. මානෙල් මුණ ගැහෙන්න ගියා කියලා මාව නොමරා මැරුවා. මේ විදිහට විජේගෙන් ගුටි කන්න මං කරපු වරද මොකක්ද දෙයියනේ..

**සෙනසුරාදා**

ගෙදරින් එළියට එක අඩියක්වත් තියන්න එපා කියලා විජේ ගියා. මං මේ ගෙදර හිරකාරියක් වගේ. වෙලාවකට මට මගේ ජීවිතේ නැති කර ගන්න හිතෙනවා. ඒ තරමටම මට මේ අපා ජීවිතේ එපාවෙලා. ඒත් අපේ වැරදිවලට අහිංසක පොඩි එකී පලි නෑනෙ කියලා මතක් වෙනකොට මගෙ පපුව දැවිල පිච්චිලා යනවා. පොඩි එකී හින්දා මම ජීවත් වෙනවා.

**ඉරිදා**

විජේට මාව පේන්න බෑ. මරන්ට පුළුවන් නම් මාව මරල දාවි. ඒ තරමට දැන් මාව විජේට පේන්ට බෑ. හැමදාම ඇඬූ කඳුළෙන් මේ විදියට දවස ගෙවන්ට පුළුවන්ද? අපේ ප්‍රශ්න හින්දා මේරිත් හුඟක් දුක් විඳිනවා. ඒ අහිංසක ගෑණියි කියලා මොනව කරන්ටද?

මානෙල් කවදාවත් කැමති නැහැ විජේගෙන් ඈත් වෙන්න. ඇයි දෙයියනේ කුරුළු කූඩුවක් වගේ සතුටින් තිබුණ අපේ පවුලට මෙහෙම වුණේ?



Scanned by CamScanner

එතැනින් එහාට කිසිවක් මට නොපෙනිණි. මා නොදැනුවත්වම මගේ දෙනෙත කඳුළින් පෙඟී තිබිණි.

''ෂෙහාන්..'' මම ඔහුගේ උරහිසට වාරුවී ඉකි ගසන්නට වූයෙමි.

''අනේ බට්ටි.. ඔයත් එක්ක බෑ..'' ෂෙහාන් මගේ හිස පිරිමදිමින් කීය.

''මට අම්ම ගැන මතක් වෙන කොට වාවන්නෙ නෑ ෂෙහාන්..'' මම හඬමින් තෙපළීමි.

''ඔයාට මතකද බට්ටි, මේරි නැන්දා මට දෙන්න කියලා ඔයාට දීපු ලියුම.. අර මේරි නැන්දා හොරෙන්ම ගෙදරින් පිට වෙලා ගිය දවසෙ..'' ෂෙහාන් යමක් මතක් කළේය. මම මඳක් කල්පනා කළෙමි. එකී ලිපිය මට සිහිපත් විණ.

''ඔව් ෂෙහාන් ඉතින්..''

''අන්න ඒ ලිපිය කියෙව්ව දවසෙ තමයි ඉස් ඉස්සෙල්ලම ඔයාගෙ අම්මගෙ මරණෙ ගැන මට සැකයක් ආවෙ. ඒක ගැන ඒ වෙලාවෙ මං එච්චර දුරට හිතුවෙ නෑ. ඒත් මේ ඩයරීස් ටික කියෙව්වම මට ඒ ලියුම ගැන ආයෙත් මතක් වුණා..'' ෂෙහාන් එසේ කියද්දී මම කුතුහලයෙන් ඔහු දෙස බලා සිටියෙමි.

''එදා මං ඒ ලියුම තිබුණෙ මොනවද කියලා ඇහුවට ඔයා කිව්වෙ නැනෙ..''

''ඔව් එදා මං නොකිව්වෙ ඔයා ඒ වෙලාවෙ මේ වගේ ප්‍රශ්නෙකට මුහුණ දෙන්න පුළුවන් තත්ත්වෙක නෙමෙයි හිටියෙ.. විභාගෙත් අත ළඟ.. මං ඕව කල්පනා කරලයි නොකිව්වෙ..'' ෂෙහාන් කීවේය.

''ඉතින් මොනවද ඒ ලියුමෙ තිබුණෙ..?'' මම නොඉවසිල්ලෙන් යුතුව විමසුවෙමි.

''ඉන්න මං ඔයාට ඒක දෙන්න..'' ෂෙහාන් නැගිට කාමරය දෙසට ගියේය.





මොහොතකට පසු පැමිණි ඔහු මට මේරි නැන්දා විසින් ෂෙහාන් අමතා ලියා තිබූ එකී ලිපිය මා අතට දුන්නේය. මම එය ඉක්මනට දිග හැරියෙමි.

**'තෙරුවන් සරණයි'**

**ෂෙහාන් මහත්තයාට,**

මහත්තයට පුදුම හිතෙයි මේ ලියමන දුටුවම. ඒත් මහත්තයා සුදු බේබිගෙ හොඳට මං මේ ගෙදරින් පිට වෙලා යන්ට යනවා. සුදු බේබිව තනි කරල දාලා ගියාට මගෙ හිතට සැනසීමක් නෑ. ඒත් සුදු බේබිට තවත් කරදර හිටීවි මේ ගෙදර මං තවත් ඉන්ට ගියොත්.

ඉතිං මහත්තය මං මේ ලියමන ලියන්ට ගත්තෙ සුදු බේබිගෙ ජීවිතේට වැදගත් වෙන රහසක් කියන්ට හිතාගෙන.

මං දන්නව සුදු බේබිට මහත්තයා ආදරෙයි කියලා. මං මහත්තයගෙන් ඉල්ලා හිටින්නෙ දුකක් නොදී සුදු බේබිව ඇස් දෙක වගේ රැක බලා ගන්ට කියලයි.

සුදු බේබි හිතාගෙන ඉන්නෙ එයාගෙ අම්ම කාර් එකක හැප්පිලා නැතිවුණා කියලා. සුදු බේබිල කලින් හිටියෙ බණ්ඩාරවෙල. දෝව ගමේ අය කිව්වෙ මැණිකෙ රාවණා ඇල්ලට පැනලා දිවි නහ ගත්තා කියලා.

ඒත් මහත්තයා, මැණිකෙ දිවි නහ ගත්තෙ නැහැ. කවුරු හරි මැණිකෙව මැරුවා. සුදු බේබිට අතවරයක් වෙයි කියන බයට මං ඔය ගැන කාටවත් කියන්ට ගියේ නෑ. මට ඕනෙ වුණේ සුදු බේබිව කොහොම හරි ලොකු මහත් කරගන්ට විතරයි.

ඒත් මහත්තය මට මැණිකෙ ගැන නිතරම මතක් වෙනවා. මැණිකෙගෙ මරණෙත් එක්ක හුඟාක් දේවල් සිද්ධ වුණා මහත්තයා. ඒව දිගින් දිගට ලියමනේ ලියන්ට බෑ.

මහත්තයා මං ආයෙමත් බණ්ඩාරවෙල යන්ට යනවා. කවද හරි සුදු බේබිව බැඳලා මගේ ඇස් දෙක පියවෙන්ට කලින් සුදු බේබිත් එක්ක මාව එක වතාවක් බලන්ට එන්ට



Scanned by CamScanner

*කියලා මං ඉල්ලා හිටිනවා. සුදු බේබිව හොඳට බලා ගන්න මහත්තයා. සුදු බේබිට දැන් තියෙන්නෙ මහත්තයගෙ රැකවරණෙ විතරයි. ඒක අමතක කරන්ට එපා. මහත්තයටත් සුදු බේබිටත් තුණුරුවන්ගෙම පිහිටයි.*

**මීට මේරි.**

මම ලිපිය එක හුස්මට කියවා ෂෙහාන් දෙස බැලීමි. ඔහු ඇසි පිය නොසලා මා දෙස බලාගත්වනම බලා සිටියේය. මා හට කිසිවක් පවසා ගත නොහී දිව පැටලී ඇතිසේය.

''බට්ටි කම්පා වෙන්නෙපා. අපි තව ටික දවසකින් බණ්ඩාරවෙල යන්න ඕනැ.''

''බණ්ඩාරවෙල..'' මම විස්මයෙන් තෙපලීමි.

''ඔව් අපි මේ මරණෙ විස්තර හොයා ගන්න ඕනැ. මං දිලිප්ටත් කියන්නම් මේ ගමනට ලේස්ති වෙන්න කියලා..'' ෂෙහාන් කියද්දී මම අසා සිටියෙමි.

මගෙ ජීවිතේ කුමක් හෝ පෙරළියක් සිදුවෙතැයි මගේ සිත කියමින් තිබිණ.

''මොනවද ඔයා ඔය තරමට කල්පනා කරන්නෙ?'' ෂෙහාන් මවෙතින් විමසා සිටියේය. සැබැවින්ම ඔහු මා අසල සිටින බව පවා මට අමතකවී තිබිණ.

''මොකද්ද ලොකු දෙයක් ගැන ඔයා මටත් නොකියා හිතනවා'' ෂෙහාන් අඩ සිනාවකින් යුතුව කීය.

''මං කල්පනා කළේ මගේ ජීවිතේ ඉස්සරහට තව මොනව මොනව වේවිද කියලායි..'' මම ඔහුගේ උරහිසට වාරු වී කීවෙමි.

''තව කොච්චර දේවල් වෙන්න තියෙනවද?'' ෂෙහාන් මදෙස මුතු බැල්මක් හෙළමින් කියද්දී මම ඔහු දෙස කුතුහලයෙන් බැලීමි.

''ඇයි ඔයා එහෙම කිව්වෙ..?'' ඔහු පැවසූ දැහි අරුත වටහාගත නොහැකිව මම විමසීමි.





''ජීවිතේ කියන්නෙ හැම මොහොතකම මොනව හරි දෙයක් සිද්ද වෙන මහ මුහුද වාගෙ තැනක්. රළිත්, දිය සුළිත් එක්ක මහ මුහුද පොර බදනව වගේ අපිටත් ජීවිතේ හුගක් ප්‍රශ්න දුක් කරදර එක්ක පොර බදන්න වෙනව බට්ටියෙ..'' ඔහු ලොකු මිනිසෙකු මෙන් කියාගෙන යද්දී මම ඔහුගේ දෑසට එබුණෙමි.

''මොකද එබෙන්නෙ..?'' ෂෙහාන් ඇසීය.

''ඇයි එපාද..?'' මම ඇසීමි.

''මං දැන් එපා කිව්වද..?''

''මං එබිල බැලුවෙ ලස්සන..''

''ආ.. දැක්කද?'' ඔහු ඇසක් වසමින් කීය.

''ඉස්සර වගේ නෙමෙයි දැන් වල් වෙලා..'' මම කීවෙමි.

''හරි මම වල්නෙ..'' ෂෙහාන් එසේ කියා මුහුණ පුම්බා ගත්තේය. ඔහුගේ ස්වරූපයට මට සිනා නැංවිණ.

ඔහු ඉවත බලාගෙනම සිටියේය.

''ෂෙහාන් මේ..'' මම ඔහුගේ මුහුණ මා වෙත හරවා ගතිමි.

''මොකද..?'' ඔහු තරහට මෙන් ඇසීය.

''මම විහිලුවක් කළේ.. ඔයා ඒක ඒතරම් ගණන් ගත්තද?'' මා අසද්දී ඔහු මුවට සිනාවක් ගලා එනු මම දුටුවෙමි.

''ඒක නෙමෙ ඔයා අම්මලා එනකම් ඉන්නවද?''

''අම්මලා ආවොත් මොනවත් හිතයිද ෂෙහාන්..?''

''නෑ ඔයා ඉන්න. හවස් වෙලා යන්න නැත්නම් ඔයා ගියාම මට පාළුයි..'' ෂෙහාන් කුඩා දරුවෙකු සේ කීවේය.

''ඔහොම කියනව නම් මං නවතින්නම්කො..''

''ඒ දවස උදා වෙනතුරු මං බලාගෙන ඉන්නෙ මොන තරම් ආශාවෙන්ද කියලා ඔයා දන්නවද?'' ෂෙහාන් මගේ කොපුල් තලයක්

සිප ගනිමින් ඇසීය. මම කිසිත් නොපවසා ඔහුගේ උණුසුමට තුරුල් වූයෙමි.

ඔහු ළඟ ගෙවෙන හැම තත්පරයක්ම මා හට දයාබර වෙමින් තිබිණ. එකී කාලය අල්ලා බදා වැළඳ ගත හැකි නම්.. මම එලෙසින් සිතුවෙමි.

දහවල ෂෙහාන්ගේ අම්මා පැමිණියාය. මා දුටු විගස ඇගේ මුවේ සිනාවක් ඇඳී ගියේය.

''කොහොමද දුව.. කොයි වෙලාවෙද ආවෙ..?'' ඇය මගෙන් විමසුවේය. මම මඳක් තිගැස්සී ගියෙමි.

''එයා ආවෙ උදේ අම්මෙ..'' ෂෙහාන් මා පිළිතුරක් දෙන්නට ප්‍රමාද වෙන බව දැන කීය.

''ඇත්තද පුතා..? ඔයාට කන්න බොන්න දුන්නද?'' ඇය කාරුණික හඬින් ෂෙහාන්ගෙන් විමසනු මම බලා සිටියෙමි.

''අපෝ ඔව්.. ඒව ඔක්කොම හරි..''

''මං එහෙනම් ඇඳුම් මාරු කරගෙන එන්නම් දුව..'' එසේ කියා ඇය ගෙතුළට ගියාය.

''ෂෙහාන් මට අර ඩයරිස් ටික අද දෙනවද..?'' අම්මා මඳක් එහාට වෙත්ම මම විමසීමි.

''මොකටද..?''

''මට ඉතුරු ටිකත් කියවල බලන්න ඕනැ..'' මම කීවෙමි.

''එපා.. ඔයා ඕව තනියම කියවල දුක් වෙනවා..''

''අනේ ෂෙහාන්.. මොනවද.. දෙන්නකෝ..''

''සැරයක් කිවුවාම අහන්න ළමයෝ..'' ෂෙහාන් මඳක් තදින් මෙන් කියද්දි මම ඔහුට අවනත වීමි.

''අපි ඉස්සර වෙලා බණ්ඩාරවෙල යන ගමන සූදානම් කර ගනිමු





බට්ටි.. කොහොමටත් ඔය ගමනට දවස් තුන හතරක් ගත වේවි. අපිට හොයා ගන්න ලැබෙන කරුණු උඩ සමහර විට දවස් ගණන වැඩි වෙන්නත් ඉඩ තියෙනවා..'' ෂෙහාන් බැරෑරුම් ස්වරයෙන් කීය.

''අන්තිමේදි මොන ප්‍රතිඵලයක් ලැබෙයිද කියලා මට බයත් හිතෙනවා.''

''නූපන් දරුවෙකුට කේන්දර හදන්න එපා.. අපි ඉස්සර වෙලා මේ ගමන ගිහින් බලමු.. කෝකටත් බණ්ඩාරවෙල ගිහින් මේරි නැන්දව හොයා ගන්න ඕනැ.. එයාගෙන් තමයි මේකෙ හුඟක් විස්තර දැන ගන්න ලැබෙන්නෙ..'' ෂෙහාන් පැහැදිලි කළේය.

''ආ.. මෙයත් මෙහෙද..?'' එක්වරම නැගුණ කටහඬකින් ගැස්සුණ මම හැරී බැලීමි.

දිලිප් අයියා සිනාසෙමින් සිටියේය.

''වරෙන්.. වරෙන්.. මෙතන නුපුරුදු තැනක්යැ.. ආයෙ බුලත් දෙනකං බලා ඉන්නෙ..'' ෂෙහාන් කෑ ගැසීය.

''දැන් එහෙනම් බුලත් දෙන තැනටත් වැඩ සිද්ධ වෙලාද?'' දිලිප් අයියා සිනාසෙමින් කීය. ඔහු පැමිණ අප අසලින් වාඩි විය.

''අපි මේ උඹ ගැනත් කතා කර කර හිටියෙ..'' ෂෙහාන්, දිලිප් අයියාගේ දණහිසට පහරක් ගැසුවේය.

''මං ගැන.. වෙන්න බැරි දෙයක්.. උඹල දෙන්නගෙ කතාවලට මාව මතක් වෙනව කියන්නෙ බොරුවක්..'' දිලිප් අයියා දෑස් කුඩා කරමින් කීය.

''යකෝ මූට ඇත්ත කිව්වත් බොරුනෙ..''

''හරි.. හරි.. මල්ලී මොකටද මාව මතක් කළේ කියපං.. තවත් බාල්දියක්ද? නැත්තං වට්ටියක්ද?'' දිලිප් අයියා අසද්දී මගේ සිනහව නවතා ගන්නට නොහැකි විය.

''ඒ දෙකම නෙමෙයි උඹේ ඔලු ගෙඩිය..'' ෂෙහාන් කීය.



Scanned by CamScanner

''මගේ ඔලු ගෙඩිය තමයි උඹලගෙ ප්‍රශ්නවලට විසඳුම් ගෙනාවෙ. ඒක මතක තියා ගනින්..'' දිලිප් අයියාගේ කතාවට මට නැගුණ සිනාව නවතා ගන්නට නොහැකි විය.

''හරි.. හරි.. ඒක මට අමතක නෑ.. උඹේ ඔය රාජකීය මොළෙන් වැඩක් කරන්න තමයි උඹව මතක් කළේ.. නැතුව වෙන එකකට නෙමෙයි..'' ෂෙහාන් සිනාවකින් යුතුව කීය.

''අපොයි මං ඒක නං හොඳට දන්නවා. ඉතින් මොකද්ද මගෙන් ගන්න තියෙන වැඩේ..?'' දිලිප් අයියා විමසීය. මම ෂෙහාන් දෙස බැලීමි. ෂෙහාන් මදෙස බැලීය. අප දෙදෙනා මොහොතකට ගොළු වූයේය.

''ඒ සැරේ මොකද මූණෙන් මූණ බලාගෙන අනිමිස ලෝචන පූජාව පවත්වන්නෙ..?'' දිලිප් අයියා විමසීය. මම යාන්තමට සිනාවක් මුවට නගා ගන්නට වෑයම් කළෙමි.

''විහිලු නෙමෙයි දිලිප්, ලොකු ප්‍රශ්නයක් මතුවෙලා..''

''උඹලට කවදද පොඩි ප්‍රශ්න මතුවුණේ..? පිට්ටු ගිලපු එකා වගේ ඉන්නෙ නැතුව මොකක්ද කියලා කියපන් ෂෙහාන්..'' දිලිප් අයියා නොඉවසුම් ලෙසින් කීය.

''මම උඹට කියල ඇතිනෙ භාෂිණීගෙ ජීවිත කතාව..''

''ඔව්.. ඉතින්..''

''භාෂිණීගෙ අම්මා මැරිල නෑ..'' ෂෙහාන් සෙමෙන් කියනු මට යාන්තමට ඇසිණි.

''නෑ..'' දිලිප් අයියා විස්මයෙන් නැගූ හඬ මට ඇසිණ.

''භාෂිණීගෙ අම්මව මරලා..''

''කවුද මරල තියෙන්නෙ..?''

''ඒක තමයි දැන් හොයාගන්න ඕන..'' එසේ කියූ ෂෙහාල් දිලිප් අයියාට සියල්ල පැහැදිලි කළේය.





''මේක මහා ලොකු අභිරහසක්නෙ ෂෙහාන්..'' සියල්ල අසා සිටි දිලිප් අයියා කීවේය.

''ඔය සිද්ධිය වෙලා අවුරුදු ගණනාවක් ගිහින්.. ඔය ගැන හොයන්න වෙන්නෙ මුල ඉඳලම. සමහර විට ඔය සිද්ධිය ගැන විස්තර හොයන්න මැරිච්ච මිනිස්සුත් කතා කරවන්න වේවි..'' ෂෙහාන් බැරෑරුම් අයුරින් පැවසීය.

''මේක ක්‍රිමිනල් කේස් එකක් නිසා අපි අත ගහනවට වැඩිය නරකද පොලිසියට බාර දෙන එක..?'' දිලිප් අයියා විමසීය.

''පොලිසියට දන්වන්න සාක්කි තියෙන්න ඕනැ.. කෝ සාක්කි..? මැරුණ කෙනෙක් ඩයරිස්වල සැක හිතෙන දේවල් ලියල තිබුණ පලියට, අර මේරි නැන්දා ඔහේ කට කියෙව්ව පලියට පොලිසිය හිතාවිද මේක මිනීමැරුමක් කියලා? ඉස්සර වෙලා මේක මිනී මැරුමක් කියලා ඔප්පු කරන්න මූලික සාධක හොයන්න ඕන.. නැත්තං පොලිසිය ඕක ඔතනම අහක දමයි..'' ෂෙහාන් බැරෑරුම් ස්වරයෙන් විස්තර කළේය.

''ඒක නම් ඇත්ත.. ඒත් අපි මේ ගාල්ලෙ ඉඳගෙන කොහොමද බණ්ඩාරවෙල වුණ දෙයක් ගැන හොයන්නෙ..? අනික ඔය සිද්ධිය අපි දණ ගාන, බඩ ගාන කාලෙ වුණ දෙයක්..'' දිලිප් අයියා දුර්මුඛ ස්වරයෙන් කීය.

''ඉස්සර වෙලා අපි බණ්ඩාරවෙල යන්න ඕනැ. සතියක් විතර නැවතිලාමේ ගැන හොයමු..''

''එහෙනම් උඹ මේ වැඩේ ගැන හුඟක් දුර හිතලා..'' දිලිප් අයියා දෙබැම රැලි ගන්වමින් කීය.

''තාම තියෙන්නෙ සැක සහිත හේතු විතරයි. සැක කටයුතු දෙයක් නෑ. අන්න ඒ දේ තමයි අපි හොයා ගන්න ඕනැ..'' ෂෙහාන් ලොකු මිනිසෙකු මෙන් පවසාලද්දී මට ඔහු ගැන පුදුම සිතිණ.



Scanned by CamScanner

පෙර මා දුටු පාසල් තරුණයා තවදුරටත් ඔහු කෙරෙන් විද්‍යාමාන නොවන වග මම ඔහුගේ කතාවෙන් පසක් කර ගතිමි. ජීවිතය පිළිබඳව බොහෝ අත්දැකීම් ලද්දෙකු ගෙන් මෙන් බොහෝ දෑ ෂෙහාන්ගෙන් මම දැන උගත්තෙමි. වටහා ගත්තෙමි. හඳුනාගත්තෙමි. මම බෙහෙවින් බැති බර සිතින් ෂෙහාන් දෙස බලා හුනිමි.

''කවදද උඹ බණ්ඩාරවෙල යන්න හිතාගෙන ඉන්නෙ..?'' බොහෝ වේලාවක් නිහඬව හුන් දිලිප් අයියා විමසීය.

''පුළුවන් තරම් ඉක්මනට මේ ගමන යන්න ඕනැ.. මේ ගමනට මමයි භාෂිණීයි උඹයි තව කවුරු හරියි යන්න ඕනැ..''

''මම එන්නම් ඕන දේකට. හැබැයි අපි කෝකටත් මේ ගමන ගැන කාටවත් එළි කරන්න නරකයි. මැරුණ කෙනෙක් ගැන පිට ගමකට ගිහින් නන්නාදුනන අපි හොයන්න ගියාම හැමෝම අපි දිහා බලන්න ගන්නවා. සමහර විට භාෂිණී නංගිගෙ තාත්තට වුණත් ආරංචි වෙන්න ඉඩකඩ තියෙනවා. ඒක භාෂිණී නංගිගෙ ජීවිතේට අනතුරක් වෙන්න ඉඩ තියෙනවා..'' දිලිප් අයියා කල්පනාකාරී ලෙසින් කීය.

''ඔව්.. උඹටත් අර මොකාටද වගේ දුර පේනවා..'' ෂෙහාන් සිනාවකින් යුතුව කීවේය.

''එහෙනම් ෂෙහාන් අපි ඔය ගැන පස්සෙ කතා කරල ගමන සූදානම් කර ගමු..'' දිලිප් අයියා කීය.

''කොහෙ යන්නද මේ කතා කරන්නෙ.?'' ෂෙහාන්ගෙ අම්මා එසේ අසමින් අප අසලට පැමිණියාය. ඇගේ මුවෙහි නිරතුරුවම දිදුලන අර සිනා රැල්ල එලෙසම තිබිණි.

''අපි මේ පොඩි ගමනක් යන්න අම්මා..'' ෂෙහාන් කීය.

''ඔයාල මොකද ඉතින්..'' අම්මා සිනාසෙමින් මා අසලින් වාඩි වූවාය.

''දිලිප් පුතා ඔයාලගෙ රිසල්ට් කවද විතර ඒවිද දන්නෙ නැහැ





නේද..?'' අම්මා විමසුවාය.

''කවද ආවම මොකද ආන්ටි අපි හොඳට ලිව්වනෙ..'' දිලිප් අයියා විහිලුවක් කරනායුරින් කීය.

''හොඳට ලිව්වද නැද්ද කියලා ඉතින් රිසල්ට් ආවම බලාගමුකො..'' අම්මා ද සිනාසෙමින් කීවාය.

ඇගේ දයාබරිත සිනහව මගේ හදවතෙහි විදුලියක් සේ ඇඳී යමින් තිබිණ. මවකගේ සෙනෙහස, රැකවරණය, සුරක්ෂිතභාවය ඇගේ ළඟ නොමඳව තිබිණි.

ඊළඟ සති අන්තයේ බණ්ඩාරවෙල යාමට ෂෙහාන් හා දිලිප් අයියා කටයුතු සම්පාදනය කළහ.

ගමනට ෂෙහාන්, දිලිප් අයියා, දිලිප් අයියාගේ අක්කා දිල්හානි අක්කා, ක්‍රිෂාන්තයියා එක්ව සිටියහ. මේ ගමනට මා එක් වන්නට නිවසින් අනුමැතිය ලබා ගනුයේ කෙසේදැයි යන්න සැමට ප්‍රශ්නයක් විය.

''එහෙම නම් වෙන්නෙ භාෂිණී නංගිව තියල යන්න තමා..'' ක්‍රිෂාන්තයියා ඉවත බලාගෙන කීවේය. මම මුහුණ ඇඹුල් කර ගතිමි.

''බොරු බට්ටි මූ මේ කියන්නෙ.. ඔයා යන්නෙ නැතුව කොහොමද මේ ගමනට..?'' ෂෙහාන් මා අස්වසන්නට මෙන් කීවේය.

''ඔයා හරි නරකයි ක්‍රිෂාන්තයියෙ.. කිව්වොත් කියන්නෙ බොරුවක්මයි..'' මම නෝක්කාඩු ලෙසින් කීවෙමි.

''ඔයා අද ද ඕක දැන ගත්තෙ..? මූ කට ඇරියොත් මූදෙ මඩ මතුවෙන බොරු කියන්නෙ කියලා අපි දැනගත්තෙ, මේකා මහින්දෙට ආව දවසෙමයි..'' දිලිප් අයියා අපව හිනා ගස්වමින් කීවේය.

''ඇති, ඇති නවත්ත ගනිල්ලා උඹලගෙ වාචාල කටවල් ටික.. දැන් අපි කල්පනා කරන්න ඕන මෙයාව සතියකට විතර ගෙදරින් එළියට ගන්නෙ කොහොමද කියලා..'' ෂෙහාන් කීය.



Scanned by CamScanner

අපි සියල්ලෝම ඔහුගේ කතාවත් සමගම නිහඬව කල්පනා කරන්නට වූයෙමු.

''මං එළියට බැස්සොත් ඉතින් සදහටම එළියෙ කියල හිතාගෙන බහින්න ඕනැ..'' මම දුක්මුසු බැවින් යුතුව තෙපළෙමි.

''එහෙම වෙන්න දෙන්නෙ නෑ නංගී.. අපි ඉන්නකං අපි කල්පනා කරලා බලමුකො මොකක්ද කරන්න ඕනැ කියලා..'' දිලිප් අයියා කීය. සැබැවින්ම ෂෙහාන් මෙන්ම ඔහුගේ මිතුරන් කැල ද මා හට බෙහෙවින්ම ළෙන්ගතුය.

''මෙතනදි උදව්වක් ගන්න පුලුවන් එකම කෙනා සුභාෂ්'' ෂෙහාන් බොහෝ වේලාවකට කල්පනා කර කීවේය.

''ඒ කොහොමද?'' දිලිප් අයියා ප්‍රශ්න කළේය.

''මං සුභාෂ්ට කියන්නම් අපි නුවරඑළියෙ ට්‍රිප් එකක් යනවා භාෂිණීව එක්ක යන්න පර්මිෂන් අරන් දෙන්න කියලා..''

''ඔව්.. එහෙම කළොත් හොඳයි තමා..'' දිලිප් අයියා එය අනුමත කරමින් කීය.

අවසානයේදී ෂෙහාන් දිලිප් අයියා සමග සුභාෂ් අයියා සොයා ගියේය.

එදින සැඳෑවේ මා නිවසට ආවේ කිසිවක් නොදත්තියක සේය.

රාත්‍රී හතට පමණ යතුරු පැදියක හඬ ඇසිණි. මම වඩාත් උවමනාවෙන් ඊට සවන් පෑවෙමි. එය සුභාෂ් අයියාගේ යතුරු පැදිය විය යුතු යැයි මට සිතිණ. මා සිතුවා නිවැරදිය. කාමරයෙහි හුන් මට සුභාෂ් අයියාගේ කටහඬ ඇසිණි.

''කොහොමද ආන්ටි..?''

''ආ පුතා.. හුඟ කාලෙකට පස්සෙ අපිව මතක් වුණා නේද..?'' මට කුඩම්මාගේ හඬ ඇසිණ.

''අමතක කරල හිටියෙ නෑ ආන්ටි.. මේ දවස්වල හුඟක් වැඩ





වැඩියි.. ඒකයි එන්න බැරිවුණේ..?'' සුභාෂ් අයියා නිදහසට කරුණු කියන්නා සේය. ඔහු එන්නට ඇත්තේ ෂෙහාන්ගේ කීමට බව මට වැටහී ගියේය.

රාත්‍රියේ බාප්පාත්, කුඩම්මාත්, සුභාෂ් අයියාත්, තමාලිත් එක්ව කෑම ගන්නා හඬ ඇසිණ. කෑම කන අතරතුරේ ඔවුන් අතරෙහි මගේ නම ද සඳහන් වෙනු මට යාන්තමට ඇසිණි.

මම නිවස ඉදිරිපසට පැමිණියෙමි. මල් සුවඳක් සුළං රැලක් ඔස්සේ මට දැනිණ. කිසියම් ශාන්ත බවක් මහිතෙහි තැවරිණි.

පාරිසරික සුන්දරත්වය විඳ ගැන්මට එකී සුන්දර බව දැක ගැන්මට හැකි සිතක් තිබීමත් පිංබර යැයි මට බොහෝ විට දැනී තිබිණි. සියලු සෝ සංකා තැවුල් මොහොතකට හෝ අමතක කරන්නට පාරිසරික සුන්දරත්වයට හැකි බව මම දැන සිටියෙමි.

''භාෂිණී නංගී..'' මා අසලින්ම වාගේ සුභාෂ් අයියාගේ කටහඬ ඇසිණ.

''ආ..''

''අන්න ඔයාගෙ වැඩේ ගැන මං කතා කළා..'' සුභාෂ් අයිය කීවේය.

''මොකද කිව්වෙ..?'' මම උනන්දුවෙන් යුතුව විමසුවෙමි.

''හරි ඔයාට යන්න පුළුවන්.. මං කිව්ව ඔයාගෙ ස්කූල් එ නුවරඑළිය ට්‍රිප් එකක් යනවා කියලා..''

''ඉතින්..''

''එයාලා මුකුත් කිව්වෙ නැහැ. ඔයා බය නැතුව යන්න..''

''අනේ ඔයාට හුඟක් ස්තුතියි.. සුභාෂ් අයියා..'' මම ඔහුට

''ආ.. ඒක සුළු දෙයක්..'' ඔහු එසේ කියා ගෙතුළට සැබැවින්ම සුභාෂ් අයියා බෙහෙවින්ම වෙනස් පුද්ගලයෙ පත්ව සිටියේය. ඔහු විසින් මා සමග කරන කතා බහ



Scanned by CamScanner

අපි සියල්ලෝම ඔහුගේ කතාවත් සමගම නිහඬව කල්පනා කරන්නට වූයෙමු.

''මං එළියට බැස්සොත් ඉතින් සදහටම එළියෙ කියල හිතාගෙන බහින්න ඕනැ..'' මම දුක්මුසු බැවින් යුතුව තෙපළෙමි.

''එහෙම වෙන්න දෙන්නෙ නෑ නංගී.. අපි ඉන්නකං අපි කල්පනා කරලා බලමුකො මොකක්ද කරන්න ඕනැ කියලා..'' දිලිප් අයියා කීය. සැබැවින්ම ෂෙහාන් මෙන්ම ඔහුගේ මිතුරන් කැල ද මා හට බෙහෙවින්ම ළෙන්ගතුය.

''මෙතනදි උදව්වක් ගන්න පුලුවන් එකම කෙනා සුභාෂ්'' ෂෙහාන් බොහෝ වේලාවකට කල්පනා කර කීවේය.

''ඒ කොහොමද?'' දිලිප් අයියා ප්‍රශ්න කළේය.

''මං සුභාෂ්ට කියන්නම් අපි නුවරඑළියෙ ට්‍රිප් එකක් යනවා භාෂිණීව එක්ක යන්න පර්මිෂන් අරන් දෙන්න කියලා..''

''ඔව්.. එහෙම කළොත් හොඳයි තමා..'' දිලිප් අයියා එය අනුමත කරමින් කීය.

අවසානයේදී ෂෙහාන් දිලිප් අයියා සමග සුභාෂ් අයියා සොයා ගියේය.

එදින සැඳෑවේ මා නිවසට ආවේ කිසිවක් නොදත්තියක සේය.

රාත්‍රී හතට පමණ යතුරු පැදියක හඬ ඇසිණි. මම වඩාත් උවමනාවෙන් ඊට සවන් පෑවෙමි. එය සුභාෂ් අයියාගේ යතුරු පැදිය විය යුතු යැයි මට සිතිණ. මා සිතුවා නිවැරදිය. කාමරයෙහි හුන් මට සුභාෂ් අයියාගේ කටහඬ ඇසිණි.

''කොහොමද ආන්ටි..?''

''ආ පුතා.. හුඟ කාලෙකට පස්සෙ අපිව මතක් වුණා නේද..?'' මට කුඩම්මාගේ හඬ ඇසිණ.

''අමතක කරල හිටියෙ නෑ ආන්ටි.. මේ දවස්වල හුඟක් වැඩ





වැඩියි.. ඒකයි එන්න බැරිවුණේ..?'' සුභාෂ් අයියා නිදහසට කරුණු කියන්නා සේය. ඔහු එන්නට ඇත්තේ ෂෙහාන්ගේ කීමට බව මට වැටහී ගියේය.

රාත්‍රියේ බාප්පාත්, කුඩම්මාත්, සුභාෂ් අයියාත්, තමාලිත් එක්ව කෑම ගන්නා හඬ ඇසිණ. කෑම කන අතරතුරේ ඔවුන් අතරෙහි මගේ නම ද සඳහන් වෙනු මට යාන්තමට ඇසිණි.

මම නිවස ඉදිරිපසට පැමිණියෙමි. මල් සුවඳක් සුළං රැලක් ඔස්සේ මට දැනිණ. කිසියම් ශාන්ත බවක් මහිතෙහි තැවරිණි.

පාරිසරික සුන්දරත්වය විඳ ගැන්මට එකී සුන්දර බව දැක ගැන්මට හැකි සිතක් තිබීමත් පිංබර යැයි මට බොහෝ විට දැනී තිබිණි. සියලු සෝ සංකා තැවුල් මොහොතකට හෝ අමතක කරන්නට පාරිසරික සුන්දරත්වයට හැකි බව මම දැන සිටියෙමි.

''භාෂිණී නංගී..'' මා අසලින්ම වාගේ සුභාෂ් අයියාගේ කටහඬ ඇසිණ.

''ආ..''

''අන්න ඔයාගෙ වැඩේ ගැන මං කතා කළා..'' සුභාෂ් අයියා කීවේය.

''මොකද කිව්වෙ..?'' මම උනන්දුවෙන් යුතුව විමසුවෙමි.

''හරි ඔයාට යන්න පුළුවන්.. මං කිව්ව ඔයාගෙ ස්කූල් එකෙන් නුවරඑළිය ට්‍රිප් එකක් යනවා කියලා..''

''ඉතින්..''

''එයාලා මුකුත් කිව්වෙ නැහැ. ඔයා බය නැතුව යන්න..''

''අනේ ඔයාට හුඟක් ස්තුතියි.. සුභාෂ් අයියා..'' මම ඔහුට කීවෙමි.

''ආ.. ඒක සුළු දෙයක්..'' ඔහු එසේ කියා ගෙතුළට ගියේය. සැබැවින්ම සුභාෂ් අයියා බෙහෙවින්ම වෙනස් පුද්ගලයෙකු බවට පත්ව සිටියේය. ඔහු විසින් මා සමග කරන කතා බහ බෙහෙවින්



Scanned by CamScanner

සීමා කොට තිබිණි. එක් අතකින් ඒ ගැන මම සතුටු වූයෙමි. කලක් මට ඔහු ආදරය කළේය. එවන් අයෙකුට යළි මා දැකීමද වේදනාවක් වනු ඇත.

බොහෝ වේලාවක් ගෙමිදුලට වී කල්පනා කරමින් හුන් මම මගේ කාමරයට වැදී දොර වසා ගතිමි. යහනට වන් ඇසිල්ලෙහි පවා මගේ සිතට පැමිණියේ ෂෙහාන්ය.

ගාල්ල නගර සභා ක්‍රීඩාංගනයට මෙහායින් තිබූ මිල්ක් බාර් එකේදී ඔහු මට මුලින්ම මුණ ගැසිණ. එතෙක් මෙතෙක් අප දෙදෙනා ආ දුර දෙස බලත්ම මට මා ගැනම පුදුම සිතින. රූමස්සල කඳු ගැටය සේම නිහඬවම වැළපෙමින් මම මෙතෙක් ඔහුගේ සෙනෙහසේ හිමිකාරිය වූයෙමි.

ආදරය, සෙනෙහස තරම්ම වටිනා අන් යමක් මගේ දිවියට නොවූ විරූ තරමය. ලැබිය යුතු බොහෝ දෑ අහිමි වෙමින් තිබියදී ඔහුගේ සෙනෙහස මට ලැබිණ.

රාත්‍රී එකොළහ නාද වෙනු මට ඇසිණ. දවස ගෙවී යමින් තිබිණ. එහෙත් එළඹෙන හෙට දිනය? මම දෙනෙත් පියා ගතිමි.



# 10

**බෙහෙවින්** සීමා සහිත දින ගණනක් තුළදී ෂෙහාන් බණ්ඩාරවෙල ගමන සූදානම් කර තිබිණ.

මමත් ෂෙහාන් හා දිලිප් අයියාත්, ඔහුගේ අක්කා, දිල්හානි අක්කාත්, ක්‍රිෂාන්තයියාත් අළුයම හයට පමණ ගාල්ලෙන් කොළඹ බසයකට නැග ගත්තෙමු.

''ගාල්ලට ආයුබෝවන් ආයෙ අපිට යහතින් එන්න පුළුවන්ද දන්නෙ නැහැනෙ..'' බසය හික්කඩුව පසු කරද්දී ක්‍රිෂාන්තයියා කීය.

''වහ ගනිත් උඹේ වාචාල කට..'' ෂෙහාන් ක්‍රිෂාන්තයියා ගේ උරහිසට අනිමින් කීවේය.

නවයයි කාලට පමණ අපට කොළඹට ළඟා වීමට හැකිවිය.

කොළඹින් තේ පානය කළ අපි දහයට පමණ නුවරඑළි බසයකට නැග ගත්තෙමු. භාග්‍යා පෞද්ගලික බස් රියේ පිටුපස අසුනෙහි පිළිවෙළින් දිල්හානි අක්කාත්, මමත්, ෂෙහානුත්, දිලිප් අයියාත්, ක්‍රිෂාන්තයියාත් වාඩිවීමු.

''බට්ටි ඔයා මීට කලින් නුවරඑළි ගිහින් තියෙනවාද..?'' ෂෙහාන් මා වෙත මඳක් නැමී විමසීය.

''නෑ මේ යනවමයි..'' මම මඳ සිනාවකින් යුතුව කීවෙමි.

''කඩුගන්නාව පහුවුණාම දිගටම තියෙන්නෙ හරිම ලස්සන පරිසරය.. ඔයා හුඟක් ආස වෙයි..'' ඔහු කීය.



Scanned by CamScanner

''උඹල කතා කරන දේවල් අපිටත් කියපල්ලකො.. තනියම කතා කරන්නෙ නැතුව..'' ක්‍රිෂාන්තයියා කීවේය.

''යකෝ කට පියාගෙන යමන්.. තවත් මිනිස්සු බස් එකේ යන්න ඕනෙ..'' දිලිප් අයියා කීය.

බසය කෑගල්ලේ බස් නැවතුම් පොළ ඉදිරිපිට වූ නිව් මිඩ්ලන්ඩ් හෝටලය ඉදිරියෙහි තේ පානය කිරීමට නතර කෙරිණි.

''අපි දෙන්නට බොන්න මොනව හරි බස් එකටම ගේන්න..''

දිල්හානි අක්කාත් සමඟ නතර වෙමින් මම කීවෙමි.

''මේව ගැන හොයන්න ගිහින් ෂෙහාන්ට කරදරයක් වෙයිද කියලා මට මහා බයක් හිතෙනවා අක්කෙ..'' මම සෙමෙන් දිල්හානි අක්කාට කීවෙමි.

''එහෙම දෙයක් වෙන්නෙ නෑ නංගී.. ඔයා බය වෙන්න එපා..'' දිල්හානි අක්කා මා අස්වසමින් කීවාය.

තේ පානයෙන් පසු බසය යළිත් ගමන ඇරඹීය. බසය කඩුගන්නාව, ගම්පොළ, පසුවෙත්ම මසිතට ඇතුල් වූයේ කිව නොහැකි අන්දමේ පහන් බවකි.

''අනේ හරිම ලස්සනයි ෂෙහාන්..'' මම රිය කවුළුවෙන් පිටතට එබෙමින් කීවෙමි.

කඳු වලින් නොකඩවා සුදු මීදුම් සේ ඇද හැලෙන දිය ඇලිත්, පහළින් කුඩාවට පෙනෙන නමුදු අති දර්ශනීය කොත්මලේ ජලාශයත් මගේ නෙත් සිත් වශී කර තිබිණ.

බසය ලබුකැලේ වංගුව ගනිද්දී මට බිය සිතිණ. මම ෂෙහාන්ගේ අතෙහි එල්ලුණෙමි.

''බය ගුල්ලි..'' දිලිප් අයියා මට විහිළු කළේය.

පරිසරයේ චමත්කාරයෙන් වශී වුණ අපට බසය නුවරඑළියට ළඟා වෙනවා නොදැනිණ. නුවරඑළියේදී වේලාව බලන විට සවස හතරට





ළංව තිබිණි.

''දැන්නම් බඩගිනියි මල්ලී..'' ගමනේ කිසිදු විටෙක එවැන්නක් නොකියූ දිල්හානි අක්කා එසේ කියද්දී මට ඇය ගැන දුක සිතිණි.

''ඔක්කොටම ඉස්සර වෙලා මොනව හරි කාලා ඉඳිමු..'' ෂෙහාන් කීය.

අපි නුවරඑළිය පෞද්ගලික බස් නැවතුම ඉදිරිපිට වූ ජයසිංහ ස්වීට් හවුස් එකට ඇතුළු වී රෝල්ස් කා තේ බීවෙමු.

''ඊළඟට..?'' මම පැනයක් ලෙසින් කීවෙමි.

''අපි අදම බණ්ඩාරවෙල යනවද..?'' ක්‍රිෂාන්තයියා විමසීය.

''ඔයාලා ඔය බණ්ඩාරවෙල යන්නද..?'' අපේ කතාව අසා සිටි අයෙකු විමසීය.

''ඔව් මෙහෙන් කෙළින්ම බණ්ඩාරවෙලට යන්න බස් තියෙනවද?'' දිලිප් අයියා ඇසීය.

''ඔයාලට යන්න වෙන්නෙ වැලිමඩට ගිහින්. එතනින් බණ්ඩාරවෙල යන්න..'' ඔහු කීය.

''දැන් මොකද කරන්නෙ..?'' ෂෙහාන් අප සියල්ලන් ගේම මුහුණු පිළිවෙළ බලමින් ඇසීය.

''අපි අද මෙහෙ කොහෙ හරි නැවතිලා හෙට උදේම යමු..'' දිලිප් අයියා කාරුණිකව කීය.

''මටත් හිතෙනව ෂෙහාන් එහෙම කළොත් හොඳයි කියලා. අපිට නම් ඔහෙ කමක් නෑ.. ඒත් මේ කෙල්ලො දෙන්නෙක් අරන් අපිට පුළුවන්ද නන්නාඳුනන පළාතක ඇවිදින්න..'' ක්‍රිෂාන්තයියා කියනු මට ඇසිණි.

අපි රාත්‍රිය ගත කෙරුමට නවාතැනක් සොයා ගතිමු. රාත්‍රී කෑම නුවරඑළියේ මිලානෝ රෙස්ටොරන්ට් එකෙන් ගත්තෙමු.



Scanned by CamScanner

පසුදා උදෑසනින්ම අවදි වූ අපි නුවරඑළියේ සිට වැලිමඩට ගියෙමු. වැලිමඩින් බණ්ඩාරවෙල බසයක නැගුණ අපි පෙරවරු නවය වෙන්නටත් පෙර බණ්ඩාරවෙලට ළඟා වූයෙමු.

බණ්ඩාරවෙල අප්සරා හෝටලයේ උඩුමහලට නැගුණු අපි ලහි ලහියේ උදෑසන ආහාරය ගතිමු.

''ඉස්සර වෙලා අපි දෝවට ගිහින් මේරි නැන්දව හමුවෙමු..'' ෂෙහාන් කෑම කන අතරවාරයේ කීය.

බදුල්ල බසයකට නැග ගත් අපි දෝව රජමහා විහාර ස්ථානය අසලින් බැස ගතිමු.

''මට දැන් යන්තමට වගේ මතකයි..'' දෝව රාජමහා විහාරස්ථානය දුටු මතින්ම මම කීවෙමි.

''මොනවද ඔයාට මතක් වෙන්නෙ..?'' ෂෙහාන් විමසීය.

''මෙතනින් එහායින් තියෙන වංගුවට එහායින් තියෙන්නෙ අපි හිටිය ගෙදර.. අපේ ගෙදරින් දානෙ දුන්නෙ දෝව පන්සලට.. දෝව පන්සල ගැන හුඟක් ලොකු ඉතිහාසයක් තිබුණා කියලා මට මේරි නැන්දා කියලා දීලා තියෙනවා.. වලගම්බා රජතුමාගේ කාලෙ හදපු පන්සලක්. අඩි 36 ක් උස ගල් බුදු පිළිමයක් හදලා තිබුණා. ගල්ලෙන ඇතුළේ නුවර යුගයේ චිත්‍ර තිබුණා. පන්සලට පහළින් තිබුණෙ ඇළක්. ඒක බදුලු ඔයේ ආරම්භය කියලා මේරි නැන්දා කියනවා මට මතකයි..'' මම අතීත දෑහැනකට සම වැදී සිටියෙමි.

''අපි ඉස්සර වෙලා පන්සලට ගිහින් බලමු ඔයා කියපු දේවල් ඇත්තද කියලා..'' ෂෙහාන් කීය. අපි පාරෙන් පහළට බැස ධර්ම ශාලාවට ඇතුළු වූයෙමු. ධර්ම ශාලාව පහළින් වූ පියගැට පෙළ බැස අපි ගල්ලෙනට ඇතු-ල් වූයෙමු. එහි තවත් අළුතින් බුදු පිළිම කිහිපයක් සාදාගෙන යමින් තිබිණ.

''මේකත් හරියට කිරි වෙහෙර වගේ වහල ගල්වලින්ම හැදිලා..''





ක්‍රිෂාන්තයියා විස්මයානුකූලව කීය.

''කෝ එතකොට හාෂිණී නංගී කියපු අඩි තිස් හයේ බුදු පිළිමේ..?'' දිලිප් අයියා විමසීය.

''ඒක එළියේ වෙන්නැති..'' ෂෙහාන් කීය.

එකී බුදු පිළිමය ගල්ලෙනට උඩින් පිහිටා තිබිණ. ගල් පර්වතයක බුදු පිළිමය කොටා තිබිණි.

''හරි පුදුමයි..'' දිල්හානි අක්කා කීවාය.

''දැන් ඔවා බැලුවා ඇති.. පන්සලේ හාමුදුරුවන්ගෙන් අහමු මේරි නැන්දා ගැන..'' ෂෙහාන් කීය. අපි ආපසු යනවිට පන්සල පහළින් ගලන ඇළ මාර්ගය නෙතට හසුවිය. ආවාස ගෙය අසලදී අපට ලොකු හාමුදුරුවන් මුණ ගැසිණි.

''මේරි ඉන්නෙ අන්න අර පල්ලමේ තියෙන ගෙදරක..'' ලොකු හාමුදුරුවෝ පැවසූහ. අපි උන් වහන්සේගෙන් සමුගෙන පල්ලම බසින්නට වූයෙමු.

''බලාගෙන ඔයාලා දෙන්නා බහින්නෙ..'' දිලිප් අයියා දිල්හානි අක්කාටත් මටත් කීය.

''මව් මහින්දෙ කන්ද උදේ හවස නැගපු අපිට නම් මේවා සිම්පල්..'' ක්‍රිෂාන්තයියා ගලකින් ගලකට මාරු වෙමින් කීය.

''ගල් උඩ දඟලල මොකක් හරි කර ගනින්..'' ෂෙහාන් ඒ දැක පැවසීය.

පල්ලමේ අඩක් පමණ බසිද්දී අප හට කටු මැටි ගැසූ ගෙපැළක් දකින්නට හැකි විය. අපි එකී නිවසට ළඟා වෙද්දී මැදි වියෙහි පමණ හුන් කාන්තාවක් අප දෙස කුතුහලින් යුතුව බැලුවාය.

''මේරි නැන්දලගෙ ගෙවල් තියෙන්නෙ කොහෙද..?'' ෂෙහාන් ඇය අසළට ළංව විමසුවේය. ඇය අත පා මෙතෙක් අපට නොපෙනුණ ගෙයක වහලක් පෙන්නුවාය.



Scanned by CamScanner

අපි ඇයට ස්තූති කොට වහල පෙනුණ ඉසව්වට පිය එසවීමු. තවත් දුරක් ගිය තැන අපට නිවසේ මිදුල සහමුලින්ම පෙනිණි.

මිදුලෙහි එක් පසෙක ගෝවාත්, ලීක්ස්ත් වවා තිබිණ. අනෙක් පස අර්තාපල් හා කැරට් වවා තිබිණ.

''ගෙදර කවුද.?'' දිලිප් අයියා උස් හඬින් උගුර පාදා විමසුවේය. ඇඳුමට උඩින් ජර්සියක් දමා ගත් කාන්තාවක් එළියට එනු අපට යාන්තමට දැක ගත හැකි විය.

''දෙයියෝ මං මේ කව්ද කියලා බැලුව.. සුදු බේබිලනෙ.. එන්ට එන්ට ගේ ඇතුළටම.. එන්ට..'' මේරි නැන්දා අපව ගෙතුළට කැඳෙව්වාය.

''සුදු බේබි මයෙ රත්තරනේ.. මොකවත් කරදරයක් එහෙම උනාද ලොකු මහත්තයගෙන් කාරිය..?'' ඇය දැඩි සෙනෙහසකින් යුතුව මගේ හිස පිරිමදිමින් විමසුවාය. මම දිගු කලකට පසුව එකී සෙනෙහස් සුවඳට තුරුළු වීමි.

''ඉන්ට මං බොන්ට මොකවත් හදාගෙන එනකං..'' එසේ කියූ මේරි නැන්දා ගෙතුළට ගියාය.

''මේරි නැන්දගෙ පුදුම ආදරයක්නෙ භාෂිණී නංගිට තියෙන්නෙ..'' දිල්හානි අක්කා ඇය ගෙතුළට ගිය විගස කීවාය.

''මං හැදුනෙම මේරි නැන්දගෙ අතේනෙ.. මං වෙනුවෙන් ජීවිතේ උනත් දෙයි..'' මම දෙනෙත කඳුළින් තෙමා ගනිමින් කීවෙමි.

''මං මහත්තයලට කෝපි හැදුවා..'' මේරි නැන්දා බන්දේසියක තබාගෙන ආ කෝපි අපට පිළිගැන්නුවාය.

''නැන්දෙ අපිට තියෙන වෙලාව හරිම ටිකයි. ඒක නිසා අපි ආව කාරණේ මුලින්ම කියන්නම්.. භාෂිණීගෙ අම්මා මැරෙන්න කිට්ටුව ලියපු දිනපොත් වගයක් අපට ලැබුණා.. මරණෙ ගැන හුඟක් සැක කරන්න පුළුවන් හේතු හුඟක් තියෙනවා ඒවයෙ. මතකනෙ මේරි





නැන්දා මට ලියල තිබුණ ලියුම. අපි ආවෙ ඒ මරණෙ ගැන අග මුල හොයන්න..'' දැඩි නිහැඬියාවක් මධ්‍යයේ ෂෙහාන් පැවසීය.

''මහත්තය මං දැනගෙන හිටිය කවද හරි දවසක සුදු බේබිත් එක්ක මේ ගමන එනව කියලා.. මහත්තයලට කෙරෙන්න ඕන මොනවද කියලා මට කියන්ට. මට පුළුවන් හැටියට මං කර දෙන්නං..'' මේරි නැන්දා දැඩි හැඟීමකින් යුතුව පැවසුවාය.

''භාෂිණීගේ අම්මා ඇක්සිඩන්ට් එකක් වෙලා නෙමෙයි කවුරු හරි මැරුවයි කියලා ඔප්පු කරන්න වෙනවා..'' ෂෙහාන් කීය.

''ඔව් මහත්තය.. ලොකු මැණිකෙගෙ පණත් හරි සුදු බේබිත් හරි.. සුදු බේබිව තනි කරල මැණිකෙ ඔය වගේ දෙයක් කවදාවත් කරගන්නෙ නැහැ.. මැණිකෙ මැරුණ නෙමෙයි මැරුවා..'' මේරි නැන්දාගේ ස්වරය වේගවත් විය.

''නැන්දෙ අම්මගෙ සොහොන තියෙන්නෙ කොහෙද?'' මම එක්වරම උපන් ආශාවකින් ඇසීමි.

''සුදු බේබිගෙ නමට තියෙන ඉඩමෙ..''

''කොහෙද ඒ..?'' මම විමසීමි. බෙහෙවින් කුඩා අවදියෙහිදී බණ්ඩාරවෙලින් පිට වුණ මා හට අප විසූ ඉඩකඩම් ගැන කිසිදු වැටහීමක් නොතිබිණි.

''දෝව පන්සල ගාව ඉහළ වැල්ලවාය පාරෙ ටික දුරක් යන්ට ඕනැ..''

''අපි එතෙන්ට යමුද?'' ෂෙහාන් ඇසීය.

''ඉන්ට මහත්තය.. මං ඇඳුමක් දාගෙන ටක් ගාලා එන්නං..'' එසේ කියූ ඇය වහ වහා ගෙතුළට ගියාය.

ටික වේලාවකට පසු වෙනත් ඇඳුමකින් සැරසුණ ඇ අප සමග ආවාය.

''නැන්ද විතරද මේ ගෙදර ඉන්නෙ..?'' මම අතරමග දී විමසුවෙ



Scanned by CamScanner

''දැන් ඉන්නෙ මං විතරයි.. දුවල තුන් දෙනාම බැඳලා.. ඉඳල හිටලා එනවා ඒ අය මාව බලන්ට..'' ඇය සෙමෙන් කීවාය. මම ඇය දෙස වඩාත් උවමනාවෙන් බැලීමි. ඇය කෙරෙන් ඊටත් වඩා වයස්ගත බවක් පෙනිණි.

දෝව පන්සල අසලින් අපි යළිත් බදුල්ල බසයකට නැග ගතිමු. මේරි නැන්දාගේ මඟ පෙන්වීම යටත් අපි ක්වීන් හෝටලය අසලදී බසයෙන් බැස ගතිමු.

''ඔතනින් ටිකක් එහාට යන්න ඕනැ..'' මේරි නැන්දා කීවාය. අපි සියළු දෙනාම කුතුහලය මුසු හැඟීමෙන් ඇය පසු පස ඇදුණෙමු.

''සුදු බේබිලගෙ ගෙදරින් මෙහාට ආවට පස්සෙ මං කීප විඩයක්ම ගියා මැණිකෙගෙ සොහොන බලන්ට. මුල් දවසෙ මං එතන සුද්ද කරලා දැම්මා.. දැන් නම් හොඳයි..'' ඇය කීවාය.

පාළුවට ගිය ඉඩමක් මැද්දැවෙන් ඇය අපිව කැඳවා ගෙන ගියාය.

''මේක තමයි සුදු බේබිගෙ නමට තියෙන ඉඩම.. පාර අයිනෙ ඉඩමක් නිසා පහුගිය දවස්වල කීප දෙනෙක්ම ඉඩම ගැන විපරම් කරන්ට ගත්තා මහත්තයා..'' මේරි නැන්දා ෂෙහාන් දෙස බලා කීවාය.

එහෙත් ඉඩමට පා තැබුව ද මේ මගේය යන හැඟෑම සිතට ඇතුළු නොවිණ. මට අවැසිව තිබුණේ අම්මාගේ සොහොන බැලීම මිස වෙනකක් නොවේ.

''එන්ට අතනින් පහළට බැස්සාම හරි..'' මේරි නැන්දා ගල් පඩියක් පෙන්වා කීවාය.

''අර තියෙන්නෙ..?''

මම එක පිම්මේ එතැනට දිව ගියෙමි. කිරි ගරුඬ සොහොන් කොතක් බඳවන්නට තරම් මගේ රත්තරන් අම්මාට ආදරය කළ කිසිවෙකු මේ මිහි මත නොවූ වග මම දැන සිටියෙමි. පොළොව් අනෙක් තැන්වලට වඩා මඳක් උස් පස් ගොඩක් තිබිණි. එහි එක්





පසෙක පුංචි සයිප්‍රස් ගසක් සිටවා තිබිණ.

මම එතැන දණ ගසා ගතිමි.

''ඔය සයිප්‍රස් පැළේ ඉන්දුවෙ මමයි බේබි.. ඒ පැත්තට තමයි මැණිකෙගෙ හිස තියෙන්නෙ..'' මේරි නැන්දා කියද්දී මගේ හිත අති වේදනාකාරී බවකින් දැවී තැවී යන්නට විය.

මගේ රත්තරන් අම්මා, මා තනිකර දමා මේ පස් ගොඩ යට සදාකාලිකවම නිදන්නේ යැයි මා කෙසේ නම් සිතන්නද? මගේ දෙනෙතින් උණු කඳුළු රූරා වැටෙයි. මම හිස නමා එකී සීතල පස් ගොඩ මත නළල තැබීමි.

මොහොතකට පසු මගේ දෙඋරින් කිසිවෙකු ඔසවනු මට දැනිණි. ඒ ෂෙහාන්ය. මම ඔහුගේ උරහිසෙහි හිස සඟවා ගෙන ඉකිබිඳින්නට වූයෙමි.

''දැන් අඬල වැඩක් නෑ සුදු බේබි.. මේ අපරාදෙ කරපු එකාව හොයන්ට බලමු..'' මේරි නැන්දාගේ හැඬුම් බර ස්වරය මට ඇසිණි.

ටික වේලාවක් හුන් ඉරියව්වෙන්ම පසුවන මම ෂෙහාන් ගෙන් මිදී ලන්දට වන්නට පිපී තිබුණ කහ පැහැති වල් සූරියකාන්ත මල් කිහිපයක් කඩා මගේ රත්තරන් අම්මා නිදන ඉසව්වේ තැබීමි.

''අපි යමු..'' ෂෙහාන් සෙමෙන් කීවේය. මම මේරි නැන්දා දෙස බැලීමි. ඇගේ දෙනෙතෙහි කඳුළු පිරී තිබිණි.

දිල්හානි අක්කා මගේ ඉණ වටා අතක් යවා මා ඉදිරියට කැඳවාගෙන ගියාය. අනෙක් සියල්ලන් අප දෙදෙනා පසුපසින් පැමිණෙන බව මට දැනිණි.

''හාෂිණීගේ අම්මා නැති වුණේ 1978 අවුරුද්දේ සැප්තැම්බර් නම වෙනිදා නේද..?'' ෂෙහාන් මේරි නැන්දාගෙන් විමසුවේය.

''ඔව් මහත්තයා.. ඒ දවස මට අද වගේ මතකයි..''

''මේරි නැන්දට ඒ දවස ගැන අපිට ටිකක් කියන්න පුළුවන්ද

ෂෙහාන් වඩාත් වුවමනාවෙන් විමසුවේය.

''ඔවා මෙහෙම ඇවිදින ගමන් කතා කරන්න පුළුවන්ද? කොහේ හරි තැනකට වෙලා කතා කරමු..'' දිලිප් අයියා කීය.

''ඒකත් ඇත්ත තමා මහත්තයා, යමු අපේ ගෙදරට.. ගෙහුං කතා කරමු..'' මේරි නැන්දා කීවාය.

අපි යළිත් මේරි නැන්දා ගේ නිවසට පැමිණියෙමු. අපි සුව පහසු ලෙස වාඩි වී මේරි නැන්දාගේ කතාවට සවන් දෙමු.

''මං මුල ඉඳලම කතාව කියන්නං එතකොට මහත්තයලට හුඟක් දේවල් තේරුම් අර ගන්ට පුලුවන් වේවි..''

මහත්තයට මැණිකෙව බන්දන්ට හදනකොට මහත්තය කැමති වෙලා නෑ.. මැණිකෙගෙ අඩුපාඩුවක් එහෙම හින්ද නෙමෙයි.. සුදූ බේබි වගේ මැණිකෙත් ඉටි රූපයක් වගෙයි.. මහත්තයට වෙන සම්බන්ධයක් තිබිල තියෙනවා.. ඒත් මහත්තයගෙ දෙමව්පියන්ගෙ බලේට කොහොමින් කොහොම හරි මැණිකෙව බඳින්ට සිද්ධ වුණා..

ඒ කාලෙදි තමයි මං අර වැඩට ආවෙ.. මුලදි දෙන්නා හොඳ ආදරෙන් හිටියා. ඒත් සුදූ බේබි ඉපදිලා ටික කාලයක් යනකොට දෙන්නා දෙමාල්ලො බහින් බස් වුණා. මහත්තයා රෑ දෙගොඩ හරියෙ එන්ට ගත්තා. සමහර දාට හොඳට බීලා. කලින් තිබුණ සම්බන්ධකම මැණිකෙට ආරංචි වෙලා..

ඒක දැන ගත්ත දා ඉඳල මැණිකෙ නොසෑහෙන්ට හිතෙන් දුක් වින්ද කියලා මං දැනගෙන හිටියා මහත්තයා.. හරියකට කෑවෙ බීවෙ නෑ. සුදූ බේබිව තුරුල් කරගෙන ඉඹ ඉඹ පැය ගණන් හූල්ල හූල්ල මැණිකෙ හිටියෙ.

එක දවසක් රෑ අපිට හොඳට නින්ද ගිහින් තිබුණා. මොකද්ද මහා සද්දෙකින් මම එක පාරටම ඇහැරුණා. සද්දෙ ආවෙ මැණිකෙගෙයි මහත්තයාගෙයි කාමරේ පැත්තෙන්. මං එක පාරටම ඒ පැත්තට





දුවගෙන ගියා. මහත්තයා මැණිකෙට නොසෑහෙන්න තලනව මං දැක්කා. මං කෑගහගෙන මහත්තයාගෙ ඇඟේ එල්ලුණා. මහත්තයා මාව තල්ලු කරලා දාලා යන්ට ගියා.

ඊට සතියකට විතර පස්සෙ ඇල්ල පැත්තෙ ගෑණු ළමෙක් වැඩට ගෙනාවා. ඒ කෙල්ල ඇවිත් සති එක හමාරකට විතර පස්සෙ දවසක් මහත්තයා ලොකු මැණිකෙට හොඳටම ගැහුවා.. එදා රෑම මහත්තයා කොහෙද ගියා.. හැබැයි කාර් එක තියල ගියේ..''

උදේ අවදි වෙලා බලන කොට කාර් එකත් නෑ.. මැණිකෙත් නෑ.. දවල් ගෙදරට ටෙලිෆෝන් කෝල් එකක් ආවා ඇල්ල තානායම ළඟ කාර් එක හැප්පිලා කියලා. මං ගෙහුං බැලුවා. ඒත් කාර් එකේ කවුරුවත් ඉඳල නෑ. හවස ආරංචි වුණා ලොකු මැණිකෙ රාවණා ඇල්ලෙන් පැනලා කියලා. මම එතෙන්ට යනකොට මැණිකෙව ඉස්පිරිතාලෙට අරන් ගිහින්. ගෙනියන කොටත් මැණිකෙ මැරිලා..

ඒත් මැණිකෙ ඇල්ලෙන් පැනල කියල විශ්වාස කරන්ට බැහැ. මැණිකෙ කාර් එළවන්ට දන්නෙ නෑ. අනික කාර් එක හැප්පුණා නම් මැණිකෙ කොහොමද ඇල්ල ළඟට යන්නෙ? ඔතන මහ පටලැවිලි ගොඩක් තියෙනවා කියලා මට තේරුම් ගියා. ඒත් අසරණ මං ඔය වෙලාවෙ මොනව කරන්නද? පහුවෙනිදා දවල් තමා මිනිය ගෙදරට ගෙනාවෙ..'' මේරි නැන්දා කඳුළු පිස දමමින් කීවාය. මගේ නෙතින් ද කඳුළු ගලමින් තිබූ බව මට දැනිණ.

''එතකොට අර වැඩකාර ළමයා..?'' ෂෙහාන් අතුරු ප්‍රශ්නයක් නැගුවේය.

''එව් ළමයා එදා රෑම ගෙදරින් යන්ට ඇති කියලයි මං හිතන්නෙ.. ඒ වෙලාවෙ තිබුණ තත්ත්වෙ උඩ අපිට ඒ ගෑණු ළමය ගැන නිච්චියක් නැතිව ගියා..'' මේරි නැන්දා දිගු සුසුමක් හෙළමින් කීවාය.

''ඒ ළමයගෙ ගෙවල් දන්නවද?'' දිලිප් අයියා මෙතෙක් නිහඬවම සිට එක්වරම විමසුවේය.



Scanned by CamScanner

''ඔය රාවණා ඇල්ලට පොඩ්ඩක් එහා දෙමෝදර පාරෙම පහළින් කියලා තමයි ඒ ළමයා මට කිව්වෙ..''

''නම දන්නවද?'' ෂෙහාන් විමසීය.

''නම.. නම.. නං මට මතක නෑ මහත්තය. දෙමළ ළමයෙක්. ඒ කාලෙ අවුරුදු දහසයක් විතර ඇති. තාත්තගෙ නම සින්නයියාද කවුද කිව්වා..''

''අපි දැන්ම යන්න ඕනැ ඒ ළමය හොයාගෙන..'' මේරි නැන්දාගේ කතාව නිම වෙන්නටත් පෙර හුන් තැනින් නැගිටිමින් ෂෙහාන් කීවේය.

''මේරි නැන්දත් එන්න අපිත් එක්ක.. මේරි නැන්දනෙ ඒ ළමයව අඳුරන්නෙ..'' ක්‍රිෂාන්තයියා කීය.

''මං එනව මහත්තය. කියන ඕනම තැනකට මං එනවා..'' මේරි නැන්දා කීවාය. ඇගේ ස්වරය දැඩි විය.

අපි යළිත් පාරට පැමිණ බසයක නැග රාවණා ඇල්ල අසලින් බැස ගතිමු.

''ආනේ.. ලස්සන අර බලන්න ෂෙහාන්.. රාවණා ඇල්ලෙ ලස්සන..'' කඳු මුදුනේ සිට කඩාගෙන හැලෙන රාවණා ඇල්ලේ චමත්කාරයෙන් වශීකෘතව ගිය මම තෙපලීමි. එහෙත් ඒ සමග මගේ රත්තරන් අම්මා බිලි ගත් දිය ඇල්ල මෙය බව සිහිවත්ම මගේ මුහුණින් සිනහව පහව ගියේය. මම අඳුරු දෑසින් පාලම මතට වී දිය ඇල්ල දෙස බලා සිටියෙමි.

''ඔයා ඇයි එකපාරටම වෙනස් වුණේ..?'' දිල්හානි අක්කා මගේ වෙනස වටහා ගත්තාක් මෙන් විමසුවාය.

''දිය ඇල්ල ලස්සන වුණාට මගේ අම්මව මට නැති කළානෙ..'' මම සෙමෙන් කොඳුළෙමි.

අපි පාලමට එහා පැත්තෙන් ගොස් දිය ඇල්ලෙන් වතුර ගලා





හැලෙන ස්ථානයට ළංවීමු. එක්වරම එහි පසෙක ඉදිකර තිබූ සිමෙන්ති පුවරුවක මගේ නෙත් නතර විය.

මෙම ආවාටය බියකරුය. නෑමට නුසුදුසුය.

1982 අප්‍රේල් මස 16 වැනි දින මෙහිදී මියගිය රන්ජිත් සෙනෙවිරත්න සිහිවීම පිණිස මහනුවර එස්.ආර්. සේනානායක සහ සමාගම විසින් පිහිටුවන ලදී.

1986.04.16

පුවරුවේ සඳහන් දෑ කියවීමෙන් පසු මහිතට වඩාත් දුක දැනිණ. මම සුසුමක් හෙළීමි.

''මෙතෙන්ට වෙලා ඉඳලා වැඩක් නෑ.. අපි අර දෙමළ ළමයව හොයා ගන්න ඕනැ..'' ෂෙහාන් යළිත් පාරට එමින් කීය.

''ඔව් ඒක ඇත්ත.. මේ වෙලාවේ හැටියට අපිට කාලෙ හරිම වැදගත්..'' දිලිප් අයියා ද ෂෙහාන් අනුමත කරමින් කීය.

අපි නිහඬවම දෙමෝදර පාරේ ඉදිරියට ගියෙමු.

''අපි කාගෙන් හරි අහල බලමුද?'' ක්‍රිෂාන්තයියා සියල්ලන්ගේ මුහුණු බලමින් ඇසීය.

''ඔව්.. නැත්තං කොහෙ කියල හොයන්නද?'' දිල්හානි අක්කා කීවාය.

''නැන්දෙ ඒ දෙමළ මනුස්සයගෙ නම මොකක්ද?'' ෂෙහාන් විමසීය.

''සින්නයියා.. ලැයින් කාමරයක හිටිය කියලා තමා කිව්වෙ..''

''අර එහා පැත්තෙ පේන්නෙ ලැයින් කාමර පේළියක් නේද..?'' ක්‍රිෂාන්තයියා එක්වරම අත දිගු කර කීය.

අපි වහ වහා එදෙසට ඇදුණෙමු.

''මේ හරියෙ සින්නයියා කියල කවුරු හරි ඉන්නවද?'' ෂෙහාන් ලැයින් කාමර පේළිය අසල හුන් ගැහැනියකගෙන් විමසුවේය.



Scanned by CamScanner

''මං නං දන්නෙ නෑ මාත්තියා.. අපේ මනුස්සයගෙන් තමා අහල බලන්න ඕනැ..'' ගැහැණිය මඳක් එහාට වෙන්නට සිටි මිනිසෙකු පෙන්වා කීවාය. අපි ඔහු අසලට ගියෙමු.

''මේ හරියෙ ඉන්නවද සින්නයියා කියලා කෙනෙක්..?''

'ආ.. මහත්තයල දන්නෙ නැතුවැ වෙන්ටැ.. සින්නයියා මැරිලා දැන් අවුරුදු තුනක් විතර වෙන්ටත් ඇවිල්ලා..'' ඔහු පැවසූ දෙයින් අපි අන්ද මන්ද වීමු.

''දැන් මොකද කරන්නේ..?'' බලාපොරොත්තු බිඳුණ ස්වරයෙන් මම විමසීමි.

''එයාගෙ දුවක් හිටිය නේද..? කෝ එයා..?'' ෂෙහාන් විමසීය.

''එක දුවෙක් නෙමෙයි මාත්තිය දුවලම හය දෙනෙක් ඉන්නවා.. එක්කෙනෙක් තාම සින්නයියා හිටිය ලැයින් කාමරේම පදිංචි වෙලා ඉන්නවා..''

''කෝ කොයි එකද..?'' අපි නොඉවසිල්ලෙන් විමසීමු. මිනිසා අපට අත පා ලැයින් කාමරයක් පෙන්වීය. අපි ඉක්මනට එදෙසට පිය නැගුවෙමු.

අපි එහි යන විටම ගෙතුළින් මඳක් කෘෂ සිරුරක් ඇති ගැහැණියක් එබුණාය.

''සින්නයියාගෙ දුවෙක්ද?'' මම ඇයට ළංව විමසීමි.

''ඔව්..'' ගැහැණිය බුලත් කහටින් වැසුන දත් දෙපෙළ පෙන්වා කීය.

''නම මොකක්ද?'' ෂෙහාන් විමසීය.

''රාසම්මා..'' ගැහැණිය කීවාය. අපි සියල්ලෝම මේරි නැන්දා දෙස හැරී බැලීමු. එහෙත් ඇයට වැඩට හුන් දෙමළ ළමයාගේ නම මතක නැති සේය.

''රාසම්මා.. පොඩි කාලෙ කොහෙ හරි ගෙදරක වැඩට හිටියද..?''





ෂෙහාන් විමසීය.

''ඔව් මාත්තියා..''

''කොහෙද ඒ..?''

''විජේකෝන් හාමුලගෙ ගෙදර..''

''මේ මේරි නැන්දව මතක නැද්ද.? මේ හාෂිණී බේබිව මතක නැද්ද..?'' ෂෙහාන් ඇසීය.

''ආන්ඩවනේ.. මොකද මට මතක නෙත්තෙ.?'' ගැහැණිය අප හඳුනා ගනිමින් විස්මයෙන් යුතුව කීවාය.

''අපි වැදගත් දෙයක් දැන ගන්න අවෙ.. විජේකෝන් හාමුලගෙ ගෙදරින් ආවෙ ඇයි කියලා මතකද?'' ෂෙහාන් නීතිඥයෙකු සේ විමසීය.

''ඔව් මාත්තියා.. විජේකෝන් හාමු මට සල්ලි දීල කිව්ව ගෙදර පලයන් කියලා.. ඒ සැරේ මං ගෙදර ආවා..''

''ඇයි එහෙම එක පාරටම ගෙදර යන්න කිව්වෙ..?'' දිලිප් අයියා ඇසීය. එහෙත් රාසම්මා එකී ප්‍රශ්නයට පිළිතුරු දීමට අදිමදි කළාය.

''ඇයි කතා නැත්තෙ..?'' ක්‍රිෂාන්තයියා සැරෙන් මෙන් විමසීය.

''මං දන්නෙ නෑ මාත්තියා..'' ඇය යමක් සඟවන බව අපිට හොඳින් පැහැදිලි විය.

''ඇත්ත කියනවා ඇයි හාමු ගෙදර එන්න කිව්වෙ..?'' දිලිප් අයියා ගැහැණිය අසලටම යමින් ඇසුවේය.

''ඒක කියන්න මං දන්නෙ නෑ මාත්තියා..'' රාසම්මා මඳක් පස්සට වෙමින් කීවාය.

''ඇත්ත කියපං.. ගෑණියෙ.. අපි හැම දෙයක්ම දැනගෙන ආවෙ.. ඇත්ත නොකිව්වොත් උඹව පොලිසියට ගෙනියනවා..'' දිලිප් අයියා ගැහැණියගේ හැට්ට කරින් අල්ලා සොලවමින් කීවේය.



Scanned by CamScanner

''මං මේ මුකුත් දන්නෙ නෑ මාත්තියා..'' ගැහැණිය බියෙන් යුතුව කීවාය.

''දන්නෙ නෑ.. යමන් පොලිසියට..'' ෂෙහාන් කෑ ගැසුවේය. සැබැවින්ම ඒ මොහොතේ මමත්, දිල්හානි අක්කාත් මඳක් බියට පත්ව සිටියෙමු. ෂෙහාන්ලා කෝපයට පත්ව ඇති බව අපට දැනිණි.

''ඇයි මාත්තියා මට කරදර කරනවා..?''

''ඇයි උඹ ඇත්ත නොකියන්නේ..?''

''මාත්තියා මං දන්නෙ නෑ..'' කියමින් රාසම්මා හඬන්නට වූවාය.

''හරි අපි ඒක නියම විදියට දැන ගන්නම්. දිලිප් උඹ භාෂිණියි අක්කායි එක්ක මෙතන ඉඳපන්.. ගෑණිට කොහේවත් යන්න ඉඩ දෙන්න එපා.. මමයි, ක්‍රිෂාන්තයි, මේරි නැන්දයි එක්ක පොඩි ගමනක් ගිහින් එන්නම්..'' ෂෙහාන් කලබලයෙන් මෙන් කීවේය.

''කොහෙද යන්නේ..?'' මම විමසුවෙමි.

''පස්සෙ කියන්නම්..'' කියා ඔවුන් දෙදෙනා යන්නට ගියහ.

''ඇයි රාසම්මා කියන්න බය වෙන්නෙ..? ඒක කිව්වම රාසම්මාට කිසි කරදරයක් වෙන්නෙ නෑ..'' දිල්හානි අක්කා ගැහැණිය අසලට යමින් කීය. එහෙත් ඇය අඬ අඬා සිටියාය.

පැයකට පමණ පසු අප හුන් දෙසට පොලිස් ජීප් රියක් පැමිණෙනු පෙනිණි. ඒ දැක රාසම්මා කලබල වූවා සේය.

''මං මොනවත් කළේ නෑ.. අනේ නෝනා මාව බේර ගන්න..'' ඇය ඇවිටිලි කරන්නට වූවාය.

ජීප් රිය නැවතුණ සැණින් පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු බිමට බසිනු මම දුටුවෙමි. ඒ සමග ෂෙහාන් සහ ක්‍රිෂාන්තයියා රථයෙන් බැස්සේය.

''ෂෙහාන් මෙයාද ගෑණි..?'' පොලිස් පරීක්ෂකවරයා විමසීය.





''ඔව්..''

''නගිනව ජීප් එකට අපිට තමුන්ගෙ කටඋත්තරයක් ගන්න තියෙනවා..'' පොලිස් පරීක්ෂකවරයා රාසම්මාට අණ කළේය. ඒ වන විට අප වටා සෑහෙන පිරිසක් එක්ව සිටියහ.

''අනේ මං අහිංසක ගෑණි මාත්තියා.. මට කරදර කරන්ට එපා.. මගේ මනුස්සය ආවම එන්නං..'' ගැහැණිය දෑත එක්කොට හඬමින් කීවාය.

''උඹට කරදරයක් වෙන්නෙ නෑ ගෑණියෙ නැගපං..'' පොලිස් නිලධාරියෙකු ඇයව රථයට ඇතුල් කළේය.

''ඕගොල්ලොත් නගින්න..'' එසේ කියමින් පොලිස් පරීක්ෂකවරයා ඉස්සර විය.

''දිලිප්, ඉන්ස්පෙක්ටර්ත් මහින්දෙ ඕල්ඩ් බෝයි කෙනෙක්.. ඒකයි අපට ඔය තරම් සපෝට්..'' ෂෙහාන් සෙමෙන් කියනු මට ඇසිණි.

ටික වේලාවකින් අපි පොලිස් ස්ථානයට ළඟා වීමු.

රාසම්මා පොලිස් ස්ථානයේදී බොහෝ තරවටු කිරීමෙන් පසු දුන් කට උත්තරයෙන් මම ක්ලාන්ත වූයෙමි.

''මැණිකෙගෙ මරණෙ වෙන්න කලින් දවසේ හාමු මාත්තියා මැණිකෙට හොඳට ගැහුවා.. රෑ දෙකට විතර ඇහුණ සද්දෙකට මම ඇහැරිලා දුවගෙන ගියේ මැණිකෙගෙ කාමරේට. ඒ යනකොට මම දැකපු දේ හින්දා මට කෑ ගැහෙන්න ගියා.. හාමු මාත්තියා පැනලා මගේ කට මිරිකා ගත්තා තමා. කෑගැහුවොත් උඹත් මෙතනම මරනවා කියලා හාමු මාත්තියා මට කිව්වා.. මම බයට එතනම වාඩි වුණා.. මැණිකෙ බිම වැටිලා හිටියා. නළලෙ පැත්තකින් ලේ ගලනවාත් මං දැක්කා..

පාන්දර වෙනකම්ම හාමු මාත්තියා කල්පනා කර කර හිටියා. මමත් බයටම වාඩි වුණ තැනින් නැගිට්ටේ නෑ. පස්සෙ හාමු මාත්තියා

මට කිව්වා මැණිකෙගෙ කකුල් දෙකෙන් අල්ලන්න කියලා. හාමු මාත්තියා මැණිකෙගෙ ඇඟෙන් උස්සල අරගෙන කාරෙකේ පස්සෙ සීට් එකේ තිබ්බා.. මටත් නගින්න කිව්වා.''

පස්සෙ ඇල්ල ගාවට කාරෙකෙන් අරන් ගියා. මට කාරෙකේම ඉන්න කියලා හාමු මාත්තියා තනියම මැණිකෙව උස්සන් ගියා.

ටික වෙලාවකට පස්සෙ හාමු ආවෙ හති දදා කාර් එක වේගෙන් ආපහු හරවගෙන එනකොට ඇල්ල තානායම ගාව පාරෙදි කාර් එක හැප්පුණා. පස් කණ්ඩියෙ.. ඉස්සරහ ඔක්කොම පොඩි වෙලා චප්ප වුණා. ඒත් හාමු මාත්තයටයි මටයි මොකුත් වුණේ නෑ. හාමු මාත්තියා මගෙ අතට රුපියල් තුන් දාහක් දීලා කිව්වා උඹට ඕන උදව්වක් කියලා එවපන් මං කරන්නම්.. හැබැයි මේ ගැන කට හොල්ලලා තිබුණොත් එවෙලෙම ඇවිල්ල වෙඩි තියලා මරනවා කියලා.. එහෙම කියලා මාව හතර හමාර බස් එකේ නැග්ගුවා. හාමු මාත්තයා කොහෙ ගියාද කියන්න මං දන්නෙ නෑ තමා. එච්චරයි මාත්තියා මං දන්නෙ.. හාමු මාත්තියාට බයේ මේ වගක් මං කාටවත් කිව්වෙ නෑ..'' ඒ රාසම්මා දුන් කට උත්තරයයි. තව දුරටත් ඇගෙන් ප්‍රශ්න කළ පොලිස් නිලධාරීහු මේරි නැන්දාගෙන් හා මගෙන් ද ප්‍රශ්න කළහ.

''සාජන් පෙරේරා වහාම ගාල්ල පොලිස් ස්ටේෂන් එකට මැසේජ් එකක් යවන්න පුළුවන් තරම් ඉක්මනට විජේකෝන් අත්අඩංගුවට අරගෙන මෙහෙට එවනව්න කියලා..'' පොලිස් පරීක්ෂකවරයා අණ දුන්නේය. ඒ වනවිට බෙහෙවින් සවස්ව තිබූ බැවින් පසුදින උදෑසන පොලිස් ස්ථානයට පැමිණෙන්නට අවසර ලැබිණි. රාසම්මාටද පසුදින එන ලෙස දන්වා නිදහස් කරනු ලැබීය.

අපි පොලිස් ස්ථානයෙන් පිටව ආවෙමු.

''දූන් කෙළින්ම නුවරඑළි යමු. මට ඉන්ස්පෙක්ටර්ගෙ යාළුවෙක් ...න්න තැනක් කිව්වා.. එයාගෙ ලොජ් එකේ අපිට නවතින්න ...එවන්..'' ෂෙහාන් කීවේය.





එකී රැය අප ගත කළේ නුවරඑළියේ ලොජ් එකකය.

පසුදා උදෑසනම අපි යළිත් පොලිස් ස්ථානයට පැමිණියෙමු. ඒ වන විටත් බාප්පා අත්අඩංගුවට ගෙන ගාල්ලේ සිට ගෙනැවිත් තිබිණි.

පොලිසිය විසින් මහේස්ත්‍රාත් උසාවියෙන් ගනු ලැබූ විශේෂ අවසරයක් මත අම්මාගේ සොහොන හාරන්නට පිරිසක් යවා තිබිණ. ඇට කොටස් ගොඩ ගත් වහාම අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත යවන බවට දැන ගන්නට ලැබිණ.

පොලිස් නිලධාරීන් විසින් බාප්පා අප ඉදිරියට ගෙන එනු ලැබීය. කුඩම්මා පසෙකට වී හඬා වැටෙනු මට පෙනිණි. රාසම්මාගේත් මේරි නැන්දාගේත් කට උත්තර බාප්පා ඉදිරියෙහි කියවනු ලැබීය. ඉන් වඩාත් වැදගත් වනුයේ රාසම්මාගේ කට උත්තරයයි.

මාංචු දමන අත්වලින් යුතුව බාප්පා දෙඅතින්ම මුහුණ වසා ගත්තේය. එදෙස තවදුරටත් බලා සිටිය නොහී මම ෂෙහාන්ගේ උරහිසෙහි මුහුණ සඟවා ගත්තෙමි.

බාප්පා රඳවාගෙන, අපට යන්නට ඉඩ ලැබිණ. තවත් තෙදිනක් අපි බණ්ඩාරවෙල ගත කළෙමු. ඒ අධිකරණ වෛද්‍ය වාර්තාව ලැබෙන තෙක්ය. වාර්තාවෙහි සඳහන්ව තිබූයේ හිස තදින් යමක වැදීම නිසා මොළයට හානි වී අධිකව ලේ ගලා යාමෙන් මරණය සිදු වූ බවය.

තවදුරටත්, මගේ රත්තරන් අම්මාගේ මරණය සිදුව ඇත්තේ බාප්පා හෙවත් මගේම අප්පච්චී අතින් බව රහසක් නොවීය.

එදා රැයෙහි අම්මාත් අප්පච්චිත් අතර වූ බහින්බස් වීමකදී අප්පච්චි අම්මාට පහර දී ඇත. ඔහු විසින් තල්ලු කර දැමූ වේගයට අම්මා දැඩි වේගයෙන් බිත්තියෙහි හැපී විසිවී ඇත. ඉන් මොහොතකට පසු අම්මා මියගොස් ඇත. අප්පච්චි ඒ බව පසුව පොලිසියේදී පාපොච්චාරණය කර තිබිණි.

සියලු දත්තයන් එක්රැස් කොට පොලිසිය විසින් ගොනු කළ නඩුව උසාවියට ඉදිරිපත් කරනු ලැබිණ. සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න අසමින්, දැඩි අවධානයකින් නඩුව විභාග කරන්නට විය.

අවසානයේදී අප්පච්චි බරපතල වැඩ සහිතව දස අවුරුද්දකට සිරගෙට නියම වන තීන්දුව ලැබෙද්දී මම සීතලව ගියෙමි.

තීන්දුව ලැබීමෙන් පසු බන්ධනාගාර නියාමකවරුන් විසින් අප්පච්චි කැඳවාගෙන යන අයුරු මම වෙව්ලමින් බලා සිටියෙමි. අප්පච්චි බන්ධනාගාර රථයට නගින්නට ඔන්න මෙන්න කියා තිබිණ. මගේ සිරුරේ ලේ.. අප්පච්චිගේ ලේ.. කකියමින් තිබිණි. පාලනය කරගත නොහැකි කුමක්දෝ ආවේගයක් මට දැනෙමින් තිබිණ.

''අප්පච්චි..'' මා උස් හඬින් කෑ ගැසුවා නොව කෑගැස්විණ. අප්පච්චි යන ගමන නවතා මොහොතකට ආපසු හැරී බලනු මට පෙනිණි. මම සියල්ල දමා ඔහු ළඟට පිම්මේ දිව ගියෙමි. මා වැළඳ ගන්නට ඔහු දෝත දිගු කළද මාංචු දමා තිබූ බැවින් එය කළ නොහැකි බව මට දැනිණි. මම තරයේම ඔහු වැළඳ ගතිමි.

''අප්පච්චි.. අප්පච්චි.. අප්පච්චි....''

මම උමතුවෙන් මෙන් හඬා වැටෙමින් මතුලෙමි. අප්පච්චිගේ දෙනෙතින් කඳුළු ගලා යනු දැනිණි.

''මගේ රත්තරන් මට සමාවෙයන්..'' මට අප්පච්චිගේ කටහඬ ඇසිණ.

''හරි දැන් යමු..'' නිලධාරියෙකු විසින් අප්පච්චි මගෙන් වෙන් කර ගනු ලැබීය. අප්පච්චි රැගත් රිය පිටව යන තුරු බලා සිටි මම ආපසු හැරී සිහි විකල් වූ ලෙසින් බැලීමි. කුඩම්මා මගේ නෙතට හසු විය. අපේ පවුල කඩා ඉහිර වූ හැතිරිය ඇය නොවන්නේද? මම නිරායාසයෙන්ම ඇය වෙතට පැන පහර පිට පහර එල්ල කළෙමි. කිසිවෙකු විසින් මා ඇද ගන්නාක් මෙන් මට දැනිණ. මගේ නෙත ඉබේම පියැවිණි. මා යළිත් නෙත් හරිද්දී ෂෙහාන්ගේ දයාබරිත වත





මට පෙනිණි.

''ෂෙහාන් මගේ අප්පච්චි..'' මම හඬ හඬා සෙමෙන් කීවෙමි.

''ඒක එයාගෙ ඉරණම.. මොන දේ උනත් මං ඔයාව තනි කරන්නෙ නෑ පුංචි කෙල්ලෙ සදහටම ඔයා මගේ.. නාඩන් බට්ටිච්චියෙ නාඩන්..'' ෂෙහාන් මගේ සවන් අද්දර ගීතවත්ව තෙපලනු මට ඇසිණ.

''ෂෙහාන්..'' මම මුළු ලොවම අමතක කළාක් මෙන් ඔහුව තරයේ වැළඳ ගත්තෙමි.

අවසානයි



Scanned by CamScanner




Scanned by CamScanner